වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2020

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දැක්ම

උසස් අධ්‍යාපන, අධ්‍යයන සහ පර්යේෂණ කාර්යයන්හි ජාත්‍යන්තර පිළිගැනීමකින් යුතු මධ්‍යස්ථානයක් බවට පත් වීම.

මෙහෙවර

තිරසාර සංවර්ධනය සඳහා දායක විය හැකි දැනුම, කුසලතා හා ආකල්ප වලින් පිරිපුන් ශක්නුවත් මානව සම්පත් බිහිකිරීම පිණිස ඉගෙනුම්, පර්යේෂණ හා පුහුණු කාර්යයන් ප්‍රවර්ධනය කරමින්, දැනුම උත්පාන කිරීමේ, වර්ධනය කිරීමේ සහ බෙදා හැරීමේ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් බවට පත් වීම.

අරමුණු

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් වීම.

රටේ සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන උපාධිධාරීන් බිහි කිරීම.

කාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞර්ෂ සංවර්ධනය.

ජාත්‍යන්තර කීර්තිය ලත් කලාපීය පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් බවට පත් වීම.

ජාතික අදාළත්වයකින් යුත් ක්ෂේත්‍ර වලට අදාළව අඛණ්ඩ වෘත්තීය වැඩසටහන් වැඩිදියුණු කිරීම.

විශ්වවිද්‍යාල ලාංඡනය

විශ්වවිද්‍යාල ලාංඡනය කලාපය සහ විශ්වවිද්‍යාලය මඟින් සේවය සපයන ජනතාව සහ එහි පවතින පරමාදර්ශයන් සංකේතවත් කරයි. සාම්ප්‍රදායික පහන සහ එහි දැල්ල දැනුම සහ ප්‍රඥාව සංකේතවත් කරයි.

පොත	:	අධ්‍යාපනය
සමනල කන්ද	:	සබරගමුව පළාත
මැණික්	:	රත්නපුර දිස්ත්‍රික්කය
වී කරල්	:	සෞභාග්‍ය

විශ්වවිද්‍යාල ධජය

විශ්වවිද්‍යාල ධජය මෙරුන් සහ රන් යන වර්ණ දෙකකින් සමන්විත වේ. මෙරුන් වර්ණයෙන් පරිණතභාවය ද රන් වර්ණයෙන් විනය මඟින් ලැබෙන දැනුම පිළිබිඹු කරයි. විශ්වවිද්‍යාල ලාංඡනය ධජයේ කේන්ද්‍රයේ පිහිටා ඇත.

විශ්වවිද්‍යාල ගීතය

මේ ඔබේ සවියයි
මේ මගේ සවියයි
සබරගමුව සරසවියයි ..... //

සමනල වැව පිපි නෙළුම් නෙලා ගෙන
ගිරිකුළු වන රද මතින් ගලා යන
ජීවිතයේ කඳු මුදුන් සොයා ගෙන
හාගල කන්ද නගින්නේ ..... //

සිරිපා පහනින් එළිය ලබා ගෙන
මනරම් විදුණැන අකුරු දරාගෙන
කළුගං පතුලේ රුවන් සොයාගෙන
උඩුගම් බලා ඇදෙන්නේ ..... //

දෙරණේ උරුමය ලොවට බෙදාගෙන
සිප් කගගින් රුදු අඳුර නසාගෙන
ඔබෙත් මගෙත් හීනය කලඑළි වන
දිනය උදා වන්නේ ..... //

මේ ඔබේ සවියයි
මේ මගේ සවියයි
සබරගමුව සරසවියයි ..... //

විශ්වවිද්‍යාල සිතියම



උපකුලපතිතුමාගේ සමාලෝචනය - 2020



ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස සිය 25 වන රජත ජයන්තිය සමරනු ලබන 2020 වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි. අගනුවර සිට කි.මී. 162 ක් දුරින්, කොළඹ බදුල්ල A4 මහා මාර්ගයේ බෙලිහුල්ඔය නගරයට ආසන්නව පඹහින්නේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දළ වශයෙන් අක්කර 200 ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්තය.

මේ වන විට විශ්වවිද්‍යාලය පීඨ 08 කින් සමන්විත වේ. ඒවා නම්; පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කෘෂි විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, භූ විඥාපන පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය, සමාජ විද්‍යා හා භාෂා පීඨය, තාක්ෂණ පීඨය හා වෛද්‍ය පීඨය වශයෙනි. වෛද්‍ය පීඨය රත්නපුර කුරුවිට ප්‍රදේශයේ පිහිටුවා ඇත.

2020 වසරේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන අදියරේ පළමු කොටස ඉදිකිරීම් මෙන් ම කෘෂි විද්‍යා පීඨයේ දෙවන අදියරේ සහ වෛද්‍ය පීඨයේ පැරා සායනික හා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ ද ඉදිකිරීම් කටයුතු ද ආරම්භ කර ඇත. ව්‍යවහාරික විද්‍යා පීඨයේ රසායනික විද්‍යා පර්යේෂණාගාරයේ සංවර්ධන කටයුතු නිම කිරීම, විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීම, කෘෂි විද්‍යා පීඨයේ මුංගස්තැන්න අධ්‍යයන කාර්ය ගොඩනැගිල්ල සඳහා අන්තර්ජාල පහසුකම් සැලසීම සහ පැරණි ශ්‍රවණාගාරය තාක්ෂණ පීඨ සිසුන්ගේ දේශන සඳහා භාවිත කළ හැකි පරිදි සකස් කිරීම පසුගිය වසරෙහි විශ්වවිද්‍යාලය ලද ජයග්‍රහණ අතර වේ. එමෙන් ම කළමනාකරණ අධ්‍යයන පීඨයේ තුන්වන අදියරේ දෙවන කොටස ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මේවන විට අනුමත කර ඇති අතර පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ සංකල්ප පත්‍රිකාව යොමු කිරීමට අවශ්‍ය කටයුතු අවසන් අදියරේ පවතී. විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ මේවන විට විශේෂ සංඥා පද්ධතියකින් (Fiber optic backbone) එකිනෙක හා ආභ්‍යන්තරිකව සම්බන්ධ කර ඇති අතර ඉදිරියේ දී එම තත්ත්වය උසස් කිරීමට නියමිතය. 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව දළ වශයෙන් 5995 ක් විය. මෙම වර්ෂයේ දී විශ්වවිද්‍යාලයට බඳවා ගත් අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව 1522 ක් වූ අතර පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයෝ 96 දෙනෙක් බඳවා ගනු ලැබුහ. ඊට අමතරව, විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන පාඨමාලා සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 2349 දෙනෙක් ලියාපදිංචි වී සිටිති. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2020 උපාධි ප්‍රදානෝත්සවය සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි වූ අතර එය 2021 වසරේ මර්තු මස 02 දින හා 10 වන දින සැසි දෙකක් ලෙස පැවැත්වීමට නියමිතව ඇත.

ශිෂ්‍ය ප්‍රජාව මෙන්ම කාර්ය මණ්ඩලය සඳහා ද සුභ සාධන හා විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමු කර තිබේ. ඒ අනුව, අභ්‍යන්තර සිසුන්ගෙන් 93.3% ක් සඳහා විශ්වවිද්‍යාලය මඟින් නේවාසික පහසුකම් සපයා දී ඇත. අධ්‍යයන කටයුතු සඳහා අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීමට ද කටයුතු යොදා ඇත. විශ්වවිද්‍යාලයේ දැනට පවතින සම්පත් උපයෝගී කර ගනිමින් අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ද හැකි පමණින් නේවාසික පහසුකම් සලසා දී තිබේ.

විශ්වවිද්‍යාලයෙහි පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා සිසුන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට පහසුකම් සැලසීමට ද විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. 2020 වර්ෂයේ දී ජාත්‍යන්තර

සම්මන්ත්‍රණ ද්විත්වයක් මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online platform) පැවැත්වූ අතර සමාජීය විද්‍යා හා භාෂා පීඨය සහ භූ විඥාපන පීඨය මඟින් විද්‍යාර්ථීන් සඳහා පර්යේෂණ සමුළු පැවැත්වීමට කටයුතු කර ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් කරන ලද පර්යේෂණ සඳහා අන්තර්ජාතික පේටන්ට් බලපත්‍රයක් ද විශ්වවිද්‍යාලය සඳහා ලැබී ඇති අතර බොහෝ දෙනෙකුට විදේශීය පර්යේෂණ සමුළුවල දී සිය පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය විශ්වවිද්‍යාලය මඟින් සපයා ඇත. ඒ අතරම නව පර්යේෂණ වෙළඳපොළ වෙත ඉදිරිපත් කිරීම සඳහාත් පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහාත් වන අවබෝධතා ගිවිසුම් 05 කට අත්සන් තැබීමත් එම වසරේ දී සිදු කරන ලද විශේෂිත කටයුතු අතර වේ.

කුසලතා පූර්ණ මානව සම්පත ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ශක්තියක් වී ඇත. විශ්වවිද්‍යාලයේ සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 281 ක් පමණ වන අතර, පරිපාලන හා විධායක කාර්ය මණ්ඩලය 36 දෙනෙකුගෙන් ද, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය 19 දෙනෙකුගෙන් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය 399 දෙනෙකුගෙන් ද සමන්විත වේ. කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය සඳහා 2020 වසරේ දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් විවිධ මාතෘකා යටතේ පුහුණු සැසි, විවිධ වැඩ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබා දීමේ අරමුණින්, අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය වෙත පුහුණු අවස්ථා සැලසීමට ද විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත.

මෙම සියලු කාර්යයන් කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ද යහ පරිදි පවත්වා ගෙන යාමට දූරදර්ශී නායකත්වය සැපයූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය හා සබැඳි සියලු අමාත්‍යාංශ, සහ නිලධාරීන් ද කෘතවේදී ව සිහිපත් කරමි. මේ සියලු කටයුතු නොපිරිහෙලා ඉටු කරන අප විශ්වවිද්‍යාල ප්‍රජාවට ද හදපිරි ස්තූතිය පිරිනමමි.

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක
උපකුලපති

පටුන

1. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
   - 1.1 විශ්වවිද්‍යාලයේ ඉතිහාසය 10
   - 1.2 හැඳින්වීම 10
   - 1.3 කුලපති 12
   - 1.4 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් 12
   - 1.5 පාලක සභාව 14
   - 1.6 සනාතන සභාව 15
   - 1.7 ආයතනික ව්‍යුහය 19
2. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨයන්
   - 2.1 පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය 20
   - 2.2 කෘෂි විද්‍යා පීඨය 24
   - 2.3 ව්‍යවහාරික විද්‍යා පීඨය 28
   - 2.4 භූ විඥාපන පීඨය 34
   - 2.5 කළමනාකරණ අධ්‍යයන පීඨය 36
   - 2.6 වෛද්‍ය පීඨය 39
   - 2.7 සමාජීය විද්‍යා හා භාෂා පීඨය 41
   - 2.8 තාක්ෂණ පීඨය 46
3. අධ්‍යයන සම්පත්
   - 3.1 පුස්තකාලය 48
   - 3.2 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය 51
   - 3.3 ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය 60
4. අධ්‍යයන මධ්‍යස්ථාන
   - 4.1 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 66
   - 4.2 විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය 69
   - 4.3 ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය 72
   - 4.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 73
   - 4.5 පර්යේෂණ හා දැනුම ව්‍යාපත් කිරීමේ මධ්‍යස්ථානය 76
   - 4.6 තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (CQA) 79
   - 4.7 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය (UBLC) 108
   - 4.8 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රය 114
5. ප්‍රථම උපාධි අභ්‍යන්තර (දේශීය සහ විදේශීය) සඳහා නව බඳවා ගැනීම් සහ ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව
   - 5.1 ප්‍රථම උපාධි අභ්‍යන්තර සඳහා දේශීය සිසුන්ගේ නව බඳවා ගැනීම් 116
   - 5.2 ප්‍රථම උපාධි අභ්‍යන්තර සඳහා ලියාපදිංචි මුළු දේශීය සිසුන් සංඛ්‍යාව 118
   - 5.3 ප්‍රථම උපාධි අභ්‍යන්තර සඳහා ලියාපදිංචි මුළු විදේශීය සිසුන් සංඛ්‍යාව 122
6. පශ්චාද් උපාධි පාඨමාලා සඳහා නව බඳවා ගැනීම් සහ ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව
   - 6.1 පශ්චාද් උපාධි පාඨමාලා සඳහා දේශීය සිසුන්ගේ නව බඳවා ගැනීම් සහ ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව 123
7. විභාග පිළිබඳ විස්තර
   - 7.1 ප්‍රථම උපාධි පිළිබඳ විස්තර - අභ්‍යන්තර 124
   - 7.2 පශ්චාද් උපාධි පිළිබඳ විස්තර 125

8. මානව සම්පත් පිළිබඳ විස්තර
8.1 අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්ය මණ්ඩලය 126
8.2 අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්ය මණ්ඩලය - අධ්‍යයන කාර්ය මණ්ඩලය 127
8.3 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් 136
8.4 ප්‍රථම උපාධි / පශ්චාද් උපාධි ඉගැන්වීම් කටයුතු / ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ / වැඩමුළු සඳහා 2019 වරෂයේ දී විශ්වවිද්‍යාලයට පැමිණි අන්තර්ජාතික කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු 136
8.5 2020 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය විසින් ලබා ගත් විදේශ ශිෂ්‍යත්ව, සහෘදත්ව සහ පුහුණු වැඩසටහන් 137
8.6 2020 වර්ෂය තුළ විදේශීය උසස් අධ්‍යාපන ආයතන / පර්යේෂණ ආයතන / පරිත්‍යාගශීලී ආයතන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම් පිළිබඳ තොරතුරු 137
8.7 2020 වර්ෂය තුළ පශ්චාද් උපාධි (දේශීය සහ විදේශීය) සඳහා ලියාපදිංචි වූ ලියාපදිංචි වූ අධ්‍යයන, පරිපාලන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය 138
8.8 2020 වර්ෂය තුළ පශ්චාද් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ අධ්‍යයන, පරිපාලන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය 140
9. ඉදිකිරීම්
9.1 පවතින / නැවත ආරම්භ කර සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති 141
9.2 2020 වර්ෂය තුළ සිදු කෙරෙමින් පවතින කැබිනට් අනුමැතිය ලද ව්‍යාපෘති 141
9.3 නව ව්‍යාපෘති 142
10. පර්යේෂණ පිළිබඳ විස්තර
10.1 2020 වර්ෂය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ ප්‍රකාශන සංඛ්‍යාව 143
10.2 2020 වර්ෂය තුළ නිර්දේශිත (සුවිගත සහ සුවිගත නොකළ) සඟරාවල ප්‍රකාශන ලැයිස්තුව 147
10.3 2020 වර්ෂය තුළ සාමාන්‍ය ජනතාව වෙත දැනුම බෙදා හැරීම පිළිබඳ තොරතුරු 180
10.4 2020 වර්ෂය තුළ ලබා ගත් ජාතික සහ අන්තර්ජාතික සම්මාන 191
11. නේවාසිකාගාර පිළිබඳ විස්තර - 2020
11.1 2020 වර්ෂය තුළ පීඨ පදනමින් නේවාසිකාගාර පහසුකම් ලැබීමට සුදුසුකම් ලැබූ සහ නේවාසාකාගාර පහසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව 193
11.2 ස්ථීර නේවාසිකාගාර 198
11.3 කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර 198
12. මහපොල ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර
12.1 මහපොල ශිෂ්‍යත්ව 200
12.2 ශිෂ්‍යාධාර 200
12.3 2020 වර්ෂයේ දී මහපොල ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව 200
13. වාර්ෂික ගිණුම් - 2020 203
14. 2020 වර්ෂයේ දී තිරසර සංවර්ධන අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ දායකත්වය 236
15. විගණකාධිපති වාර්තාව - 2020 237
16. විගණකාධිපති වාර්තාවට පිළිතුරු - 2020 247

1. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

1.1 විශ්වවිද්‍යාලයේ ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉතිහාසය 1991 වර්ෂය තෙක් දිව යන්නකි. 1991 දී අනුබද්ධ විශ්වවිද්‍යාලයක් ලෙස බෙලිහුල්ඔය ප්‍රදේශයේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ අනුබද්ධ විශ්වවිද්‍යාල ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව විමසා බැලීම පිණිස 1995 වර්ෂයේ දී ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශය මත ජාතික විශ්වවිද්‍යාලයක් බවට උසස් කරන ලද්දේ එවකට රහංගල සහ බුත්තල ප්‍රෙද්ශයන්හි පැවති අනුබද්ධ විශ්වවිද්‍යාල ද සබරගමුව අනුබද්ධ විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ කරමිනි. ඒ අනුව, එම ඒකාබද්ධ කරන ලද අනුබද්ධ විශ්වවිද්‍යාල ‘‘සබරගමුව විශ්වවිද්‍යාලයේ උඟව මණ්ඩපය’’ ලෙස නම් කරන ලදී. මෙසේ ඒකාබද්ධ කිරීමට පෙර, බෙලිහුල්ඔය සහ බුත්තල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ ද රහංගල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ ද අනුබද්ධ ව පැවතිණි. මෙසේ අනුබද්ධ විශ්වවිද්‍යාල තුනක් ඒකාබද්ධ කොට පිහිටුවනු ලැබූ සබරගමුව විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස 1996 පෙබරවාරි 02 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

රහංගල සහ බුත්තල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාල පසුව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය බවට පත් වූ අතර, ඒවා පිළිවෙළින් 2001 වර්ෂයේ දී සහ 2008 වර්ෂයේ දී බෙලිහුල්ඔය පිහිටි ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රය වෙත ගෙන එන ලදී.

1.2 හැඳින්වීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සමනලවැව ජලාශයට යන මාර්ගයේ වම් පසින් ද කොළඹ - බදුල්ල අධිවේගී මාර්ගයෙන් කිලෝමීටර් 160 ක් පමණ දුරින් ද පිහිටා ඇත.



විශ්වවිද්‍යාලය පීඨ 08 කින් සමන්විත වේ. ඒවා නම්:

- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
- කෘෂි විද්‍යා පීඨය
- ව්‍යවහාරික විද්‍යා පීඨය
- භූ විඥාපන පීඨය
- කළමනාකරණ අධ්‍යයන පීඨය
- වෛද්‍ය පීඨය
- සමාජීය විද්‍යා හා භාෂා පීඨය
- තාක්ෂණ පීඨය

මෙම පීඨ 08 ට අමතරව විශ්වවිද්‍යාලය යටතේ පහත සඳහන් අධ්‍යයන මධ්‍යස්ථාන 09 ක් ද ක්‍රියාත්මක වේ.

- පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
- විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (CODL)
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)
- ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය
- පර්යේෂණ හා දැනුම බෙදා හැරීමේ මධ්‍යස්ථානය
- තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (CQA)
- විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය (UBLC)
- විශ්වවිද්‍යාල කෞතුකාගාරය

විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සපයනු ලැබේ.

- සියලුම සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම්
- කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් පහසුකම්
- ආයුර්වේද මධ්‍යස්ථානය
- පෙර පාසල
- කෘෂි පීඨ ගොවිපල නවාතැන
- ආගන්තුක නිවාස
- වෛද්‍ය මධ්‍යස්ථානය
- ක්‍රීඩා පිට්ටනිය සහ කායවර්ධන මධ්‍යස්ථානය
- ‘‘සිත් අරණ’’ උපදේශන මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන වාර්ෂික සමුළු, සම්මන්ත්‍රණ සහ සැසි:

- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සමුළුව (ICSUSL)
- කෘෂි විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (AgInsight)
- වාර්ෂික පර්යේෂණ සැසිය (ARS)
- කළමනාකරණ පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICMR)
- සමාජීය විද්‍යා හා භාෂා පිළිබඳ ශිෂ්‍ය පර්යේෂණ සැසිය (SRS)
- කළමනාකරණ උපාධි අපේක්ෂක පර්යේෂණ සැසිය (MURS)

1.3 කුලපති

මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර හිමි.

1.4 විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

1978 දරණ විශ්වවිද්‍යාල පනතෙහි (සංශෝධිත) 33 වන වගන්තිය මඟින් නියම කර ඇති පරිදි විශ්වවිද්‍යාලයෙහි නිලධාරීන් පහත පරිදි වේ.

උපකුලපති

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක
BScHons (Sp.) in Agriculture (RUH), MSc (Biotechnology) (PDN), PhD (AIT) Thailand
(2020 නොවැම්බර් 02 සිට)

මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල (වැඩබලන උපකුලපති)
BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (Xiamen-P R, China)
(2020 මැයි 19 සිට 2020 නොවැම්බර් 01 දක්වා)

මහාචාර්ය එම්. සුනිල් ශාන්ත
BAHons (SJP), MA in Economics (SJP), PhD (UOC)
(2020 මැයි 18 දක්වා)

පීඨාධිපතිවරුන්

පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
මහාචාර්ය එච්.එම්. එස්. ප්‍රියනාත්
BA (SJP), MA (SJP), PhD (CMB)

පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය එම්.එම්.පී. සුමිත්
BVSc (Sri Lanka), MSc (Kobe-Japan), PhD (Kobe – Japan)

පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය
ආචාර්ය ආර්.එස්. සබරගමුව
BScHons (Sp.) (PDN), MPhil (PDN), PhD (UoA, New Zeeland)
(2020 ඔක්තොම්බර් 03 සිට)

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක
BScHons (Sp.) in Agriculture (RUH), MSc (Biotechnology) (PDN), PhD (AIT) Thailand
(2020 ඔක්තොම්බර් 02 දක්වා)

පීඨාධිපති, භූ විඥාපන පීඨය
ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න
BScHons(Surveying Sciences)(SUSL), MPhil (Geodesy)(SJP), PhD (Geodesy) ThePolytechnic University, Hong Kong

පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥනපාල
BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (Xiamen-P R, China)

පීඨාධිපති, වෛද්‍ය පීඨය
මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න
PhD in Biochemistry Loyola University, Chicago Chicago, Illinois USA

පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු
BScHons (Statistics) (SJP), MPhil (PDN), PhD (University of Auckland)
(2020 ඔක්තොම්බර් 13 සිට)

ආචාර්ය ඩබ්ලිව්. මනෝජ් ආරියරත්න
BAHons (SJP), MA (SJP), PhD (Pune)
(2020 ඔක්තොම්බර් 12 දක්වා)

පීඨාධිපති, තාක්ෂණ පීඨය
ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත
BSc (Agriculture) (RUH), MSc (Agriculture) (PDN), D.Eng (Water Resource Engineering) (Wuhan, PR China)

ලේඛකාධිකාරී

කමල් ගුණවර්ධන
BSc, MBA (Human Resource Management) (OUSL)
(2020 මාර්තු 30 සිට)

වී.ඩී. කිත්සිරි
BComHons (Sp.) (SJP), PGDM (SJP), EMBA (PIM – SJP), ICA PI, Dip English (Aquinas, ACHE, SLIDA), Dip (computer Studies), ICDL
(2020 මාර්තු 29 දක්වා)

පුස්තකාලයාධිපති

ටී.එන්. නෙයිසූරි
BA (KLN), MSSc (LIS) (KLN), Chartered Librarian

මූල්‍යාධිකාරී

කේ.ඒ.ආර්.එස්. ජයකොඩි
BCom (SJP), PGD (IGNOU), APFA (SL), Dip (Accountancy), ICA PI, AAT (SL)

1.5 පාලක සභාව

1978 අංක දරණ විශ්වවිද්‍යාල පනතෙහි (සංශෝධිත) 44 වන වගන්තිය මඟින් නියම කර ඇති පරිදි විශ්වවිද්‍යාලයෙහි පාලන අධිකාරිය වන විශ්වවිද්‍යාල පාලක සභාව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය.

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	උපකුලපති - සභාපති (2020 නොවැම්බර් 02 සිට)
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	වැඩබලන උපකුලපති - සභාපති (2020 මැයි 19 සිට 2020 නොවැම්බර් 01 දක්වා)
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත	උපකුලපති - සභාපති (2020 මැයි 18 දක්වා)
මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත්	පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එම්.පී. සුමිත්	පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය ආර්.එස්. සබරගමුව	පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 03 සිට)
මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 02 දක්වා)
ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න	පීඨාධිපති, භූ විඥාපන පීඨය
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න	පීඨාධිපති, වෛද්‍ය පීඨය
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු	පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 13 සිට)
ආචාර්ය ඩබ්ලිව්. මනොජ් ආරියරත්න	පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය **(**2020 ඔක්තොම්බර් 12 දක්වා**)**
ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත	පීඨාධිපති, තාක්ෂණ පීඨය

සනාතන සහා නියෝජිතයින්

ආචාර්ය සමන් කොස්වත්ත	භූ විඥාපන පීඨය
ආචාර්ය කේ.වී.ඩී.ඊ. මැණිකේ	සමාජීය විද්‍යා හා භාෂා පීඨය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින්

පූජ්‍ය කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහා නායක හිමි
පූජ්‍ය අනුනායක දම්පහල සීලානන්ද හිමි
මහාචාර්ය පූජ්‍ය කෝන්ගස්තැන්න ආනන්ද හිමි
මහාචාර්ය ඒ. බමුණුආරච්චි
පියතිස්ස රණසිංහ
එච්.ඩබ්ලිව්. ගුණදාස
එම්.එම්. රෆීක්
වෛද්‍ය එස්.පී.ඒ.එල්. රණවීර
දේශබන්දු සූරියපටබැඳි
තිලක් ධර්මරත්න

වෛද්‍ය අනෝජා රොද්‍රිගෝ
විසාකා එල්ලාවල (2020 මැයි දක්වා)
ඩබ්ලිව්.එම්.එස්.එස්. වීරසේකර (2020 සැප්තැම්බර් සිට)

පාලක සභා ලේකම්

කමල් ගුණවර්ධන **(**2020 මාර්තු 30 සිට**)**	-	වැඩබලන ලේඛකාධිකාරී
වී.ඩී. කිත්සිරි **(**2020 මාර්තු 29 දක්වා**)**	-	ලේඛකාධිකාරී

2020 වර්ෂය තුළ පාලක සභා රැස්වීම් 12 ක් පවත්වා ඇත.

1.6 සනාතන සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි (සංශෝධිත) 46 වගන්තිය මඟින් නියම කර ඇති පරිදි, විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන බල මණ්ඩලය වන විශ්වවිද්‍යාල සනාතන සභාව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විතය.

සභාපති

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	උපකුලපති (2020 නොවැම්බර් 02 සිට)
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	වැඩබලන උපකුලපති (2020 මැයි 19 සිට 2020 නොවැම්බර් 01 දක්වා)
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත	උපකුලපති (2020 මැයි 18 දක්වා)

සනාතන සභා සාමාජිකයින්

මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත්	පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එම්.පී. සුමිත්	පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය ආර්.එස්. සබරගමුව	පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 03 සිට)
මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 02 දක්වා)
ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න	පීඨාධිපති, භූ විඥාපන පීඨය
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න	පීඨාධිපති, වෛද්‍ය පීඨය
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු	පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 13 සිට)
ආචාර්ය ඩබ්ලිව්. මනෝජ් ආරියරත්න	පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 12 දක්වා)
ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත	පීඨාධිපති, තාක්ෂණ පීඨය

මහාචාර්යවරුන්

මහාචාර්ය ආර්.පී. මහලියනආරච්චි	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය ඒ.ඒ.වයි. අමරසිංහ	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය
මහාචාර්ය චන්දන පී. උඩවත්ත	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
මහාචාර්ය ලාල් පී. විදාන ආරච්චි	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය
මහාචාර්ය ඩී.එම්.ඒ. ගුණරත්න	මහාචාර්ය, පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාශය
මහාචාර්ය ජී.එම්.එල්.පී. අපොන්සු	මහාචාර්ය, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
මහාචාර්ය එම්. ඉෂාම්	මහාචාර්ය, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය පී.එම්.ඒ.එස්. කරුණාරත්න	මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය
මහාචාර්ය පී.අයි. යාපා	මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය
මහාචාර්ය ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක	මහාචාර්ය, සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය එස්.කේ. ගුණතිලක	මහාචාර්ය, ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
මහාචාර්ය ඩී.ඒ.අයි. දයාරත්න	මහාචාර්ය, ගණකාධිකරණ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය ජේ.එම්.සි.කේ. ජයවර්ධන	මහාචාර්ය, ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
මහාචාර්ය එම්.එස්.එම්. අස්ලම්	මහාචාර්ය, සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය එම්.එල්.එම්.සී. දිසානායක	මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය
මහාචාර්ය සී.එන්. වල්පිට	මහාචාර්ය, පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයානංශය
මහාචාර්ය ටී.එල්. දම්මලගේ	මහාචාර්ය, දුරස්ථ ගෝචර ග්‍රහණ හා භූමි තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
මහාචාර්ය ඒ. සරත් ආනන්ද	මහාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත	මහාචාර්ය, ගණකාධිකරණ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය ඒ.අරුණ ශාන්තආරච්චි	මහාචාර්ය, ගණකාධිකරණ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය එස්.එස්.ඒ. සෙනෙවිරත්න	මහාචාර්ය, භාෂා අධ්‍යයනාංශය
මහාචාර්ය කේ.පී.එල්. නිශාන්ත	මහාචාර්ය, විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයානංශය
මහාචාර්ය එස්.ඩී.ඒ. සඳනායක	මහාචාර්ය (විඥාපක), භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
මහාචාර්ය. එච්.ඒ.ඩී. රුවන්දීපිකා	මහාචාර්ය, පශු සම්පත් අධ්‍යයනාංශය

පුස්තකාලයාධිපතිනී

ටී.එන්. නෙයිසූරී	පුස්තකාලයාධිපතිනී

අධ්‍යයනාංශ ප්‍රධානීන්

මහාචාර්ය ඩී.ඒ.එම්. ද සිල්වා	අධ්‍යයනාංශ ප්‍රධාන, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
ආචාර්ය පී.කේ. දිසානායක	අධ්‍යයනාංශ ප්‍රධාන, කෘෂි අපනයන අධ්‍යයනාංශය (2020 අගෝස්තු දක්වා)

මහාචාර්ය පී.එම්.ඒ.එස්. කරුණාරත්න	අධ්‍යයනාංශ ප්‍රධාන, කෘෂි අපනයන අධ්‍යයනාංශය (2020 සැප්තැම්බර් සිට)
ආචාර්ය ටී.එස්.පී. ජයවීර	අධ්‍යයනාංශ ප්‍රධාන, පශු සම්පත් අධ්‍යයනාංශය
ආචාර්ය එච්.ආර්.එස්. බණ්ඩාර	අධ්‍යයනාංශ ප්‍රධාන, බිම් මැනුම් හා භූමිතික මැනුම් අධ්‍යයනාංශය
ආචාර්ය එස්. කොස්වත්ත	අධ්‍යයනාංශ ප්‍රධාන, දුරස්ථ ගෝචර ග්‍රහණ හා භූමි තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
ආචාර්ය බී.ටී.ජී.එස්. කුමාර	අධ්‍යයනාංශ ප්‍රධාන, ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය (2020 මාර්තු දක්වා)
මහාචාර්ය එස්. වසන්තප්‍රියන්	අධ්‍යයනාංශ ප්‍රධාන, ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය (2020 ජූනි සිට)
ආචාර්ය ඊ.පී. කුඩවිදානගේ	අධ්‍යයනාංශ ප්‍රධාන, ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
මහාචාර්ය ජී.එම්.එල්.පී. අපොන්සු	අධ්‍යයනාංශ ප්‍රධාන, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
ටී.එස්.එච්. පෙරේරා	අධ්‍යයනාංශ ප්‍රධාන, ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය
ආර්.එස්. සබරගමුව	අධ්‍යයනාංශ ප්‍රධාන, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (2020 සැප්තැම්බර් දක්වා)
ආචාර්ය ඩබ්ලිව්.එස්.එම්. සෙනෙවිරත්න	අධ්‍යයනාංශ ප්‍රධාන, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (2020 ඔක්තොම්බර් සිට)
ආචාර්ය ආර්.එස්.එස්.ඩබ්ලිව්. ආරච්චි	අධ්‍යයනාංශ ප්‍රධාන, සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය (2020 සැප්තැම්බර් දක්වා)
ආචාර්ය පී.කේ.එස්. මුණසිංහ	අධ්‍යයනාංශ ප්‍රධාන, සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය (2020 ඔක්තොම්බර් සිට)
ඩී. ජාසිංහ	අධ්‍යයනාංශ ප්‍රධාන, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය
ආචාර්ය එච්.පී.ආර්. ප්‍රියන්කර	අධ්‍යයනාංශ ප්‍රධාන, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය ඩී.ඒ.අයි. දයාරත්න	අධ්‍යයනාංශ ප්‍රධාන, ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය (2020 මාර්තු දක්වා)
ආචාර්ය ඩී.ජී. ධර්මරත්න	අධ්‍යයනාංශ ප්‍රධාන, ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය (2020 ජූලි සිට)
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු	අධ්‍යයනාංශ ප්‍රධාන, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයානංශය (2020 සැප්තැම්බර් දක්වා)
ආචාර්ය ආර්.ඒ.එච්.එම්. රූපසිංහ	අධ්‍යයනාංශ ප්‍රධාන, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය (2020 දෙසැම්බර් සිට)
ආචාර්ය කේ.වී.ඩී.ඊ. මැණිකේ	අධ්‍යයනාංශ ප්‍රධාන, භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධයනාංශය
ආචාර්ය කේ.එස්.එන්. ප්‍රසංගනී	අධ්‍යයනාංශ ප්‍රධාන, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය
ආචාර්ය ආර්.ජී.එස්. රත්නායක	අධ්‍යයනාංශ ප්‍රධාන, භාෂා අධ්‍යයනාංශය
එස්.කේ. හඳුරාගම	අධ්‍යයනාංශ ප්‍රධාන, සමාජ විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය කේ.ආර්. කොස්වත්තගේ	අධ්‍යයනාංශ ප්‍රධාන, ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය
ආචාර්ය ඩබ්ලිව්.ජී.එම්.එස්. පෙරේරා	අධ්‍යයනාංශ ප්‍රධාන, ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය

ආචාර්ය එම්.එම්.ජේ.ඒ. ජයවර්ධන	අධ්‍යයනාංශ ප්‍රධාන, භෞතවේද අධ්‍යයනාංශය
ආචාර්ය ජී.එන්. පුෂ්පකුමාර	අධ්‍යයනාංශ ප්‍රධාන, කායව්‍යච්ඡේද අධ්‍යයනාංශය
ආචාර්ය අමල් වගීෂ	අධ්‍යයනාංශ ප්‍රධාන, ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය

පීඨ මණ්ඩල නියෝජිතයින්

ආචාර්ය ඒ.ඩබ්ලිව්. විජේරත්න	කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය සී.එන්. වල්පිට	කෘෂි විද්‍යා පීඨය (2020 ජූලි දක්වා)
ආචාර්ය එම්.එස්.ජේ. පෙරේරා	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය එස්. වසන්ත ප්‍රියන්	ව්‍යවහාරික විද්‍යා පීඨය
ආර්.පී.එස්.එච්. හෙට්ටිආරච්චි	සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ආචාර්ය කේ.ආර්.ඩබ්ලිව්.කේ.එච්. අබේවික්‍රම	සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් සිට)
ආචාර්ය එච්.ඒ. නාලනී	භූ විඥාපන පීඨය (2020 මාර්තු දක්වා)
ආචාර්ය පී.ජී.ආර්.එන්.අයි. පුස්සැල්ල	භූ විඥාපන පීඨය (2020 අගෝසතු සිට)
ආචාර්ය එච්. දිවිතුර	භූ විඥාපන පීඨය
ආචාර්ය ඩී.ජී. ධර්මරත්න	කළමනාකරණ අධ්‍යයන පීඨය (2020 මාර්තු දක්වා)
ආචාර්ය එල්.එම්.සී.එස්. මැණිකේ	කළමනාකරණ අධ්‍යයන පීඨය (2020 අගෝස්තු සිට)
ආචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්.බී. වාහල	කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය කවීෂ විජේසිංහ	වෛද්‍ය පීඨය (2020 ජූනි සිට)
බී.ඒ.පී.එම්.එල්. පතිරණ	සමාජී විද්‍යා හා භාෂා පීඨය
ආර්.පීඑස්.එච්. හෙට්ටිආරච්චි	සමාජී විද්‍යා හා භාෂා පීඨය
ආචාර්ය පී.කේ.ජී.එස්. බණ්ඩාර	තාක්ෂණ පීඨය (2020 ජූනි සිට සැප්තැම්බර් දක්වා)
ආචාර්ය ආර්.එම්.කේ.ටී. රත්නායක	ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් සිට)

සනාතන සහා ලේකම්

කමල් ගුණවර්ධන (2020 මාර්තු 30 සිට)	වැඩබලන ලේඛකාධිකාරී
වී.ඩී. කිත්සිරි (2020 මාර්තු 29 දක්වා)	ලේඛකාධිකාරී

2020 වර්ෂය තුළ සනාතන සභා රැස්වීම් 10 ක් සහ විශේෂ රැස්වීම් 02 ක් පවත්වන ලදී.

1.7 ආයතනික ව්‍යුහය



2.1 පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

2.1.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය මඟින් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හරහා පශ්චාද් උපාධි පිරිනැමීම සිදු කරනු ලබයි. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් 2015 නොවැම්බර් 09 වන දින පවත්වන ලද එහි 928 වන රැස්වීමේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් කෘෂි විද්‍යා, පරිගණක හා තොරතුරු පද්ධති, භූ විඥාපන, මානව ශාස්ත්‍ර, කළමනාකරණ, භෞතීය විද්‍යා හා ස්වභාවික විද්‍යා, සමාජීය විද්‍යා, ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපනය යනා දී ක්ෂේත්‍ර ගණනාවකට අදාළව පශ්චාද් උපාධි පිරිනමනු ලබයි. සිසුන්ගේ වෘත්තීය සංවර්ධනය පමණක් නොව නව දැක්මකින් යුතුව ගෝලීය අභියෝගයන්ට විසඳුම් සෙවීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය ද ඉලක්ක කර ගත්, පර්යේෂණ පදනම් කරගත් පුළුල් දැනුම සම්භාරයක් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යාපනය හදාරන සිසුන් වෙත ප්‍රදානය කෙරේ.

වර්තමානයේ දී පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පශ්චාද් උපාධි පාඨමාලා තුනක් සහ පර්යේෂණ උපාධි පාඨමාලා (දර්ශනශූරී සහ දර්ශනපති උපාධි) පිරිනමනු ලබයි. මේ වන විට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති මුළු සිසුන් සංඛ්‍යාව 318 ක් වන අතර, සිසුන් 100 - 120 අතර ප්‍රමාණයක් 2019 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට අයදුම් කර ඇත. දේශීය සහ ජාත්‍යන්තර සංවර්ධන අභියෝගවලට මුහුණ දීමට සමත් පශ්චාද් උපාධි සුදුසුකම් සහිත උපාධිධරයන් බිහි කිරීම පිණිස, ගුණාත්මක ඉගැන්වීම් හා පර්යේෂණ පුහුණු කටයුතු හරහා අධ්‍යයන පාඨමාලා සඵලදායීවත් කාර්යක්ෂමවත් පැවැත්වීමට පහසුකම් සහ අවස්ථාව සැලසීම පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අරමුණ යි.

2.1.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත් BA (SJP), MA (SJP), PhD (CMB)
සහකාර ලේඛකාධිකාරී	ජී.ඩබ්ලිව්.එන්.ආර්. විජේරත්න (වැඩබලන සහකාර ලේඛකාධිකාරී) BA (SUSL), Dip (English) (2020 දෙසැම්බර් 14 සිට)
	ඩී.එස්.ආර්.සී. සවනාවඩු (වැඩබලන සහකාර ලේඛකාධිකාරී) MSc (Computer Sciences) (UOC), BSc (BIT) (SLIIT) (2020 දෙසැම්බර් 02 සිට 2020 දෙසැම්බර් 13 දක්වා)
	ඒ. හිස්නදාස් BBA (EUSL), MBA (SEUSL) (Reading) (2020 දෙසැම්බර් 01 දක්වා)
සහකාර මූල්‍යාධිකාරී	වී.කේ.එස්. චතුමාල් BSc (Finance) (CMB) (2020 ජනවාරි 06 සිට)

එන්.ඩබ්ලිව්.එන්.පී. විජේන්ද්‍ර
BSc (Business Administration) (SJP)
(2020 ජනවාරි 05 දක්වා)

2.1.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව
- ඉංග්‍රීසි භාෂාව සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව
- ව්‍යාපාර පරිපාලනපති උපාධිය
- ව්‍යාපාර පරිපාලනපති උපාධිය (මූල්‍ය)
- ව්‍යාපාර පරිපාලනපති උපාධිය (අලෙවිකරණය)
- ව්‍යාපාර පරිපාලනපති උපාධිය (සංචාරක)
- ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
- මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය

2.1.4 සලකා බලනු ලබන කලාප



කෘෂි විද්‍යා

- කෘෂි ව්‍යාපාර කළමනාකරණය
- කෘෂිකාර්මික පරිසරය සහ සම්පත් කළමනාකරණය
- සත්ත්ව ජෛව සම්පත් කළමනාකරණය
- ජලජ ජෛව සම්පත් කළමනාකරණය
- බෝග වැඩිදියුණු කිරීම සහ ශාක ආරක්ෂා කිරීම
- බෝග නිෂ්පාදන තාක්ෂණය
- ආහාර ව්‍යාපාර කළමනාකරණය



පරිගණක හා තොරතුරු තාක්ෂණ පද්ධති

- පරිගණක විද්‍යාව
- තොරතුරු තාක්ෂණය
- මෘදුකාංග ඉංජිනේරු



භූවිඥාපන

- භූමිතික මැනුම්
- භූගෝලීය තොරතුරු පද්ධති
- ජල විද්‍යාව
- ඉඩම් කළමනාකරණය
- ඉඩම් මැනීම
- දුරස්ථ සංවේදනය



මානව ශාස්ත්‍ර

- ඉංග්‍රීසි භාෂාව
- ජර්මන් භාෂාව
- මාධ්‍ය අධ්‍යයනය
- සිංහල භාෂ
- දෙමළ භාෂාව



කළමනාකරණය

- පාරිසරික කළමනාකරණය
- මූල්‍ය
- අලෙවිකරණය
- උද්‍යාන සහ විනෝදාස්වාදය
- සංචාරක



භෞතික සහ ස්වභාවික විද්‍යා

- ව්‍යවහාරික භෞතික විද්‍යාව
- රසායනික තාක්ෂණය
- සංරක්ෂණ ජීව විද්‍යාව
- භූවිද්‍යා විද්‍යා
- පාරිසරික විද්‍යා
- ආහාර විද්‍යාව හා තාක්ෂණය
- භෞතීය විද්‍යා



සමාජ විද්‍යා

- ජෛව සංඛ්‍යානය
- ව්‍යාපාර ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යානය
- සංවර්ධන ආර්ථික විද්‍යාව
- සංවර්ධන අධ්‍යයනය
- ආර්ථිකමිතික
- පාරිසරික ආර්ථික විද්‍යාව
- මූල්‍ය ආර්ථික විද්‍යාව
- උපද්‍රව ආපදා කළමනාකරණය
- මානව සම්පත් ආර්ථික විද්‍යාව
- ඉඩම් පරිහරණ සැලසුම්
- පුස්තකාල හා තොරතුරු විද්‍යාව
- වෛද්‍ය සමාජ විද්‍යාව
- කලාපීය සංස්කෘතික අධ්‍යාපනය
- ප්‍රාදේශීය සංවර්ධනය සහසැලසුම්කරණය



ක්‍රීඩා විද්‍යාව සහ ශාරීරික අධ්‍යාපනය

- ශාරීරික අධ්‍යාපනය
- ක්‍රීඩා විද්‍යා

2.2 කෘෂි විද්‍යා පීඨය

2.2.1 ඉතිහාසය

1995 වර්ෂයේ දී පළමුවෙන්ම රහංගල පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය පසුව 2001 වර්ෂයේ දී බෙලිහුල්ඔය ප්‍රධාන පරිශ්‍රය වෙත ගෙන එන ලදී. 2001 වර්ෂයේ සිට පීඨයේ අධ්‍යයන කටයුතු ඉතා සීමිත පහසුකම් යටතේ බෙලිහුල්ඔය ප්‍රධාන පරිශ්‍රය තුළ පවත්වාගෙන යන ලදී. 2005 වර්ෂයේ දී සහ 2018 වර්ෂයේ දී යටිතල පහසුකම් සහ අධ්‍යයන කටයුතු දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 82.5 ක සහ රුපියල් මිලියන 120 ක ප්‍රදාන ලෝක බැංකුව වෙතින් ලබා ගැනීමට පීඨය සමත් වූ අතර එමඟින් අවශ්‍යතා බොහොමයක් සපුරා ගැනීමට හැකි විය. පරිපූර්ණ විෂයමාලා සංශෝධනයක් ද සිදු කරන ලද අතර, කෘෂි විද්‍යා හා කළමනාකරණ උපාධිය ලෙස උපාධි පාඨමාලා නාමය ද වෙනස් කරන ලදී.

2.2.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	මහාචාර්ය එම්.එම්.පී. සුමිත් BVSc (Sri Lanka), MSc (Kobe-Japan), PhD (Kobe – Japan)
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය	මහාචර්ය ඩී.ඒ.එම්. ද සිල්වා BSc (Agri.) (RUH), MBA in Agribusiness Management (PDN), PhD (Hiroshima University, Japan)
කෘෂි අපනයන අධ්‍යයනාංශය	මහාචාර්ය පී.එම්.ඒ.එස්. කරුණාරත්න BScHons (Agriculture) (PDN), MPhil (Crop Physiology) (PDN), PhD (Crop Modelling) (University of Nottingham, United Kindom)
පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාංශය	ආචාර්ය ටී.එස්.පී. ජයවීර BVScHons (PDN), MSc (Food Science and Nutrition) (Ghent University, Belgium)
සහකාර ලේඛකාධිකාරී	එම්.ඩී.එන්.කේ. මැද්දගේ BAHons (KLN), MA (Human ResourceManagement) (IHRA, UOC)

2.2.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

කෘෂි විද්‍යා පීඨය කෘෂි ව්‍යාපාර කළමනාකරණ, අපනයන කෘෂි අපනයන සහ පශු සම්පත් නිෂ්පාදන යන අධ්‍යයනාංශ තුනෙන් සමන්විත වේ. කෘෂි විද්‍යා පීඨය විසින් පහත දැක්වෙන සිව් අවුරුදු (ගෞරව) උපාධි පාඨමාලා පිරිනමනු ලබයි.

- කෘෂි විද්‍යා හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (සිසුන්ට කෘෂි ව්‍යාපාර කළමනාකරණය, කෘෂි පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග වැඩි දියුණු කිරීම හා ශාක ආරක්ෂාව, බෝග නිෂ්පාදන තාක්ෂණය, සත්ත්ව ජෛව සම්පත් තාක්ෂණය හා කළමනාකරණය, සත්ත්ව ජෛව සම්පත් තාක්ෂණය හා කළමනාකරණය, ජලජ ජෛව සම්පත් තාක්ෂණය හා කළමනාකරණය වැනි ක්ෂේත්‍ර හතරකට (04) අදාළව විශේෂවේදී උපාධිය හැදෑරි හැකිය.)

- ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

කෘෂි අපනයන අධ්‍යයනාංශය මඟින් කෘෂි පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග වැඩි දියුණු කිරීම හා ශාක ආරක්ෂාව සහ බෝග නිෂ්පාදන තාක්ෂණයලෙස අධ්‍යයන මොඩියුල තුනක් (03) පිරිනමනු ලබයි. පළමු සාමාසික හතර (04) තුළ (එනම් පළමු වසර දෙක තුළ) සිසුන් විසින් කෘෂිකර්මය පිළිබඳ අනිවාර්ය අධ්‍යයන කටයුතු සඳහා අදාළ හර විෂයයන් හැදෑරිය යුතු අතර තුන්වන වර්ෂයේ සමාසික දෙක තුළ කෘෂි ව්‍යාපාර කළමනාකරණය, කෘෂි පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග සංවර්ධනය හා බෝග ආරක්ෂාව, බෝග නිෂ්පාදන තාක්ෂණය සහ සත්ත්ව ජෛව සම්පත් තාක්ෂණය හා කළමනාකරණය, ජලජ ජෛව සම්පත් තාක්ෂණය හා කළමනාකරණය යන විශේෂීකරණ විෂයයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් හැදෑරිය යුතුය. සිසුන් විසින් තමාගේ රුචිකත්වය අනුව දෙවන වසර අවසානයේ දී තමන්ගේ විශේෂවේදී අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගත යුතුය ගොවිපල ප්‍රායෝගික පුහුණු වීම්, පරිගණක සහ ඉංග්‍රීසි යන පාඨමාලා පළමු වර්ෂ තුන තුළ පිරිනමනු ලබන අතර උපාධිය සම්පූර්ණ කිරීම සඳහා සිසුන් විසින් ඒ ඒ විෂයයන් පිළිබඳව ඒ ඒ සමාසික තුළ සතුටුදායක ශ්‍රේණි ලබාගත යුතුය. ඊට අමතරව, තුන්වන වසරේ දෙවන සාමාසිකය සහ අවසාන වසරේ අවසාන සාමාසිකය තුළ දී වෛකල්පිත පාඨමාලා පිරිනමනු ලබයි. සිසුන් විසින් තමාගේ මනාපය පරිදි තුන්වන වසරේ දී වෛකල්පිත පාඨමාලා දෙකක් ද අවසාන වසරේ දී වෛකල්පිත පාඨමාලා හතරක් ද තෝරා ගත යුතුයි. කෘෂි විද්‍යා හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි ශිෂ්‍යයෙකු හට අවසාන වසරේ දෙවන සාමාසිකය ද ආහාර ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාවේ අවසාන වසර දක්වා සාමාසික දෙක ද උපාධි පාඨමාලා සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන කාර්මික පුහුණුව සඳහා වෙන් කෙරෙන අතර සිසුන් විසින් තමා විශේෂීකරණය වූ විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණයක් කළ යුතුය. උපාධි පාඨමාලාවට අදාළ ඉගැන්වීම් මාධ්‍ය වනුයේ ඉංග්‍රීසි මාධ්‍යයයි.

උපාධි පාඨමාලාවේ ප්‍රායෝගික අංගයක් ලෙස, සිසුන් සහ ගොවීන් අතර අන්‍යෝන්‍ය කුසලතා සහ දැනුම හුවමාරු කර ගැනීමට හැකිවන පරිදි ප්‍රදේශයේ ගොවීන් සම්බන්ධ කරගත් වැඩසටහන් කෘෂි විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස කෘෂි විද්‍යා පීඨය සහ ගම්වාසීන් අතර සමීප සම්බන්ධතාවක් ගොඩ නැඟී ඇත. තවද, සිසුන්ට කර්මාන්තයේ සහ පර්යේෂණ ආයතනවල ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය පිළිබඳව අවබෝධය ලබා දීම අරමුණු කර ගත් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ද පීඨය විසින් සංවිධානය කරනු ලබයි.

2.2.4 පීඨ ගොවිපල

කෘෂි පීඨ ගොවිපල 2003 වර්ෂයේ දී මුණ්ගස්තැන්න ප්‍රදේශයේ සංවිධානය කරන ලදී. එය අක්කර 33 ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත වේ. පීඨ ගොවිපල පශු සම්පත් නිෂ්පාදන අංශය, බෝග නිෂ්පාදන අංශය සහ ගොවිපල නවාතැන් අංශය ලෙස ප්‍රධාන වශයෙන් අංශ තුනකින් (03) යුක්ත වේ. සිසුන්ගේ

ප්‍රායෝගික පුහුණු අරමුණු සහ පර්යේෂණ අරමුණු ඉටු කිරීම එහි ප්‍රධාන ඉලක්කය වේ. පශු සම්පත් අංශය පිළිබඳව සලකා බැලීමේ දී එය පහත සඳහන් අංශ වලින් සමන්විත වේ.

- සූකර අංශය
- කුකුළු අංශය
    1. ස්ථර අංශය
    2. බ්‍රොයිලර් අංශය
- කිරි ගව අංශය
- හාවන් අංශය
- විවිධ අංශය



පීඨ ගොවිපල තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු වේ.

- ඖෂධීය ගෙවතු වගාව
- ගොවිපල සතුන් පෝෂණය කිරීම
- කිරි ලබා ගැනීම
- සත්ව පාලනය
- මගපෙන්වීම සහිත ගොවිපල සංචාරය
- මෙහෙයුම් තොරා ගැනීම
- ආරක්ෂිත කෘෂිකාර්මික පරිවය
- කුරුල්ලන් නැරඹීම
- කඳු තරණය කිරීම
- පාගමන්

බෝග නිෂ්පාදන අංශය

ප්‍රධාන වශයෙන් ගොවිපල බහු වාර්ෂික බෝග වලින් සමන්විත වේ.



කෘෂි පීඨ ගොවිපල නවාතැන

කෘෂි පීඨ ගොවිපල ශ්‍රී ලංකාවේ සබරගමුව පළාතේ බෙලිහුල්ඔය ප්‍රදේශයේ වැටියේ පිහිටා ඇති අතර එය කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය විසින් කළමනාකරණය කරනු ලබයි. කෘෂි පීඨ ගොවිපල නවාතැන කොළඹ - බදුල්ල අධිවේගී මාර්ගයේ තිබෙන කදිම නැවතුමක් වන අතර එය විවේක සුවයෙන් ගත කිරීම සඳහා ආකර්ශනීය සහ සාමකාමී නිවාඩු ගමනාන්තයකි.



කෘෂි පීඨ ගොවිපලෙහි ප්‍රධාන වශයෙන් කබානා තුනක් (03) තිබේ.

- විල් වාස (Lake View)
- කෙත් වාස (Farm View)
- ගිරි වාස (Mountain View)

2.3 ව්‍යවහාරික විද්‍යා පීඨය

2.3.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය 1993 වර්ෂයේ ජූනි මස 23 වන දින බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය (BAUC) ලෙස ආරම්භ කරන ලදී. බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය විසින් ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා ලෙස ඩිප්ලෝමා පාඨමාලා දෙකක් (02) පිරිනමන ලදී. 1996 වර්ෂයේ මුල් භාගයේ දී අනුබද්ධ විශ්වවිද්‍යාල සම්පූර්ණයෙන් ම ජාතික විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීමත් සමඟ සබරගමුව අනුබද්ධ විශ්වවිද්‍යාලය, ඌව අනුබද්ධ විශ්වවිද්‍යාලය සහ බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය එක් කොට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවන ලද අතර බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය බවට පත් විය.

මෙම පීඨය 2008 වර්ෂයේ මාර්තු මස බෙලිහුල්ඔය ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ස්ථාපිත කරන ලදී.

2.3.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	ආචාර්ය ආර්.එස්. සබරගමුව BScHons (Sp.) (PDN), MPhil (PDN), PhD (UoA, New Zeeland) (2020 ඔක්තොම්බර් 03 සිට)
	මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක BScHons (Sp.) in Agriculture (RUH), MSc in Biotechnology (PDN), PhD (AIT) Thailand (2020 ඔක්තොම්බර් 02 දක්වා)
අධ්‍යයනාංශය ප්‍රධානීන්	
ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය	ආචාර්ය ඊ.පී. කුඩවිදානගේ BScHons(Sp.) (UOC), MSc (UOC), PhD (NUS, Singapore)
ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය	ආචාර්ය ඩබ්ලිව්.එස්.එම්. සෙනෙවිරත්න BSc (OUSL), MSc (South Korea), PhD (South Korea) (2020 ඔක්තොම්බර් 03 සිට)
	ආචර්ය ආර්.එස්. සබරගමුව BScHons (Sp.) (PDN), MPhil (PDN) (2020 ඔක්තොම්බර් 02 දක්වා)
භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය	ආචාර්ය සී.එච්. බදුරලිය BScHons (Sp.) (SJP), MSc (PDN), PhD (UK) (2020 ඔක්තොම්බර් 04 සිට)

	මහාචාර්ය ජී.එම්.එල්.පී. අපොන්සු BScHons (Sp.) (UOC), MPhil (UOC), PhD (SJP) (2020 ඔක්තෝම්බර් 03 දක්වා)
ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය	මහාචාර්ය එස්. වසන්තප්‍රියන් BScHons (Sp.) (PDN), MSc (Einhoven University of Technology, Nettherland), PhD (Wuhan University of Technology, China) (2020 මැයි 01 සිට)
	ආචාර්ය බී.ටී.ජී.එස්. කුමාර BScHons (Sp.) (SUSL), MSc (PDN), PhD (Japan) (2020 අප්‍රේල් 30 දක්වා)
ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය	ටී.එස්.එච්. පෙරේරා BScHons (Sp.) (SUSL), MSc (China)
සහකාර ලේඛකාධිකාරී	එම්. සුදර්ශන් BSc in Nursing (PDN), Dip in Sports Sciences & Excercises (PDN) (2020 දෙසැම්බර් 07 සිට)
	ඒ.ඒ.වයි. අබේසිංහ PGD (UOC), BA (Social Sciences, OUSL) (2020 දෙසැම්බර් 06 දක්වා)

2.3.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

ව්‍යවහාරික විද්‍යා පීඨය ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය ආගණන හා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය සහ ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය යනුවෙන් අධ්‍යයනාංශ පහකින් සමන්විත වේ.

ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් අ.පොස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත සෘජුවම පීඨයට ඇතුල් වන සිසුන් සඳහා ආහාර විද්‍යා හා තාක්ෂණ, පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය, රසායනික තාක්ෂණය, පරිගණක විද්‍යාව හා තාක්ෂණය, ව්‍යවහාරික භෞතීය විද්‍යාව, ආගණන හා තොරතුරු පද්ධති, ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල විද්‍යාවේදී උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

භෞතීය විද්‍යාව හා තාක්ෂණය සහ පරිසර විද්‍යාව හා කළමනාකරණය යන පාඨමාලා සිව් අවුරුදු උපාධි පාඨමාලා ලෙස සකසා තිබුණ ද එම විෂයයන් හදාරන සිසුන්ට අවුරුදු තුනකට පසු විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය ලබා ගෙන වුව ද විශ්වවිද්‍යාලයෙන් පිටව යා හැකිය. සෙසු උපාධි පාඨමාලා ඉඳුරාම සිව් අවුරුදු පාඨමාලා වේ.

ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය යන විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගනු ලබන්නේ අ.පොස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මෙන්ම තෝරා ගැනීමේ

පරීක්ෂණයක දී (ලිඛිත විභාගයක දී) දක්වනු ලබන කුසලතාව ද පදනම් කර ගනිමිනි. එසේම ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය යන විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා ඉල්ලුම් කරන සිසුන් ඉහත පරීක්ෂණයට අමතරව ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු වේ. කෙසේ නමුත් මෙම තෝරා ගැනීමේ පිළිවෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් මඟින් වෙනස් වී ඇති බැවින් ඉදිරියේ දී මෙම පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී අභියෝග්‍යතා පරීක්ෂණ නොපැවැත්වෙනු ඇත.

ජාත්‍යන්තර සහ දේශීය රැකියා ප්‍රවණතාවන්ට සහ ඉල්ලුමට සරිලන ලෙස උපාධි පාඨමාලා නිර්මාණය කර ඇති අතර පාඨමාලා පැවැත්වෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි. විශේෂිත ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවී උපාධියෙන් පසු පුළුල් ක්ෂේත්‍රයක සේවය කළ හැකි වන ආකාරයට පරිගණක විද්‍යාව, ආර්ථික විද්‍යාව, කළමනාකරණය ආදී විෂයයන් ඇතුළත් වන පරිදි අන්තර් ක්ෂේත්‍ර පාඨමාලා ලෙස සියලු පාඨමාලා නිර්මාණය කර ඇත.

අධ්‍යයන කටයුතුවලට අමතරව ව්‍යාප්ති සේවා සහ දැනුම බෙදා හැරීමට අදාළ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රජා සංවර්ධනයට ද, ව්‍යවහාරික විද්‍යා පීඨය දායකත්වය සපයයි. කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාව වාර්ෂිකව එවැනි කටයුතු සඳහා සහභාගි වෙති.

ව්‍යවහාරික විද්‍යා පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

තොරතුරු පද්ධති විද්‍යාවේදී ගෞරව උපාධිය
ආහාර විද්‍යා හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
පාරිසරික විද්‍යා හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
පාරිසරික විද්‍යා හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
ව්‍යවහාරික භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
රසායනික විද්‍යා තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය
පරිගණක විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය
ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී ගෞරව උපාධිය
ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී ගෞරව උපාධිය

ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය

මෙම උපාධි පාඨමාලාව 2008 වසරේ දී ඇරඹී තිබුණ ද තොරතුරු පද්ධති විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමන ඉහත අධ්‍යයනාංශය පිහිටවනු ලැබුයේ 2011 මාර්තු පළමුවෙනි දා ය. විෂයමාලාව විශේෂයෙන්ම නිර්මාණය වී ඇත්තේ ආගණනය හා තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර දෙකෙහි ම දක්ෂතාව සහිත උපාධිධරයින් බිහි කිරීම සඳහා ය. මේ වන විට අධ්‍යයනාංශය සතුව මනාව ස්ථාපනය කරන ලද පරිගණක විද්‍යාගාර තුනක් තිබෙන අතර අධ්‍යයනාංශයේ සිසුන් සංඛ්‍යාව 312 කි.

වසරින් වසර මෙම උපාධි පාඨමාලාවට ඇති ඉල්ලුම වැඩි වී ඇති අතර, මේ වන විට පාඨමාලාවට වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 80 තෙක් ඉහළ ගොස් ඇත. අධ්‍යයනාංශයට දැනට බඳවා ගත හැකි උපරිම සංඛ්‍යාව වනුයේ එයයි. මෙම අධ්‍යයනාංශය පෞද්ගලික පරිගණක ක්ෂේත්‍ර සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යන අතර, දේශන සහ ප්‍රායෝගික සැසි පැවැත්වීමේ දී තාක්ෂණික සහාය ලබා ගැනීමට මෙන්ම සිසුන්ට සුළු පරිමාණ ව්‍යාපෘති හා අවසන් වසර ව්‍යාපෘති සිදු කිරීමේ අවස්ථාව ලබා ගැනීමට ද එමඟින් හැකි වී ඇත. සිසුන්ට උපාධිය සම්පූර්ණ කළ වහාම රැකියා අවස්ථා

උදා කර ගැනීමේ හැකියාව ද එමඟින් ලැබී තිබේ. අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය, මහාචාර්යවරයෙකුගෙන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් පස්දෙනෙකුගෙන් සහ ආධුනික කථිකාචාර්යවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ.

ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය

1996 වර්ෂයේ දී පීඨය ඇරඹී දා සිට ස්වභාවික විද්‍යා අධ්‍යයනාංශය යටතේ ආහාර විද්‍යා හා තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබූ මුත්, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවනු ලැබුයේ 2005 වසරේ දී ය. ආහාර විද්‍යා තාක්ෂණය, ප්‍රායෝගික ආහාර තාක්ෂණයන්, සාමාන්‍ය විද්‍යා, සංඛ්‍යානය, පරිගණක විද්‍යාව හා තාක්ෂණය, ආහාර අලෙවිකරණය, කර්මාන්ත ආර්ථික විද්‍යාව සහ විද්‍යාත්මක සන්නිවේදන හා වෘත්තීය සංවර්ධන පාඨමාලා මෙම උපාධි පාඨමාලාවේ විෂය පථයට ඇතුළත් වේ. ආහාර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන්හි නියැලීමට අපේක්ෂා කරන සිසුන් අරභයා මෙම පාඨමාලාව සකස් කර ඇත. දේශීය සහ විදේශීය වශයෙන් මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සීඝ්‍ර ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතින ආහාර විද්‍යාඥයින්ගේ සහ තාක්ෂණවේදීන්ගේ අවශ්‍යතාව සපුරාලිය හැකි ආකාරයේ විද්‍යාර්ථීන් මෙම පාඨමාලාව මඟින් බිහි කෙරේ. එසේ ම ආහාර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව පශ්චාද් උපාධි හැදෑරීමට අපේක්ෂා කරන්නන් සඳහා ද මෙම පාඨමාලාව කදිම මාර්ගයකි. මේ වන විට අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය ලෙස මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හත් දෙනෙක් සහ ආධුනික කථිකාචාර්යවරුන් දෙදෙනෙක් සේවයේ යෙදී සිටිති. එසේ ම බාහිර වෘත්තිකයන් ලෙස ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් සහිත විද්වතුන් සහ කර්මාන්තයේ විශේෂඥයින් කිහිපදෙනෙකුගේ ම දායකත්වය අධ්‍යයනාංශය වෙත ලැබේ. අධ්‍යයන කටයුතුවලට අදාළ විද්‍යාගාර සැසි හා පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අධ්‍යනාංශය සතුව සියලු පහසුකම් සහිත විද්‍යාගාර පහක් තිබේ. ඒ, ආහාර විශ්ලේෂණ විද්‍යාගාරය, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාගාරය, ආහාර සැකසුම් විද්‍යාගාරය, මාංශ සැකසුම් විද්‍යාගාරය සහ කිරි ආහාර සැකසුම් විද්‍යාගාරය වශයෙනි. අධ්‍යයනාංශයේ වර්තමාන සිසුන් සංඛ්‍යාව 150 කි.

ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙහි ස්වාභාවික සම්පත් අධ්‍යයනාංශය, ස්වාභාවික සම්පත් පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පිරිනැමීම සඳහා 1996 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. ගෝලීය වශයෙන් මෙන් ම දේශීය වශයෙන් ද රැකියා වෙළඳපොළෙහි පවත්නා පරිසර ආරක්ෂණ, ස්වභාවික සම්පත් කළමනාකරණ හා සංරක්ෂණ, ජෛව විවිධත්ව සංරක්ෂණ හා කළමනාකරණ සහ පරිසර විද්‍යා යනා දී ක්ෂේත්‍රයන්හි පවතින වෘත්තීමය අවස්ථාවන්ට සරිලන ලෙස මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර තිබේ.

ආරම්භයේ දී පාඨමාලා කාලය වසර තුනකින් යුත් සාමාන්‍ය උපාධියක් ලෙස පිරිනමන ලද පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් පිළිබඳ විද්‍යාවේදී උපාධිය 2006 වසරේ දී ප්‍රතිව්‍යුහගත කර, උපාධිධාරීන්ගේ වෘත්තීය අවස්ථා වර්ධනය වන පරිදි පරිසර විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය නමින් උපාධි පාඨමාලාවක් පිරිනැමීමට කටයුතු කරන ලදී. වර්තමානයේ දී පාරිසරික විද්‍යාව, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ භෞතික විද්‍යාව යන ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර තුන යටතේ මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ලෙස සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් ද පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලෙස තුන් අවුරුදු උපාධි පාඨමාලාවක් ද පිරිනමනු ලැබේ. මෙම උපාධි පාඨමාලා මඟින් අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාද් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා ද මනා පදනමක් සැපයෙයි. අධ්‍යයනාංශය මහාචාර්යවරුන් දෙදෙනෙකු,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හත් දෙනෙකු සහ කථිකාචාර්යවරයෙකු ඇතුළුව දහ දෙනෙකුගෙන් යුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය

භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය මඟින් රසායනික විද්‍යා තාක්ෂණය, ව්‍යවහාරික භෞතීය විද්‍යාව සහ පරිගණක විද්‍යාව හා තාක්ෂණය යන ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර තුනක් යටතේ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. සහායක විෂයයන් ලෙස ගණිතය, සංඛ්‍යානය, කළමනාකරණ අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් ද පාඨමාලාවලට ඇතුළත් කර ඇත.

මෙම අධ්‍යයනාංශය මඟින් පහත සඳහන් උපාධි ප්‍රදානය කරනු ලැබේ:

- රසායනික විද්‍යා තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 4)
- පරිගණක විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 4)
- ව්‍යවහාරික භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 4)
- භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 3)

සිසුන්ට මනා ආත්ම විශ්වාසයකින් යුතුව රැකියා වෙළඳපොළට මුහුණ දීම සඳහා මූලික අත්දැකීමක් ලබා දෙනු පිණිස සියලුම සෛද්ධාන්තික පාඨමාලා ඒකකවලට ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබේ. තවද, සිසුන්ගේ නිර්මාණාත්මක සහ නව චින්තනය උද්දීපනය කිරීමේ අරමුණින් තුන්වන සහ හතරවන අධ්‍යයන වර්ෂවල පාඨමාලා ඒකකවලට සුළු පරිමාණ ව්‍යාපෘති ඇතුළත් කර ඇත. අවසන් වසරේ සම්පූර්ණ සමාසිකයක් ආවරණය වන සේ සිදු කළ යුතු ව්‍යාපෘතිය (පර්යේෂණයක් ලෙස හෝ කාර්මික පුහුණුවට අදාළව) මඟින් උපාධි අපේක්ෂකයන්ට වැඩ පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා දෙන අතර, උපාධිය ලබා ගැනීමට පෙර ස්වකීය වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික රැකියා අත්දැකීමක් ද ලබා දේ. විශ්වවිද්‍යාලයීය පරිසරය මෙන්ම අධ්‍යයන වැඩසටහන් ද නිර්මාණය කර ඇත්තේ මෙම අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි සහ ස්වකීය විෂය ක්ෂේත්‍රයන්හි නිපුණ වෘත්තිකයන් බිහි කළ හැකි වන පරිද්දෙනි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ව්‍යවහාරික භෞතීය විද්‍යාව පිළිබඳ (ගෞරව) උපාධිය පිරිනමනු ලබන එකම ආයතනය වන්නේ ද ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය යි. අධ්‍යනාංශය සතුව සියලු පහසුකම් සහිත විද්‍යාගාර හතරක් තිබේ. ඒ, භෞතික විද්‍යාගාරය, රසායන විද්‍යාගාරය I, රසායන විද්‍යාගාරය II හා රසායන පර්යේෂණ විද්‍යාගාරය වශයෙනි. අධ්‍යයනාංශයේ වර්තමාන සිසුන් සංඛ්‍යාව 117 ක් වන අතර අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය විඥාපක මහාචාර්ය වරයෙකුගෙන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුගෙන්, මහාචාර්යවරයෙකුගෙන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අටදෙනෙකුගෙන්, ආධුනික කථිකාචාර්යවරු හත් දෙනෙකුගෙන්, තාවකාලික සහකාර කථිකාචාර්යවරයෙකුගෙන් සහ තාවකාලික කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය

ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සහ ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී (ගෞරව) උපාධිය යන උපාධි පාඨමාලා දෙක 2008 වර්ෂයේ සිට ව්‍යවහාරික විද්‍යා පීඨය මඟින් ප්‍රදානය කෙරේ. ක්‍රීඩා විද්‍යාව හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය පිහිටවනු ලැබුයේ 2011 මාර්තු පළමුවෙනි දා ය. මූලික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රීඩා කටයුතු ඉගැන්වීම සඳහා අවශ්‍ය කෙරෙන මූලික විද්‍යාත්මක ක්‍රීඩා කුසලතාවයෙන් සහ කළමනාකරණ කුසලතාවයෙන් යුත් උපාධිධාරීන් බිහි කිරීමේ අරමුණින් ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ පිළිබඳ පාඨමාලා නිර්මාණය කොට ඇත. ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී උපාධි පාඨමාලාව විශේෂයෙන් නිර්මාණය කොට ඇත්තේ ශාරීරික

අධ්‍යයන කටයුතු සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව විද්‍යාත්මක පදනමකින් යුත් ප්‍රවීණත්වයක් ලබා ගත් උපාධිධාරීන් බිහි කිරීමට ය. පාඨමාලා දෙකෙහි ම පාඨමාලා කාල සීමාව වසර 4 කි. පාඨමාලාව සඳහා අවුරුදු පතා ප්‍රවේශ වන සිසුන් සංඛ්‍යාවේ සීග්‍ර වර්ධනයක් දැකිය හැකි වන අතර, පාඨමාලාව සඳහා පවතින ඉල්ලුම එමඟින් පැහැදිලි වේ. මේ වන විට පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව උපරිම මට්ටමට ළඟා වී ඇත. වසර 4 ක් තුල කුසලතාපූර්ණ සහ මනා ප්‍රවීණත්වයකින් යුත් උපාධිධාරීන් බිහි කිරීමට හැකි වන පිරිදි මෙම පාඨමාලා දෙක තුළට ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති රැසක් එක් කර තිබේ. සිසුන්ට ජාතික සහ ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලට සහභාගි වීමට අවස්ථාව සලසනු පිණිස අධ්‍යයනාංශය විවිධ ක්‍රීඩා සංගම් / ආයතන සමග විවිධ සහයෝගිතාවන්ට එළඹී ඇත. අධ්‍යනාංශය සතුව සියලු පහසුකම් සහිත විද්‍යාගාර දෙකක් තිබේ. ඒ, ජෛව රසායන විද්‍යාගාරය සහ පර්යේෂණ විද්‍යාගාරය වශයෙනි. අධ්‍යයනාංශයේ වර්තමාන සිසුන් සංඛ්‍යාව 374 ක් වන අතර, කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හය දෙනෙකුගෙන්, කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගෙන්, ආධුනික කථිකාචාර්යවරුන් පස් දෙනෙකුගෙන්, උපදේශකවරුන් දෙදෙනෙකුගෙන් සහ තාවකාලික සහකාර කථිකාචාර්යවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත වේ. මීට අමතරව, න්‍යායාත්මක සහ ප්‍රායෝගික පාඨමාලා පවත්වාගෙන යාම සඳහා රටේ ප්‍රමුඛ පෙළේ ක්‍රීඩා විශේෂඥයින්ගේ සහයෝගය ද ලබා ගැනේ.

2.4 භූ විඥාපන පීඨය

2.4.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඇති අධ්‍යයන පීඨ අට අතුරෙන් එක් පීඨයක් වන භූ විඥාපන පීඨය 2004 වසරේ දී ස්ථාපනය කරන ලදී. 1997 වර්ෂයේ දී විද්‍යාවේදී (මැනුම් විද්‍යා) උපාධි පාඨමාලාව හඳුන්වා දුන් මැනුම් විද්‍යා අධ්‍යයනාංශය මෙසේ 2004 වර්ෂය වන විට පීඨයක් බවට පත් විය. රටේ ඉතා වැදගත් අවශ්‍යතාවයක් පිරිමසමින් සබරගමුව විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කළ මෙම උපාධිය ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතියට අයත් විශ්වවිද්‍යාලයක් විසින් හඳුන්වා දුන් එවැනි ගණයේ පළමු උපාධි පාඨමාලාව විය. සිව් වසරක අධ්‍යයන කාලයකින් යුත් මෙම විද්‍යාවේදී (මැනුම් විද්‍යා) උපාධිය විශේෂ උපාධියක් ලෙස පිරිනමනු ලැබේ. මෙම පාඨමාලාව සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම 1997 වසරේ දී බඳවා ගත් අතර ඔවුහු 2002 වසරේ දී උපාධිය ලබා පිට වූහ.

2.4.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න BScHons (Surveying Sciences) (SUSL), MPhil (Geodesy) (SJP), PhD (Geodesy) Polytechnic University, Hong Kong
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
බිම් මැනුම් හා භූමිතික මැනුම් අධ්‍යයනාංශය	පී.ජී.වී. අබේරත්න BSc (Surveying Geodesy, Photogrammetry), MSc (Photogrammetry and Geoinformatics, Stuttgart University of Applied Sciences, Germany) (2020 දෙසැම්බර් 09 සිට)
	ආචාර්ය එච්.ආර්.එස්. බණ්ඩාර BSc (SUSL), MSc (PDN), PhD (Civil Engineering) (Monash University, Australiya) (2020 දෙසැම්බර් 08 දක්වා)
දුරස්ථ ගෝචර ග්‍රහණ හා භූමි තොරතුරු පද්ධති අධ්‍යයනාංශය	ආචාර්ය ආර්.එම්.කේ.ජී.එස්.පී.බී. කොස්වත්ත BSc (Surveying Sciences, SUSL), MPhil (PDN), PhD (Spatial Scieces, USQ, Australia)
සහකාර ලේඛකාධිකාරී	එච්.එච්.කේ.එන්. ධර්මසිරි BScHons (PDN), MSc (PGIA, PDN)

2.4.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

පීඨය මඟින් විශේෂ විෂය ක්ෂේත්‍ර පහක් යටතේ මැනුම් විද්‍යාවේදී උපාධි පිරිනමනු ලබයි. ඒවා නම්:

1) බිම් මැනීම සහ භූමිතිය මැනුම් පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
2) ඉඩම් කළමනාකරණය පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
3) ජලමාන මැනුම් පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
4) දුරස්ථ ගෝචර ග්‍රහණය පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
5) භූමි තොරතුරු පද්ධති පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය



නවකයින් සඳහා ඉංග්‍රීසි කඳවුර

2.5 කළමනාකරණ අධ්‍යයන පීඨය

2.5.1 ඉතිහාසය

ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයනාංශය සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය යටතේ තුන් අවුරුදු උපාධි පාඨමාලා පිරිනමනු වස් ව්‍යාපාර අධ්‍යයන පීඨය 1996 සැප්තැම්බර් මාසයේ දී පිහිටුවනු ලැබිණි. පදනම් වසර හා තවත් විශේෂීකරණ වසර දෙකක අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශිෂ්‍යයන් වෙත මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, අලෙවි කළමනාකරණය සහ සංචාරක කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාවේදී උපාධි පිරිනමන ලදී. මේ අනුව, 1997, 1998, 1999, 2000, 2001 සහ 2002 වර්ෂවල දී ශිෂ්‍ය කණ්ඩායම් 06 ක් මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, අලෙවි කළමනාකරණය සහ සංචාරක කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාවේදී (විශේෂ) උපාධි ලැබූහ.

2003 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සහිතව, ව්‍යාපාර අධ්‍යයන පීඨය කළමනාකරණ අධ්‍යයන පීඨය ලෙස නම් කරන ලදී. එම වර්ෂයේ දී ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය මත තුන් අවුරුදු උපාධි පාඨමාලා වල කාල සීමාව වෙනස් කර ඒවා සිව් අවුරුදු පාඨමාලා බවට පත් කරන ලදී.

වර්තමානය වන විට කළමනාකරණ අධ්‍යයන පීඨය අධ්‍යයනාංශ හතරකින් සමන්විත වේ. ඒවා නම්; ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය සහ සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය යනාදියයි.

2.5.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (Xiamen- P R China)
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය	ආචාර්ය ඩී.ජී. ධර්මරත්න BSc (Financial Management) (SUSL), MBA (PDN), PhD (CMB)
ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය	ආචාර්ය එච්.පී.ආර්. ප්‍රියන්කර BSc (Bus Admin) (HRM) (SJP), MBA (HRM) (CMB), PhD (WUT) (China)
අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය	ඩී. ජාසිංහ BSc (Bus Admin) (SJP), MSc (SJP)
සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය	ආචාර්ය පී.කේ.එස්. මුණසිංහ BSc (Tourism Management) (SUSL), MBA (PIM - SJP), PhD (New Zealand)

සහකාර ලේඛකාධිකාරී	ආර්.එන්. නෙළුවපතිරණ BSc (Business Administration) (SJP), MA (Sp.) (Development Managemet) (OUSL), LLB (AIM, Philippines)

2.5.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

පීඨයේ අධ්‍යයනාංශ හතර මඟින් විශේෂීකරණය සහිත උපාධි පාඨමාලා හතක් පවත්වනු ලබන අතර සෑම පාඨමාලාවක් ම අවුරුදු හතරක කාල සීමාවකින් යුක්ත වේ.

අධ්‍යයනාංශය	උපාධි පාඨමාලාව (පාඨමාලා)
ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය	ව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය
අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය	අලෙවි කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය
ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය	මූල්‍ය කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය බැංකු හා රක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය
සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය	සංචාරක කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය සත්කාරක සේවා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය

2020 වර්ෂය තුළ සාමාන්‍ය මහජනතාව වෙත දැනුම බෙදා හැරීම පිළිබඳ තොරතුරු

ලෝක පාරිසරික දින සැමරුම: මාර්ගගත ඉගෙනුම් වැඩසටහන2020

වැඩසටහනේ සාරාංශය

මෙම වැඩසටහන කළමනාකරණ අධ්‍යයන පීඨයේ සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන පාරිසරික ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව සහ හේලීස් PLC සමාගම සමඟ එක්ව සංවිධානය කරන ලදී.

සම්පූර්ණ පාඨමාලාව සඳහා සාමාජිකයින් ලියාපදිංචි කිරීම සහ සහභාගිවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලදී. ලියාපදිංචිය අවසන් වූ පසු, වැඩසටහන අතරතුර සහභාගී වූ අය සඳහා ඔවුන්ගේ ඉගෙනුම් අත්දැකීම් ඉදිරිපත් කිරීම සඳහා සකස් කළ මෙවලම් කට්ටලයක් ලබා දෙන ලදී.

මාර්ගගත ඇගයීම්, අභියෝග සහ මාර්ගගත සාකච්ඡා මෙම වැඩසටහනේ ප්‍රධාන අංගයන් විය.

වැඩසටහන ආරම්භ වූ දිනය

2020 ජූනි 05 සිට ජූනි 15 දක්වා

මාර්ගගත ඇගයීම්

වැඩසටහන පුරාවටම අඛණ්ඩව සහභාගිවූවන්ගේ වැඩිදියුණුව සඳහා පූර්ව ඇගයීම, මධ්‍ය ඇගයීම සහ අවසන් ඇගයීම ලෙස මාර්ගගත ඇගයීම් තුනක් පවත්වන ලදී.

අභියෝග

වැඩසටහනට සහභාගී වූ අයගේ සම්බන්ධ වීම සහ දැනුම වැඩි දියුණු කිරීම වැඩසටහන පුරාවටම ස්වභාවධර්මය පදනම් කරගත් අභියෝග හතරක් (Upcycle Challenge, Nature Art Challenge, Nature Quote Challenge, Ocean Day Challenge) පවත්වන ලදී.

මාර්ගගත සාකච්ඡා

ශාස්ත්‍රීය හා කාර්මික වෘත්තිකයින් සම්බන්ධ කර ගනිමින් අතථ්‍ය සාකච්ඡා හයක් පවත්වන ලදී.

සැසිය	සැසියේ නම	සම්පත්දායකයින්
පළමු සැසිය	ඉන්දියානු කබල්ලෑවන්: විද්‍යාව හා සංරක්ෂණය	ආචාර්ය ප්‍රියන් පෙරේරා ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
දෙවන සැසිය	හරිත ව්‍යාපාර සඳහා පිරිසිදු කිරීමේ නිෂ්පාදයෙදුම්	සමන්ත කුමාරසේන ප්‍රධාන විධායක නිලධාරී, පිරිසිදු කිරීමේ නිෂ්පාද මධ්‍යස්ථානය
තුන්වන සැසිය	හේලීස් වැවිලි අංශයේ ජෛව විවිධත්ව වාරිකාව	ආචාර්ය රොෂාන් රාජදුරේ කළමනාකරණ අධ්‍යක්ෂ, හේලීස් වැවිලිකරුවන්
සිව්වන සැසිය	ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව මාවත ඉදිරියට	මහාචාර්ය සරත් කොටගම කොළඹ විශ්වවිද්‍යාලය
පස්වන සැසිය	ගෝලීය ආර්ථිකයේ සහ කාර්මික සහයෝගීතාවයේ වැදගත්කම	මහාචාර්ය අජිත් ද අල්විස් මොරටුව විශ්වවිද්‍යාලය
හයවන සැසිය	කර්මාන්ත භාවිතයන්ට එරෙහිව ජෛව විවිධත්වය	පරිසරවේදී අමිල සුමනපාල කොළඹ විශ්වවිද්‍යාලය

2.6 වෛද්‍ය පීඨය

2.6.1 ඉතිහාසය

ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨ ජාලයට අලුතෙන්ම එකතුවූ වෛද්‍ය පීඨය ලෙස ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨය හැඳින්විය හැකිය. එය අංක 2082/32 හා 2018 අගෝස්තු 01 දිනැති ගැසට් නිවේදනය මඟින් 2018 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. මෙම පීඨය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 08 වන පීඨය වේ. වෛද්‍ය වෘත්තිය සමාජයේ වඩාත් අත්‍යාවශ්‍ය වෘත්තියකි. එම නිසා මෙම වෛද්‍ය උපාධිය ලබා ගැනීම සඳහා විශාල තරඟකාරීත්වයක් මෙන්ම අභියෝගයක් පවතී. මෙම වෛද්‍ය පීඨය අධ්‍යයනාංශ 15 කින් සමන්විත වන අතර අධ්‍යයන අරමුණු සහ මෙහෙවර ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ගුණාංග වලින් මේවා සමන්විත වේ. වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධියේ අධ්‍යයන අංගයන් පදනම් වී ඇත්තේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 04 ක් තුළිනි. ඒවා නම්: න්‍යායාත්මක අධ්‍යාපනය, සායනික පුහුණුව, ප්‍රජා සම්බන්ධතා සහ පර්යේෂණ. වෛද්‍ය පීඨය රත්නපුර පිහිටා ඇති අතර උපාධියේ ප්‍රථම වසරේ අධ්‍යයන කටයුතු බටුහේන පීඨ පරිශ්‍රයේ පවත්වනු ලබයි. නව පීඨ ගොඩනැගිල්ල සහ මහාචාර්ය පුහුණු ඒකකය රත්නපුර පළාත් මහ රෝහලට යාබදව ඇති භූමියේ ඉදිවෙමින් පවතී. මෙය ශිෂ්‍යයන්ට සායනික පුහුණු පහසුකම් සපයමින් වෛද්‍ය පීඨයේ ශික්ෂණ රෝහල ලෙස ක්‍රියාකරනු ඇත. පීඨයට සිසුන් 75 දෙනෙකු එක් කණ්ඩායමකට බඳවා ගනු ලබන අතර වෛද්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සපයනු ලැබේ.



පීඨ කෞතුකාගාරය

2.6.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න Graduateship in Chemistry (Institute of Chemistry), PhD in Biochemistry, Loyola University, Chicago Chicago, Illinois USA
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය අමල් වගීෂ PhD in Biochemistry (UOC), MPhil in Biochemistry (SJP), Graduateship in Cemistry (Institute of Chemistry), MI Chem C.
භෞතවේද අධ්‍යයනාංශය	ආචාර්ය ජානාා ජයවර්ධන (වැඩබලන අධ්‍යයනාංශ ප්‍රධාන) MBBS (SJP)
කායව්‍යච්ඡේද අධ්‍යයනාංශය	ආචාර්ය නිලන්ත ගම්ලත්ගේ MBBS (SL) (Res), MD (Res), DTCD (UOC), MSc (UK) DOHS (UOC), PGCME(UOC), AET (UK)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	ඒ.ඒ.එස්. ප්‍රියදර්ශනී BA (Sp.), MPhil (Economics) (PDN), Dip in English, Dip in HRM

2.6.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

MBBS – වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය

වෛද්‍ය පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ වලින් සමන්විත වේ.

1. කායව්‍යච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය
2. ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය
3. භෞතවේද අධ්‍යයනාංශය
4. පරපෝෂවේද අධ්‍යයනාංශය
5. ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය
6. අධිකරණ වෛද්‍ය විද්‍යා හා විෂ විද්‍යා අධ්‍යයනාංශය
7. ව්‍යාධිවේද විද්‍යා අධ්‍යයනාංශය
8. ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
9. පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
10. භිෂග්වේදය අධ්‍යයනාංශය
11. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
12. වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
13. ළමා රෝග හා කෞමාරභෘතීය අධ්‍යයනාංශය
14. ප්‍රසව හා නාරීවේද අධ්‍යයනාංශය
15. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය

2.7 සමාජීය විද්‍යා හා භාෂා පීඨය

2.7.1 ඉතිහාසය

වර්ෂ 1996 දී විශ්වවිද්‍යාලයෙ හි අධ්‍යයන කටයුතු ආරම්භ කළ කාලයේ දී ම සමාජීය විද්‍යා හා භාෂා පීඨය ආරම්භ කෙරිණි. මුල් කාලයේ දී, භාෂා අධ්‍යනාංශය සහ සමාජ විද්‍යා අධ්‍යනාංශය යන අධ්‍යයනාංශ දෙකෙන් පීඨය සමන්විත විය. තුන්වැනි අධ්‍යයනාංශය වූ ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය 2004 වසරේ දී ආරම්භ කරන ලද අතර, සිව් වැන්න වූ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය පිහිටුවන ලද්දේ 2009 වසරේ දී ය. පස්වන අධ්‍යයනාංශය ලෙස භූගෝල විද්‍යාව හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය 2015 වසරේ දී ආරම්භ කරන ලදී. 1996 නොවැම්බර් මාසයේ දී පීඨය විසින් සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද්දේ, එවකට අනුබද්ධ විශ්වවිද්‍යාලය විසින් ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හදාරා වසර දෙකකින් පසු උපාධිය සම්පූර්ණ කර ගැනීම සඳහා බඳවා ගන්නා ලද සිසු පිරිස සමාජීය විද්‍යා හා භාෂා පීඨය වෙත අනුයුක්ත කර ගනිමිනි. 1998 වසරේ සිට අ.පොෂ. (උ/පෙළ) සුදුසුකම් මත පමණක් සිසුන් බඳවා ගැනීම ආරම්භ කරන ලදී.

සමාජීය විද්‍යා හා භාෂා පීඨය පීඨය විසින් සිය දැක්ම සහ මෙහෙවරට අනුකූලව, සිය අධ්‍යයනාංශ හරහා ගෞරව උපාධි ප්‍රදානය කරනු ලැබේ. 2007 වසරේ දී තුන් අවුරුදු ගෞරව උපාධි පමණක් පිරිනැමීමේ සිය මූලික සංකල්පයෙන් බැහැර වූ පීඨය, තුන් අවුරුදු සමාජ විද්‍යා ගෞරව උපාධි පාඨමාලාවට අමතරව ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව සහ මානව විද්‍යාව යන ක්ෂේත්‍රයන් හි සිව් අවුරුදු උපාධි පාඨමාලාවන් පිරිනැමීම ද ආරම්භ කළේය. 2013 වසරේ සිට බල පැවැත්වෙන පරිදි සිංහල, දමිළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන්, චීන සහ හින්දි භාෂා පිළිබඳ ගෞරව උපාධි පාඨමාලා ද හඳුන්වා දුන් අතර, 2015 වසරේ දී භාෂා පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව ආරම්භ කරනු ලැබිණි. වර්තමානය වන විට පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන්නේ සිව් අවුරුදු ගෞරව උපාධි සහ තුන් අවුරුදු සාමාන්‍ය උපාධි පමණි.

ක්ෂේත්‍ර ගණනාවකට අයත් විෂයයන් පිළිබඳව මනා දැනුමකින් සහ මානව සම්ප්‍රදායයන් පිළිබඳව පුළුල් අවබෝධයකින් යුත් වෘත්තිකයන් බවට පත් වීමේ හැකියාව සිසුන් වෙත ලබා දෙමින්, සිය වෘත්තීය අභියෝග ජය ගැනීමට හැකි වන පරිදි ඔවුන් සූදානම් කිරීමට පීඨය කැප වී කටයුතු කරයි. වර්තමාන වැඩ ලෝකයේ අභියෝගවලට සහ කටයුතුවලට සාර්ථක ලෙස මුහුණ දීම සඳහා එම දැනුම අදාළ කර ගත හැකි ආකාරය පිළිබඳව උපාධි පාඨමාලාවල දී අවධාරණය කෙරේ. උපාධි අපේක්ෂකයින්ගේ ස්වාධීන හා විචාරශීලී චින්තන හැකියාව, තාර්කික හා විශ්ලේෂණ හැකියාවන්, ඵලදායී සන්නිවේදන හැකියාවන් සහ සාමූහික ක්‍රියාකාරකම්වල දී වැදගත් වන සන්නිවේදනාත්මක සහභාගිත්ව හැකියාවන් සංවර්ධනය කිරීම පීඨයේ අරමුණයි. එනිසා ම, මෙම කලා උපාධි පාඨමාලා තුළ පන්ති කාමරය තුළ සිදු කෙරෙන ක්‍රියාකාරකම්වලට අමතරව ඉන් පරිබාහිරව කෙරෙන ස්වාධීන කියවීම්, ලිවීම්, ප්‍රායෝගික පර්යේෂණ සහ ව්‍යාපෘති ආදිය ද ඇතුළත් කර ඇත.



කන්ෆියුසියස් පන්ති කාමරය තුළ සිය පළමු වන වසන්ත උත්සවය ගාලා පවත්වන ලදී



2.7.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු BScHons (Statistics) (SJP), MPhil (PDN), PhD (University of Auckland) (2020 ඔක්තොම්බර් 13 සිට) ආචාර්ය ඩබ්ලිව්. මනෝජ් ආරියරත්න BAHons (SJP), MA (SJP), PhD (Pune) (2020 ඔක්තොම්බර් 12 දක්වා)
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය	ආචාර්යආර්.ඒ.එච්.එම්. රූපසිංහ BSc (Computing and Information Systems)(SUSL), MSc (Computer Science and Engineering) (University of Aizu, Japan), PhD (Computer Sciences and Engineering) (University of Aizu, Japan) (2020 නොවැම්බර් 13 සිට) මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත් (වැඩබලන අධ්‍යයනාංශ ප්‍රධාන) BA (SJP), MA (SJP), PhD (CMB) (2020 ඔක්තොම්බර් 12 සිට නොවැම්බර් 12 දක්වා) ආචාර්යඑම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු BScHons (Statistics) (SJP), MPhil (PDN), PhD (University of Auckland) (2020 ඔක්තොම්බර් 11 දක්වා)
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය	ආචාර්ය කේ.එස්.එන්. ප්‍රසංගනී BAHons (Languages) (SUSL), MA in Linguistics (KLN), PhD (Applied Linguistics) (University Malaysia, Sarawak)
භූගෝල විද්‍යාව හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය	ආචාර්ය කේ.වී.ඩී.ඊ. මැණිකේ BA(Geography), MA (Geography) (SJP), PhD (Geography) (SJP)
භාෂා අධ්‍යයනාංශය	ආචාර්ය ආර්.ජී.එස්. රත්නායක BA (Sp.) (Hindi) (KLN), MPhil (Hindi) (KLN), PhD(Hindi) (MGAHV, India)

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

එස්.කේ. හඳුරාගම
BAHons (Sp.) (Sociology) (UOC), MA (Sociology) (UOC)

සහකාර ලේඛකාධිකාරී

යශෝදා චන්ද්‍රසේකර
LL.BHons (Law) (UOC)

2.7.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

සමාජීය විද්‍යා හා භාෂා පීඨය අධ්‍යයනාංශ පහකින් සමන්විත වේ. ඒවා නම්: ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, භාෂා අධ්‍යයනාංශය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය යනාදියයි.

පීඨය මඟින් පහත සඳහන් උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

1. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය (සිව් අවුරුදු)
2. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය (තුන් අවුරුදු)

පීඨයේ සියලුම අධ්‍යයනාංශවල සහායයෙන් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර, එක් එක් විෂයයන්ට අදාළ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි පාඨමාලා පහත පරිදි එක් එක් අධ්‍යයනාංශ මඟින් පවත්වාගෙන යනු ලැබේ.

ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
(ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.)

භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය

භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

භාෂා අධ්‍යයනාංශය

සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
දමිළ භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
ජර්මන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
ජපන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
චීන භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
හින්දි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය (DELT)

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය විසින් ‘‘දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (ESL)’’ ප්‍රධාන/අනු විෂයයක් ලෙස උගන්වන අතර, සිසුන්ගේ විශ්වවිද්‍යාලයීය ජීවිතය පුරාවට ඉංග්‍රීසි භාෂා පාඨමාලා පිරිනැමීමට ද එමඟින් කටයුතු යොදා ඇත.

2.8 තාක්ෂණ පීඨය

2.8.1 ඉතිහාසය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 27 (1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා ලෙස ලක්ෂ්මන් කිරිඇල්ල මහතාට පැවරී ඇති බලතල අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තියේ නියෝගය අනුව 1995.11.07 දිනැති අංක 896/2 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධියට පත් කර ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය සහ ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය යන අධ්‍යයනාංශ දෙකෙන් සමන්විත ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය නෛතිකව ස්ථාපනය කරන ලදී.

2.8.2 පීඨ කළමනාකරණය

පීඨාධිපති	ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත BSc (Agriculture) (RUH), MSc (Agriculture) (PDN), D.Eng (Water Resource Engineering) (Wuhan, PR China)
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය	ආචාර්ය කේ.ආර්. කොස්වත්තගේ BSc (Sp.) (Physics) (UOC), MSc(Kobe University, Japan), PhD (Kobe University, Japan)
ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය	ආචාර්ය ඩබ්ලිව්.ජී.එම්.එස්. පෙරේරා BScHons (Sp.) (Chemistry) (PDN), PhD (Chemistry) (University of Texas at San Antonio, USA)
සහකාර ලේඛකාධිකාරී	ඩී.එස්.ආර්.සී. සවනාවඩු BSc (Information Technology) (SLIIT), MSc (Computer Sciences), (PDN)

2.8.3 පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය: BBST (Hons)

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය: BET (Hons)





තාක්ෂණ පීඨයේ රසායන විද්‍යාගාරයේ හා ජීව විද්‍යාගාරයේ විවෘත කිරීමේ උත්සවය

3. අධ්‍යයන සම්පත්

3.1 පුස්තකාලය

3.1.1 පුස්තකාලය පිළිබඳ හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් වල අපේක්ෂිත විශිෂ්ඨත්වය සහ ගුණාත්මකභාවය ළඟා කර ගැනීම පිණිස විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය සමස්ත විශ්වවිද්‍යාලයට ම සිය සේවා සපයන අතර, ඊට අමතරව කළමනාකාරණ අධ්‍යයන පීඨ පුස්තකාලය සහ කෘෂි විද්‍යා පීඨ පුස්තකාලය මඟින් එම එක් එක් පීඨයේ පුස්තකාල අවශ්‍යතා සපුරාලනු ලැබේ. වෛද්‍ය පීඨයෙ හි වෙනම ශාඛා පුස්තකාලයක් පිහිටා ඇත. විෂයමාලා අධ්‍යයනය සඳහා ලබා දෙන මූලික සහයෝගයට පමණක් සීමා නොවී පරිශීලකයන්ගේ උසස් පර්යේෂණ අවශ්‍යතා ද සපුරාලිය හැකි ආකාරයට පුස්තකාල සම්පත් සම්භාරය සහ සේවාවන් සැලසුම් කර තිබේ.

වෙනස් වන තොරතුරු අවශ්‍යතා සපුරාලනු පිණිස නිර්මාණශීලී ලෙස හැඩ ගැසෙමින් සහ ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද මුහුණ දීමට සිදුවන නව අභියෝගයන්ට නව්‍ය ලෙස ප්‍රතිචාර දක්වමින් සිය පරිශීලකයන් වෙත ගුණාත්මක තොරතුරු, සේවා සහ වැඩසටහන් සැපයීමට සබරගමුව විශ්වවිද්‍යාලයීය පුස්තකාල කැප වී කටයුතු කරයි.

2020 වසර අග භාගය වන විට විශ්වවිද්‍යාලයේ සියලුම පුස්තකාලවල තිබූ පොත් සම්භාරය 134000 ක් (මිල දී ගත් + පරිත්‍යාග 133694) පමණ වූ අතර, විශ්වවිද්‍යාලය විසින් මිල දී ගත් පොත්, පරිත්‍යාග ලෙස ලද පොත්, පත්‍රිකා, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ විද්‍යුත් සම්පත් ඊට ඇතුළත් විය.

සබරගමුව විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පුස්තකාල ස්වයංක්‍රියකරණය කිරීම සහ කාර්යක්ෂමතාවය සහතික කිරීම සඳහා ‘‘KOHA open source’’ මෘදුකාංගය භාවිතා කරයි. ඒ අනුව, බැහැර දීමේ අංශය, විමර්ශන අංශය, නිත්‍ය විමර්ශන අංශය, සහරා අංශය ලෙසත් පසුගිය ප්‍රශ්න පත්‍ර එකතුව සහ වෙනත් එකතූන් ලෙසත් පුස්තකාල සම්පත් සම්භාරය සංවිධිත ලෙස වර්ගීකරණය කර ඇත.

3.1.2 ගෘහස්ථ ක්‍රියාකාරකම්

පුස්තකාල කමිටුව

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ ප්‍රධාන කළමනාකරණ ව්‍යුහය ලෙස සනාතන සභාවේ උප කමිටුවක් වන පුස්තකාල කමිටුව හැඳින්විය හැකිය. මෙම කමිටුව සෑම මසකම පවත්වනු ලැබේ. විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා කමිටු සභාපති ලෙස ක්‍රියාකරන අතර පුස්තකාලයාධිපතිනිය කමිටු ලේකම් ලෙස ක්‍රියා කරයි.

පුස්තකාලවල අරමුණු

විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ ඉටු කිරීම සඳහා රටෙ හි ඇති විශ්වවිද්‍යාල පුස්තකාලයන් ස්වයං අධ්‍යයන සහ ස්වයං වැඩිදියුණු කිරීම් හරහා විශාල දායකත්වයක් සපයනු ලබයි. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තුළ ප්‍රධාන පුස්තකාලයට අමතරව ශාඛා පුස්තකාල 03 ක් පවතී. ඒවා නම් කළමනාකරණ අධ්‍යයන පීඨ පුස්තකාලය, කෘෂි විද්‍යා පීඨ පුස්තකාලය සහ වෛද්‍ය පීඨ පුස්තකාලය වේ. ප්‍රධාන පුස්තකාලය මඟින් සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, භූ විඥාපන, තාක්ෂණ පීඨය සහ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ 05 හි අවශ්‍යතා තෘප්ත කරනු ලබයි. කෘෂි විද්‍යා පීඨ, කළමනාකරණ අධ්‍යයන පීඨ සහ වෛද්‍ය පීඨ පුස්තකාල මඟින් එම පීඨයන්ගේ විද්‍යාර්තයින්ගේ අවශ්‍යතා තෘප්ත කරනු ලබයි. වර්තමානයේ සබරගමුව විශ්වවිද්‍යාලය විද්‍යුත් තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාශීලීව කටයුතු කරමින් සිටී.

ප්‍රධාන පුස්තකාලය සඳහා නව පුස්තකාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරීමත් සමඟ එහි පහසුකම් පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි. මානව සම්පත් හැරුණු විට පරිත්‍යාගශීලීන්ගෙන් ලැබුණු සහ පුස්තකාලය විසින් මිල දී ගන්නා ලද ග්‍රන්ථ නාමාවලිය වැනි භෞතික සම්පත් වැඩි දියුණු කිරීම යන දිශාවට අවධානය යොමු කර නව ගොඩනැගිල්ල ස්ථාපිත කිරීම සමඟ ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

3.1.3 2020 වර්ෂයේ වෙනත් ක්‍රියාකාරකම්

පත්වීම්, උසස්වීම් සහ අංගයන්

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ආචාර්ය පී.කේ.සී.එම්. විජේවික්‍රම මහතා ප්‍රධාන පුස්තකාලය තුළ 2018.09.03 සිට බල පැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I ශ්‍රේණිය තනතුරට උසස් කරන ලදී.

- සුසිල් හෙට්ටිආරච්චි මහතා, එම්.එච්.පී.වී. කුමාරි මිය සහ ඩී.කේ.එස්. ගාමිණී මහතා ප්‍රධාන පුස්තකාලය සහ කළමනාකරණ අධ්‍යයන පීඨය තුළ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර තනතුරට උසස් කරන ලදී.

- තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2019/2020 ආයතනික සමාලෝචනයේ සමාලෝචන කණ්ඩායම 2020 ජනවාරි 27 වන දින පුස්තකාලය නැරඹීමට පැමිණි අතර නිර්ණායක 04 - ඉගෙනුම් සම්පත්, ශිෂ්‍ය සහයෝගය සහ වැඩිදියුණුව සඳහා "B" සාමාර්ථයක් ලැබිණි.

- භූ විඥාපන පීඨයේ දී 2020 දෙසැම්බර් 16 වන දින පවත්වන ලද ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 10 වන වාර්ෂික පර්යේෂණ සැසිය සඳහා ලේකම් ලෙස ආචාර්ය පී.කේ.සී.එම්. විජේවික්‍රම මහතා පත් කරන ලදී.





තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය විසින් පවත්වන ලද ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ සමාලෝචන කණ්ඩායම 2020 ජනවාරි 27 වන දින පුස්තකාලය නිරීක්ෂණය කරන ලදී

3.2 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය

3.2.1 හැඳින්වීම

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් සබරගමුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණයට අදාළ බොහෝ අධ්‍යයන සහ තාක්ෂණික සේවාවන් සපයනු ලබයි. විවිධ පීඨවල අධ්‍යයන වැඩසටහන් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම, තොරතුරු තාක්ෂණයට අදාළ විෂය නිර්දේශ සැකසීම සහ අධ්‍යයන, අනධ්‍යයන මෙන්ම අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව සැපයීම මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලැබේ. එසේම සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහාම අවශ්‍ය අන්තර්ජාල සේවා සැපයීම සහ විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීම සිදු කරනු ලබයි. ජාල පහසුකම්, මාර්ගගත ඉගෙනුම් පහසුකම් මෙන්ම දෘඩාංග, මෘදුකාංග නඩත්තු කිරීමේ සේවාවන් වැනි තාක්ෂණික සෙවාවන් ද මෙමඟින් සපයනු ලබයි.

3.2.2 ඉතිහාසය

සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉතිහාසය, 1991 වර්ෂයේ දී සබරගමුව පළාතේ අනුබද්ධ විශ්වවිද්‍යාලය පිහිටුවීමේ කාලය දක්වා විහිදේ. එය සමනළවැව ජල විදුලි බල ව්‍යාපෘතියට අයත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලද අතර වර්තමානයේ එය D1-4 නිල නිවසේ ස්ථානගතව ඇත. ආරම්භයේ දී මෙම අංශය මෙගා බයිට් 1 ක අහඹු ප්‍රවේශ මතකයන් (1MbRAM) සහ මෙගා බයිට් 40 ක දෘඩ තැටි (40 MbHarddisks) සහිත Tatung 286 පරිගණක 10 කින්ද OKI 9 – pin ඩොට් මෙට්‍රික්ස් මුද්‍රණ යන්ත්‍රයකින් ද සමන්විත විය. අනුබද්ධ විශ්වවිද්‍යාලයේ සමාරම්භක උත්සවයට පැමිණි හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා විසින් එම අවස්ථාවේ දී මෙම පරිගණක මධ්‍යස්ථානයේ ද ඵලකය නිරාවරණය කරන ලදී.

මුල් කාලීනව ගණකාධිකරණය හා මූල්‍යය පිළිබඳ ඩිප්ලෝමාව, සංචාරක කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව යන ඩිප්ලෝමා තුන සඳහා අනුබද්ධ විශ්වවිද්‍යාලය විසින් සිසුන් බඳවා ගනු ලැබූ අතර, හර පාඨමාලාවක් ලෙස පරිගණක මධ්‍යස්ථානය විසින් පිරිනැමූ පරිගණක පාඨමාලාව හැදෑරීම, එකී සියලු ඩිප්ලෝමා ලබා ගැනීම සඳහා අනිවාර්ය විය.

එවකට සිටි බලංගොඩ දිසා විනිසුරු විසින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් අය කෙරෙන දඩ මුදල් සමාජ සත්කාර සඳහා යොදා ගැනීමේ වැඩසටහනක් දියත් කරන ලද අතර, එමඟින් පරිත්‍යාග කරනු ලැබූ රු. 15000.00 ක මුදලින්, එවකට සිටි සේවකයින්, සිසුන්, ගම්වාසීන් ඇතුළු සියලු දෙනාගේ සහයෝගයෙන් ශ්‍රමදාන ව්‍යාපාරයක් ලෙස දැනට පවතින පරිගණක මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. පසුව රජයෙන් ලැබුණු අරමුදල් මත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරනු ලැබීය. සමනළවැව ව්‍යාපෘතියෙන් අත්පත් කර ගත් ගොඩනැගිලි වලට අමතරව, අනුබද්ධ විශ්වවිද්‍යාලය සඳහා ඉදි කළ පැරණි ශ්‍රවණාගාරය සහ සමගාමීව ඉදි වුණු පළමු ගොඩනැගිල්ල වන්නේ දැනට පරිගණක මධ්‍යස්ථානය පවත්වාගෙන යන ගොඩනැගිල්ලයි.

පළමුව එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පරිගණක තාක්ෂණ උපදේශකවරයෙකු වශයෙන් බඳවා ගන්නා ලද අතර ඔහු විසින් පරිගණක හර පාඨමාලාවේ දේශන සහ ප්‍රායෝගික වැඩසටහන් මෙහෙයවන ලදී. ඉන් අනතුරුව පරිගණක මධ්‍යස්ථානයේ සේවා තවත් පුළුල් කිරීම අරභයා තවත් උපදේශකවරුන් දෙදෙනෙකු මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය වෙත බඳවා ගත් අතර, එය අනුබද්ධ

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පැවති අනුමත සේවක සංඛ්‍යාවකින් සමන්විත එකම පරිගණක මධ්‍යස්ථානය විය.

1996 සබරගමුව අනුබද්ධ විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීමෙන් අනතුරුව පරිගණක මධ්‍යස්ථානය විසින් විවිධ උපාධි වැඩසටහන් සඳහා සේවා සැපයීම ආරම්භ කරන ලදී. විශේෂයෙන් ම, තොරතුරු තාක්ෂණ පාඨමාලා සඳහා අවශ්‍ය අධ්‍යයන වැඩසටහන් නිර්මාණය කිරීම සහ එම පාඨමාලා සඳහා දේශන හා ප්‍රායෝගික පුහුණු කටයුතු පැවැත්වීම, විශ්වවිද්‍යාලයට පරිගණක හා වෙනත් අදාළ උපකරණ මිල දී ගැනීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් සැකසීම හා ඒවා ඇගයීම් කිරීම, දිනපතා රාජකාරී කටයුතු පහසු කිරීම සඳහා ලිපිකරුවන්ට පරිගණක දැනුම ලබා දීම, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට ඔවුන්ගේ පශ්චාද් උපාධි නිබන්ධන සකස් කර ගැනීමට සහාය වීම සහ ඉගැන්වීමේ පත්‍රිකා / සටහන් සූදානම් කර ගැනීමට සහාය වීම ආදී කටයුතු මඟින් පරිගණක මධ්‍යස්ථානය අනෙකුත් පීඨ සඳහා සිය සේවා සැපයීය.

විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟ ම පරිගණක මධ්‍යස්ථානය පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය ලෙස නව්‍යකරණය කොට, වෙනම අධ්‍යක්ෂවරයෙකු යටතේ ප්‍රතිව්‍යුහගත කරන ලදී. එමෙන්ම කළමනාකරණ අධ්‍යයන සහ සමාජීය විද්‍යා හා භාෂා පීඨයන් හි තොරතුරු තාක්ෂණයට අදාළ උපාධි වැඩසටහන් සඳහා සහයෝගය ලබා දීම ද සිදු කෙරිණි. මධ්‍යස්ථානයේ සේවා කටයුතු පුළුල් කිරීමේ අරමුණෙන්, පෙර පැවති ගොඩනැගිල්ලට යාබදව තවත් ගොඩනැගිල්ලක් ද ඉදිකරන ලදී. එම කාලයේ දී ම විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය ජාලය (LAN) ආරම්භ කර ලංකා අධ්‍යාපන සහ පර්යේෂණ ජාලය (LEARN) හරහා අන්තර්ජාල පහසුකම්වලට සම්බන්ධ කරමින් විශ්වවිද්‍යාල ප්‍රජාවට අන්තර්ජාල පහසුකම් හා ජාලගත සේවා ලබා දීම සහ එම කටයුතු නඩත්තු කිරීම ආරම්භ කෙරිණි. සබරගමුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය නිර්මාණය කිරීම සහ විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් සිදු කළ තවත් වැදගත් සේවාවන් ලෙස දැක්විය හැකිය.

මේ අතර පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් සපයනු ලබන සේවාවන් ශක්තිමත් කිරීම සඳහා 2020 වර්ෂයේ දී අනුමත කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිලාභන කොමිෂන් සභාවේ සේවක ලැයිස්තුවට අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය වැඩි කර ඇත.

3.2.3 ස්ථිර කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ - ආර්.එල්. දංගල්ල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - IIශ්‍රේණිය / ව්‍යවහාරික විද්‍යා පීඨය

නම	තනතුර	විද්‍යුත් තැපැල් ලිපිනය
ආර්.වී.එස්.පී.කේ.රණතුංග	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	spkr@ccs.sab.ac.lk
ආර්.එම්.එන්.බී. රත්නායක	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	nevil@ccs.sab.ac.lk
ආචාර්ය ඒච්.කේ. සාලින්ද ප්‍රේමදාස	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	salinda@ccs.sab.ac.lk
එන්.ජේ. මල්රාජ් සිල්වා	කථිකාචාර්ය	malraj@ccs.sab.ac.lk
එස්. නිමිෂාන්	ආධුනික කථිකාචාර්ය	nimishan@ccs.sab.ac.lk

අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

නම	තනතුර	විද්‍යුත් තැපැල් ලිපිනය	අනුයුක්ත කර ඇති ස්ථානය
ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රේමවර්ධන	පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක (I ශ්‍රේණිය)	ccwhd@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ කෘෂි විද්‍යා පීඨය
ඩබ්ලිව්.ආර්.වයි.එස්. සමරසේකර	පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක (II ශ්‍රේණිය)	yasantha@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ඒ.සී. නානායක්කාර (අධ්‍යයන නිවාඩු මත)	පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක (II ශ්‍රේණිය)	chethana@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය
එච්.එම්.එම්.ඒ. හේරත්	පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක (II ශ්‍රේණිය)	mahesh@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය /කළමනාකරණ අධ්‍යයන පීඨය
ඒ.සී.පී.කේ. සිරිවර්ධන (අධ්‍යයන නිවාඩු මත)	උපදේශක (II ශ්‍රේණිය)	chaminda@geo.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ කෘෂි විද්‍යා පීඨය
කේ.ටී. ධනංජලී	තාවකාලික උපදේශක	dananjali@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ඩබ්ලිව්.ජී.එස්. සමීර	තාවකාලික ප්‍රදර්ශක	sameera@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ඊ.එස්.ඒ. ගුණසිංහ	සහකාර ජාල කළමනාකරු (II ශ්‍රේණිය)	suranjith@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
එස්.ඒ.එස්.කේ.ජේ. පෙරේරා	සහකාර ජාල කළමනාකරු (II ශ්‍රේණිය)	sadeepa@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය

මෙම පරිගණක තාක්ෂණය පිළිබඳ සිටීර උපදේශකවරුන් තොරතුරු තාක්ෂණය සම්බන්ධ දේශන / ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා පීඨවල ඉල්ලීම මත කෘෂි විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය සහ කළමනාකරණ අධ්‍යයන පීඨය යන පීඨ හතර සඳහා අනුයුක්ත කර ඇත.

එච්.එම්.එම්.ඒ. හේරත් මහතා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පරිගණක මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක වන අතර පීඨයේ සහ විශ්වවිද්‍යාල වෙබ් අඩවිය පවත්වාගෙන යාමට අමතරව උපදේශකවරයෙකු ලෙස ද ක්‍රියා කරයි.

පීඨාධිපතිතුමාගේ ඉල්ලීම මත ඩබ්ලිව්.ආර්.වයි.එස්. සමරසේකර මහතා විසින් සමාජීය විද්‍යා හා භාෂා පීඨය සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.

ජ්‍යෙෂ්ඨ උපදේශක ප්‍රේමවර්ධන මහතා කෘෂි විද්‍යා පීඨයේ තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන ලදී. පීඨ සඳහා අවශ්‍ය මානව සම්පත් සහ වෙනත් තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවාවන් ලබා දීම සඳහා පීඨ මණ්ඩල වලට සම්බන්ධ වී ඇති සම්බන්ධීකාරකවරුන් පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂතුමා සමඟ සම්බන්ධ වී කටයුතු කරනු ලබයි.

කේ.ටී. ධනංජලී මිය විසින් සමාජීය විද්‍යා හා භාෂා පීඨය සඳහා තොරතුරු තාක්ෂණයට අදාළ දේශණ සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පවත්වනු ලබයි.

ඊ.එස්.ඒ. ගුණසිංහ මහතා සහ එස්.ඒ.එස්.කේ.ජේ. පෙරේරා මහතා යන සහකාර ජාල කළමනාකාරවරුන් විසින් අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ අවශ්‍ය විට දී නව ජාල සේවා ක්‍රියාත්මක කිරීම මෙන්ම විශ්වවිද්‍යාල LAN ජාලයේ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා වගකීම දරනු ලබයි.

අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

නම	තනතුර	විද්‍යුත් තැපැල් ලිපිනය	අනුයුක්ත කර ඇති ස්ථානය	සේවාව සපයන ස්ථාන සහ රාජකාරියේ ස්වභාවය
පී.එස්. ප්‍රේමලාල්	පරිගණක යෙදුම් සහකාර (I ශ්‍රේණිය)	sanjewa@ccs.sab.ac.lk	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය	විශ්වවිද්‍යාල මෘදුකාංග නඩත්තු කිරීම
එච්.ජේ.සී. සෙනරත්	තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය)	hjcsenarath@gmail.com	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය	විශ්වවිද්‍යාල මෘදුකාංග නඩත්තු කිරීම
ඩී.ඒ. චතුරංග	කම්කරු (III ශ්‍රේණිය)	asithachathuranga5@gmail.com	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
ජී.ඒ.ආර්. ඉන්දික	විද්‍යාගාර සහායක (පහළ ශ්‍රේණිය)	ranilindika2244@gmail.com	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය

සමස්ත විශ්වවිද්‍යාලයේ ම මධ්‍යස්ථානවල සහ කාර්යාලවල වැනි වෙනත් ස්ථාන වලට අමතරව පීඨ පරිගණක මධ්‍යස්ථානවල පරිගණක සහ උපාංග වල මෘදුකාංග සහ දෘඩාංගවල ඇති වන ගැටලු විසඳීම සඳහා පරිගණක යෙදුම් සහකාර සහ තාක්ෂණික නිලධාරීපත් කර ඇත. සංජීව ප්‍රේමලාල් මහතා සහ ජනක සෙනරත් මහතා මේ වන විට එවැනි කටයුතු සිදු කිරීමට සම්බන්ධ වී සිටින අතර උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා උපකරණවල අක්‍රමිකතා පිළිබඳව අදාළ බලධාරීන්ට වාර්තා කිරීම සිදු කරනු ලබයි.

3.2.4 වර්තමාන තත්ත්වය

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථාන උපකාරක සේවාව (Helpdesk)

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සියලුම තාක්ෂණික අවශ්‍යතා සහ ගැටළු සඳහා මූලින්ම පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ උපකාරක සේවාව හා සම්බන්ධ විය යුතු වේ.

එදිනෙදා රාජකාරී කටයුතුවල දී තොරතුරු තාක්ෂණයට සම්බන්ධ කරුණු පිළිබඳව ශිෂ්‍යයින්, පීඨය, අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් විද්‍යුත් තැපෑල මඟින් සහ පුද්ගලිකව කරනු ලබන ඉල්ලීම් මෙම උපකාරක සේවාව මඟින් හසුරවනු ලබයි.

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථාන ශිෂ්‍ය උපකාරක සේවාව (Helpdesk)

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථාන ශිෂ්‍ය උපකාරක සේවාව මඟින් සෑම පීඨයකම පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය යටතේ පවතින පරිගණක මධ්‍යස්ථානවල පරිගණක ආශ්‍රිත ගැටළු සහිත පරිශීලකයින්ට සහාය වීම සඳහා පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සේවයේ යොදවා ඇති තාක්ෂණික සේවකයින් සේවයේ යොදවා ඇත.

සේවාවන්

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලය තුළ ඉංජිනේරු, තාක්ෂණික, ඉලෙක්ට්‍රොනික, විද්‍යුත්, පරිගණක අලුත්වැඩියා කිරීම සහ දොශ නිරාකණය කිරීම යන සියල්ල මෙහෙයවනු ලබයි. මේ මඟින් අධ්‍යයන කටයුතු පමණක් නොව පරිපාලන කටයුතු ද වැනි සියලුම විශ්වවිද්‍යාල කටයුතු පහසුවෙන් හා කාර්යක්ෂමව සිදු කිරීමට උපකාරී වේ.

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන් වනුයේ:

- තාක්ෂණික සහාය සහ පරිගණක පද්ධති නඩත්තු කිරීම Preventive Maintenances
- ජාල ස්ථාපනය, විනාසය (Configuration) සහ දෝශ නිරාකරණය
- ඉලෙක්ට්‍රොනික, විදුලි සහ දුරකතන පද්ධති නඩත්තු කිරීම
  දේශන, විශේෂ අංග, ශ්‍රවණාගාර තුළ සිදු කරන අංගයන් හැසිරවීමට සහ පරිගණක සේවා මධ්‍යස්ථාන පුහුණු වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය ලබා දීම

සේවාව	විස්තරය
මෙහෙයුම් පද්ධති නැවත ස්ථාපනය කිරීම	පරිගණකයක මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කිරීම, එම මෙහෙයුම් පද්ධති මෘදුකාංගය සඳහා නවතම ආරක්ෂක පැවස් සහ සියලුම සුදුසු දෘඩාංග ඩ්‍රයිවර්ස් එක් සේවාවක් ලෙ ඇතුළත් කර ඇත.
මෘදුකාංග ස්ථාපනය	පරිගණක මධ්‍යස්ථානවල පරිගණක සඳහා පමණක් නොව කථිකාචාර්යවරුන්ගේ, පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහ ශිෂ්‍යයින්ගේ පෞද්ගලික ලැප්ටොප් පරිගණක සඳහා අවශ්‍ය සියලුම මෘදුකාංග සැපයීම සහ ස්ථාපනය කිරීම.
වෛරස්, මෘදුකාංග සහ ඇඩ්වෙයාර් ඉවත් කිරීම	සාමාන්‍යයන් පරිගණකයක ඉදිරිපත් කිරීමට, ක්‍රියාකාරිත්වයට බලපාන සහ විශ්වවිද්‍යාල ජාලය තුළ ආරක්ෂක අවදානමක් ඇති කරන ඇඩ්වෙයාර්, ස්පයි වෙයාර් සහ වෛරස් ලෙස හැඳින්වෙන අනිෂ්ට කේත ඉවත් කිරීම
ජාල සම්බන්ධතාවය/ දෝශ නිරාකරණය	විනාසය (configuration) සැකසුම්, මෘදුකාංග සහ අකුණු ගැසීම්, විදුලි අක්‍රමිකතා වැනි බාහිර විපත්, හෙතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ අන්තර්ජාල ප්‍රවේශය සීමා කරන රැහැන් සහිත හෝ රැහැන් රහිත ජාල සම්බන්ධතා ගැටළු දෝශ නිරාකරණය සහ විසඳීම
යෙදුම්වල දෝශ නිරාකරණය (මයික්‍රොසොෆ්ට් කාර්යාල)	මයික්‍රොසොෆ්ට් කාර්යාල යෙදුම්වල අක්‍රමවත් හා නොගැලපෙන ක්‍රියාකාරිත්වය සඳහා දෝශ නිරාකරණය.

සේවාවන්

විශ්වවිද්‍යාල වෙබ් තැපෑල
පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සියලුම අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ සිසුන් සඳහා xxx.sab.ac.lk යටතේ අසීමිත ගබඩා ධාරිතාවක් යටතේ විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දී ඇත.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල තැපෑල
පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය මයික්‍රොසොෆ්ට් සමාගම සමඟ සම්බන්ධ වී සියලුම අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ සියලුම සිසුන් සඳහා ms.sab.ac.lk යටතේ 1 GB ගබඩා ධාරිතාවක් සහිත විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දී ඇත.

මාර්ගගත ඉගෙනුම් පරිසරය (VLE)
පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා විද්‍යුත් ඉගෙනුම් සහ මාර්ගගත ඉගෙනුම් කළමනාකරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයනු ලබයි.

වර්තමාන තත්ත්වය:
වර්තමානය වන විට විවිධ පීඨවල ඉල්ලීම මත සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව හා සුළු පරිගණක පාඨමාලාව, කළමනාකරණ අධ්‍යයන පීඨයේ විවිධ අධ්‍යයනාංශවල සමහර තොරතුරු තාක්ෂණය ආශ්‍රිත විෂයයන් ප්‍රායෝගික අංග සහ කෘෂි විද්‍යා පීඨයට පැවැත්වීම සඳහා මධ්‍යස්ථානය විසින් සපයනු ලබන අධ්‍යයන සේවාවන් ප්‍රධාන වශයෙන් සීමා කර ඇත. සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා අන්තර්ජාල සේවාව සහ වෙබ් සේවාව වැනි තොරතුරු තාක්ෂණ සේවාවන් සපයනු ලබයි. ඊට අමතරව පුස්තකාල පද්ධතිය, IP දුරකතන පද්ධතිය, IP කැමරා පද්ධතිය සහ රැහැන් රහිත ජාල වැනි වෙනත් පාර්ශවයන් විසින් ස්ථාපනය කරන ලද ජාලය තුළ ක්‍රියාත්මක වන සේවාවන් සඳහා පරිගණක මධ්‍යස්ථානය විසින් නඩත්තු සහාය ලබා දේ.

වර්තමානයේ බොහෝමයක් පීඨ තමන්ගේ ම සංකීර්ණ ගොඩනගාගෙන තිබෙන අතර එම පීඨවල තොරතුරු තාක්ෂණය සම්බන්ධ අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම සඳහා පීඨ පරිශ්‍රය තුළ ඔවුන්ගේ ම පරිගණක මධ්‍යස්ථාන ඇත. එමනිසා, ඔවුන්ගේ වැඩසටහන් පැවැත්වීම සඳහා තවදුරටත් පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ පවතින ගොඩනැගිලි භාවිතා කිරීමට අවශ්‍ය නොවන අතර ඒ වෙනුවට ඒවා අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන් මෙන්ම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ සම්බන්ධ අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය වීම වැනි මධ්‍යස්ථානය විසින් සපයන සේවාවන් පුළුල් කිරීම සඳහා යොදාගත හැක.

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් මෙම පරිගණක මධ්‍යස්ථාන පහේ ම සියලුම පරිගණක ආශ්‍රිත අධ්‍යයන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ වෙබ්, විද්‍යුත් ඉගෙනුම්, DNS, විද්‍යුත් තැපෑල, ඩිජිටල් පුස්තකාල පද්ධතිය, ශිෂ්‍ය තොරතුරු සේවාව සහ ජාල දෝෂ නිරාකරණ සේවාවන් වැනි ජාල සේවාවන් සැපයීමට අවශ්‍ය සියලුම සර්වර (servers) ඇතුළු ව විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පුළුල් පරිගණක ජාලය (campus-wide network) ද නඩත්තු කිරීම සිදු කරයි.

2013 වර්ෂයේ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය වෙත වෙන් කරන ලද ඒකාබද්ධ අරමුදල් වලින් තොරතුරු තාක්ෂණය සම්බන්ධ යටිතල පහසුකම් සහ අධ්‍යාපනික වැඩ සටහන් සම්බන්ධයෙන් ප්‍රගතියක් ළඟා කර ගත හැකි විය. මෙම අරමුදල් මඟින් අන්තර්ජාල කලාප පළල (Internet bandwidth) හි අගය තත්පරයට මෙගා බයිට් 20 සිට 100 (20 Mbps - 100 Mbps) දක්වා වැඩිකර

ගැනීමටත් අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත පරිගණක පහසුකම් ලබා දීමටත් හැකි විය.

විශ්වවිද්‍යාලය තුළ අන්තර්ජාල සේවා සඳහා ඇති අධික ඉල්ලුම හේතු කොට ගෙන 2018 වර්ෂයේ කලාප පළල (bandwidth) අගය තත්පරයට මෙගා බයිට් 225 ක් (225 Mpbs) දක්වා වැඩිකිරීමට අන්තර්ජාල සැපයුම්කරුවන් ඉල්ලීම් කර ඇති අතර, එය SLT සමඟින් මෙගා බයිට් 100 ක (100 Mbps) ඩයලොග් උපස්ථ සබැඳියක් (backup link) සමඟ මෙගා බයිට් 700 (700 Mbps) දක්වා වැඩි වී ඇත. ඒ අනුව ප්‍රකාශ තන්තු වල (fiber backbone) අභ්‍යන්තර කලාප පළල (bandwidth) ඉහළ නැංවීමට පරිගණක මධ්‍යස්ථානය යෝජනා කර ඇති අතර වර්තමාන විශ්වවිද්‍යාල සම්බන්ධතාවය මෙගා බයිට් 600 ක (600Mbps) කලාප පළලකින් යුක්ත වේ.

සිසුන් සඳහා වඩාත් හොඳ ඉගෙනුම් පරිසරයක් ලබා දීමේ පරමාර්ථයෙන්, නොමිලේ Wi-Fi පහසුකම් ලබා දීම පිණිස සියලුම පීඨවල නිදහස් Wi-Fi කලාප පිහිටුවා තිබේ. තවද, පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ශිෂ්‍යයින්ගේ නේවාසිකාගාර සහ අධ්‍යයන ප්‍රදේශ සඳහා Wi-Fi කලාප වැඩි කිරීම සඳහා නොමිලේ Wi-Fi ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පුළුල් පරිගණක ජාලය

විශ්වවිද්‍යාලයේ W-LAN ජාලය මෙහෙයවීම සහ නඩත්තු කිරීම පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබයි. එය පරිපාලනය කිරීම සහකාර ජාල කළමනාකාර විසින් සර්වර් කුටියක් (Serverroom) තුළ සිදු කරනු ලබයි. සර්වර් කුටිය සිස්කෝ රවුටරයන් (CISCO routers), proxy server, DNS server, සිස්කෝ ස්විචයන් (CISCO switches), වෙබ් සර්වර් (web server), ඉලෙක්ට්‍රොනික ඉගෙනීම් සර්වර් (e-learning sever), වෛරස් ආරක්ෂක සර්වර් (virus guard server) (මධ්‍යගත සර්වර්) (centralized server) යනාදියෙන් සමන්විත වේ. ජාල රේඛ කාර්යයන්වල සහ විද්‍යුත් ඉගෙනුම් පද්ධතියේ කාර්යථල වැඩිදියණු කිරීම proxy server, DNS server සහ e-learning යන සර්වරයන් (Servers) 03 මඟින් 2014 වර්ෂයේ දී සිදුකර ඇත. සර්වර් කුටිය පවත්නා පරිගණක විද්‍යාගාරයෙන් බාහිරව වෙන් කර තැබීමෙන් සර්වරයන් (servers) පහසුවෙන් නඩත්තු කිරීමේ සහ භෞතිකව ආරක්ෂා කිරීම සහතික කර ඇත. තවද කිලොවොට් ඇම්පියර් 20 ක (20 KVA) විදුලි උත්පාදන යන්ත්‍රයක් මෙන්ම කිලොවොට් ඇම්පියර් 20 ක (20 KVA) අඛණ්ඩ බල මෙහෙයුම් පද්ධතියක් (UPS) තබා ගැනීමෙන් සෑම අවස්ථාවක දී ම ජාල කාර්යයන් අඛණ්ඩව පැවතීම තහවුරු කර ඇත.

විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ මේ වන විට විශේෂ සංඥා පද්ධතියකින් (fiber optic backbone) එකිනෙක සහ අභ්‍යන්තරිකව සම්බන්ධ වී ඇති අතර මෙය ඊළඟ වසරේ දී වඩාත් තත්ත්වයෙන් උසස් කිරීමට නියමිත ය. මේ වන විට අපගේ අන්තර්ජාල සේවාවේ අන්තර්ජාල ශක්‍යතාව තත්පරයට මෙගා බයිට් 600 (600 Mbps) වන අතර භෞතික සම්බන්ධතා ජාලය සංඥා තත්පරයට මෙගා බයිට් 100 (100 Mbps) ක් හැසිරවීමට සමත් අන්තර්ජාල ශක්‍යතාවයකින් යුක්තය.

2020 වර්ෂයේ අරමුණු:

- අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේ සහ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ තන්තු සම්බන්ධතාවය අලුතින් ස්ථාපනය කිරීම සහ අලුත්වැඩියා කිරීම.

- සියලුම ආගන්තුක නිවාසවල තන්තු සම්බන්ධතාවය අලුතින් ස්ථාපනය කිරීම සහ අලුත්වැඩියා කිරීම.
- වෙබ් විකාශන විශේෂ විශ්වවිද්‍යාල අංග සඳහා පහසුකම් සැපයීම.
- "ISP Dialog Axiata"වෙතින් සමස්ත විශ්වවිද්‍යාලය සඳහාම ෆයිබර් උපස්ථ සම්බන්ධතාවයක් නිර්මාණය කිරීම.
- රාසයන විද්‍යා, ජීව විද්‍යා සහ භෞතික විද්‍යා විද්‍යාගාර සඳහා ප්‍රකාශ තන්තු ඇතුළත්ව ප්‍රාදේශීය ජාල (LAN) සම්බන්ධතාවයක් ඇති කිරීම
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සියලුම ශිෂ්‍ය නේවාසිකාගාර සහ කාර්ය මණ්ඩල නිල නිවාස සඳහා Wi-Fi පහසුකම් ලබා දීම.
- විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම.
- විශ්වවිද්‍යාල සමාජ මාධ්‍ය පිටු නිල පිටු ලෙස නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම (Facebook, YouTube, LinkedIn සහ Twitter)
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඩිජිටල් තොරතුරු එකතු කිරීමට සහ සංරක්ෂණය කිරීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ලෙස ඩිජිටල් ගබඩාවක් නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම.
- භූ විඥාපන පීඨය, කෘෂි විද්‍යා පීඨය සහ සමාජීය විද්‍යා හා භාෂා පීඨය යන පීඨවල Wi-Fi ප්‍රවේශ ස්ථාන වැඩි දියුණු කිරීම.
- වෛද්‍ය පීඨයේ Wi-Fi ප්‍රවේශ ස්ථාන වැඩිදියුණු කිරීම (අදියර I සහ අදියර II).
- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ Wi-Fi ප්‍රවේශ ස්ථාන වැඩිදියුණු කිරීම.
- ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළබඳ වැඩමුළු පැවැත්වීම.

වර්ෂය තුළ ළඟා කරගත් අරමුණු:

- Wi-Fi ජාලය සහ ප්‍රාදේශීය ජාලය සහිතව වෛද්‍ය පීඨය සඳහා අන්තර්ජාල සම්බන්ධතාවය ලබා දීම.
- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සඳහා අන්තර්ජාල සම්බන්ධතාවය ලබා දීම.
- තාක්ෂණ පීඨය සඳහා නව Wi-Fi පහසුකම් ස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශයේ (සමාජීය විද්‍යා හා භාෂා පීඨය) පරිගණක විද්‍යාගාරය සඳහා නව ජාලයක් ස්ථාපනය කිරීම
- සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශයේ පරිගණක විද්‍යාගාරය සඳහා නව ජාලයක් ස්ථාපනය කිරීම.
- කෘෂි විද්‍යා පීඨයේ මුංගස්තැන්න ගොඩනැගිලි සංකීර්ණය සඳහා නව ජාලයක් ස්ථාපනය කිරීම.
- CDB බැංකුව වැනි සඳහා බාහිර පාර්ශව සඳහා පහසුකම් සහ සේවාවන් ලබා දී විශ්වවිද්‍යාලය සඳහා මුදල් ඉපයීමට අවස්ථාවක් ලබා දීම.
- ඩ්‍රෑපල් (Drupal) අන්තර්ගත කළමනාකරණ පද්ධතියේ නවතම අනුවාදය සහිතව විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම.
- විශ්වවිද්‍යාලය පුරා Wi-Fi ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධව සහයෝගයෙන් කටයුතු කිරීම.
- විශ්වවිද්‍යාල සමාජ මාධ්‍ය ජාල පිටු නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාලය සඳහා නව ජීව ප්‍රවේශයක් ලබා දීම සඳහා සෑම සමාජ මාධ්‍ය පිටුවක ම නවතම ප්‍රවෘත්ති සහ යාවත්කාලීන කිරීම නඩත්තු කිරීම.

- විශ්වවිද්‍යාල මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් වලට පහසුකම් සැපයීම සඳහා මූඩ්ල් (Moodle) මෘදුකාංගයේ නවතම අනුවාදයක් ස්ථාපනය කිරීම.
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඩිජිටල් තොරතුරු එකතු කිරීමට සහ සංරක්ෂණය කිරීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ලෙස ඩිජිටල් ගබඩාවක් නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම.

2020 වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන්

නව වෙබ් ආකෘතිය

සමස්ත විශ්වවිද්‍යාල වෙබ් අතුරු මුහුණතට අභිරුචිකරණය කළ හැකි අන්තර්ගත කළමනාකරණ පද්ධතියක් සමඟ නව යාවත්කාලීන කරන ලද වෙබ් ආකෘතියක් ස්ථාපනය කර පීඨ මධ්‍යස්ථාන පිටු ද ඒ අනුව සංවිධානය කර ඇත. පීඨ වෙබ් සම්බන්ධීකාරකවරුන් සඳහා උපදේශන සැසි කිහිපයක් පැවැත්වීම.

ඩිජිටල් ගබඩාව

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඩිජිටල් තොරතුරු එකතු කර සංරක්ෂණය කළ හැකි ඩිජිටල් සේවාවක් සැපයීම සඳහා නව වෙබ් ගබඩාවක් ස්ථාපනය කර සංවිධානය කර ඇත. ඩිජිටල් ගබඩාවේ විද්‍යුත් පොත්, සාමාන්‍ය ප්‍රකාශන, පර්යේෂණ ප්‍රකාශන සහ නිබන්දන හා පත්‍රිකා සංරක්ෂිත එකතුවක් ලෙස ඇත.

විශ්වවිද්‍යාල ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම

විශ්වවිද්‍යාල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මූඩ්ල් (Moodle) හි නව අනුවාදයක් සමඟ වැඩිදියුණු කර ව්‍යාවහාරික විද්‍යා පීඨය හැර සමස්ත විශ්වවිද්‍යාලය සඳහාම නව පරිශීලක ගිණුම් සහ කාණ්ඩ නිර්මාණය කර ඇත. ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා නව මාර්ගගත ඉගෙනුම් පරිසරය සමඟ වැඩ කටයුතු සිදු කිරීම පිළිබඳව වැඩමුළු පැවැත්වීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.

ප්‍රකාශිත සාරාංශ

සාරාංශයේ මාතෘකාව	ප්‍රධාන කතෘගේ නම			සමකතෘවරුන්ගේ නම්	සම්මේලනයේ නම
	පූජ්‍ය/ මයා/ මිය/ මෙය	මුලකුරු	අවසාන නාමය		
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය, සිසාසහිත තාර්කිකත්වය සහ ව්‍යාපාර කාර්ය සාධනය: ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ පර්යේෂණාත්මක විමර්ශනයක්	මයා	ආර්.වී.එස්. පී.කේ.	රණතුංග	මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත්, මහාචාර්ය ආර්.ජී.එන්. මීගම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 03 වන උපාධිධාරී සමුළුව සමඟ සම්බන්ධව 10 වන වාර්ෂික පර්යේෂණ සැසිය 2021

කතෘවරයෙකු ලෙස ප්‍රකාශයට පත් කළ පොත්

පොතේ මාතෘකාව	ප්‍රධාන කතෘගේ නම		
	පූජ්‍ය/ මයා/ මිය/ මෙය	මුලකුරු	අවසාන නාමය
දත්ත සමුදා නිර්මාණය කිරීමේ මූලික කරුණු	මයා	එන්.ජේ.එම්.	සිල්වා

3.3 ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය



3.3.1 කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ	ඩබ්ලිව්.ඒ. ලලිත් රෝහණ
උපදේශකවරුන්	බී.කේ. සමන්තා ප්‍රින්සි ලාලනී
	ජී.එස්.කේ. බෝපිටිය
	පී.ඩී.ඩී.අයි. ගුණතිලක

3.3.2 2020 වාර්ෂික වැඩසටහන

2020 වර්ෂය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී. රට තුළ පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය පැතිරීම හේතුවෙන් මෙම ක්‍රියාකාරකම් නොපැවැත්වූ අතර විශ්වවිද්‍යාලය සහභාගිවීමට නියමිතව තිබූ අංග සඳහා සහභාගිවීමට නොහැකි විය.

මාසය	සංවිධානය කරන ලද වැඩසටහන	ස්ථානය
ජනවාරි	පුහුණු සැසි	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පුහුණු තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	සියලුම ක්‍රීඩා සඳහා පුහුණු සැසි	-
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	ජ්‍යෙෂ්ඨ ජාතික පැසිපන්දු සහ හොකී තරඟාවලිය	-
	ලෝක විශ්වවිද්‍යාල මාර්ග ධාවන ශූරතාවලිය සඳහා මූලික තේරීම්	පේරාදෙණිය
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	සියලුම ක්‍රීඩා සඳහා සුභද තරඟ	-
	නවකයින්ගේ ක්‍රීඩා උළෙල	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	අන්තර් විශ්වවිද්‍යාල බර ඉසිලීමේ තරඟාවලිය (ගැහැණු)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	අන්තර්ජාතික ආරාධිත වෙස් තරඟාවලිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	සත් සාමාජික තරඟාවලිය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය / COL/MOR
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	වර්ණ රාත්‍රිය	2019
පෙබරවාරි	අන්තර් කණ්ඩායම් තරඟාවලි (සියලුම ක්‍රීඩා සඳහා)	-
	අන්තර් පීඨ ක්‍රීඩා උළෙල	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පුහුණු සැසි (සියලුම ක්‍රීඩා සඳහා)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	නවකයින්ගේ ක්‍රීඩා උළෙල	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	නායක සහ උපනායක සඳහා වැඩමුළුව	-
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	සුභද තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීමේ වැඩසටහන	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	ආරාධිත තරඟාවලියක් සංවිධානය කිරීම (සියලුම ක්‍රීඩා)	-
	GS හමුව	බලංගොඩ
	කොට්ඨාස තරඟාවලිය	-
	ඌවට එරෙහිව සබ්‍රා බිග් මැච් (රග්බි)	-
	කරාතේ ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මාසය	සංවිධානය කරන ලද වැඩසටහන	ස්ථානය
මාර්තු	පුහුණු සැසි	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	අන්තර් පීඨ ක්‍රීඩා උළෙල	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	දිස්ත්‍රික් ක්‍රීඩා උළෙල	රත්නපුර
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	සුහද තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	විවෘත සහ පාසල් ආරාධිත වෙස් තරඟාවලිය පැවැත්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	අන්තර් ශිෂ්‍ය ශ්‍රේණිගත කිරීමේ තරඟාවලිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	රට හරහා ලෝක විශ්වවිද්‍යාල ශූරතාවය	-
	ආසියානු විශ්වවිද්‍යාල හොකී තරඟාවලිය	-
	ලෝක විශ්වවිද්‍යාල ශූරතාවය සඳහා මූලික තේරීම්	කොළඹ විශ්වවිද්‍යාලය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	අන්තර පීඨ නවකයින්ගේ ක්‍රීඩා	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
අප්‍රේල්	පුහුණු සැසි (සියලුම ක්‍රීඩා සඳහා)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	සුහද තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	කාර්ය මණ්ඩල බැඩ්මින්ටන් තරඟාවලිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා නායකයින් සහ උප නායකයින් සඳහා වැඩමුළු	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	අන්තර්ජාතික අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල මෝරා කුසලාන තරඟාවලිය	මොරටුව විශ්වවිද්‍යාලය
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල පිහිනුම් ශූරතාවලිය (KEL/COL/PERA/SUSL)	කොළඹ
	කොට්ඨාස තරඟ	-
	ලෝක විශ්වවිද්‍යාල මූලික තේරීම්	කොළඹ විශ්වවිද්‍යාලය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
	රට පුරා ලෝක විශ්වවිද්‍යාල තරඟාවලිය	-
	විශේෂ පිහිනුම් පුහුණු කඳවුර	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය හෝ මොරටුව විශ්වවිද්‍යාලය
මැයි	පුහුණු සැසි	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	මිත්‍රත්ව තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-

මාසය	සංවිධානය කරන ලද වැඩසටහන	ස්ථානය
මැයි	පුහුණු තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලිය සංවිධානය කිරීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පළාත් ක්‍රීඩා උළෙල	කෑගල්ල
	අන්තර් විශ්වවිද්‍යාල රග්බි සහ ක්‍රිකට් තරඟාවලිය	-
	කොට්ඨාස තරඟ (ක්‍රිකට්, රග්බි)	-
	සය සමාජික තරඟාවලි (ක්‍රිකට්)	-
	ලෝක විශ්වවිද්‍යාල මූලික තේරීම්	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
ජූනි	පුහුණු සැසි	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	මිත්‍රත්ව (සියලුම ක්‍රීඩා සඳහා)	-
	පුහුණු තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	ගෘහස්ථ අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා සඳහා විශේෂ පුහුණු සැසි	කොළඹ / පේරාදෙණිය
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සංවිධානය කිරීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	කොට්ඨාස තරඟ (ක්‍රිකට්, රග්බි)	-
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
ජූලි	පුහුණු සැසි (සියලුම ක්‍රීඩා සඳහා)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	මිත්‍රත්ව තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	පුහුණු තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	සත් සාමාජික තරඟ (රගර්)	මොරටුව විශ්වවිද්‍යාලය /කොළඹ විශ්වවිද්‍යාලය
	ලෝක විශ්වවිද්‍යාල ශූරතාවය සඳහා තෝරා ගත් සිසුන් සඳහා පුහුණුවීම්	-
	පුහුණු කඳවුරු මලල ක්‍රීඩා සඳහා දින තුනක විශේෂ පුහුණු කඳවුර	දියගම හෝ සුගතදාස ක්‍රීඩාංගනය
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	ආරාධිත බැඩ්මින්ටන් ශූරතා - කාර්ය මණ්ඩල	කොළඹ විශ්වවිද්‍යාලය
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලිය සංවිධානය කිරීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	-
	කොට්ඨාස තරඟ (ක්‍රිකට්, රග්බි)	රත්නපුර
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මාසය	සංවිධානය කරන ලද වැඩසටහන	ස්ථානය
අගෝස්තු	පුහුණු සැසි (සියලුම ක්‍රීඩා සඳහා)	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
	මිත්‍රත්ව තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	පුහුණු තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	-
	"Anatomy Carpow" විවෘත වෙස් තරඟාවලිය	මහනුවර
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි (සංවිධානය කිරීම සහ සහභාගි වීම)	ස්ථිර නැත
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	සය සාමාජික / සත් සාමාජික / 3x3 තරඟාවලි	-
	ආසියානු විශ්වවිද්‍යාල වෙරළ අත්පන්දු ශූරතාවය	-
	මෝරා කින්ග්ස් අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේ ශූරතාවය	මොරටුව විශ්වවිද්‍යාලය
	ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා (SLUG)	-
	ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා	-
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
සැප්තැම්බර්	පුහුණු සැසි	කොළඹ විශ්වවිද්‍යාලය
	මිත්‍රත්ව තරඟ (සියලුම ක්‍රීඩා සඳහා)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හෝ වෙනත් විශ්වවිද්‍යාලයක
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	සය සාමාජික / සත් සාමාජික /3x3 තරඟාවලි (පැසිපන්දු, රගර්, පාපන්දු, ක්‍රිකට්)	-
	ආරාධිත අන්ර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි	රුහුණු විශ්වවිද්‍යාලය
	විවෘත සමාජ දැල් පන්දු තරඟාවලි	කොළඹ විශ්වවිද්‍යාලය
	සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ වැඩමුළුව	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
ඔක්තොම්බර්	පුහුණු සැසිය	උඩවළව
	පුහුණු කඳවුරු	-
	ආරාධිත ශ්‍රේණිගත කිරීමේ වෙස් තරඟාවලිය	-
	සය සාමාජික / සත් සාමාජික/ 3x3 තරඟාවලි (පැසිපන්දු, රගර්, පාපන්දු, ක්‍රිකට්)	-
	ආසියානු විශ්වවිද්‍යාල ශූරතාවය	-
	පිහිනුම් ජීවිත ආරක්ෂක සේවා කඳවුර සංවිධානය කිරීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	SLUSA රැස්වීම	කොළඹ විශ්වවිද්‍යාලය
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
නොවැම්බර්	පුහුණු සැසිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය / කොළඹ
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	3x3 තරඟාවලි	-
	ජාතික ඔලිම්පික් පුහුණු අධ්‍යාපනික ආයතන වැඩසටහන	බණ්ඩාරවෙල

මාසය	සංවිධානය කරන ලද වැඩසටහන	ස්ථානය
නොවැම්බර්	ලෝක විශ්වවිද්‍යාල ශූරතාවය	-
	සත් සාමාජික තරඟාවලිය	රත්නපුර
	කොට්ඨාස තරඟාවලි	-
	SLUSA සම්මාන	කොළඹ
	ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ වෙනත් ආරාධිත තරඟාවලි	-
	SLUSA රැස්වීම	කොළඹ
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
දෙසැම්බර්	පුහුණු සැසිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	පුහුණු කඳවුරු (සියලුම ක්‍රීඩා සඳහා)	-
	සිංගප්පූරු වෙස් සමාජ විවෘත තරඟාවලිය (ශ්‍රී ලංකාව)	-
	ආසියානු විශ්වවිද්‍යාල ක්‍රීඩා	-
	විදේශීය තරඟාවලිය	-
	අන්තර්ජාතික අන්තර් විශ්වවිද්‍යාල වෙස් ශූරතාවය (විදේශීය)	-
	ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය (කරාතේ 3)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
	අන්තර්ජාතික කරාතේ ශූරතාවය	ඉන්දියාව
	නායකයා සහ උප නායකයා සඳහා වැඩමුළුව	-
	ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේ වැඩසටහන	-
	"බුද්ධි" අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේ වෙස් ශූරතාවය	-
	SLUSA රැස්වීම	කොළඹ
	ක්‍රීඩා උපදේශක මණ්ඩල රැස්වීම	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

4. අධ්‍යයන මධ්‍යස්ථාන

4.1 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

4.1.1 කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ	-	ආචාර්ය එස්. මලවිපතිරණ ව්‍යවහාරික විද්‍යා පීඨය
වෘත්තීය උපදේශක	-	දීපාල් විජේසේකර

4.1.2 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

පෞර්ෂත්වය වැඩිදියුණු කිරීමේ වැඩසටහන

වර්ෂයේ පළමු මාර්ගගත වැඩසටහන (webinar) ලෙස මෙම වැඩසටහන බොහෝ දුරට භූ විඥාපන පීඨයේ තුන් වන වසරේ සහ අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා සාර්ථකව පවත්වන ලදී. වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වූයේ වෘත්තීය ජීවිතය සහ සහයෝගීතා අංශයේ අවශ්‍යතා සඳහා විශේෂ සැලකිල්ලක් දක්වමින් පුද්ගලික වැඩසටහන්කරණය සහ සමාජ ආචාර විධි පිළිබඳ දැනුවත්භාවයෙන් උපාධි අපේක්ෂකයින් සවිබල ගැන්වීමයි. මෙම මාර්ගගත වැඩසටහන පීඨයේ 100 කට ආසන්න උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් 2020 මැයි 05 වන දින ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල් විජේසේකර මහතා විසින් පවත්වන ලදී.

වෘත්තීය දැක්ම සංවර්ධනය කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන භූ විඥාපන පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා මාර්ගගත වැඩසටහනක් ලෙස පවත්වන ලදී. වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වූයේ කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් නිවසේ රැඳී සිටින කාල සීමාව තුළ උපාධි අපේක්ෂකයින්ගේ අවධානය සහ ගම්‍යතාවය පවත්වා ගැනීමයි. මෙම මාර්ගගත වැඩසටහනේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායම පීඨයේ පළමු වසර සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් වුව ද, මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා වැඩසටහනට සහභාගි වීම සඳහා ආරාධනා කරන ලදී. මෙම වැඩසටහන 2020 මැයි 19 වන දින ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා සාර්ථකව පැවැත්වුණු අතර එය පීඨයේ ඉල්ලීම මත ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල් විජේසේකර මහතා විසින් පවත්වන ලදී.

වාර්තා ගොඩනැගීමේ වැඩසටහන

මෙය විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද ටේලර් මේඩ් වැඩසටහනකි. මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථ වූයේ ප්‍රේක්ෂකයින් අතර වාර්තා ගොඩනැගීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සන්නිවේදන කුසලතා පිළිබඳ දැනුවත්භාවයෙන් යුක්තව ඉලක්කගත කණ්ඩායම සවිබල ගැන්වීම. කේවළ සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් වලින් පොහොසත් වූ වැඩමුළුවක් ලෙස වැඩසටහන පැවැත්විණි. මෙය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල්

විජේසේකර මහතා විසින් 2020 අගෝස්තු 12 වන දින ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සංවර්ධන මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

ජීව දත්ත අයදුම්පත් සකස් කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන කෘෂි විද්‍යා පීඨයේ අවසන් වසර උපාධි අපේක්ෂකයින් සඳහා පැවැත්විණි. වැඩසටහනේ පරමාර්ථය වූයේ රැකියා ලෝකයේ අවස්ථාවලට අයදුම් කිරීම සඳහා ජීව දත්ත අයදුම්පත් සකස් කිරීම පිළිබඳ කුසලතා සමඟ ප්‍රෙක්ෂකයින් සූදානම් කිරීම. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල් විජේසේකර මහතා විසින් උපාධි අපේක්ෂකයින් 60 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් 2020 නොවැම්බර් 29 වන දින පෙ.ව. 10.00 සිට ප.ව. 1.00 දක්වා මාර්ගගත වේදිකාවක මෙම වැඩසටහන සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහනේ කොටසක් ලෙස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සහභාගීවූ අය සඳහා වැඩිදුර වර්ධනයන් සඳහා තමන්ගේ ජීව දත්ත අයදුම්පත් (CVs) ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන ලදී.

වෘත්තීය දැක්ම සංවර්ධනය කිරීමේ වැඩසටහන

මෙම මාර්ගගත වැඩසටහන ද පවත්වනු ලැබුවේ කෘෂි විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහාය. මෙම වැඩසටහනේ අරමුණ වූයේ පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් අතර යහපත් වෘත්තීය අභිප්‍රායක් වර්ධනය කිරීමයි. මෙම වැඩසටහන 2020 දෙසැම්බර් 10 වන දින පෙ.ව. 10.00 සිට ප.ව. 1.00 දක්වා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල් විජේසේකර මහතා විසින් සාර්ථකව පවත්වන ලද අතර කෘෂි විද්‍යා පීඨය සඳහා පවත්වන ලද වැඩසටහන් දෙකම පීඨයේ ඉල්ලීම පරිදි සිදු කරන ලදී.

“නව ආරම්භය සඳහා දැක්ම” නම් වූ වැඩසටහන් මාලාව

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ අධ්‍යක්ෂගේ සංකල්පයක් ලෙස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ‘‘නව ආරම්භය සඳහා දැක්ම’’ යන මාතෘකාව යටතේ වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන් මාලාවේ ප්‍රධාන විෂය පථය වූයේ පළමු වසරේ උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ පළමු ආරම්භයේ සිටම යහපත් වෘත්තීය නැඹුරුවක් සහිත විශ්වවිද්‍යාල ජීවිතයක් සඳහා ශක්තිමත් කිරීමයි. මෙම වැඩසටහන් මාලාවේ පළමු පියවර ලෙස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් තාක්ෂණ පීඨය සඳහා 2020 දෙසැම්බර් 10 වන දින පෙ.ව. 10.00 සිට මධ්‍යයනය 12.00 දක්වා පීඨයේ ඉතා සතුටුදායක සහභාගීත්වයක් සහිතව මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී.

මෙම වැඩසටහන් මාලාවේ දෙවන පියවර ලෙස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා 2020 දෙසැම්බර් 30 වන දින පෙ.ව. 10.00 සිට මධ්‍යයනය 12.00 දක්වා සාර්ථක වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල් විජේසේකර මහතා විසින් මෙහෙයවන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලය සඳහා ‘‘ගමන සඳහා දැක්ම’’ වැඩසටහන

කොළඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ ආරාධනය මත ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා 2020 දෙසැම්බර් 22 වන දින පෙ.ව. 10.00 සිට මධ්‍යයනය 12.00 දක්වා මාර්ගගත වැඩසටහනක් පවත්වන ලදී. වැඩසටහනේ පරමාර්ථය වූයේ අවධානය යොමු කළ වෘත්තීය

අභිප්‍රාය ගොඩනැගීම සහ උපාධි අපේක්ෂකයින් අතර රැකියා ලෝකය පිළිබඳ යාවත්කාලීන දැනුවත්භාවය වැඩිදියුණු කිරීමයි. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මෙම අවස්ථාව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයට ලැබුණු ත්‍යාගයක් ලෙස සලකනු ලබයි. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක, දීපාල් විජේසේකර මහතා විසින් වැඩසටහන පවත්වන ලදී.

ගබාගත් ජයග්‍රහණය

ඉහත වැඩසටහන් වලට අමතරව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) සමඟ සහයෝගීව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් පවත්වන ලද ‘‘උපාධිධාරී ව්‍යවසායක උදානය’’ නම් වූ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් යටතේ කෘෂි විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය සහ සමාජීය විද්‍යා භාෂා පීඨය නියෝජනය කරමින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් හතර දෙනෙක් (04) තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ව්‍යාපාර සංවර්ධන ප්‍රදාන ලබා ගත් බව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සතුටින් ප්‍රකාශ කර සිටී. මෙම වැඩසටහනේ සම්මාන ප්‍රදානෝත්සවය 2020 දෙසැම්බර් 08 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

4.2 විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

4.2.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බාහිර ඒකකයේ ඉතිහාසය, විශ්වවිද්‍යාලය ආරම්භ වීමට ද පෙර, එනම් 1992 වර්ෂයේ දී සබරගමුව අනුබද්ධ විශ්වවිද්‍යාලයේ ආරම්භය තෙක් දිව යන්නකි.

මුල් කාලීනව මෙම ඒකකය ප්‍රදේශයේ තරුණ පිරිසට තෝරාගත් ක්ෂේත්‍ර සඳහා රැකියාභිමුඛ සහතිකපත්‍ර පාඨමාලා සැපයීම අරමුණු කරගත් ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය.

1996 වර්ෂයේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරුව, ප්‍රදේශයේ ජනතාවට පුළුල් ක්ෂේත්‍රයක සහාය සහ මාර්ගෝපදේශනය සැපයීමේ අපේක්ෂාවෙන් මෙම මධ්‍යස්ථානය 2000 වර්ෂයේ දී බාහිර උපාධි පාඨමාලා හා ව්‍යාප්ති සේවා ඒකකය (EDPESU) ලෙස නම් කරන ලද අතර ඉන්පසුව 2015 වර්ෂයේ සිට විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (CODL) ලෙස නැවත නම් කරන ලදී.

4.2.2 කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	-	උපකුලපති - සභාපති (2020 නොවැම්බර් 02 සිට)
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී ඥානපාල	-	වැඩබලන උපකුපති - සභාපති (2020 මැයි 19 සිට 2020 නොවැම්බර් 01 දක්වා)
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත	-	උපකුලපති - සභාපති (2020 මැයි 18 දක්වා)
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු	-	පීඨාධිපති - සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 13 සිට)
ආචාර්ය ඩබ්ලිව්. මනෝජ් ආරියරත්න	-	පීඨාධිපති - සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 12 දක්වා)
මහාචාර්ය එම්.එම්.පී. සුමිත්	-	පීඨාධිපති - කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	-	පීඨාධිපති - කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය ආර්.එස්. සබරගමුව	-	පීඨාධිපති - ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 03 සිට)
මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	-	පීඨාධිපති - ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 02 දක්වා)
කමල් ගුණවර්ධන	-	වැඩබලන ලේඛකාධිකාරී (2020 මාර්තු 03 සිට)
වී.ඩී. කිත්සිරි	-	ලේඛකාධිකාරී (2020 මාර්තු 29 දක්වා)
ඩබ්ලිව්.ඒ.එම්.පී. සේනාධීර	-	වැඩබලන මූල්‍යාධිකාරී
ඩී. ජාසිංහ	-	අධ්‍යක්ෂ - විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (කමිටු ලේකම්)
පූජ්‍ය ජී. බුද්ධානන්ද හිමි	-	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික

එච්.ඩබ්ලිව්. ගුණදාස	-	පාලක සභා සාමාජික
ආචාර්ය පී.කේ. දිසානායක	-	සභාපති - අධ්‍යයන මණ්ඩලය, කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය ඩී.ඒ.අයි. දයාරත්න	-	සභාපති - අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ අධ්‍යයන පීඨය
එස්.කේ. හඳරාගම	-	සභාපති - අධ්‍යයන මණ්ඩලය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ආචාර්ය බී.ටී.ජී.එස්. කුමාර	-	සභාපති - අධ්‍යයන මණ්ඩලය, ව්‍යවහාරික විද්‍යා පීඨය
එස්.එන්. ප්‍රියදර්ශනී	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
එන්.පී. විජේන්ද්‍ර	-	සහකාර මූල්‍යාධිකාරී - විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

4.2.3 ස්ථිර කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	-	01
සහකාර මූල්‍යාධිකාරී	-	01
කළමනාකරණ සහකාර	-	05
පෙර පාසල් සහායක	-	01
යන්ත්‍ර ක්‍රියාකරු	-	01
වැඩ සහායක	-	03

4.2.4 උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා

1. ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව
2. සමූපකාර ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
3. ඉංග්‍රීසි ඩිප්ලෝමාව
4. පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව
5. ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව
6. සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමාව
7. මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව
8. මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමාව
9. ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව
10. පරිගණක හා කොරකුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව
11. වෙබ් පාදක යෙදුම් සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
12. ජාවා වැඩසටහන් නිර්මාණකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
13. පරිගණක ආශ්‍රිත නිර්මාණකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

4.2.5 බාහිර පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය

අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වර්ෂය	නව බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2020)			ශිෂ්‍ය ලියාපදිංචිය ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව) (2020 දෙසැම්බර් 31 දිනට)		
		පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
උසස් ඩිප්ලෝමා පාඨමාලා							
ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව	2018	-	-	-	11	44	55
සමූපකාර ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	2018	-	-	-	14	27	41
ඩිප්ලෝමා පාඨමාලා							
ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව	2018	-	-	-	31	23	54
	2019	-	-	-	39	46	85
සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමාව	2019				7	6	13
	2020	9	9	18	9	9	18
මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව	2017	-	-	-	10	3	13
ඉංග්‍රීසි ඩිප්ලෝමාව	2019	-	-	-	86	391	477
පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව	2019	-	-	-		28	28
මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමාව	2019/II	-	-	-	62	28	90
සහතිකපත්‍ර පාඨමාලා							
ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව	2019/II	-	-	-	324	612	936
	2020/I	110	227	337	110	227	337
වෙබ් පාදක යෙදුම් සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	2019	-	-	-	23	09	32
ජාවා වැඩසටහන් නිර්මාණකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	2019	-	--	-	17	07	24
පරිගණක හා කොරකුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව	2019	-	-	-	24	96	120
පරිගණක ආශ්‍රිත නිර්මාණකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	2019	-	-	-	18	08	26

4.3 ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය

4.3.1 ඉතිහාසය

ආදිවාසී ජන අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කටයුතු හැදෑරීමට උනන්දුවක් දක්වන අය සඳහා පහසුකම් සැලසීමේ අරමුණෙන්, සබරගමුව විශ්වවිද්‍යාලයේ ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය 2006 දෙසැම්බර් 18 වන දින පිහිටුවන ලදී. ඒ අනුව, පශ්චාද් උපාධි ඩිප්ලෝමා, දර්ශනපති සහ ආචාර්ය උපාධි යන පාඨමාලා තුන මෙම අධ්‍යයන කේන්ද්‍රය මඟින් හඳුන්වා දෙන ලදී. ඕනෑම ක්ෂේත්‍රයක අපේක්ෂකයින්ට ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම රටක ජන අධ්‍යයනයට අදාළව ඉහත පාඨමාලා හැදෑරීමට මෙම කේන්ද්‍රය මඟින් දිරි ගන්වනු ලැබේ. සිසුන් සංඛ්‍යාව අවුරුදු පතා ඉහළ නංවා ගැනීමත්, නියමිත කාලය තුළ ම ප්‍රමාදයකින් තොරව අදාළ පර්යේෂණ උපාධි සම්පූර්ණ කර ගැනීම පිණිස අපේක්ෂකයින් අභිප්‍රේරණය කිරීම කේන්ද්‍රයේ අභිමතාර්ථය යි.

4.3.2 කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ	-	ආචාර්ය ඩබ්ලිව්.එම්.ජේ. වෙල්ගම සමාජීය විද්‍යා හා භාෂා පීඨය

4.3.3 2020 වර්ෂයේ ජයග්‍රහණ

- දර්ශනපති නිබන්ධන පහක් ඇගයීම
- ආචාර්ය උපාධි නිබන්ධනයක් ඇගයීම
- පර්යේෂණ ක්‍රමවේද පාඨමාලාව සහ 2019 කණ්ඩායම සඳහා විභාගය පැවැත්වීම.
- පර්යේෂණ හතක් ඇගයීම (දර්ශනපති / ආචාර්ය උපාධිය)
- පර්යේෂණ යෝජනාවලි හතක් ඉදිරිපත් කිරීම (දර්ශනපති / ආචාර්ය උපාධිය)
- අඛ්‍යාන විද්‍යුත් සඟරාවේ එක් වෙළුමක් නිකුත් කිරීම
- 2020 වර්ෂයේ ජනවාරි මස දර්ශනපති / ආචාර්ය උපාධි 2019 කණ්ඩායම සඳහා නව අයදුම්කරුවන් ලියාපදිංචි වීම
- පර්යේෂණ ක්‍රමවේද පාඨමාලාව සම්පූර්ණ කිරීම සහ 2019 කණ්ඩායම සඳහා විභාගය පැවැත්වීම.
- 2020 කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවීමට දැන්වීමක් පල කරන ලද අතර ඒ සඳහා කේන්ද්‍රය වෙත අයදුම්පත් 16 ක් ලැබිණි.
- 2020 කණ්ඩායම සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සම්පූර්ණ කිරීම.

4.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

4.4.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල පද්ධතිය තුල සිටින ප්‍රජාවගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම මඟින් මිත්‍රශීලී පරිසරයක් තුල කාර්ය මණ්ඩලයෙන් කාර්යක්ෂම සහ ඵලදායී සේවයක් ලබා ගැනීමටත් ජාතික සංවර්ධනයට දායකත්වයක් සැපයීමට අරමුණු කර ඇත. ඒ සඳහා මධ්‍යස්ථානය මඟින් පුහුණු වැඩ සටහන්, වැඩමුළු සහ වෙනත් ක්‍රියාකාරකම් ඉහළ කළමනාකරණයට, අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විධායක හා කාර්ය මණ්ඩල කාණ්ඩවල නිලධාරීන්ට, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට, කාර්මික නිලධාරීන්ට සහ වෙනත් අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ නැංවීම පිණිස සංවිධානය කරනු ලබයි.

4.4.2 කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පැවති මධ්‍යස්ථාන අතර දෙවන ස්ථරයේ මධ්‍යස්ථානයක් ලෙස වර්ගීකරණය කර ඇත. එමනිසා සමායෝජකයින් සඳහා අනුමත පිරිස් ප්‍රතිපාදන නියම කර නැත. කෙසේ වුවත්, අර්ධ කාලීන අධ්‍යක්ෂවරයකු සහ අර්ධ කාලීන වැඩ සටහන් කළමනාකරුවකු මෙම මධ්‍යස්ථානයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා පත් කර ඇත.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සෘජුව ම උපකුලපතිවරයාගේ විෂය පථයට යටත් වන අතර එය අර්ධකාලීන අධ්‍යක්ෂවරයෙකු විසින් කළමනාකරණය කරනු ලබයි.

අධ්‍යක්ෂ - මහාචාර්ය අරුණ ශාන්තආරච්චි
සමාජීය විද්‍යා හා භාෂා පීඨය
(2020 ජූනි 02 සිට)

ආචාර්ය එස්.ටී.සී. අමරසිංහ
කෘෂි විද්‍යා පීඨය
(2020 ජූනි 01 දක්වා)

වැඩසටහන් කළමනාකරු - වයි.එස්. චන්ද්‍රසේකර
සහකාර ලේඛකාධිකාරී / සමාජීය විද්‍යා හා භාෂා පීඨය
(2020 අගෝස්තු 11 සිට)

එච්.එච්.කේ.එන්. ධර්මසිරි
සහකාර ලේඛකාධිකාරී / භූ විඥාපන පීඨය
(2020 ජූලි 31 දක්වා)

ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික ශිල්පියකු මධ්‍යස්ථානයට පත් කිරීමට නියමිතව ඇත.

4.4.3 කළමනාකරණ කමිටුව

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක - උපකුලපති - සභාපති

(2020 නොවැම්බර් 02 සිට)

මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	-	වැඩබලන උපකුපති - සභාපති (2020 මැයි 19 සිට 2020 නොවැම්බර් 01 දක්වා)
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත	-	උපකුලපති - සභාපති (2020 මැයි 18 දක්වා)
මහාචාර්ය අරුණ ශාන්තආරච්චි	-	අධ්‍යක්ෂ / කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය / කළමනාකරණ මණ්ඩල ලේකම් (2020 ජූනි 02 සිට)
ආචාර්ය එස්.ටී.සී. අමරසිංහ	-	අධ්‍යක්ෂ / කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය /කළමනාකරණ මණ්ඩල ලේකම් (2020 ජූනි 01 දක්වා)
මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත්	-	පීඨාධිපති / පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එම්.පී. සුමිත්	-	පීඨාධිපති / කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය ආර්.එස්. සබරගමුව	-	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 03 සිට)
මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රතනායක	-	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 02 දක්වා)
ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න	-	පීඨාධිපති / භූ විඥාපන පීඨය
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	-	පීඨාධිපති / කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න	-	පීඨාධිපති / වෛද්‍ය පීඨය
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු	-	පීඨාධිපති / සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 13 සිට)
ආචාර්ය ඩබ්ලිව්. මනෝජ් ආරියරත්න	-	පීඨාධිපති / සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 12 දක්වා)
ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත	-	පීඨාධිපති / තාක්ෂණ පීඨය
කමල් ගුණවර්ධන	-	වැඩබලන ලේඛකාධිකාරී (2020 මාර්තු 30 සිට)
වී.ඩී. කිත්සිරි	-	ලේඛකාධිකාරී (2020 මාර්තු 29 දක්වා)
ටී.එන්. නෙයිසූරි	-	පුස්තකාලයාධිපතිනී
ඩබ්ලිව්.ඒ.එම්.පී. සේනාධීර	-	වැඩබලන මූල්‍යාධිකාරී
මහාචාර්ය එම්.එස්.එම්. අස්ලම්	-	සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය / කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය ඊ.පී.එන්. උදයකුමාර	-	ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය / ව්‍යවහාරික විද්‍යා පීඨය
වෛද්‍ය අනෝජා රොද්‍රිගෝ	-	පාලක සභා සාමාජික
විෂාකා එල්ළාවල	-	පාලක සභා සාමාජික

4.4.4 වැඩසටහන් කමිටුව

මහාචාර්ය අරුණ ශාන්තආරච්චි	-	අධ්‍යක්ෂ / කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය - කළමනාකරණ කමිටු ලේකම් (2020 ජූනි 02 සිට)

ආචාර්ය එස්.ටී.සී. අමරසිංහ	-	අධ්‍යක්ෂ / කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය - කළමනාකරණ කමිටු ලේකම් (2020 ජූනි 01 දක්වා)
වයි.එස්. චන්ද්‍රසේකර	-	වැඩසටහන් කළමනාකර - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ලේකම් (2020 අගෝස්තු 11 සිට)
එච්.එච්.කේ.එන්. ධර්මසිරි	-	වැඩසටහන් කළමනාකරු - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ලේකම් (2020 ජූලි 31 දක්වා)
මහාචාර්ය ලාල් පී. විදාන ආරච්චි	-	කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය ජී.එම්.එල්.පී. අපොන්සු	-	ව්‍යවහාරික විද්‍යා පීඨය
ජේ.ඒ.එස්. ජයකොඩි	-	භූ විඥාපන පීඨය
සී.එන්.ආර්. විජේසුන්දර	-	කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය අරුණ ශාන්තආරච්චි	-	සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ආචාර්ය කේ.ආර්. කොස්වත්තගේ	-	තාක්ෂණ පීඨය
ආචාර්ය අමල් වගීෂ	-	වෛද්‍ය පීඨය
ආචාර්ය ජී.ඩී.කේ. කුමාර	-	කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය එච්.කේ.එස්. ප්‍රේමදාස	-	පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
මහාචාර්ය එස්. වසන්තප්‍රියන්	-	අධ්‍යක්ෂ / පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
ආචාර්ය කේ.එස්.එන්. ප්‍රසංගනී	-	අධ්‍යයනාංශ ප්‍රධාන / ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය
ඩී. ජාසිංහ	-	අධ්‍යක්ෂ / විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
ආචාර්ය එස්. මලවිපතිරණ	-	අධ්‍යක්ෂ / වෘත්තීය මාරගෝපදේශන ඒකකය

4.4.5 2020 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළු

වැඩමුළුව පවත්වන ලද දිනය	වැඩමුළුවේ නම	සම්පත්දායකයාගේ නම	ඉලක්ක කළ කණ්ඩායම
2020 ජනවාරි 03	උපාය මාර්ග සැලසුම් සහ කළමනාකරණය	මහාචාර්ය කේ.ඩී.ආර්. රේණුක සිල්වා	2018 / 2019 ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳ ප්‍රේරක පුහුණු වැඩසටහන සඳහා තෝරාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය
2020 ජනවාරි 31	ගුණාත්මක විශ්වවිද්‍යාලයක් සඳහා පෙළ ගැසීම පිළිබඳ වැඩමුළුව	ආචාර්ය චාලින්ද බෙනරගම	
2020 ජූලි 28 සහ 29	මාර්ගගත් ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම	මහාචාර්ය රොෂාන් ජී. රේගල් ආචාර්ය චාලින්ද බෙනරගම ආචාර්ය අසිත බණ්ඩාරනායක	අධ්‍යයන කාර්ය මණ්ඩලය
2020 අගෝස්තු 24	යතුරු ලියනය පිළිබඳ පුහුණුව	කේ.එල්.එස්.එන්. බණ්ඩාර	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
2020 ඔක්තොම්බර් 10	විශ්වවිද්‍යාල ගුරුවරයෙක් ලෙස දිශානතිය	ආචාර්ය චාලින්ද බෙනරගම	2020 / 2021 ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳ ප්‍රේරක පුහුණු වැඩසටහන සඳහා තෝරාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය
2020 සැප්තැම්බර් 18 සහ 25	පුද්ගලික සංවර්ධනය සහ උපදේශනය	ආචාර්ය ඩබ්ලිව්.එම්.ජේ. වෙල්ගම	-
2020 ඔක්තොම්බර් 02 හා 23 සහ 2020 නොවැම්බර් 06	ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රමවේද	මහාචාර්ය එම්.එම්.පී. සුමිත්	-

4.5 පර්යේෂණ හා දැනුම ව්‍යාපත් කිරීමේ මධ්‍යස්ථානය

4.5.1 හැඳින්වීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ මධ්‍යස්ථානය යනු විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කර්ය මණ්ඩලය අතර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයින් සඳහා පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට සහ ප්‍රජාවට දැනුම බෙදා හැරීමට අවස්ථාව සලසා දෙන ස්ථානයකි. ඉගැන්වීමට අමතරව, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය උසස් පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් නව දැනුම ගවේෂණය කිරීමත් ජාතික සංවර්ධනය උදෙසා විවිධ ක්‍රියාකාරකම් තුළින් ප්‍රජාවට එම දැනුම ලබා දීමත් සිදු කරයි. එවැනි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ භූමිකාවන්හි වැදගත්කම වටහා ගනිමින්, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ කටයුතු වැඩි දියුණු කිරීමට සහ ප්‍රජාවට එමඟින් සේවය කිරීම සඳහා අවශ්‍ය පියවරයන් දැනටමත් නිර්මාණය කර ඇත. එමනිසා, කාර්යක්ෂම සේවාවක් සඳහා දැනට සිදු කෙරෙමින් පවතින ක්‍රියාකාරකම් විධිමත් කිරීමට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ මධ්‍යස්ථානයෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ දේශීය හා ජාත්‍යන්තර විද්‍යාත්මක රැස්වීම් සහ විශ්වවිද්‍යාලය සහ ප්‍රජාව සහයෝගීව සිදු කරනු ලබන වැඩසටහන් හරහා උසස් තත්ත්වයේ පර්යේෂණ තුළින් සහ එවැනි පර්යේෂණ දැනුම ප්‍රජාවට බෙදා හැරීම තුළින් ජාතික සංවර්ධනයට දායක වීමට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහාය වීමයි.

4.5.2 ඉලක්ක

- ඉදිරි වර්ෂ 05 තුළ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පර්යේෂණ විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය ඉදිරි වර්ෂ 02 තුළ දී, අනාගතයේ දී ඇති විය හැකි යැයි අපේක්ෂා කළ හැකි ගැටළු සහ අභියෝග සඳහා උපායමාර්ගික විසඳුම් සහ නිපුණතා ලබා දිය හැකි ප්‍රමුඛතම ස්ථානයක් බවට පත් කිරීම
- විවිධ ආයතන වලින් ආයතනික හා පුද්ගල පර්යේෂණ ප්‍රදාන වලින් වැඩි ප්‍රතිශතයක් ලබා ගැනීම
- දේශීය, කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ගැටළු විසඳීමේ හා නිපුණතා ගොඩනැගීමේ ව්‍යාපෘති වැඩි සංඛ්‍යාවක් ලබා ගැනීම
- විශ්වවිද්‍යාලය ඉදිරි වර්ෂ 05 තුළ දී විශ්වවිද්‍යාල ශ්‍රේණිය 2000 දක්වා ඉහළ නැංවීම

4.5.3 ක්‍රියාකාරකම්

- පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම
- පර්යේෂණ නිමැවුම් දිරිමත් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම
- අභ්‍යන්තර පාර්ශවකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මාර්ග සහ අඩිතාලම සැපයීම
- දැනුම බෙදා හැරීම සඳහා නාලිකා සහ අවස්ථාවන් උත්පාදනය කිරීම
- ව්‍යවසාය සහ විශ්වවිද්‍යාල අලෙවිකරණයට සහාය වීම
- පාර්ශවකරුවන්ගේ අපේක්ෂිත අවශ්‍යතා සහ උවමනා සඳහා සහාය වීම

4.5.4 කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ	-	මහාචාර්ය එම්.එල්.එම්. චන්ද්‍රිකා දිසානායක කෘෂි විද්‍යා පීඨය
සංස්කාරක, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල ජර්නලය	-	මහාචාර්ය එම්. එෂාම් කෘෂි විද්‍යා පීඨය
සංස්කාරක, සිංහල ජර්නලය	-	ආචාර්ය ඩී.කේ. චම්පා ද සිල්වා සමාජීය විද්‍යා හා භාෂා පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල ජර්නලය	-	එච්.ආර්.එන්.එස්. බණ්ඩාර ව්‍යවහාරික විද්‍යා පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල සිංහල ජර්නලය	-	ආර්.සී. පල්ලියගුරුගේ සමාජීය විද්‍යා හා භාෂා පීඨය
සංස්කාරක, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල පුවත් පත්‍රිකාව	-	ආචාර්ය මංජුල විජේවික්‍රම ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
සභාපතිනිය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල සම්මන්ත්‍රණය	-	ආචාර්ය ඉනෝකා පී. කුඩවිදානගේ ව්‍යවහාරික විද්‍යා පීඨය
පිටපත් සංස්කාරක, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල පුවත් පත්‍රිකාව	-	මහේෂ් හපුගොඩ සමාජීය විද්‍යා හා භාෂා පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව	-	ආචාර්ය ආර්.කේ.සී. ජීවන්ති කෘෂි විද්‍යා පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව	-	සමීර පෙරේරා ව්‍යවහාරික විද්‍යා පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව	-	දිල්ෂාන් ජයතිලක භූ විඥාපන පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව	-	විතියලානි මුත්තුසාමි කළමනාකරණ අධ්‍යයන පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව	-	ආචාර්ය චාමලිකා වීරකෝන් වෛද්‍ය පීඨය
සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව	-	යූ.බී.එච්.එන්. පෙරේරා සමාජීය විද්‍යා හා භාෂා පීඨය

සම්බන්ධීකරණ සංස්කාරක, පුවත් පත්‍රිකාව - පබසර අත්තනායක
තාක්ෂණ පීඨය

4.5.5 2020 තුළ සිදු කළ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම්	කෙටි හැඳින්වීම
පුවත් පත්‍රිකාව ප්‍රකාශනය කිරීම	පුවත් පත්‍රිකාවේ වෙළුම 16, අංක III (2019, ජූලි - දෙසැම්බර්) සම්පූර්ණ කර ඇත පුවත් පත්‍රිකාවේ වෙළුම 17, අංක I (2020, ජනවාරි - ජූනි) සම්පූර්ණ කර ඇත *සටහන:විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2020 චක්‍රලේඛයට අනුව පුවත් පත්‍රිකාව මුද්‍රණය කිරීම නවත් වන ලදී.
වාර්ෂික පර්යේෂණ සැසිය පැවැත්වීම - 2020	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ භූ විඥාපන පීඨයේ දී 2020 දෙසැම්බර් 16 වන දින 2020 10 වන වාර්ෂික පර්යේෂණ සැසිය පැවැත්විණි. 2020 වාර්ෂික පර්යේෂණ සැසිය යනු විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය, පශ්චාද් උපාධි සිසුන් සහ උපාධි අපේක්ෂක සිසුන් විසින් සිදු කරන ලද මෑත කාලීන පර්යේෂණ පිළිබඳ අවබෝධයක් බෙදා ගැනීම සඳහා අවස්ථාව සලසන බහුවිද විද්වත් වේදිකාවකි. මෙම සම්මන්ත්‍රණය සංවිධානය කරන ලද්දේ පර්යේෂණ හා දැනුම ව්‍යාපත් කිරීමේ මධ්‍යස්ථානය (CRKD) විසිනි. 2020 වාර්ෂික පර්යේෂණ සැසිය විසින් කෘෂි විද්‍යාව, ව්‍යවහාරික විද්‍යාව, භූගෝල විද්‍යාව, කළමනාකරණ අධ්‍යයන, වෛද්‍ය විද්‍යාව සහ සමාජීය විද්‍යා හා භාෂා ඇතුළත් ශාස්ත්‍රීය විෂයයන්වල ප්‍රධාන ක්ෂේත්‍ර අනාවරණය කර ඇත. මෙම සැසිය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ 03 වන උපාධිධාරී හමුව සමඟ සම්බන්ධව පවත්වන ලදී. මෙවර සමුළුවේ දී මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයට අනුයුක්තව සේවය කරන කීර්තිමත් ප්‍රධාන දේශකයෙකු වන මහාචාර්ය රංගික හල්වතුර මහතා විසින් ‘‘ස්වභාවික විද්‍යාවට එරෙහිව කෘතිම විද්‍යාව’’ යන මැයෙන් ප්‍රධාන දේශණය ඉදිරිපත් කරන ලදී.
විශ්වවිද්‍යාල ජර්නල ප්‍රකාශනය කිරීම	සිංහල ජර්නලය (සබරගමුව විශ්වවිද්‍යාල ශාස්ත්‍රීය සංග්‍රහය) වෙළුම 10, 2019 – ජූනි අවසන් ක්‍රියාවලියේ පවතී. සබරගමුව විශ්වවිද්‍යාල ජර්නලය වෙළුම 18, අංක: 01 (ඉංග්‍රීසි ජර්නලය) අවසන් ක්‍රියාවලියේ පවතී.

4.6 තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (CQA)

4.6.1 දැක්ම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය, ජාතික ගෝලීය පරිමාණයෙන් ශ්‍රේණිගත කිරීම ශක්තිමත් කිරීම සඳහා උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවල විශිෂ්ටත්වය ළඟා කර ගැනීම අපේක්ෂා කෙරේ.

4.6.2 මෙහෙවර

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපන පද්ධතියේ සියලු අංගයන් සඳහා සංයුක්ත තත්ත්ව සුනිශ්චිතකරණ පද්ධතියක් නිර්මාණය කර සක්‍රිය කිරීම සහ දේශීය හා ජාත්‍යන්තර අධ්‍යයන ප්‍රමිතීන් මත පදනම්ව විශ්වවිද්‍යාලයේ මෙහෙවර සහ දැක්ම සමඟ අනුකූල වන ලෙස සියලුම ඉගැන්වීම්, ඉගෙනුම් හා ශිෂ්‍ය ආධාරක අක්ෂ සහ ආයතනික සංවර්ධනය සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය පවත්වා ගැනීම මෙන්ම එහි ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලය ජාතික වශයෙන් ප්‍රතීතනය කිරීම සඳහා සුදුසුකම් ලබන පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සමඟ සමස්ත තෘප්තිමත්භාවය සහ එකඟතාවය ළඟා කර ගැනීම.

4.6.3 හැඳින්වීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය අංක 04/2015 කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව HETC ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සුනිශ්චිතකරණ කවුන්සිලයේ සම්බන්ධීකරණ ව්‍යුහයක් ලෙස ස්ථාපනය කරන ලදී. තත්ත්ව සනිශ්චිකරණ කේන්ද්‍රය ප්‍රධාන වශයෙන් ගුණාත්මක උසස් අධ්‍යාපනයේ කළමනාකරණය අඛණ්ඩව වැඩිදියුණු කිරීම දිරිගැන්වීම සහ දැන්වීම සඳහා අධ්‍යයන ප්‍රමිතීන් සහ උසස් අධ්‍යාපන සුදුසුකම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය විසින් සියලුම ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලි, ශිෂ්‍ය සහාය සහ ආයතනික සංවර්ධනයේ තත්ත්ව සුනිශ්චිතකරණය අධීක්ෂණය කරයි. එමෙන්ම ශ්‍රී ලංකා තත්ත්ව සුනිශ්චිතකරණ කවුන්සිලය විසින් දක්වා ඇති ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) සහ අධ්‍යයන ප්‍රමිතීන්ට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන බව මෙම කේනද්‍රය මඟින් සහතික කරයි. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාවලි අභ්‍යන්තර තත්ත්ව සුනිශ්චිතකරණ ප්‍රතිපත්ති රාමුවට අනුකූල වේ.

තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ ප්‍රධානියා තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ සනාතන ස්ථාවර කමිටුව මඟින් මෙහෙයවනු ලබන අධ්‍යක්ෂවරයෙකි. පීඨ මට්ටමේ තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලබන්නේ තත්ත්ව සුනිශ්චිතකරණ අතුරු ව්‍යවස්ථාවට අනුව ස්ථාපනය කරන ලද පීඨ තත්ත්ව සුනිශ්තකරණ ඒකක මඟිනි.

4.6.4 තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ වර්තමාන තත්ත්වය

කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ	-	මහාචාර්ය එච්.ඒ.ඩී. රුවන්දීපිකා / කෘෂි විද්‍යා පීඨය (වැඩබලන අධ්‍යක්ෂ) (2020 ඔක්තොම්බර් 12 සිට)
		මහාචාර්ය ජේ.එම්.සී.කේ. ජයවර්ධන අධ්‍යක්ෂ / තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (2020 අගෝස්තු දක්වා)
ලේකම්	-	එච්.කේ.අයි.පී. අබේසිංහ සහකාර ලේඛකාධිකාරී / උපකුලපති කාර්යාලය (2020 ජූනි සිට)
		එම්.පී.ජී. සිල්වා සහකාර ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන අංශය (2020 මැයි දක්වා)

පාලන ව්‍යුහය: තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ සනාතන ස්ථාවර කමිටුව

කමිටුවේ සංයුතිය සහ රැස්වීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04 / 2015 සහ අංක 09 / 2019 ප්‍රකාරව තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ සනාතන ස්ථාවර කමිටුවේ සාමාජිකත්වය පහත දක්වා ඇත. විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ සහභාගීත්වය මෙම කමිටුවට ලබා ගැනීම තුළින් විශ්වවිද්‍යාලයේ තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ සැබෑ තත්ත්වය සාකච්ඡා වීමක් තහවුරු වන අතර තත්ත්ව සුනිශ්චිතකරණ කාර්යයන් පරිපාලන අධිකාරිය විසින් අතික්‍රමණය නොවීමක් අවධාරණය කෙරේ.

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	-	උපකුලපති (2020 නොවැම්බර් 02 සිට)
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	-	වැඩබලන උපකුලපති (2020 මැයි 19 සිට 2020 නොවැම්බර් 01 දක්වා)
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත	-	උපකුලපති (2020 මැයි 20 දක්වා)
ආචාර්ය එච්.ඒ.ඩී. රුවන්දීපිකා	-	වැඩබලන අධ්‍යක්ෂ / තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (2020 ඔක්තොම්බර් 12 සිට)
මහාචාර්ය ජේ.එම්.සී.කේ. ජයවර්ධන	-	අධ්‍යක්ෂ / තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (2020 අගෝස්තු දක්වා)
මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත්	-	පීඨාධිපති / පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
ආචාර්ය එම්.එම්.පී. සුමිත්	-	පීඨාධිපති / කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය ආර්.එස්. සබරගමුව	-	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 03 සිට)

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	-	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය (2020 ඔක්තොම්බර් 02 දක්වා)
ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න	-	පීඨාධිපති / භූ විඥාපන පීඨය
මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල	-	පීඨාධිපති / කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න	-	පීඨාධිපති / වෛද්‍ය පීඨය
ආචාර්ය එම්.ඒ.සී.එස්.එස්. ප්‍රනාන්දු	-	පීඨාධිපති / සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 13 සිට)
ආචාර්ය ඩබ්ලිව්. මනොජ් ආරියරත්න	-	පීඨාධිපති / සමාජීය විද්‍යා හා භාෂා පීඨය (2020 ඔක්තොම්බර් 12 දක්වා)
ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත	-	පීඨාධිපති / තාක්ෂණ පීඨය
කමල් ගුණවර්ධන	-	වැඩබලන ලේඛකාධිකාරී (2020 මාර්තු 30 සිට)
වී.ඩී. කිත්සිරි	-	ලේඛකාධිකාරී (2020 මාර්තු 29 දක්වා)
ටී.එන්. නෙයිසූරි	-	පුස්තකාලයාධිපතිනී
මහාචාර්ය අරුණ ශාන්තආරච්චි	-	අධ්‍යක්ෂ / කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (2020 ජූනි 02 සිට)
ආචාර්ය එස්.ටී.සී. අමරසිංහ	-	අධ්‍යක්ෂ / කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (2020 ජූනි 01 දක්වා)
ආචාර්ය ඩී.ඩී. වික්‍රමනායක	-	සම්බන්ධීකාරක / කෘෂි විද්‍යා පීඨය (2020 මාර්තු 18 සිට)
ආචාර්ය රුවිනි මුතුකුමාරණ	-	සම්බන්ධීකාරක / කෘෂි විද්‍යා පීඨය (2020 මාර්තු 17 දක්වා)
ආචාර්ය ඊ.පී.එන්. උදයකුමාර	-	සම්බන්ධීකාරක / ව්‍යවහාරික විද්‍යා පීඨය
ආචාර්ය එම්.ඩී.ඊ.කේ. ගුණතිලක	-	සම්බන්ධීකාරක / භූ විඥාපන පීඨය
ආචාර් ඩබ්ලිව්.එම්.පී.එස්.බී. වාහල	-	සම්බන්ධීකාරක / කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය අමල් වගීෂ	-	සම්බන්ධීකාරක / වෛද්‍ය පීඨය
ආචාර්ය යූ.පී. ලේකම්ගේ	-	සම්බන්ධීකාරක / සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ආචාර්ය කේ.ආර්. කොස්වත්තගේ	-	සම්බන්ධීකාරක / තාක්ෂණ පීඨය
එච්.කේ.අයි.පී. අබේසිංහ	-	ලේකම් / තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (සහකාර ලේඛකාධිකාරී / උපකුලපති කාර්යාලය) (2020 ජූනි සිට)
එම්.පී.ජී. සිල්වා	-	ලේකම් / තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය (සහකාර ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන අංශය) (2020 මැයි දක්වා)

ගණපූර්ණය

රැස්වීමක ගණපූර්ණය සාමාජිකත්වයෙන් 50% කි.

රැස්වීම්

තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ සනාතන ස්ථාවර කමිටුවේ රැස්වීම මාසිකව පැවැත්වෙන අතර ලිපි හුවමාරු තුළින් ද කරුණු කාරණා සලකා බැලීම සිදුවේ. වර්ෂයක දී පවත්වනු ලබන රැස්වීම් ගණන 10 කට නොඅඩු වේ.

රැස්වීම් අංකය	දිනය	සහභාගි වූ සාමාජිකයින් සංඛ්‍යාව
18	23.01.2020	23*
19	05.03.2020	18
20	15.06.2020	12
21	16.07.2020	17
22	20.08.2020	14
23	22.10.2020	18
24	24.11.2020	17
25	25.12.2020	17

*** ආරාධිත සාමාජිකයින් ලෙස ආයතනික සමාලෝචනයේ නිර්ණායකවල සභාපති සහ ලේකම් සහභාගි විය.**

පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකය (FQAC)

සෑම පීඨයක් සඳහාම පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයක් පවතින අතර පීඨ මට්ටමින් තත්ත්ව සුනිශ්චිතකරණයට අදාළ කටයුතු ඉටු කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයන් පත්කර ඇත.

<u>කෘෂි විද්‍යා පීඨය:</u>

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	මහාචාර්ය එම්.එම්.පී. සුමිත් / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය ඩී.ඩී. වික්‍රමනායක / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාංශය
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	මහාචාර්ය ඩී.ඒ.එම්. ද සිල්වා / කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
		ආචාර්ය පී.කේ. දිසානායක / කෘෂි අපනයන අධ්‍යයනාංශය
		ආචාර්ය ටී.එස්.පී. ජයවීර / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	ආචාර්ය ඒ.ඩබ්ලිව්. විජේරත්න / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
		ආචාර්ය ජී.ඩී.කේ. කුමාර / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / කෘෂි අපනයන අධ්‍යයනාංශය
		ආචාර්ය ආර්.එම්.ඒ.එස්. බණ්ඩාර / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාංශය
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	මහාචාර්ය පී.අයි. යාපා / කෘෂි අපනයන අධ්‍යයනාංශය

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.අයි.බී. විජේතුංග
		කේ.එම්.ඕ.එන්. කරුණාරත්න
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	ඩී.ජී. යසවති / තාක්ෂණික නිලධාරී
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	එච්.එම්.එස්.එන්. කුලරත්න / කාර්ය මණ්ඩල කළමනාකරණ සහකාර
09	කැඳවුම්කරු	එම්.ඩී.එන්.කේ. මැද්දගේ / සහකාර ලේඛකාධිකාරී

<u>ව්‍යවහාරික විද්‍යා පීඨය:</u>

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	ආචාර්ය ආර්.එස්. සබරගමුව / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය ඊ.පී.එන්. උදයකුමාර / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	මහාචාර්ය එස්. වසන්තප්‍රියන් / ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
		ආචාරය ඩබ්ලිව්.එස්.එම්. සෙනෙවිරත්න / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
		ආචාර්ය ඊ.පී. කුඩවිදානගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
		ආචාර්ය සී.එච්. බදුරලිය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
		ටී.එස්.එච්. පෙරේරා / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	ආචාර්ය පියුමි ඉෂංකා / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
		ජනිත ලියනගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
		ආචාර්ය ඩී.එන්.එස්. වන්නිආරච්චි / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
		එච්.ආර්.එන්.එස්. බණ්ඩාර / ආධුනික කථිකාචාර්ය / භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශ
		එල්.ආර්.එන්.ඩී. වීරරත්න / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	මහාචාර්ය ජේ.එම්.සී.කේ. ජයවර්ධන / ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	ආර්.එම්.පී.පී.එස්. දීප්ත
		ඩී.එම්.සී.සී. අමරසිංහ
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	එස්.ඒ.ඒ.සී.කේ. හේමචන්ද්‍ර
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	පී.එම්.එච්.කේ. ප්‍රියකාන්ති
09	කැඳවුම්කරු	ඒ.ඒ.වයි. අබේසිංහ / සහකාර ලේඛකාධිකාරී

භූ විඥාපන පීඨය

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	ආචාර්ය එච්.එම්.අයි. ප්‍රසන්න / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය එම්.ඩී.ඊ.කේ. ගුණතිලක / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / බිම් මැනුම් හා භූමිතික මැනුම් අධ්‍යයනාංශය
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	ආචාර්ය සමන් කොස්වත්ත / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / දුරස්ථ ගෝචර ග්‍රහණ හා භූමි තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
		ආචාර්ය එච්.ආර්.එස්. බණ්ඩාර / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / බිම් මැනුම් හා භූමිතික මැනුම් අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	ජේ.ඒ.එස්. ජයකොඩි / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / දුරස්ථ ගෝචර ග්‍රහණ හා භූමි තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
		ඩී.එස්. මුණසිංහ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / බිම් මැනුම් හා භූමිතික මැනුම් අධ්‍යයනාංශය
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	-
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	ආර්. විදුරනාත්
		සී. සුලෝචනා
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	ජී. කන්දෙගෙදර / තාක්ෂණික නිලධාරී
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	එච්.එච්.කේ.එන්. ධර්මසිරි / සහකාර ලේඛකාධිකාරී
09	කැඳවුම්කරු	ආචාර්ය එම්.ඩී.ඊ.කේ. ගුණතිලක / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / බිම් මැනුම් හා භූමිතික මැනුම් අධ්‍යයනාංශය

<u>කළමනාකරණ අධ්‍යයන පීඨය</u>

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	මහාචාර්ය ඩබ්ලිව්.කේ. අතුල සී. ඥානපාල / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්.බී. වාහල / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
	සම සම්බන්ධීකාරක	අයි.ඒ. ඒකනායක / ආධුනික කථිකාචාර්යව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	මහාචාර්ය ඩී.ඒ.අයි. දයාරත්න / ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය
		ආචාර්ය එච්.පී.ආර්. ප්‍රියන්කර / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
		ආචාර්ය ආර්.එස්.එස්.ඩබ්ලිව්. ආරච්චි / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
		ඩී. ජාසිංහ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	ඒ.ඩබ්ලිව්.ජී.සී.එන්. විජේතුංග / ආධුනික කථිකාචාර්ය / ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය
		මියුනි ශාමිකා / ආධුනික කථිකාචාර්ය / ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය
		අයි.එම්. කටුවන්දෙණිය / ආධුනික කථිකාචාර්ය / ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
		ජේ.ආර්.සී. සඳරුවනි / ආධුනික කථිකාචාර්ය / සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
		ජී.වී.එච්. දිනූෂා / ආධුනික කථිකාචාර්ය / සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
		ආර්.ඒ.ඩී.සී. රණතුංග / ආධුනික කථිකාචාර්ය / සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
		පී.එල්.ජී.එස්.ඩී. පියුමාලි / ආධුනික කථිකාචාර්ය / අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	මහාචාර්ය එම්.එස්.එම්. අස්ලම් / සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	ආර්.එම්.යූ.වී. රත්නායක
		ඩබ්ලිව්.එස්. සමන්ත
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	ඒස්.එම්.ඩී. බණ්ඩාර නාමල් නිරෝෂ්
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	ඉන්ද්‍රානි ස්වර්ණලතා
09	කැඳවුම්කරු	රෝෂිනී නෙළුවපතිරණ / සහකාර ලේඛකාධිකාරී
10	පරිපාලන ලේකම්	ඒ.ඩබ්ලිව්. තිරණගම / ආධුනික කථිකාචාර්ය / ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය

වෛද්‍ය පීඨය

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය අමල් වගීෂ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	ආචාර්ය නිලන්ත ගමලත්ගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය
		ආචාර්ය ජානියා ජයවර්ධන / ආධුනික කථිකාචාර්ය / භෞතවේද අධ්‍යයනාංශය
		ආචාර්ය අයි.එච්.වී. නිකලස් / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	ටී.සී.එස්. වීරකෝන් / ආධුනික කථිකාචාර්ය / කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	මහාචාර්ය දීප්ති සමරගේ / බාහිර කථිකාචාර්ය / භෞතවේද අධ්‍යයනාංශය
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	දුනියා ජයසේකර
		ඔසුර විතානගේ
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	ධම්මික පියසේන
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	අනිල් රණසිංහ
09	කැඳවුම්කරු	-

සමාජීය විද්‍යා හා භාෂා පීඨය

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	ආචාර්ය මනෝජ් ආරියරත්න / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය උපුල් ලේකම්ගේ
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	සමන් හඳුරාගම / සමාජ විද්‍යා අධ්‍යයනාංශය
		ආචාර්ය නිලූකා ප්‍රසංගනී / භාෂා අධ්‍යයනාංශය
		ආචාර්ය සම්පත් ප්‍රනාන්දු / ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය
		දීපානි එදිරිසූරිය / භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය
		ආචාර්ය සංගීත් රත්නායක / ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	ශාන්ති හේමලතා / සමාජ විද්‍යා අධ්‍යයනාංශය

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
04	අධ්‍යයනාංශ නියෝජිත	ආචාර්ය චන්දන දිසානායක / භාෂා අධ්‍යයනාංශය
		නුවන් වීරරත්න / ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය
		ඊ.එම්.ටී.කේ. සෙනවිරත්න / භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය
		ලක්මිණී බස්නායක / ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත්
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	අයි.ඩී. ලියනපතිරණ
		ඩබ්ලිව්.කේ.ඒ. පවිත්‍රා ජනනි
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	චමිත් බණ්ඩාර
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	ඉෂානි පෙරේරා
09	කැඳවුම්කරු	යශෝධා චන්ද්‍රසේකර / සහකාර ලේඛකාධිකාරී

<u>තාක්ෂණ පීඨය</u>

අනු අංකය	තනතුර	නිලධාරියාගේ නම
01	පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සභාපති	ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත / පීඨාධිපති
02	සම්බන්ධීකාරක	ආචාර්ය කේ.ආර්. කොස්වත්තගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය
03	අධ්‍යයනාංශ ප්‍රධානීන්	ආචාර්ය කේ.ආර්. කොස්වත්තගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය
		ආචාර්ය ඩබ්ලිව්.ජී.එම්.එස්. පෙරේරා / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය
04	අධ්‍යයනාංශ නියෝජිත	එන්.ඩී. හෙට්ටිආරච්චි /ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය
		දසිත් විජේසේකර / ආධුනික කථිකාචාර්ය / ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය
05	පීඨයේ එක් මහාචාර්යවරයෙකු	-
06	ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු	හසිඳු කුමාර
		කසුන් සුදාරක
07	තාක්ෂණ / විද්‍යාගාර කාර්ය මණ්ඩල නියෝජිතයෙකු	ප්‍රසාද් ඉද්දමල්ගොඩ
08	ලිපිකාර කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙකු	බාලිකා ප්‍රියදර්ශනී
09	කැඳවුම්කරු	ඩී.එස්.ආර්.සී. සවනාවඩු / සහකාර ලේඛකාධිකාරී

පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකය සඳහා සමායෝජකවරයා පීඨ මණ්ඩල හෝ සමාන ව්‍යුහයක් මඟින් පත් කරනු ලබයි.

ගණපූර්ණය

රැස්වීමක ගණපූර්ණය සාමාජිකත්වයෙන් 50% කි.

රැස්වීම්

අඩුම වශයෙන් මාස 02 කට වරක් රැස්වීම් පැවැත්වෙන අතර ලිපි හුවමාරු මඟින් ද කරුණු කාරණා සලකා බැලීම සිදු කරනු ලබයි.

නිල කාලය

මෙම කමිටුවේ පත්කළ සාමාජිකයින්ගේ නිල කාලය වර්ෂයකි.

තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ පත් කිරීම

විශ්වවිද්‍යාලය තුළ තනතුරෙහි ස්වභාවය

1. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ තනතුර පූර්ණකාලීන තනතුරක් විය යුතුය. නුදුරු අනාගතයේ දී මෙය සිදු කළ නොහැකි බැවින් අධ්‍යක්ෂවරයාගේ අධ්‍යයන කාර්ය භාරයෙන් 50% ක් අඩු කළ යුතු වේ. අධ්‍යක්ෂවරයා සඳහා සියලුම පීඨාධිපතිවරුන් සහ වෙනත් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සහයෝගය අවශ්‍ය වන බැවින් අධ්‍යක්ෂවරයා සුදුසු මට්ටමක ස්ථානගත කිරීම වැදගත් වේ. එමනිසා අධ්‍යක්ෂ තනතුර උසස් අධ්‍යාපන ආයතන ව්‍යුහයේ නියෝජ්‍ය උපකුලපති (DVC) මට්ටමින් හෝ අවසාන වශයෙන් අධ්‍යක්ෂකවරයෙකුගේ හෝ පීඨාධිපතිවරයෙකුගේ මට්ටමින් සඳහන් කළ හැක.
2. තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරයා අනෙකුත් ප්‍රධාන පරිපාලන වගකීම්වලින් නිදහස් විය යුතු වේ. අධ්‍යයන විගණනය අභ්‍යන්තර තත්ත්ව සුනිශ්චිතකරණයේ කොටසක් බැවින් තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාවලියේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය උපකුලපතිවරයෙකු, පීඨාධිපතිවරයෙකු හෝ අධයයනාංශයක පරිපාලන ප්‍රධානියෙකු නොවිය යුතු වේ.
3. මෙම ක්‍රියාවලියේ දී අධ්‍යක්ෂවරයෙකුට වැදගත් වගකීමක් පැවරෙන බැවින් ඔහු හෝ ඇය පරිපානය පිළිබඳ (පසුගිය වසර තුනක) මෙන්ම තත්ත්ව ස්නිශ්චිතකරණය පිළිබඳ සැලකිය යුතු පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු / මහාචාර්යවරයෙකු විය යුතු අතර බාහිර සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳ දැනුමක් තිබිය යුතුය. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ, මහාචාර්යවරයෙකු නොවූව ද ඔහු හෝ ඇය සනාතන සභාවේ ආරාධිත සාමාජිකයෙකු විය යුතු වේ.
4. ඔහු හෝ ඇය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව වසර තුනක කාල සීමාවක් සඳහා පත් කළ යුතු වේ. ඔහු හෝ ඇය වසර තුනකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කිරීමට හැකිය.

අධ්‍යක්ෂවරයෙකු සතු වරප්‍රසාද

1. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ සඳහා මාසිකව මූලික වැටුපෙන් 25% ක දීමනාවක් සහ අංක 06 / 2015 කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලද සන්නිවේදන දීමනාවක් ලැබිය යුතු වේ.
2. ඔහුට හෝ ඇයට කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය විට දී ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතුය.
3. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය සඳහා විශ්වවිද්‍යාල බලධාරීන් විසින් කේන්ද්‍රය සඳහා ම වෙන් වූ අන්තර්ජාල සහ දුරකතන පහසුකම් සහිතව ගැළපෙන ස්ථිර කාර්යාල අවකාශයක් ලබා දිය යුතුය.
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017 ඔක්තොම්බර් 30 වන දින නිකුත් කරන ලද තත්ත්ව සුනිශ්චිතකරණ චක්‍රලේඛ ලිපිය (ref UGC/QAAC/IQAU) මඟින් නිර්දේශ කර ඇති පරිදි විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය විසින් තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය සඳහා එහි රාජකාරි කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ස්ථිර සහායක කාර්ය මණ්ඩලයක් (ස්ථිර සහාකර ලේඛකාධිකාරී, කළමනාකරණ සහකාර සහ වැඩ සහායක) ලබා දිය යුතුය.

වගකීම් සහ යුතුකම්

තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ

1. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය සඳහා නීති රීති සකස් කිරීම සහ ඒ සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සුනිශ්චිතකරණ කවුන්සිලය විසින් සකස් කරන ලද මූලික මාර්ගෝපදේශ වලට අනුව තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කිරීම සහ ඒවා විශ්වවිද්‍යාලයේ පාලන ව්‍යුහය / සංවිධානය හා නිශ්චිත ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සඳහා අභිරුචිකරණය කිරීම.
3. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය සඳහා තුන් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා විශ්වවිද්‍යාල සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සුනිශ්චිතකරණ කවුන්සිලයේ එකඟතාවය ලබා ගැනීම.
4. එක් එක් වර්ෂය ආරම්භයේ දී තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ සඳහා විශ්වවිද්‍යාල සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම.
5. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර ඒ සඳහා මූල්‍ය කමිටුවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම.
6. විශ්වවිද්‍යාල වෙබ් අඩවිය තුළ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රය ස්ථාපනය කිරීම සහ එහි තොරතුරු නිතිපතා යාවත්කාලීන කිරීම.
7. තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් නිතිපතා විශ්වවිද්‍යාල සනාතන සභාවට සහ පාලක සභාවට ඉදිරිපත් කිරීම.
8. විශ්වවිද්‍යාල ප්‍රජාව සහ වෙනත් විශ්වවිද්‍යාල තුළ තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් පිළිබඳ දැන්වීම් බෙදා හැරීම.
9. තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ විශ්වවිද්‍යාල සහ පීඨ මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

10. ආයතනික සමාලෝචන සඳහා ස්වයං ඇගයීම් වාර්තා සැකසීම ආරම්භ කිරීම සහ සහාය දැක්වීම.
11. අධ්‍යයන වැඩසටහන්වල වැඩසටහන් සමාලෝචන සඳහා ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීම, දිරි ගැන්වීම සහ සහාය වීම.
12. ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සහ වැඩමුළු ලබා දීම.
13. තත්ත්ව සුනිශ්චිතකරණයෙහි යහපත් භාවිතයන් ප්‍රදර්ශනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සහ සහාය දීම.
14. තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ජාත්‍යන්තර නියෝජිත ආයතන සහ විශ්වවිද්‍යාල සමඟ සබඳතා වර්ධනය කර ගැනීම.
15. නව උපාධි වැඩසටහන් පැවැත්වීම සඳහා ව්‍යාපෘති සකස් කිරීමේ ක්‍රියාවලියේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහාය වීම සහ මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයට (SLQF) අනුකූල බව සහතික කිරීම.
16. විශ්වවිද්‍යාල තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට ඉදිරිපත් කිරීම.
17. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ වාර්ෂික වාර්තාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සුනිශ්චිතකරණ කවුන්සිලය වෙත ඉදිරිපත් කිරීම.
18. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ සහ පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකවල රැස්වීම් සඳහා පහසුකම් සැපයීම.
19. පීඨවල තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ අත්පොත් සකස් කිරීම සඳහා සහාය වීම.
20. ශිෂ්‍ය සමීක්ෂණ ඇතුළුව බාහිර සහ අභ්‍යන්තර සමාලෝචනවල ප්‍රතිඵල පිළිබඳව සියලුම කාර්ය මණ්ඩලය සහ බාහිර පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ සම්බන්ධීකාරක

1. නියෝජිතයෙකු ලෙස පීඨය තුළ සියලුම තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් ආශ්‍රිතව ගුණාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම.
2. විශ්වවිද්‍යාල මට්ටමේ තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
3. මාස දෙකකට වරක් පීඨ මට්ටමේ තත්ත්ව සුනිශ්චිතකරණ රැස්වීම් සංවිධානය කිරීම.
4. සෑම වර්ෂයක ම අවසානයේ වාර්ෂික පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ වාර්තාව සකස් කිරීම.
5. විශ්වවිද්‍යාලීය තත්ත්ව සුනිශ්චිතකරණය පිළිබඳ සනාතන කමිටුව මඟින් වරින් වර නිර්දේශ කරනු ලබන නිශ්චිත ගැටළු විසඳීම සඳහා සහාය වීම.
6. වැඩසටහන් සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීම සඳහා මගපෙන්වීම.
7. අවශ්‍ය අවස්ථාවල දී වෘත්තීය තත්ත්ව සුනිශ්චිතකරණ හා ප්‍රතීතන ව්‍යුහයන් සමඟ සම්බන්ධ වී තත්ත්ව සුනිශ්චිතකරණය හා ප්‍රතීතනයට අදාළ කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
8. තුල්‍ය සමාලෝචන පත්‍රිකා සහ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ පත්‍රිකා වැනි පීඨ මට්ටමේ තත්ත්ව සුනිශ්චිතකරණ දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම අධීක්ෂණය කිරීම.
9. තත්ත්ව සුනිශ්චිතකරණ ක්‍රියාකාරකම්වලට අදාළ කරුණු පිළිබඳව පීඨය තුළ ඇති අනෙකුත් අදාළ කමිටු සහ අංශ සමඟ සම්බන්ධීකරණය කිරීම.
10. පීඨ සාමාජිකයින් විසින් තත්ත්ව සුනිශ්චිතකරණයට අදාළව මතු කරනු ලබන ගැටළු සලකා බැලීම සහ ඒ සඳහා පිළිතුරු සැපයීම හා නිත්‍ය පදනමක් මත පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයේ ක්‍රියාකාරකම් පීඨ මණ්ඩලයට සහ අභ්‍යන්තර තත්ත්ව සුනිශ්චිතකරණ ඒකකයට වාර්තා කිරීම.

11. පීඨ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ ක්‍රියාකාරකම් පිළිබඳව පීඨ මණ්ඩලයට සහ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයට වාර්තා කිරීම.

නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම

1. ඉල්ලුම සහ අවශ්‍යතාව මත පදනම්ව නව උපාධි වැඩසටහන් හඳුනාගැනීම පීඨවල වගකීම වේ.
2. පීඨ මණ්ඩලයේ නිර්දේශය සහිත නව වැඩසටහන සඳහා යෝජනාව තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.
3. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ වලට අනුකූලව නිරීක්ෂණ සහතිව එම යෝජනාව පිළිබඳව සලකා බැලීම සඳහා සනාතන සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
4. සනාතන සභාව විසින් විස්තරාත්මක යෝජනාව සමාලෝචනය කිරීම සඳහා බාහිර සමාලෝචකයින් දෙදෙනෙක් පත් කළ යුතු වේ.
5. බාහිර සමාලෝචකයින්ගේ නිර්දේශය පදනම් කරගෙන අදාළ පීඨය මඟින් විස්තරාත්මක යෝජනාව සංශෝධනය කර එය තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර බාහිර සමාලෝචකයින්ගේ නිර්දේශය එම සංශෝධිත විස්තරාත්මක යෝජනාවට ඇතුළත් කර ඇති බව තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ විසින් සහතික කළ යුතුය.
6. තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ විසින් සංශෝධිත යෝජනාව පාලක සභාව හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා සනාතන සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

පවතින අධ්‍යයන වැඩසටහනක විෂයමාලාව නව්‍යකරණය කිරීම

1. අධ්‍යයනාංශය / අධ්‍යයනාංශ හෝ පීඨය මඟින් හඳුනාගනු ලබන නව්‍යකරණ පීඨ මණ්ඩල අනුමැතිය සහිතව නිශ්චිත ආකෘතියකින් තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා එම නව්‍යකරණය කරන ලද විෂයමාලාව තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ විසින් තම නිරීක්ෂණ සමඟ සනාතන සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
2. අධ්‍යයනාංශය / අධ්‍යයනාංශ හෝ පීඨය මඟින් මීළඟ සිසුන් බඳවා ගැනීමේ දී නව්‍යකරණය කළ විෂයමාලාව ක්‍රියාත්මක කළ හැක.

විශ්වවිද්‍යාලයේ සහ අධ්‍යයන වැඩසටහන්වල ස්වයං ඇගයීම සඳහා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය කිරීම

පුස්තකාලය	වෙනත් (විශේෂ)- මහජන දේශන	ජාතික කියවීමේ මාසය සහ 2020 ඔක්තොම්බර් 01 ලෝක ළමා දිනය සැමරීම සඳහා මහජන දේශනය	ආසන්න වශයෙන් 100	බලංගොඩ, පින්නවල, කීරපත්දෙණිය මහා විද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය නැරඹීම. (පසල් සිසුන් සහ ගුරුවරුන්)

10.4 2020 වර්ෂය තුළ ලබා ගත් ජාතික සහ අන්තර්ජාතික සම්මාන

පීඨය	සම්මාන වර්ගය	සම්මානයේ නම	ජාතික / අන්තර්ජාතික	සම්මානය පිළිබඳ විස්තර	සම්මානය ප්‍රදානය කළ ආයතනය සහ රට	සම්මානලාභී ශිෂ්‍යයාගේ/ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ/ අධ්‍යයනාංශයේ/ පීඨයේ/ විශ්වවිද්‍යාලයේ නම
ව්‍යවහාරික විද්‍යා පීඨය	පර්යේෂණ / නවෝත්පාදන					
	පර්යේෂණ / නවෝත්පාදන	පර්යේෂක දිරිගැන්වීමේ ප්‍රදාන 2020 (ජාතික පර්යේෂණ සභාව)	ජාතික	මිලියන 3 ක අරමුදල් (ව්‍යාපෘති මාතෘකාව: "ක්ෂුද්‍ර ප්ලාස්ටික් සම්බන්ධ ප්‍රවාහනය සහ ඖෂධවල අවකල ජෛව උපයෝගීතාව, පෞද්ගලික ආරක්ෂණ නිෂ්පාදන (PPCPs) සහ ජලයේ ඇති විෂ සහිත මූලද්‍රව්‍ය".)	ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ කවුන්සිලය	ආචාර්ය හසින්ත විජේසේකර සහ ආචාර්ය එච්.එස්.එම්. සොයිසා
		42 වන "JASP" පර්යේෂණ පත්‍ර සම්මානය	අන්තර්ජාතික	පර්යේෂණ පත්‍ර සම්මානය	ජපානය	එස්.ඩී.ඒ. සඳනායක
	වෙනත්					
	සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයක් සහිත රටක ආහාර සුරක්ෂිතතා වෘත්තිකයන් සඳහා සංචාරක සම්මානය		අන්තර්ජාතික	ආහාර සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමයේ වාර්ෂික රැස්වීමට සහභාගී වීම සඳහා සමරුඵලකය සහ සංචාරක අරමුදල්. සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයක් සහිත රටක ආහාර සුරක්ෂිතතා ක්ෂේත්‍රයේ පූර්ණ කාලීනව සේවය කරන ආහාර සුරක්ෂිතතා වෘත්තිකයන් සඳහා ඉදිරිපත් කරන ලදී.	ආහාර සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය, ඇමරිකා එක්සත් ජනපදය	ඒ.එල්.සී.ජේ. ලියනගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
භූ විඥාපන පීඨය	පර්යේෂණ / නවෝත්පාදන					
	වාණිජකරණය පිළිබඳ පර්යේෂණ සහ නවෝත්පාදන	AHEAD/RIC ප්‍රදාන	ජාතික		ලෝක බැංකුව	ආචාර්ය එන්.එම්.පී.එම්. පියසේන
කළමනාකරණ අධ්‍යයන පීඨය	පර්යේෂණ / නවෝත්පාදන					
	පර්යේෂණ	කැපීපෙනෙන සමාලෝචක	අන්තර්ජාතික	කැපීපෙනෙන - 2019: "FIIB" ව්‍යාපාර සමාලෝචනය, "SAGE" ප්‍රකාශන	"FIIB" ව්‍යාපාර සමාලෝචනය, "SAGE" ප්‍රකාශන	ආචාර්ය ඩී.එන්. ජයන්ත

11. නේවාසිකාගාර පිළිබඳ විස්තර - 2020

විශ්වවිද්‍යාලය කුඩා ප්‍රදේශයක් තුළපවතින බැවින්, උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසික පහසුකම් තනිවම සොයා ගැනීමේ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, විශ්වවිද්‍යාලයෙන් 20 km කට වඩා දුරින් ස්ථිර පදිංචිය ඇති සියලුම සිසුන්ට විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ. එබැවින්, 89.82% ක් පමණ උපාධි අපේක්ෂකයින් සඳහා විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.

පිරිමි සිසුන් 987 දෙනෙකුට සහ ගැහැණු සිසුන් 1446 දෙනෙකුට විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල නේවාසික පහසුකම් ලබා දී ඇත. අනෙක් සිසුන්ගෙන් පිරිමි සිසුන් 498 දෙනෙකුට සහ ගැහැණු සිසුන් 1650 දෙනෙකුට විශ්වවිද්‍යාලය අවට පිහිටි කුලී පදනම මත ලබා ගත් නිවාසවල අවශ්‍ය පහසුකම් සහිතව නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත.

ශිෂ්‍යයින්ට නවාතැන් පහසුකම් ලබා දීම සඳහා කුලී පදනම මත ලබා ගත් නිවාස සඳහා විශ්වවිද්‍යාලය වසරකට රුපියල් මිලියන 12 කට වඩා වැඩි මුදලක් වැය කරයි.

11.1 2020 වර්ෂය තුළ පීඨ පදනමින් නේවාසිකාගාර පහසුකම් ලැබීමට සුදුසුකම් ලැබූ සහ නේවාසිකාගාර පහසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව

පීඨය	කණ්ඩායම් වසර	බඳවා ගනු ලැබූ වර්ෂය	ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව	නේවාසිකාගාර සඳහා තෝරා ගැනීමේ නිර්ණායක සපුරා ඇති සිසුන් සංඛ්‍යාව	නේවාසික පහසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව		
					පිරිමි	ගැහැණු	එකතුව
කෘෂි විද්‍යා පීඨය	1	2018/2019	177	170	35	135	170
	2	2017/2018	159	136	14	122	136
	3	2016/2017	160	140	30	110	140
	4	2015/2016	99	81	12	69	81
ව්‍යවහාරික විද්‍යා පීඨය	1	2018/2019	341	335	145	190	335
	2	2017/2018	325	297	132	165	297
	3	2016/2017	301	267	125	142	267
	4	2015/2016	216	181	69	112	181
භූ විඥාපන පීඨය	1	2018/2019	99	94	61	33	94
	2	2017/2018	98	81	66	15	81
	3	2016/2017	94	86	67	19	86
	4	2015/2016	69	63	55	8	63
කළමනාකරණ අධ්‍යයන පීඨය	1	2018/2019	356	349	103	246	349
	2	2017/2018	354	301	81	220	301
	3	2016/2017	340	274	78	196	274
	4	2015/2016	317	273	75	198	273

පීඨය	කණ්ඩායම් වසර	බඳවා ගනු ලැබූ වර්ෂය	ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව	නේවාසිකාගාර සඳහා තෝරා ගැනීමේ නිර්ණායක සපුරා ඇති සිසුන් සංඛ්‍යාව	නේවාසික පහසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව		
					පිරිමි	ගැහැණු	එකතුව
වෛද්‍ය පීඨය	1	2018/2019	75	75	27	48	75
	2	2017/2018	70	70	28	42	70
සමාජීය විද්‍යා හා භාෂා පීඨය	1	2018/2019	312	304	45	259	304
	2	2017/2018	282	235	25	210	235
	3	2016/2017	275	240	29	211	240
	4	2015/2016	283	249	20	229	249
තාක්ෂණ පීඨය	1	2018/2019	148	142	88	54	142
	2	2017/2018	150	138	75	63	138
එකතුව			**5100**	**4581**	**1485**	**3096**	**4581**

2020 වර්ෂය තුළ පීඨ පදනමින් නේවාසිකාගාර පහසුකම් ලබා ගත් සිසුන්ගේ ප්‍රගතිය




ව්‍යවහාරික විද්‍යා පීඨය
335
297
267
181
පළමු වසර
දෙවන වසර
තෙවන වසර
සිව්වන වසර


භූ විඥාපන පීඨය
94
81
86
63
පළමු වසර
දෙවන වසර
තෙවන වසර
සිව්වන වසර


කළමනාකරණ අධ්‍යයන පීඨය
349
301
274
273
පළමු වසර
දෙවන වසර
තෙවන වසර
සිව්වන වසර


වෛද්‍ය පීඨය
75
70
පළමු වසර
දෙවන වසර


සමාජීය විද්‍යා හා භාෂා පීඨය
304
235
240
249
පළමු වසර
දෙවන වසර
තෙවන වසර
සිව්වන වසර


තාක්ෂණ පීඨය
142
138
පළමු වසර
දෙවන වසර

11.2 ස්ථිර නේවාසිකාගාර

නම	ස්ථානය	විශ්වවිද්‍යාලයේ සිට ඇති දුර	නේවාසික පහසුකම් ලබා දිය හැකි සිසුන් සංඛ්‍යාව		නේවාසික සිසුන් ගණන (2020 දෙසැම්බර් 31 දිනට)		නේවාසික පහසුකම් සඳහා වසරකට එක් ශිෂ්‍යයෙකුගෙන් අය කර ගන්නා මුදල
			පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	
වළව A	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	-	392	-	98	500.00
වළව B	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	-	388	-	76	500.00
වළව C	පඹහින්න, බෙලිහුල්ඔය	500m	-	392	-	97	500.00
සමනල I	පඹහින්න, බෙලිහුල්ඔය	1 km	-	72	-	14	500.00
සමනල II	පඹහින්න, බෙලිහුල්ඔය	1 km	-	146	-	16	500.00
සමනල III	පඹහින්න, බෙලිහුල්ඔය	1 km	-	138	-	17	500.00
සිංහරාජ I	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	60	-	-	-	500.00
සිංහරාජ II	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	130	-	-	-	500.00
සිංහරාජ III	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	116	-	-	-	500.00
සිංහරාජ IV	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	136	-	-	-	500.00
සිංහරාජ V	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	294	-	25	-	500.00
සිංහරාජ VI	පඹහින්න, බෙලිහුල්ඔය	500 m	396	-	98	-	500.00
එකතුව			**1132**	**1528**	**123**	**318**	**6,000.00**

11.3 කුලී පදනම මත ලබා ගත් නේවාසිකාගාර

ස්ථානය	වාර්ෂික කුලිය	2020 දෙසැම්බර් 31 දිනට නේවාසික සිසුන් සංඛ්‍යාව			නේවාසික පහසුකම් සඳහා වසරකට එක් ශිෂ්‍යයකුගෙන් අය කර ගන්නා මුදල
		පිරිමි	ගැහැණු	එකතුව	
“මනම්පේරි නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	29400.00	**කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් සිසුන් පිටව ගොස් ඇත.**			500.00
“ජයසූරිය නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	42000.00				500.00
“ඩබ්ලිව්.කේ.කේ. බණ්ඩාර නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	37500.00				500.00
“ඩිලානි නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	30800.00				500.00
“සංඝමිත්තා නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	30800.00				500.00
“ගුණරත්න 1 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	34500.00				500.00
“ගුණරත්න 2 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	33750.00				500.00
“වීරකෝන් නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	83300.00				500.00
“වළවේ නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	57400.00				500.00
“සිරිමැදුර 1 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	39000.00				500.00

ස්ථානය	වාර්ෂික කුලිය	2020 දෙසැම්බර් 31 දිනට නේවාසික සිසුන් සංඛ්‍යාව			නේවාසික පහසුකම් සඳහා වසරකට එක් ශිෂ්‍යයකුගෙන් අය කර ගන්නා මුදල
		පිරිමි	ගැහැණු	එකතුව	
“සිරිමැදුර 2 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	39000.00	කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් සිසුන් පිටව ගොස් ඇත.			500.00
“සිරිමැදුර 3 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	52500.00				500.00
“මහවැලි නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	84000.00				500.00
“ගුණවර්ධන නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	137200.00				500.00
“චිත්‍රලතා නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	32200.00				500.00
“රවින්ද්‍ර නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	123200.00				500.00
“සහන් නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	42750.00				500.00
“අංජලිකා 1 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	53200.00				500.00
“අංජලිකා 2 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	19600.00				500.00
“සිතුම් නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	27000.00				500.00
“දයාශාන්ති 1 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	60000.00				500.00
“දයාශාන්ති 2 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	30000.00				500.00
“චන්ද්‍රිකා නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	30000.00				500.00
“මාපටුන නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	27000.00				500.00
“මාලනී නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	75000.00				500.00
“කුමාරතුංග නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	30000.00				500.00
“අම්ල නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	28000.00				500.00
“වීරසිංහ 1 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	28000.00				500.00
“වීරසිංහ 2 නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	35000.00				500.00
“විජේරත්න නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	15400.00				500.00
“සෙව්වන්දි නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	57400.00				500.00
“වනසිංහ නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	27300.00				500.00
“ආසිරි නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	51800.00				500.00
“සුභද්‍රා නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	37100.00				500.00
“කුරුණෑගල නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	54000.00				500.00
“කීර්තිසිංහ නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	34500.00				500.00
“ජයසිංහ නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	60000.00				500.00
“විතාරණ නේවාසිකාගාරය”, පඹහින්න, බෙලිහුල්ඔය.	60000.00				500.00
එකතුව	**1,769,600.00**				**19,000.00**

12. මහපොල ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර

12.1 මහපොල ශිෂ්‍යත්ව

2020 වර්ෂයේ මුළු ශිෂ්‍ය ජනගහනය 5995 කින් ශිෂ්‍යයින් 2485 කට පමණක් මහපොල ශිෂ්‍යත්ව ලැබුණි. මෙය සමස්ත ශිෂ්‍ය ජනගහනයෙන් 41.45% කි. මහපොල සාමාන්‍ය වාරිකය රු. 5,000.00 ක් (මාසිකව) වන අතර කුසලතා වාරිකය රු. 5,050.00 කි.

12.2 ශිෂ්‍යාධාර

2020 වර්ෂයේ ශිෂ්‍යාධාර ලැබූ සංඛ්‍යාව 1923 කි. මෙය මුළු ශිෂ්‍ය ජනගහනයෙන් 32.08% කි. ශිෂ්‍යාධාර වාරික මුදල රු. 4,000.00 කි.

මහපොල සහ ශිෂ්‍යාධාර ලෙස මූල්‍යාධාර ලබා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4408 කි. මෙය මුළු ජනගහනයෙන් 73.53% කි.

12.3 2020 වර්ෂය තුළ මහපොල ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව

පීඨය	බඳවා ගත් වර්ෂය	අධ්‍යයන වර්ෂය	මහපොල ශිෂ්‍යත්ව		ශිෂ්‍යාධාර	
			මහපොල ශිෂ්‍යත්ව ලැබූ සිසුන් සංඛ්‍යාව	ගෙවූ මුදල (LKR)	ශිෂ්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව	ගෙවූ මුදල (LKR)
කෘෂි විද්‍යා පීඨය	2018/2019	පළමු වසර	9	ගෙවිය යුතුයි	114	-
	2017/2018	දෙවන වසර	12	160,000.00	89	1,368,000.00
	2016/2017	තෙවන වසර	31	1,205,000.00	90	1,252,000.00
	2015/2016	සිව්වන වසර	25	935,000.00	51	800,000.00
	2014/2015	සිව්වන වසර	8	315,000.00	46	158,400.00
ව්‍යවහාරික විද්‍යා පීඨය	2018/2019	පළමු වසර	67	310,000.00	159	-
	2017/2018	දෙවන වසර	69	2,230,000.00	157	1,704,000.00
	2016/2017	තෙවන වසර	93	3,150,000.00	109	1,208,000.00
	2015/2016	තෙවන වසර (දෙවන සාමාසිකය)	96	3,370,000.00	73	752,000.00
	2014/2015	සිව්වන වසර	87	3,145,000.00	42	42,000.00
භූ විඥාපන පීඨය	2018/2019	පළමු වසර	63	610,000.00	3	-
	2017/2018	දෙවන වසර	54	1,835,000.00	10	300,000.00
	2016/2017	තෙවන වසර	41	1,510,000.00	26	756,000.00
	2015/2016	තෙවන වසර (දෙවන සාමාසිකය)	40	1,400,000.00	11	344,000.00
	2014/2015	සිව්වන වසර	33	1,195,000.00	6	152,000.00

පීඨය	බඳවා ගත් වර්ෂය	අධ්‍යයන වර්ෂය	මහපොල ශිෂ්‍යත්ව		ශිෂ්‍යාධාර	
			මහපොල ශිෂ්‍යත්ව ලැබූ සිසුන් සංඛ්‍යාව	ගෙවූ මුදල (LKR)	ශිෂ්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව	ගෙවූ මුදල (LKR)
කළමනාකරණ අධ්‍යයන පීඨය	2018/2019	පළමු වසර	139	2,305,500.00	162	2,940,000.00
	2017/2018	දෙවන වසර	183	6,080,250.00	105	2,812,000.00
	2016/2017	තෙවන වසර	230	7,875,600.00	57	1,612,000.00
	2015/2016	තෙවන වසර (දෙවන සාමාසිකය)	210	6,390,000.00	48	1,307,300.00
	2014/2015	සිව්වන වසර	232	8,045,300.00	34	1,035,700.00
වෛද්‍ය පීඨය	2018/2019	පළමු වසර	31	ගෙවිය යුතුයි	N/A	N/A
	2017/2018	දෙවන වසර	27	1,085,000.00	4	112,000.00
සමාජීය විද්‍යා හා භාෂා පීඨය	2018/2019	පළමු වසර	98	193,550.00	134	516,000.00
	2017/2018	දෙවන වසර	95	2,980,000.00	120	3,440,000.00
	2016/2017	තෙවන වසර	126	4,375,000.00	79	2,424,000.00
	2015/2016	තෙවන වසර (දෙවන සාමාසිකය)	112	4,385,000.00	74	2,276,000.00
	2014/2015	සිව්වන වසර	120	4,205,200.00	60	1,724,000.00
තාක්ෂණ පීඨය	2018/2019	පළමු වසර	82	640,000.00	32	448,000.00
	2017/2018	දෙවන වසර	72	240,000.00	28	464,000.00
එකතුව			**2485**	**70,170,400.00**	**1923**	**29,947,400.00**

මහපොල ශිෂ්‍යත්ව ලබා ගත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රගතිය



ශිෂ්‍යාධාර ලබා ගත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රගතිය



FAS	-	කෘෂි විද්‍යා පීඨය
FAPSC	-	ව්‍යවහාරික විද්‍යා පීඨය
FG	-	භූ විඥාපන පීඨය
FMS	-	කළමනාකරණ අධ්‍යයන පීඨය
FOM	-	වෛද්‍ය පීඨය
FSSL	-	සමාජීය විද්‍යා හා භාෂා පීඨය
FT	-	තාක්ෂණ පීඨය

13. වාර්ෂික ගිණුම් - 2020

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
2020 දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වත්කම්	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමානද෫	**2**	25,018,058	17,324,233
ලැබිය යුතු ද෫	**3**	38,011,976	29,677,918
ණය හා සේවක අත්තිකාරම්	**4**	19,075,055	20,573,720
තොග	**5**	37,097,263	39,508,262
අනෙකුත් අත්තිකාරම්	**6**	251,514,708	164,640,960
		370,717,060	271,725,093
ජංගම නොවන වත්කම්			
ණය හා සේවක අත්තිකාරම්	**4**	55,656,004	55,369,227
තැන්පතු	**7**	76,846,811	100,171,416
පශු සම්පත්	**8**	2,895,925	1,383,770
දැනුම වර්ධනය කිරීම	**9**	559,181	573,541
විෂය මාලා සංශෝධනය කිරීම	**10**	173,000	235,076
ස්ථාපිත කිරීමේ ප්‍රාථමික පිරිවැය	**11**	4,083,731	5,444,974
අස්පෘශ්‍ය වත්කම් (ශුද්ධ)	**12**	2,890,502	6,049,485
කෙරිගෙන යන වැඩ	**13**	317,931,993	92,256,956
දේපල පිරියත උපකරණ (ශුද්ධ)	**14**	3,077,224,440	3,232,286,578
		3,538,261,587	3,493,771,023
මුළු වත්කම්		**3,908,978,647**	**3,765,496,116**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	**15**	299,888,185	337,971,082
ගෙවිය යුතු වියදම්	**16**	149,356,764	146,891,195
නිදහස් කලයුතු තැන්පතු හා අරමුදල්	**17**	119,200,660	99,934,663
පාරිතෝෂික වෙන් කිරීම්	**18**	3,666,703	11,760,442
		572,112,312	**596,557,382**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන් කිරීම්	**18**	470,253,105	448,518,962
		470,253,105	**448,518,962**
මුළු වගකීම්		**1,042,365,417**	**1,045,076,344**
මුළු ශුද්ධ වත්කම්		**2,866,613,230**	**2,720,419,772**

ශුද්ධ වත්කම් /හිමිකම්	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
ප්‍රාග්ධන ප්‍රදාන	19	3,433,549,209	3,202,193,869
අනෙකුත් සංචිත	20	60,495,111	58,982,956
සමුච්චිත අතිරික්තය /ඌණතාවය	21	(723,760,585)	(632,657,162)
ඇහුරූ සංචිත අරමුදල්	22	76,772,025	76,041,294
පරිත්‍යාග		19,557,469	15,858,815
මුළු ශුද්ධ වත්කම් /හිමිකම් එකතුව		2,866,613,230	2,720,419,772

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ අවශ්‍යතාවයන් සහ අනිකුත් ව්‍යවස්ථානුකූල නියමයන් හා එකඟ වේ.

ඉංග්‍රීසි පිටපතේ අත්සන් යොදා ඇත.

ඩබ් ඒ එම් පී සේනාධීර
වැඩබලන මූල්‍යාධිකාරී

විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමට වගකිවයුතු වේ.පාලක සභාව වෙනුවෙන් අත්සන් කරන ලදී

මහාචාර්ය ආර් එම් යූ එස් කේ රත්නායක	පියතිස්ස රණසිංහ	එම් එම් රෆීක්
උපකුලපති	පාලකසභා සාමාජික	පාලකසභා සාමාජික

01.03.2021

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයයි

	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
ආදායම්			
පුනරාවර්තන ප්‍රදාන		1,806,500,000	1,629,295,000
මහපොල සහ ශිෂ්‍යාධාර	23	40,775,850	53,944,700
ස්වයං ජනින ආදායම් පාඨමාලා ආදායම	24	49,441,617	53,297,764
අනෙකුත් ආදායම්	25	21,587,290	33,958,709
විලම්භිත ආදායම්	26	394,617,492	413,667,067
මුළු ආදායම		**2,312,922,248**	**2,184,163,240**
මෙහෙයුම් වියදම්			
පුද්ගලික වේතන	27-A	1,613,811,336	1,415,774,481
ගමන් වියදම් සහ සංයුක්ත දීමනා	27-B	3,955,050	3,505,543
සැපයුම් සහ පරිභෝජන	27-C	43,188,183	64,019,794
නඩත්තු වියදම්	27-D	14,436,830	19,064,538
ගිවිසුම්ගත සේවා	27-E	220,199,106	216,334,440
අනෙකුත් පුනරාවර්තන වියදම්	27-F	32,519,850	58,666,703
ස්වයං ජනින ආදායම් පාඨමාලා වියදම	27-G	35,775,531	39,809,398
මහපොල සහ ශිෂ්‍යාධාර	27-H	40,775,850	53,944,700
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	27-I	399,365,187	404,312,033
මුළු වියදම		**2,404,026,922**	**2,275,431,629**
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌණතාවය		**(91,104,674)**	**(91,268,389)**
ජල පිරිපහදු ඒකකය ඉවත් කිරීමේ අලාභය		1,250	-
මෝටර් රථය ඉවත් කිරීමේ ලාභය		-	1,963,000
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ඌණතාවය		**(91,103,424)**	**(89,305,389)**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයයි

	සටහන්	2020 සත්‍ය රු.	2020 ඇස්තමේන්තුගත රු.
ආදායම්			
පුනරාවර්තන ප්‍රදාන		1,806,500,000	1,806,500,000
මහපොල සහ ශිෂ්‍යාධාර ප්‍රදාන	23	40,775,850	40,775,850
ස්වයං ජනින ආදායම් පාඨමාලා ආදායම	24	49,441,617	-
අනෙකුත් ආදායම්	25	21,587,290	7,885,000
විලම්බිත ආදායම්	26	394,617,492	-
මුළු ආදායම		**2,312,922,248**	**1,855,160,850**
මෙහෙයුම් වියදම්			
පුද්ගලික වේතන	27-A	1,613,811,336	1,582,074,000
ගමන් වියදම් සහ සංයුක්ත දීමනා	27-B	3,955,050	1,433,000
සැපයුම් සහ පරිභෝජන	27-C	43,188,183	75,285,000
නඩත්තු වියදම්	27-D	14,436,830	16,502,000
ගිවිසුම්ගත සේවා	27-E	220,199,106	119,626,000
අනෙකුත් පුනරාවර්තන වියදම්	27-F	32,519,850	17,965,000
ස්වයං ජනින ආදායම් පාඨමාලා වියදම	27-G	35,775,531	-
මහපොල සහ ශිෂ්‍යාධාර	27-H	40,775,850	40,775,850
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	27-I	399,365,187	404,312,033
මුළු වියදම		**2,404,026,922**	**2,257,972,883**
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌණතාවය		**(91,104,674)**	**-**
මෝටර් රථ ඉවත් කිරීමේ අලාභය		**1,250**	**-**
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌණතවය)		**(91,103,424)**	**-**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල්		
මෙහෙයුම් කටයුතු මගින් අතිරික්තය/ඌණතාවය	(91,103,424)	(87,495,768)
මුදල් නොවන කටයුතු සඳහා ගැලපීම්		
ක්ෂය වෙන් කිරීම් - දේපල පිරියත සහ උපකරණ සඳහා	387,355,971	376,916,923
මෝටර් වාහන ඉවත් කිරීමේ ලාභය	-	(1,963,000)
උපාධි ලෝගු ඉවත් කිරීමේ ලාභය	(1,250)	-
ක්‍රමක්ෂය වියදම්	12,009,216	18,851,910
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	25,057,083	44,892,495
වසර 5 වැඩි රඳවා ගැනීම් කපා හැරීම	-	(2,496,599)
ඇහුරූ සංචිත අරමුදල් වලින් විශ්වවිද්‍යාලයේ දායකත්වය මාරු කිරීම	(16,685)	(317,232)
සම්මන්ත්‍රණ ආදායම් - සමාජවිද්‍යා හා භාෂා පීඨය	(47,236)	
ණය ගැලපුම් ගිණුම	-	-
කල්බදු පොලී	-	122,711
පොලී ආදායම්	(6,968,547)	(16,226,596)
විලම්බිත ආදායම්	(394,617,492)	(404,624,997)
මෙහෙයුම් කටයුතු වලින් ජනිත අතිරික්තය (ඌණතාවය)	**(68,332,365)**	**(72,340,153)**
තොග (වැඩිවීම්)/(අඩුවීම්)	2,410,999	(6,403,387)
ජංගම වත්කම් (වැඩිවීම්)/(අඩුවීම්)	(6,930,417)	(1,114,243)
ජංගම වගකීම් (වැඩිවීම්)	72,051,367	64,456,976
පාරිතෝෂික ගෙවීම්	(11,416,678)	(221,700)
මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(12,217,093)**	**(15,622,506)**
ආයෝජන කටයුතු වලින් ජනිත මුදල් ප්‍රවාහ		
ඉඩම් දේපල හා උපකරණ මිලදී ගැනීම	(345,688,861)	(460,687,234)
මෝටර් රථ විකිණීමෙන් උත්පාදනය වූ මුදල්	-	1,963,000
උපාධි ලෝග විකිණීමෙන් උත්පාදනය වූ මුදල්	6,250	
අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම	(778,289)	(177,500)
කෙරිගෙන යන වැඩ සඳහා ගෙවීම	(136,424,798)	(70,433,440)
ණය ගෙවීම්	(27,644,946)	(61,652,872)
ණය ලැබීම්	28,856,834	63,031,293
පොලී ආදායම්	4,563,324	5,566,098
තැන්පත,තත්වය සහතික කිරීම,වෘත්තීය මාර්ගෝපදේශය,බුද්ධි වර්ධනය,උපදේශන ගාස්තු	(36,560,718)	(15,319,656)
සේවය යෙදවීමේ අත්තිකාරම් ලැබීම්	-	1,179,621
ස්ථාවර තැන්පත් ආපසු ගැනීම්	61,571,232	-
ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා ලැබීම්	150,000	3,115,600
පර්යේෂණ හා සම්මන්ත්‍රණ සඳහා ගෙවීම්	(3,659,794)	(9,814,145)
වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්	473,000,000	499,000,000
ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය	**17,390,235**	**(44,229,236)**
මූල්‍ය කටයුතු වලින් ජනිත මුදල් ප්‍රවාහය		
කල්බදු ගෙවීම්	-	(4,284,636)
අවුරා තබන ලද අරමුදල් ලැබීම්	29,883,255	33,034,864
අවුරා තබන ලද අරමුදල් ගෙවීම්	(27,362,571)	(20,874,275)
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,520,684**	**7,875,954**
සමස්ථ ශුද්ධ මුදල් හා මුදල් සමානද්‍ය වැඩිවීම්/(අඩුවීම)	7,693,826	(51,975,788)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමානද්‍ය	17,324,233	69,300,021
වර්ෂය අවසානයට මුදල් හා මුදල් සමානද්‍ය	**25,018,058**	**17,324,233**
සටහන් ඒ		
මුදල් හා මුදල් සමානද්‍ය		
මුදල් සහ බැංකු ශේෂය	**25,018,058**	**17,324,233**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

හිමිකරුවන් සඳහා හිමිකම්						
	ප්‍රාග්ධන දායකත්වය	අනෙකුත් සංචිත	සමුච්චිත අතිරික්ත (ඌණතාවය)	එකතුව	සුළුතර හිමිකම්	ශුද්ධ වත්කම්/ හිමිකම්
2019/12/31 දිනට ශේෂය	3,263,050,823	58,982,956	(632,243,972)	2,689,789,807	-	2,689,789,807
ගිණුම් කරණ ප්‍රතිපත්ති සහ දෝෂ වෙනස් කිරීම් පෙර වර්ෂ ගැලපීම්	31,043,154	-	(413,188)	30,629,966		30,629,966
සංශෝධනය කල ශේෂය 01/01/2020	3,294,093,977	58,982,956	(632,657,161)	2,720,419,772	-	2,720,419,772
2020 වර්ෂයේ ශුද්ධ වත්කම් හිමිකම් වෙනස්වීම	235,784,726	-		235,784,726	-	235,784,726
පශු සම්පත් නැවත අගය මත ලාභය	-	1,512,155	-	1,512,155	-	1,512,155
ආයෝජන නැවත අගය මත ලාභය	-	-	-	-	-	-
විදේශීය ගනුදෙනු මත විනිමය වෙනස්කම්	-	-	-	-	-	-
		-				
ශුද්ධ වත්කම් හා හිමිකම් සඳහා සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම	-	1,512,155	-	1,512,155	-	1,512,155
වර්ෂය සඳහා ඌණතාවය	-	-	(91,103,424)	(91,103,424)	-	(91,103,424)
වර්ෂය සඳහා හඳුනාගත් ආදායම් වියදම් එකතුව	-	-	-	-	-	-
2020-12-31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය	**3,529,878,703**	**60,495,111**	**(723,760,585)**	**2,866,613,229**	-	**2,866,613,230**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
2020 වර්ෂය සඳහා ඒකක ශිෂ්‍ය පිරිවැය

		වියදම වෙන් කරන ලද පදනම	පීඨ						
	මුළු වියදම 2020		කෘෂි විද්‍යා පීඨය	ව්‍යවහාරික විද්‍යා පීඨය	කළමණාකරණ අධ්‍යයන පීඨය	සමාජ විද්‍යා හා භාෂා පීඨය	භූ විශ්‍රදාපන පීඨය	වෛද්‍ය පීඨය	තාක්ෂණ පීඨය
ශිෂ්‍ය සංඛ්‍යාව	5987		669	1379	1681	1389	424	145	300
සෘජු පිරිවැය	1,291,468,030	**Direct**	247,299,873	292,071,976	239,082,961	289,254,415	119,459,267	62,392,016	41,907,522
සෘජු ඒකක ශිෂ්‍ය පිරිවැය	215,712		369,656	211,800	142,227	208,247	281,744	430,290	139,692
සෘජු පරිපාලන පිරිවැය									
පොදු	136,467,767	No: of students	15,249,196	31,432,946	38,316,739	31,660,887	9,664,662	3,305,132	6,838,204
මූල්‍ය	31,336,625	No: of students	3,501,621	7,217,840	8,798,541	7,270,181	2,219,263	758,946	1,570,233
සැපයුම්	14,865,609	No: of students	1,661,114	3,424,031	4,173,892	3,448,861	1,052,784	360,032	744,894
ප්‍රවාහන	53,623,262	No: of students	5,991,976	12,351,174	15,056,072	12,440,740	3,797,605	1,298,709	2,686,985
ආරක්ෂක	85,472,942	No: of students	9,550,927	19,687,187	23,998,666	19,829,951	6,053,203	2,070,081	4,282,927
එකතුව	321,766,205		35,954,834	74,113,178	90,343,910	74,650,619	22,787,518	7,792,901	16,123,244
සෘජු ඒක ශිෂ්‍ය පරිපාලන පිරිවැය	53,744		53,744	53,744	53,744	53,744	53,744	53,744	53,744
අධ්‍යයන සහායක සේවා									
විභාග	19,839,715	No: of students	2,216,932	4,569,729	5,570,496	4,602,867	1,405,051	480,501	994,140
පුස්තකාල	39,382,633	No: of students	4,400,698	9,071,096	11,057,659	9,136,876	2,789,082	953,814	1,973,407
අධ්‍යයන තාක්ෂණ	36,692,702	No: of students	4,100,120	8,451,518	10,302,394	8,512,805	2,598,581	888,666	1,838,619
සෞඛ්‍යය	4,884,970	No: of students	545,857	1,125,167	1,371,577	1,133,326	345,954	118,310	244,779
ශාරීරික අධ්‍යාපන	14,452,489	No: of students	1,614,952	3,328,876	4,057,898	3,353,016	1,023,527	350,027	724,194
සේවක සහ ශිෂ්‍ය සුභසාධනය	33,824,616	No: of students	3,779,634	7,790,905	9,497,107	7,847,401	2,395,463	819,203	1,694,903
ඉඩම් හා ගොඩනැගිලි	90,336,711	No: of students	10,094,415	20,807,470	25,364,291	20,958,358	6,397,656	2,187,878	4,526,643
විදුලිය	22,555,973	No: of students	2,520,452	5,195,371	6,333,154	5,233,046	1,597,416	546,286	1,130,248
ජලය	2,214,600	No: of students	247,464	510,094	621,804	513,793	156,838	53,636	110,970
උද්‍යාන අංශය	6,933,050	No: of students	774,714	1,596,906	1,946,627	1,608,486	490,999	167,913	347,405
පොදු කටයුතු	20,265,433	No: of students	2,264,502	4,667,785	5,690,027	4,701,634	1,435,200	490,811	1,015,472
එකතුව	291,382,892		32,559,739	67,114,917	81,813,035	67,601,610	20,635,769	7,057,043	14,600,780
අධ්‍යයන සහායක ඒක පිරිවැය	48,669		48,669	48,669	48,669	48,669	48,669	48,669	48,669
මුළු පිරිවැය	1,904,617,127		315,814,446	433,300,071	411,239,907	431,506,644	162,882,554	77,241,960	72,631,545
ඒකක ශිෂ්‍ය පිරිවැය	318,125		472,069	314,213	244,640	310,660	384,157	532,703	242,105

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

1..1.1 ගිණුම් වාර්තාකරණ ආයතනය

සබරගමුව විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාලීය පනත යටතේ නැ.පෙ. 02 බෙලිහුල්ඔය යන ලිපිනයේ ස්ථාපිත කර ඇති අතර රාජ්‍ය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ජාතික විශ්වවිද්‍යාලයකි.

1..1.2 ප්‍රධාන කර්තව්‍යයන් සහ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සමනලවැව ජලාශයට යන මාර්ගයේ වම්පසින්ද කොළඹ බදුල්ල අධිවේගී මාර්ගයෙන් කිලෝමීටර් 160 ක් පමණ දුරින්ද පිහිටා ඇත. වර්තමානයේ ස්ථාපිත පීඨ වන වෛද්‍ය පීඨය සහ තාක්ෂණික පීඨයේ කටයුතු වර්මානයේ ක්‍රියාකාරීව පවතී. විශ්වවිද්‍යාලය පීඨ 08 කින් සමන්විත වන එතර ඒවා නම්,

1 පශ්චාද් උපාධි පීඨය
2 කෘෂිවිද්‍යා පීඨය
3 ව්‍යවහාරික විද්‍යා පීඨය
4 භූ විඥාපන පීඨය
5 තළමණාකරණ අධ්‍යයන පීඨය
6 වෛද්‍ය පීඨය
7 සමාජවිද්‍යා හා භාෂා පීඨය
8 තාක්ෂණ පීඨය

මෙම පීඨ වලට අමතරව විශ්වවවිද්‍යාලය යටතේ පහත සඳහන් අධ්‍යයන මධ්‍යස්ථාන 11 ද ක්‍රියාත්මක වේ.

1 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
2 කෘෂිව්‍යාපාර සමීක්ෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
3 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
4 විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
5 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
6 ආදිවාසී ජන කේන්ද්‍රය
7 පර්යේෂණ හා දැනුම බෙදාහැරීමේ මධ්‍යස්ථානය
8 අභ්‍යන්තර තත්ව ආරක්ෂණ ඒකකය
9 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය
10 පෙව විවිධත්ව සහ පරිසර අධ්‍යයන ඒකකය
11 විශ්වවිද්‍යාල කෞතුකාගාරය

1.1.3 ගිණුම් පිළියෙල කිරීමේ මූලිකයන්

(අ) ගිණුම් ප්‍රකාශන වල අනුකූලතාව

ගිණුම් ප්‍රකාශන වල පහත සඳහන් ගිණුම් ප්‍රකාශ ඇතුලත් වේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන වාර්ථාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශුද්ධ වත්කම් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ගිණුම් සඳහා සටහන්.
සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව උපචිත පදනමින් පිළියෙල කර ඇත. අනුගමනය කර ඇති සියළු ගිණුම්කරණ ප්‍රත්පත්ති අඛණ්ඩව අනුගමනය කර ඇති අතර යම් ගිණුම්කරණ වෙනස්වීමක් සිදු කර ඇත්නම් එකී වෙනස්වීමට අදාලව නියමිත පරිදි ගැලපීම් කර ප්‍රවර්තන වර්ෂයේ සන්සන්දනාත්මකව ඉදිරිපත් කර ඇත.

(ආ) ඇගයීම් පදනම

සබරගමුව විශ්වවිද්‍යාලයේ සියළු මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය සංකල්ප යටතේ ගිණුම් ගත කර ඇති අතර මෙම සංකල්පයෙන් බැහැරව ගිණුම්ගත කර ඇත්නම් ඒ පිළිබඳ පැහැදිලිව හෙලිදරව් කොට ඇත.

(ඇ) ගනු දෙනු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මුදල් ඒකකය

සබරගමුව විශ්වවිද්‍යාලයේ සියළු ගිණුම්ගත කිරීම් මූල්‍ය ඒකකය ලෙස රුපියල් අගය පදනම්ව පිළියෙල කර ඇත.

(ඈ) අඛණ්ඩ බව

සියළු ගිණුම් ප්‍රකාශන දිගින් දිගටම පැවැතීමේ සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

1.2 <u>වත්කම් සහ එම වත්කම් අගය කිරීමේ පදනම</u>

1.2.1 ඉඩම්, දේපල පිරියත සහ උපකරණ

ඉඩම්, ගොඩනැගිලි, විද්‍යාගාර උපකරණ සහ ඉගැන්වීමේ උපකරණ සියළු, සවිකිරීම්, පුස්තකාල පොත් හා වාර්ෂික වාර්ථා, මෝටර් වාහන, උපාධි ලෝගු සහ අනෙකුත් වත්කම් ස්ථාවර වත්කම් තුල ඇතුලත් වන අතර මෙම වත්කම් රජයේ ප්‍රදාන, පරීක්ෂණ ප්‍රදාන, පරිත්‍යාග සහ උත්පාදිත අරමුදල් මගින් මිලදී ගැනීම හෝ ඉදිකිරීම කර ඇත.

(අ) හඳුනාගැනීම් හා මැනීම්

දේපල පිරියත හා උපකරණ හඳුනාගනු ලබන්නේ විශ්වවිද්‍යාලයට වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින්නේ නම් සහ අදාල පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි නම් පමණි. දේපල පිරියත හා උපකරණ ගිණුම් ගත කරනු ලැබ ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් වන අතර පිරිවැය යන්නට අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ එම දේපල පිරියත ආර්ථිකමය වශයෙන් උපයෝජනය කර ගැනීම සඳහා එම තත්වයට ගෙන ඒමට දරණ ලද සියළුම පිරිවැය ඇතුලත් කර ඇත..

(ආ) පිරිවැය

සියළුම දේපල පිරියත හා උපකරණ වල අගය ලෙස එම දේපල මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට උපයෝගී කර ගත් පිරිවැය සහ එම දේපල පිරියත ආර්ථිකමය වශයෙන් උපයෝජනය කර ගැනීම සඳහා එම තත්වයට ගෙන ඒමට දරණ ලද සියළුම පිරිවැය ඇතුලත් කර ඇත.

(ඇ) පවතින වත්කම් සඳහා පසු කාලීනව දැරූ පිරිවැය

පවතින සියළුම ස්පෘශ්‍ය වත්කම් සඳහා පසුව දැරූ වියදම් පහත සඳහන් ගණායට නොවැටෙන අවස්ථා වලදී එම වියදම් දැරූ වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට වියදම් ලෙස ඇතුලත් කර ඇති අතර අනෙකුත් සෑම විටම වත්කම් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශන වලට ඇතුලත් කර ඇත.

- අදාල වත්කමෙහි වෙළෙඳපල වටිනාකම ඉහලයෑම
- වත්කමෙහි ධාරිතාව ඉහලයෑම
- වත්කමෙහි නිෂ්පාදිතයන්හි ප්‍රමිතිය ඉහල යෑම හෝ මෙහෙයුම් පිරිවැය පහල යෑම
- අදාල පිරිවැය නිසා එම දේපලහි ඵලදායී ජීවිත කාලය ඉහල යෑම

(ඈ) ක්ෂය වෙන් කිරීම්

ඉඩම් සඳහා ක්ෂය වෙන්කිරීම් නොකරනු ලබන අතර අනෙකුත් සියළුම දේපල පිරියත හා උපකරණ සඳහා දේපල වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන සෘජු ක්‍රමය යටතේ ක්ෂය වෙන් කරනු ලැබේ. ප්‍රවර්තන වර්ෂයේ සියළු ක්ෂය වෙන්කිරීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුලත් කොට ඇත. ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය පහත දක්වා ඇත.

ක්ෂය වෙන් කිරීම්	**ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය**
ගොඩනැගිලි	අවුරුදු 20
ජල පිරිපහදු ඒකකය	අවුරුදු 20
මාර්ග ජාල	අවුරුදු 20
කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ	අවුරුදු 05
පරිගණක සහ පරිගණක උපාංග	අවුරුදු 05
පුස්තකාල පොත් හා වාර්ෂික ප්‍රකාශන	අවුරුදු 05
තොරතුරු හුවමාරු උපකරණ	අවුරුදු 05
මෝටර් රථ වාහන	අවුරුදු 05
උපාධි සාධක	අවුරුදු 05
අනිකුත් උපකරණ	අවුරුදු 05

ක්ෂය වෙන් කරනු ලබන සියළුම ස්ථාවර වත්කම් සඳහා මිලදී ගත් දිනය නොසලකා මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණ ක්ෂය වෙන් කරනු ලබන අතර ඉවත් කරනු ලබන වර්ෂය සඳහා ක්ෂය වෙන් කරනු නොලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කාමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක 649 දරණ චක්‍රලේඛණය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීමේ රේටයන් යොදාගෙන ඇති අතර මෙම රේටයන් 2006 මුදල් වර්ෂයේ සිට අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන අතර ඉදිරියේදීත් මෙම රේටයන් තබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම ක්ෂය අනුපාතයන් සබරගමුව විශ්වවිද්‍යාලයේ 20-01-2007 පැවති 117 වන පාලක සභාව විසින් අනුමත කර ඇත.

2020 වර්ෂයේ පහත දීර්ඝකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සම්පූර්ණ කර විශ්වවවිද්‍යාලයට භාරදෙන ලදි. මෙම වත්කම්, ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කරනු ලැබ ඇති අතර මෙම වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපත්තිය 2020 වර්ෂයේ සිට අනුගමනය කරනු ලැබේ.

i.	අන්තරජාල පහසුකම් සවිකිරීමේ සහ ස්ථාපනය කිරීමේ	
ii.	පිරිවැය -මුංගස්තැන්න	රු.1,028,883.06
iii.	පශ්චාද් උපාධි පීඨය පුනරුත්තාපන කිරීමේ පිරිවැය	රු.1,755,568.99
iv.	වහල ඉදිකිරීමේ පිරිවැය-කළමණාකරන අධ්‍යයන පීඨය සහ සමාජවිද්‍යා හා භාෂා පීඨය	රු.4,660,649.01

2020 වර්ෂයේදී උපාධි ලෝගුවක් රු.6,250/- ක වටිනාකමකට ඉවත් කිරීම සිදු කර ඇති අතර එම වත්කමේ ශුද්ධ පොත් අගය පහත පරිදි වේ.

පිරිවැය	ක්ෂය	ශුද්ධ පොත් අගය
රු. 6,250/-	රු. 1250/-	රු.5000/-

ඉවත් කිරීමෙන් ලද ලාභය වූ රු.1,250/-, 2020 වර්ෂයේ දී කාර් සාධන ප්‍රකාශනයට අය කරන ලදි.

(ඉ) ප්‍රාග්ධන ස්වරූපයේ කෙරීගෙන යන වැඩ

ප්‍රාග්ධන ස්වරූපයේ කෙරීගෙන යන වැඩ පිරිවැය මත ගිණුම්ගත කර ඇත. ප්‍රාග්ධන ස්වරූපයේ වර්ෂය තුල කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා ඇති අතර වර්ෂය තුල සම්පූර්ණ වශයෙන් නිම වී භාවිතාවට ගනු ලබන කෙරීගෙන යන වැඩ තුල ඇති වත්කම් ස්ථාවර වත්කම් ලෙස කෙරීගෙන යන වැඩ තුලින් ඉවත්කොට වත්කම් ලෙස ප්‍රාග්ධන ගත කර ඇත.

1.2.2 අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය පැහැදිලිව හඳුනාගත් අනාගත ආර්ථික ඵලදායීතාවයන් ආයතනයට ගලා එන අස්පෘශ්‍ය වත්කම් පමණක් අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා ඇත.
සියළුම අස්පෘශ්‍ය වත්කම් පිරිවැය මත අගය කර ඇති අතර වර්තමාන තත්වයට ගෙන ඒමට දැරූ සියළුම වියදම් ඇතුලත් කර ඇත. ගිණුම් වල පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කර ඉදිරිපත් කර ඇති අතර ප්‍රාග්ධනගත කිරීමෙන් පසුව දරණ වියදම් එම වියදම් නිසා වත්කම් අනාගත ප්‍රාග්ධන ඵලදායීතාවය වර්ධනය වන්නේ නම් පමණක් වත්කම් වටිනාකමට එකතු කර ඇත. සියළුම අස්පෘශ වත්කම් වලට සීමිත ඵලදායී ජීවන කාලයක් ඇති බැවින් එම ජීවන කාලය හා සුන්බුන් අගය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පදනම ගණනය කර ඇති අතර ක්‍රමක්ෂය පදනම අඛණ්ඩව අනුගමනය කර ඇත. ඒ අනුව පහත පරිදි අස්පෘශ වත්කම් වල ඵලදායී ජීවන කාලය ගණනය කර ඇත.

(අ) පරිඝණක මෘදුකාංග වර්ෂ 5 ජීවිත කාලයට සෘජු ක්‍රමය අනුව

(ආ) විෂයමාලා සංශෝධන පිරිවැය වර්ෂ 5ක ජීවිත කාලයකට සෘජු ක්‍රමය අනුව නව විෂය මාලාව ක්‍රියාත්මක වන දින සිට

(ඇ) ස්වාධිකාරය වර්ෂ 5 පීවිත කාලයට සෘජු ක්‍රමය අනුව

1.2.3 විෂයමාලා ප්‍රතිසංශෝධනය

විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 5කට වරක් සියළුම උපාධිපාඨමාලා වල විෂයමාලා ප්‍රතිසංශෝධනය කරනු ලබන අතර මෙම කාලසීමාව තුල වෙනස් කිරීම් නොකරනු ලැබේ. මෙම වියදම ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකොට නව විෂයමාලා වල ආර්ථික ඵලදායීතාවය විශ්වවිද්‍යාලයට ගලා එන කාලසීමාව වර්ෂ 5 ක් ලෙස සලකා වර්ෂ 5 ක් තුල ක්‍රමක්ෂය ක්ෂය ලෙස කපා හරිනු ලැබේ. කළමණාකරණ අධ්‍යයන පීඨය සහ භූවිඥාපන පීඨය සඳහා 2015 වසරේ විෂයමාලා ප්‍රතිසංශෝධන කටයුතු සිදු කොට ඇති අතර මේ සඳහා දරණ ලද වියදම 2015 වසරේ සිට වසර 5 තුල ක්‍රමක්ෂය කරනු ලැබේ. කෘෂිවිද්‍යා පීඨය හා ව්‍යවහාරික විද්‍යා පීඨය 2016 වර්ෂයේ සිට නව සංශෝධනය කල විෂය මාලා ක්‍රියාත්මක කරන බැවින් ප්‍රාග්ධනගත කල එම පීඨ වල විෂයමාලා සංශෝධිත පිරිවැය 2016 සිට ක්‍රමක්ෂය කර ඇත.
විෂයමාලා ප්‍රතිසංශෝධන සඳහා තාක්ෂණ පීඨය විසින් දරණ ලද වියදම් 2019 වර්ෂයේ සිට ක්‍රමක්ෂය කරන ලදී.2019 වර්ෂයේදී කළමණාකරණ අධ්‍යයන පීඨයේ, සමාජ විද්‍යා හා භාෂා පීඨයේ සහ විවෘත සහ දුරස්ථ අධ්‍යයන ඒකකයේ විෂයමාලා ප්‍රතිසංශෝධන කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇත. කොවිඩ් 19 හේතුවෙන් 2020 සංශෝධිත විෂයමාලා ක්‍රියාත්මක නොවිය. එබැවින් සංශෝධිත විෂයමාලා ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව අදාල වියදම් ක්‍රමක්ෂය කරනු ලැබේ. එසේ වුවද විවෘත හා දුරස්ථ අධ්‍යයන ඒකකයේ නව සංශෝධිත විෂය මාලා ක්‍රියාත්මක වූ හෙයින් අදාල පිරිවැය 2020 වර්ෂයේදී ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

1.2.4 බුද්ධි අභිවෘද්ධිය සඳහා වියදම්

සේවක බුද්ධි අභිවෘද්ධිය සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනා ගන්නා අතර මෙම වියදම වසර 5ක කාලයක් තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

1.2.5 ස්ථාපිත කිරීමේ ප්‍රාථමික පිරිවැය

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද ගොඩනැගිල්ලක් තුල වෛද්‍ය විද්‍යා පීඨය ස්ථාපිත කල අතර විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල පවතින ගොඩනැගිලි තුළ තාක්ෂණ පීඨය ස්ථාපිත කිරීම සිදු කරන ලදී.. අලුත්වැඩියා සහ මෙම ගොඩනැගිලි පීඨ ස්ථාපිත කිරීම සඳහා සුදුසු තත්වයට ගෙන ඒම සඳහා දරණ ලද පිරිවැය ප්‍රාග්ධන පිරිවැය ලෙස සලකනු ලබන අතර 2019 වර්ෂයේ සිට අවුරුදු 05ක් පුරා ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ. වෛද්‍ය විද්‍යා පීඨය ස්ථාපිත කිරීමේදී දරණු ලබන උපදේශක සේවා පිරිවැය ප්‍රාග්ධන පිරිවැය ලෙස සලකනු ලබන අතර දරණු ලබන වර්ෂයේදී ක්‍රමක්ෂය කරනු ලැබේ.

1.2.6 පශු සම්පත්

පශු සම්පත් වාර්ෂික ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර එහි අතිරික්තය හෝ ඌණතාවය කාර්ය සාධන වාර්තාවෙහි ගැලපීම් කරනු ලැබේ. ප්‍රවර්ත වර්ෂයේ ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 1,512,155/-කි.

1.2.7 තොග

තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි යන අගයන්ගෙන් අඩු අගයට ගිණුම්ගත කොට ඇති අතර සාමාන්‍යයෙන් පළමු ලැබූ පළමු නිකුත් කිරීම පදනමින් පිරිවැය ගණනය කර ඇත.
තොග අගය කිරීමේ දී පිරිවැය හා තොග වර්තමාන තත්වයට ගෙන ඒමට දැරූ සියළුම වියදම් ඇතුලත් කර ඇත.
තොග යන්නට විශ්වවිද්‍යාලයට සේවය සැපයීමට අවශ්‍ය ද්‍රව්‍ය සහ සැපයුම් අන්තර්ගත වේ.

1.2.8 ලැබිය යුතු ලැබීම්

සියළු ලැබීම් උපලබ්ධිවීම් පදනමින් ගිණුම්ගත කොට ඇත.

1.2.9 විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රතිපත්ති අංක 20 ට අනුව සියළුම පර්යේෂණ වියදම් ගිණුම්ගතකොට ඇත. ඒ අනුව සියළුම පර්යේෂණ වියදම් ප්‍රාග්ධන ප්‍රදාන මගින් එම වසරේම කාර්ය සාධන වාර්තාවේ වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. යම් පරීක්ෂණයක් මගින් සොයා ගැනීම් පසුව සංවර්ධනය කරන්නේ නම් පමණක් සංවර්ධන වියදම ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ. මෙම පදනම මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කොට ඇත.
විශ්වවිද්‍යාලය විසින් ප්‍රාග්ධන අයවැය මගින් මෙම ප්‍රදාන සඳහා මුදල් වෙන් කරනු ලබන අතර ඉහත පදනම මත පරීක්ෂණ සඳහා වියදම්කරනු ලැබූ මුදල් කාර්ය සාධන වාර්තාවට වියදම් ලෙස කපාහැර ඇත. 2020 වර්ෂයේ මුළු පරීක්ෂණ වියදම් ලෙස රුපියල් 2,630,161/- මුදලක් යොදා ඇත.

1.2.10 මුදල් සහ මුදල් සමානයන්

මුදල් සහ මුදල් සමානයන් ලෙස අතැති මුදල් සහ බැංකු තැන්පතු ඇතුලත් කොට ඇත.

1.3 වගකීම් සහ වෙන් කිරීම්

මූල්‍ය තත්වය ප්‍රකාශිත දිනට හඳුනාගත හැකි සියළුම වගකීම්, වගකීම් ලෙස ගිණුම් ගත කොට ඇති අතර හඳුනාගත් නමුත් වගකීම් මුදල පැහැදිලිව හඳුනාගත නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

ඉල්ලූ විට ගෙවිය යුතු හෝ ඊලඟ ගිණුම් වර්ෂය තුල ගෙවිය යුතු සියළු වගකීම් ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇති අතර අනෙකුත් සියළු වගකීම් ජංගම නොවන වගකීම් ලෙස දක්වා ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයින් විශ්‍රාමයෑමේ දී ගෙවිය යුතු ප්‍රතිලාභ හඳුනාගෙන ඇත.

පාරිතෝෂික වෙන් කිරීම්

1983 අංක 12 දරණ සේවක පාරිතෝෂික පනත අනුව විශ්වවිද්‍යාලය මගින් සේවක පරිතෝෂික වෙන් කිරීම් කර ඇත..

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ සේවයෙන් විශ්‍රාම යෑමේ දී වයස සහ සේවා කාලය පදනමින් ප්‍රතිලාභ හඳුනාගන්නා අතර විශ්වවිද්‍යාලය මගින් ගිණුම් පිළියෙල කරන දිනට විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලබන විශ්වවිද්‍යාල පද්ධතිය තුල වර්ෂ 5 ක කාලයක් සම්පූර්ණ කල සියළුම සේවකයින් සඳහා පාරිතෝෂික වෙන් කිරීම් කර ඇත. එහිදී ඉදිරියට ගෙන එන ලද වෙන්කිරීම් ශේෂයෙන් වාර්ෂිකව කරන ලද පාරිතෝෂික ප්‍රමාණය අඩුකොට වර්තමාන ගිණුම් වාර්තා කරනු ලබන දිනට පාරිතෝෂික පනත යටතේ ගණනය කරනු ලැබූ ශේෂය ගැලපීම් කොට යම් වෙනසක් වේ නම් එම වෙනස කාර්ය සාධන ප්‍රකාශයට ගලපා ඇත. වාර්ෂික වෙන්කිරීම් වගකීම් ආයෝජනය කර නොමැත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කොමිෂන් චක්‍රලේඛ 05/2019 අනුව 2019 සිට සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීමේ දී අධ්‍යයන දීමනා සහ මාසික හිලව් දීමනාද සලකා බලනු ලැබේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම පසු සේවා නියුක්තිය පදනමින් ස්ථිර දායකත්ව කරනු ලබන අතර වැඩි මුදලක් ගෙවීමට ආයතනය බැඳී නොමැත. දායකත්ව වගකීම් සඳහා වෙන් කිරීම කර නොමැති අතර ගෙවිය යුතු බවට හඳුනාගත් විට පමණක් ගෙවීම් ලෙස ගිණුම්ගත කරනු ලබයි.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

විශ්වවිද්‍යාල පනත යටතේ සහ විශ්වවිද්‍යාලීය අර්ථසාධක පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලය තුල සේවය කරන සියළුම ස්ථිර කාර්ය මණ්ඩලය ඔවුන්ගේ වැටුපෙන් 10% ක් සහ විශ්වවිද්‍යාලය මගින් එම සේවකයාගේ වැටුපෙන් 15% ක මුදලක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදල සඳහා මාසිකව වෙන් කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ විශ්‍රාම වැටුප් අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපට දායක වී ඇති සේවකයින් සඳහා ඉහත සඳහන් විශ්වවිද්‍යාලය මගින් දායක කරනු ලබන 15%වේ මුදලින් එම එම සේවකයින් සඳහා 8% මුදලක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරන අතර ඉතිරි 7% පමණක් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. විශ්‍රාම වැටුපට දායක වී නොමැති සේවකයින් සඳහා මුළු මුදලම විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. 2000 වසරේ සිට අලුතින් බඳවා ගනු ලබන සියළුම සේවකයින් විශ්‍රාම පාරිතෝෂික අරමුදලට දායකවීම අනිවාර්ය වේ.

විශ්වවිද්‍යාලයේ සේවය කරන ස්ථිර නොවන සියළු සේවකයින් සඳහා විශ්වවිද්‍යාලය මගින් 12% ක් සහ අදාල සේවකයා විසින් 8% ක මුදලක් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක කරනු ලැබේ.

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල

විශ්වවිද්‍යාලය මගින් සියළුම සේවකයින් සඳහා සේවක වැටුපෙන් 3% ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක කරනු ලැබේ.

1.3.2 ප්‍රදාන ගිණුම්ගත කිරීම්

වියදම් දැරීම සඳහා වියදම් සඳහා ලැබූ සියළුම ප්‍රදාන එම වියදම් හඳුනාගත් කාලසීමාව තුල ආදායම් ලෙස හඳුනාගෙන කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් ලෙස ගිණුම් ගත කොට ඇත. ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් සඳහා ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රාග්ධන ප්‍රදාන මත මිලදී ගත් හෝ ඉදිකරන ලද වත්කම් වල ආර්ථික ඵලදායී ජීවන කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය පදනමින් ගිණුම් ගත කොට ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව විශ්වවිද්‍යාලය මගින් සියළුම ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග සඳහා ආදායම් පදනම මත 2014-01-01 දින සිට ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර ඉදිරියටත් මෙම ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

රුපියල් මිලියන 31 ක ප්‍රාග්ධන ප්‍රදානයක් වෛද්‍ය පීඨය සඳහා 2020 වර්ෂයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශ්වවිද්‍යාලයට ලැබී ඇත.

1.3.4 අවිනිශ්චිත වගකීම්

පහත සඳහන් අධිකරණ මගින් විභාග වන නඩු සඳහා විශ්වවිද්‍යාලයට එරෙහිව තීන්දු ලැබුණහොත් ඒ සඳහා වන්දි ගෙවීමට සිදුවිය හැක. මෙම නඩු මේ වන විටත් විභාග වෙමින් පවතින අතර එම නඩු සඳහා යම් ගෙවීමක් කිරීමට සිදු වුවහොත් එම වගකීම් ප්‍රමාණය අවිනිශ්චිත වන අතර එම මුදල ගිණුම් ඉදිරිපත් කරන දිනට තක්සේරු කල නොහැකි හෙයින් මෙසේ ඉදිරිපත් කරමි.

දිස්ත්‍රික් අධිකරණය

3917/M	ඩී.එම්.ඩී. එම්.එල්.ඩී.කේ. යටවර
3947/M	අනුරාධ රොඩ්රුගෝ
3555/M	ඩී.එම්. රත්නායක
4708-විශේෂ	මහින්ද මෙත්සිරි අතුකෝරල
4995/M	කුමුදුනී අතුකෝරල
4248/M	ඩබ් එස් ඩී ප්‍රියදර්ශනී
3918/M අභියාචනය	එම් ඩී එම් එල් ඩී කේ යටවර
DMR 1419/20	ඇසෝසියේටි නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්

ශ්‍රේෂ්ඨාධිකරණය

267/2014 (එෆ්/ආර්)	බී.එම්.ඩී.පී.ඒ.ඩී. බණ්ඩාර
CEFR/45/15	ටී.ඩී. මානාආරච්චි
SEFR/09/2015	ආර්. ඒ.එච්.එස්.එස්. කරුණාරත්න
SE.HCCA.LA 344/16	එම්. විමලදාස ද සිල්වා
SC/FRA/284/2020	එම්. ඩබ්.පී.ආර්.පෙහාරා

වාණිජ අධිකාරී

HC/LA 38/19	ඩිසයින් කන්සල්ටන්
HC/LA 39/19	ඩිසයින් කන්සල්ටන්

මානවහිමිකම් කොමිසම

HRC /642/15	එච්.එම්.පී.පී. ගුණතිලක
HRC/3562/15	ඩබ්.ඩී.ඒ.එස්. විජය
HRC/751/2016	ලයනල් ගුරුගේ

අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව

එම්. එම්. විමලසිරි

එම්. මිලින්ද විමලසිරි

එම්.එල්.එම්.කේ. දිසානායක

කාර්මික අධිකරණය

A/7/2049	පී.බී.එම්. ප්‍රසාද්

අභියාචනාධිකරණය

CA/Writ/463/2019	එම්.එන්. විනීෂියා
CA/Writ/545/2010	කේ.කේ අතුකෝරලගේ

විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලය

එස් මලවිපතිරණ

1.4 ආදායම් වාර්තාව

1.4.1 ආදායම් හඳුනා ගැනීම

(අ) මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනා ගෙන ඇත.

(ආ) ප්‍රදාන මගින් ලද ආදායම් අදාල ප්‍රදාන ලද කාලපරිච්ඡේදයේ හඳුනාගෙන ඇත.

(ඇ) අනුග්‍රහක ආදායම් ලැබීම් පදනමින් හඳුනා ගෙන ඇත.

(ඈ) අනෙකුත් සියළු ආදායම් උපචිත පදනමින් හඳුනාගෙන ඇත.

(ඉ) රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස වර්ගීකරණය කර ඇති අතර පුනරාවර්තන ආදායම්, ආදායම් ලෙස හඳුනාගෙන ඇති අතර ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා භාවිතා කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රාග්ධන භාණ්ඩ ක්ෂය පදනම මත විලම්භිත ආදායම් ලෙස ප්‍රවර්තන වර්ෂයේ සහ පසුව ආදායමට හඳුනාගනු ලැබේ. මුළු රාජ්‍ය ප්‍රදාන ලෙස ප්‍රවර්තන වර්ෂයේ ලැබූ රු. 2,289,275,850/-/- පහත වර්ගීකරණයේ දක්වා ඇත.

	2020 රු.	2019 රු.
රාජ්‍ය ප්‍රදාන පුනරාවර්තන	1,806,500,000	1,629,295,000
රාජ්‍ය ප්‍රදාන මහපොල ශිෂ්‍යත්ව	220,050	16,620,600
රාජ්‍ය ප්‍රදාන ශිෂ්‍යාධාර	40,555,800	37,324,100
රාජ්‍ය ප්‍රදාන ස්ථාවර වත්කම් පුනරුත්තාපන	2,588,000	15,800,000
ප්‍රාග්ධන ප්‍රදාන උපකරණ පොත් හා චාර සඟරා	78,475,000	117,000,000
ප්‍රාග්ධන ප්‍රදාන ඉදිකිරීම්	350,722,000	272,850,000
බුද්ධි වර්ධන හා මානුෂීය ප්‍රවර්ධන	10,215,000	22,350,000
එකතුව	2,289,275,850	2,111,239,700

1.4.1.1 එලදායී පොළී අනුපාත ක්‍රමය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 ට අනුව මූල්‍ය වත්කම් වලට අදාල පොළී ආදායම් සඵලදායී පොළී අනුපාත ක්‍රමයට 2020 වර්ෂේදී ගිණුම්ගත කර ඇත. මූල්‍ය වත්කම් මිණුම් කිරීමේ දී ක්‍රමක්ෂය පිරිවැය භාවිතා කරනු ලැබ ඇති අතර එහිදී මිලදී ගැනීමේ වට්ටම් හෝ අධිමිල සහ සඵලදායී පොළී අනුපාතයට අදාල ගාස්තු සැලකිල්ලට ගෙන ඇත.

1.4.2 වියදම්

සියළු වියදම් උපචිත පදනමින් ගිණුම් ගත කර ඇති අතර එම වියදම් මගින් උත්පාදනය කරන ලද ආදායමට එරෙහිව ගිණුම්ගත කොට ඇත.

1.5 ගිණුම්කරණ කාලච්ඡේදයට පසුව ඇතිවන සිදුවීම්

විශ්වවිද්‍යාලයේ නව පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම සහ ඉදිකිරීම CML-MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ආයතනය වෙත 2017 දෙසැම්බර් 27 දින මාස 24 ක ගිවිසුම් කාලච්ඡේදයකට පිරිනමන ලදී..පිරිනමන ලද අගය වූයේ රු. 315,051,433 + වැට් වේ. අදාල ආයතනයේ මූල්‍ය අර්බුද හේතුවෙන් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම නැවතී ඇති හෙයින් සබරගමුව විශ්වවිද්‍යාලය නෙතුපාර්ශික ගිවිසුමකට Romet කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම සහ CML-MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ආයතනය සමඟ අධ්‍යාපන අමාත්‍යංශයේ අනුමැතියට යටත්ව 2021 පෙබරවාරි 01 දින එළඹ ඇත. විශ්වවිද්‍යාලය විසින් කාර්ය සාධන සුරක්ෂාව මුදල් බවට 2021 පෙබරවාරි 03 දින පත්කර ගනු ලැබ ඇති අතර එසේ සිදු කර ඇත්තේ නොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ බැඳීම් වලට අනුකූල නොවීම හේතුවෙන් වේ. (කාර්ය සාධන සුරක්ෂා අංකය PFG/CGD/18/003- රු.15,752,571.65)

පහත අගයන් මූල්‍ය ප්‍රකාශන වල ඉහත ගිවිසුමට අදාලව පෙන්නුම් කරනු ලැබේ.

කෙරීගෙන යන වැඩ - පුස්තකාල ගොඩනැගිල්ල රු 39,314,427.39

පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අමතරව මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කල යුතු ප්‍රමාණාත්මක සිදුවීම මූල්‍ය කාලවිශේදයෙන් පසු සිදු නොවීය.

1.6 සන්සන්දනාත්මක තොරතුරු

සන්සන්දනාත්මක තොරතුරු අවශ්‍ය තැන්හි වර්තමාන ගිණුම් ඉදිරිපත් කරන ස්ථාන වල දක්වා ඇත.

1.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය අනුගමනය කරමින් පිළියෙල කර ඇත.

1.8 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 03 අනුව පෙර වර්ෂවලට අදාල පහත සඳහන් අගයන් පොදු සංචිත ගිණුමට ගැලපීම් කර ඇත.

පහත අගයන් පොදු සංචිත ගිණුමට හර කර ඇත

a	රු.	175,000.00	අඩුවෙන් වෙන් කිරීම්
b	රු.	181,660.00	Web based Development ව්‍යාපෘතිය
c	රු.	7,068.99	අඩුවෙන් වෙන් කිරීම්
d	රු.	32,250.10	රඳවා ගැනීම්
e	රු.	9,500.00	උපචිත පුනරාවර්තන වියදම්
f	රු.	4,604.60	උපචිත පුනරාවර්තන වියදම්
g	රු.	16,675.00	උපචිත පුනරාවර්තන වියදම්
h	රු.	317,184.00	උපචිත ප්‍රාග්ධන වියදම්
I	රු.	392,386.32	පුස්තකාල පොත් සහ සඟරා
J	රු.	28,055.00	පුස්තකාල පොත් සහ සඟරා
k	රු.	8,020.00	ගිණුම්ගත නොවූ අනෙකුත්-පුවත්පත් සඟරා වියදම්
l	රු.	72,866.26	අඩුවෙන් ගිණුම්ගත කල ක්ෂය
m	රු.	100.43	රඳවා ගැනීම්
n	රු.	10,000.00	අඩුවෙන් ක්‍රමක්ෂය කරන ලද ප්‍රාථමික ස්ථාපිත කිරීමේ පිරිවැය
o	රු.	44,000.00	විගණන ගාස්තු සඳහා අඩුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම්
p	රු.	1,623,182.00	අඩුවෙන් වෙන් කිරීම් -පශ්චාද් උපාධි පීඨය
q	රු.	9,389.91	අඩුවෙන් වෙන් කිරීම්
r	රු.	6,506,966.09	ස්ථාවර වත්කම් ආදායම
s	රු.	14,280,635.00	ස්ථාවර වත්කම් ක්ෂය කිරීම් AHEAD ව්‍යාපෘතිය

t	රු.	15,859.20	ගිණුම්ගත නොවූ ක්ෂය
u	රු.	16,675.00	ගිණුම් ගත නොවූ වියදම්
v	රු	3,335.00	වැඩිපුර ගිණුම්ගත වූ විලම්භිත ආදායම්
w	රු.	4,604.60	ගිණුම් ගත නොවූ වියදම්
x	රු.	920.92	වැඩිපුර ගිණුම්ගත වූ විලම්භිත ආදායම්
y	රු.	9,500.00	ගිණුම්ගත නොවූ වියදම්
z	රු.	1,900.00	වැඩිපුර ගිණුම්ගත වූ විලම්භිත ආදායම්

පහත අගයන් පොදු සංචිත ගිණුමට බැර කර ඇත

aa)	රු.	16,000.00	ගිණුම්ගත නොවූ තොග
bb)	රු.	0.53	රඳවා ගැනීම්
cc)	රු.	9,500.00	උපචිත පුණරාවර්තන වියදම්
dd)	රු.	4,604.60	උපචිත පුනරාවර්තන වියදම්
ee)	රු.	16,675.00	උපචිත පුනරාවර්තන වියදම්
ff)	රු.	317,184.00	උපචිත ප්‍රාග්ධන වියදම්
gg)	රු.	364,331.32	පුස්තකාල පොත් සහ සඟරා
hh)	රු.	28,055.00	පුස්තකාල පොත් සහ සඟරා
ii)	රු.	5,611.00	වැඩිපුර ක්ෂය කිරීම්
jj)	රු.	10,000.00	ගිණුම්ගත නොවූ විලම්භිත ආදායම්
kk)	රු.	486,897.29	වැඩිපුර ප්‍රතිපාදන වෙන් කිරීම්
ll)	රු.	4,401,540.50	වැඩිපුර ප්‍රතිපාදන වෙන් කිරීම්
mm)	රු.	2,034,692.98	අවුරුදු 2ට වඩා වැඩි තැන්පතු
nn)	රු.	14,280,634.70	විලම්භිත ආදායම් AHEAD ව්‍යාපෘත
oo)	රු.	317,184.00	වැඩිපුර ප්‍රතිපාදන වෙන් කිරීම්
pp)	රු.	15,859.20	ගිණුම්ගත නොවූ විලම්භිත ආදායම්
qq)	රු.	3,335.00	වැඩිපුර ක්ෂය කිරීම්
rr)	රු.	920.92	වැඩිපුර ක්ෂය කිරීම්
ss)	රු.	1,900.00	වැඩිපුර ක්ෂය කිරීම්

1..9 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ප්‍රදාන (HETC GRANT)

උක්ත ප්‍රදාන යටතේ උපාධි අධ්‍යයන සිසුන්ගේ තොරතුරු තාක්ෂණ ඉංග්‍රීසි අධ්‍යාපන සහ මානුෂීය කුසලතා වර්ධනයට සහ පශ්චාද් උපාධි අධ්‍යයන සිසුන්ගේ පරීක්ෂණ සහ සංවර්ධනය වැඩිදියුණු කිරීම පිණිස ලබා දෙන ලදී. එම ප්‍රදාන යටතේ 2012 සිට 2016 වර්ෂ සඳහා ප්‍රදාන පහත පරිදි වේ. මෙම වියදම්/ආදායම් 2016 වර්ෂයේ ගිණුම් වල ඉදිරිපත් කර නැත.

විස්තරය	මුදල
විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන	22,435,284
බාහිර උපාධි වැඩසටහන් ප්‍රදාන	10,028,688
IDS ප්‍රදාන	18,234,913
ගුණාත්ව වැඩි දියුණු කිරීමේ ප්‍රදාන	36,141,404
මානව සම්පත් වැඩිදියුණු කිරීම් ප්‍රදාන	20,847,339
මුළු එකතුව	107,687,628

මෙම ප්‍රදාන යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු.77,827,930 ක් හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්ය උපාධි සඳහා රු 20,078,188.81 වැය කර ඇත. මෙම වටිනාකම් අනුව එම මුදල් වියදම් කල වර්ෂයේ සිට 2016-01-01 දක්වා අදාල වත්කම් වලට අදාල ක්ෂය වෙන් කිරීම් රේටයන් පදනම් කොටගෙන ක්ෂය වෙන් කර ශුද්ධ අගය ගිණුම් ගත කර ඇත. ගිණුම්ගත කල වටිනාකම රු. 66,638,815/- කි. මෙකී වත්කම් ක්ෂය පදනමින්ම අදාල ප්‍රදානය ක්‍රමක්ෂය කර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගිණුම්ගත කර ඇත.

1.10 කොන්ෆියුසියස් ආයතනයෙන් ලද ප්‍රදාන

කොන්ෆියුසියස් ආයතනයේ මූලස්ථාන මගින් කොන්ෆියුසියස් පංතිකාමර සෑදීම සඳහා සමාජවිද්‍යා හා භාෂා පීඨය සඳහා අරමුදල් සපයනු ලැබේ. 2019 වර්ෂයේදී රු 5,257,400.00 ක මුදලක් සහ 2020 වර්ෂයේ රු.5,154,789.00 ලැබී තිබුණි. මෙම අරමුදල හෝ වත්කම් ලැබීම් හෝ මෙම ප්‍රදාන මගින් මිලදී ගැනීම් ව්‍යාපෘතිය අවසන් වනතුරු විශ්වවිද්‍යාලයට අයත් නොවේ. එබැවින් මෙම ව්‍යාපෘතිය අවසන් වීවෙන් පසුව මෙම ව්‍යාපෘතිය මගින් ඉදිකිරීම සහ මිල දී ගනු ලැබූ වත්කම් ශුද්ධ පොත් අගය විශ්වවිද්‍යාලයට අත්පත් කර ගැනීම සිදු කරනු ලැබේ. ව්‍යාපෘතිය අවසන් වනතුරු ශුද්ධ අගය ඇහුරෑ සංචිත අරමුදල යටතේ පෙන්වනු ලැබේ.

1.11 අන්තර් සමාගම් ගිණුම්

ගිණුම් පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකයට ගෙවිය යුතු රු 17,553,940.00 ක මුදල සහ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට ගෙවිය යුතු රු 1,835,348.00 ක මුදල එම එකක මිල විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු මුදල් ලෙස එම අගයම පෙන්නුම් කරන අතර අවසාන ගිණුම එම ඒකක ඒකාබද්ධකර පිළියෙල කරන බැවින් එකිනෙකට එරෙහිව කපාහැර ඇත.

1.12 ආලාභ සහ හානි වීම්

2019 වර්ෂයේදී රසායන විද්‍යාගාරය පිපිරීම නිසා ලී බඩු, බිම, විදුරු සහ අනෙකුත් උපකරණ වලට හානිවීම සිදු වූ අතර ඇස්තමේන්තුගත අගය රු.617,229.52 කි. මෙම අගයෙන් රු.454,899.32 මුදලක් ප්‍රාග්ධන වත්කම් සඳහා පීඨ ගොඩනැගිල්ලට ප්‍රග්ධනිත ගත කර ඇත. පහත අයිතම වල මූලික අගයන් ලබා ගත නොහැකි බැවින් අලාභයන් වියදම් ලෙස ගිණුම්ගත කර නොමැත. අනෙකුත් සියලුම අයිතමයන් පාරිභෝජ්‍ය අයිතම බැවින් මිල දී ගනු ලබන අවස්ථාවේ දීම වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

අයිතමය	පිරිවිතරය	ප්‍රමාණය	අගය
තුනී ලෑලි දොරවල්	2150 *840	01	5,500.00
ඩිදුරු	5mm (300 *1000)		
	0.600cm x200	02	2624.00
ඩිදුරු	5mm (910 *1230)		
	3.3100 x200	03	6,613.20
රසායනාගාර මේස		02	400,000.00
රසායනාගාර බේසම්		02	14,000.00
Floor Tranking	3m	03	3,750.00
පී වී සී බට	විශ්කම්භය 1 1/2, 2		
	දිග (1,700.00)	02	3400.00
	විශ්කම්භය 1/2,1		
	දිග (3*150.00)	03	450.00
කේසින්	අඟල් 4	03	5,100.00
ආවරණ ඵලකය	(0.5 +3.0) 1.5m2	1.5	9,225.00
Floor rendwing	(4*1*1059.33)*4m	04	4,237.32

1.13 AHEAD ව්‍යාපෘතියේ වියදම් ගිණුම්ගත කිරීම - වත්කම්

AHEAD ව්‍යාපෘතිය යටතේ ප්‍රදාන වශයෙන් ලද වත්කම් 2020 වර්ෂයේ දී ගිණුම්ගත කරනු ලැබ ඇති අතර පෙර වර්ෂ වල ගැලපීම් 2019 වර්ෂය නැවත සංශෝධනය කර ඉදිරිපත් කරනු ලැබ ඇත. වත්කම් වලට අදාල විස්තර පහත පරිදි වේ.

	2020	2019	2018
	රු.	රු	රු
කාර්යාල සහ ඉගෙනුම් උපකරණ	26,241,342.00	11,832,697.60	102,680,992.11
පරිගණක උපාංග	-	1,174,923.50	9,474,954.01
සන්නිවේදන උපකරණ	-	-	819,225.00
අනෙකුත් උපකරණ	-	5,912,868.41	36,611,595.20
පුස්තකාල පොත්	-	-	675,488.00
එකතුව	26,241,342.00	18,920,489.51	149,443,029.32

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
මුදල් සහ මුදල් සමාන දෑ	**2**		
ලංකා බැංකුව -බලංගොඩ පුනරාවර්තන - 0002246976		41,512	66,457
ලංකා බැංකුව -බලංගොඩ ප්‍රාග්ධන - 0003416128		7,127,771	70,537
ලංකා බැංකුව -බලංගොඩ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය - 0002246875		8,656,076	9,880,686
මහජන බැංකුව -බලංගොඩ පුනරාවර්තන - 017100150040960		725,289	5,212,460
ලංකා බැංකුව -බලංගොඩ පශ්චාද් උපාධි පීඨය - 79701001		3,663,424	2,094,093
කෙට්කාලීන ස්ථාවර තැන්පතු		4,803,986	-
		25,018,058	17,324,233
ලැබිය යුතු දෑ	**3**		
මුදල් වංචා- රහංගල (පුනරාවර්තන)		189,303	189,303
විවිධ තැන්පතු-ලැබිය යුතු		3,787	3,787
පෙර ගෙවීම්		3,065,104	3,682,045
පෙර ගෙවීම් - පුස්තකාල පොත් හා වාර සඟරා		894,796	400
සේවකයින්ගෙන් ලැබිය යුතු ලැබීම්		133,492	-
ලැබියයුතු ශිෂ්‍යාධාර		19,964,000	12,228,700
ලැබිය යුතු ස්ථාවර තැන්පතු මත පොලී		863,721	3,620,815
ලැබිය යුතු පාඨමාලා ආදායම්- පශ්චාද් උපාධි පීඨය		12,761,155	9,816,250
ලැබිය යුතු අත්තිකාරම් - නීති කටයුතු සඳහා		136,618	136,618
		38,011,976	29,677,918

ණය සහ සේවක අත්තිකාරම් **4**

	2021 තුල අය කර ගත හැකි	2021 න් පසුව අය කර ගත හැකි	2020	2019
ආපදා ණය	16,147,617	51,649,911	67,797,528	66,708,838
සේවක ණය	134,640	225,410	360,050	472,470
පරිගණක ණය	710,000	975,000	1,685,000	1,906,000
ප්‍රවාහන ණය	2,068,048	2,805,683	4,873,731	6,105,585
ගංවතුර ණය			-	647,610
උත්සව අත්තිකාරම්	14,450	-	14,450	26,950
විශේෂ අත්තිකාරම්	300	-	300	7,300
වැටුප් අත්තිකාරම්	-	-	-	68,194
	19,075,055	55,656,004	74,731,059	75,942,947

තොග	**5**		
ගබඩා අත්තිකාරම් ගිණුම - පුනරාවර්තන		14,139,093	17,452,636
තොග ගැලපුම් ගිණුම		2,812	2,315
ගබඩා අත්තිකාරම් ගිණුම - නඩත්තු සේවා		509,196	495,506
තොග - මුද්‍රණ ඒකකය		449,664	449,664
තොග - ගොවිපල		323,101	204,037
තොග - වෛද්‍ය මධ්‍යස්ථානය		512,770	763,747
තොගය - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය		336,468	276,261
තොගය - ඉන්ධන		60,140	60,140
රසායනික ද්‍රව්‍ය තොගය - ව්‍යවහාරික විද්‍යා පීඨය		9,853,536	8,239,568
රසායනික ද්‍රව්‍ය තොගය - කෘෂි විද්‍යා පීඨය		6,842,560	7,939,883
රසායනික ද්‍රව්‍ය තොගය - වෛද්‍ය පීඨය		4,067,923	3,624,505
		37,097,263	39,508,262

	සටහන්	2020	නැවත සංශෝධනය කල 2019
		රු.	රු.
අනෙකුත් අත්තිකාරම්	**6**		
ප්‍රාග්ධන අත්තිකාරම්		675,000	374,900
විවිධ අත්තිකාරම්		59,201	933,987
ව්‍යාපෘති අත්තිකාරම්		3,444,979	4,818,155
කාර්ය ආරම්භක අත්තාකාරම් -ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය		241,489,196	153,492,283
පර්යේෂණ අත්තිකාරම් - ප්‍රාග්ධන		5,702,807	4,938,310
මුද්දර අග්‍රිමය		143,525	80,020
සුළු මුදල් අග්‍රිමය		-	3,305
		251,514,708	**164,640,960**

තැන්පතු	**7**		
ඉන්ධන තැන්පතු		600,000	600,000
ස්ථාවර තැන්පතු- සේවක		166,498	153,519
ස්ථාවර තැන්පතු- ගිවිසුම් කඩකිරීම්		15,682,403	63,860,914
ස්ථාවර තැන්පතු- රන් පදක්කම්		1,964,687	1,779,371
ස්ථාවර තැන්පතු- ක්‍රීඩා සංවර්ධනය		140,589	127,972
ස්ථාවර තැන්පතු- ඩර්හැම් විශ්වවිද්‍යාලය		798,130	726,339
තැන්පතු- ලංකා විදුලිබල මණ්ඩලය		1,105,500	1,105,500
ස්ථාවර තැන්පතු- මහජන බැංකුව		98,936	90,059
ස්ථාවර තැන්පතු- මහජන බැංකුව		40,168,653	20,634,705
ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව පශ්චාද් උපාධි පීඨය		15,461,415	10,433,037
නෛතික ගාස්තු තැන්පතුව		660,000	660,000
		76,846,811	**100,171,416**

	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
පශු සම්පත්	**8**		
පශු සම්පත්		2,895,925	1,383,770
		2,895,925	**1,383,770**
බුද්ධි අනිවෘද්ධිය	**9**		
ආරම්භක ශේෂය-ජනවාරි 01		16,233,206	16,178,206
එකතු කිරීම්		341,000	55,000
අවසාන ශේෂය - දෙසැම්බර් 31		16,574,206	16,233,206
ක්‍රමක්ෂය මුළු එකතුව		(16,015,025)	(15,659,665)
ධාරණ අගය- දෙසැම්බර් 31 දිනට		**559,181**	**573,541**
විෂයමාලා ප්‍රතිසංශෝධනය	**10**		
කළමනාකරණ අධ්‍යයන පීඨය		377,752	377,752
භූ විඥාපන පීඨය		814,896	814,896
ව්‍යවහාරික විද්‍යාපීඨය		661,415	661,415
කෘෂිකර්ම පීඨය		213,965	213,965
තාක්ෂණ පීඨය		75,000	75,000
විවෘත හා දුරස්ථ අධ්‍යයන ඒකකය		160,000	-
		2,303,028	2,143,028
දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය එකතුව		(2,130,028)	(1,907,952)
		173,000	**235,076**
ස්ථාපිත කිරීමේ ප්‍රාථමික පිරිවැය	**11**		
වෛද්‍ය පීඨය			
ආරම්භක ශේෂය-ජනවාරි 01		5,719,430	3,761,763
එකතු කිරීම්		-	1,957,667
අවසාන ශේෂය - දෙසැම්බර් 31		5,719,430	5,719,430
මුළු ක්‍රමක්ෂය		(2,287,772)	(1,143,886)
ධාරණ අගය- දෙසැම්බර් 31 දිනට		**3,431,658**	**4,575,544**
තාක්ෂණ පීඨය			
ආරම්භක ශේෂය-ජනවාරි 01		1,086,788	767,083
එකතු කිරීම්		-	319,705
අවසාන ශේෂය - දෙසැම්බර් 31		1,086,788	1,086,788
මුළු ක්‍රමක්ෂය		(434,715)	(217,358)
ධාරණ අගය- දෙසැම්බර් 31 දිනට		**652,073**	**869,430**
		4,083,731	**5,444,974**

	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
අස්පෘශ්‍ය වත්කම්	**12**		
පරිගණක මෘදුකාංග			
පිරිවැය			
ආරම්භක ශේෂය		18,908,070	18,730,570
එකතු කිරීම්		2,000	177,500
දෙසැම්බර් 31 දිනට ශේෂය		18,910,070	18,908,070
සමුච්චිත ක්‍රමක්ෂය			
ආරම්භක ශේෂය		12,858,585	9,076,971
ක්‍රමක්ෂය අය කිරීම		3,782,014	3,781,614
දෙසැම්බර් 31 දිනට ශේෂය		16,640,599	12,858,585
ශුද්ධ පොත් අගය		**2,269,471**	**6,049,485**
ස්වාධිකාරය			
පිරිවැය			
ආරම්භක ශේෂය		-	-
එකතු කිරීම්		776,289	-
දෙසැම්බර් 31 දිනට ශේෂය		776,289	-
සමුච්චිත ගෙවීම්			
ආරම්භක ශේෂය		-	-
ක්‍රමක්ෂය අය කිරීම		155,258	-
දෙසැම්බර් 31 දිනට ශේෂය		155,258	-
ශුද්ධ පොත් අගය		**621,031**	**-**
		2,890,502	**6,049,485**
ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ	**13**		
කෙරීගෙන යන වැඩ - පුනරුත්ථාපන		18,346,200	16,177,404
කෙරීගෙන යන වැඩ - පරිපාලන		1,517,543	1,517,543
කෙරීගෙන යන වැඩ - අනෙකුත්		1,085,972	320,143
කෙරීගෙන යන වැඩ - තොතතුරු තාක්ෂණ ගොඩනැගිල්ල		1,819,966	1,819,966
කෙරීගෙන යන වැඩ - ස්ථාවර වත්කම් ලේඛණය		1,890,300	1,890,300
කෙරීගෙන යන වැඩ - ඉඩකඩම් අත්පත් කර ගැනීම		4,222,500	4,222,500
කෙරීගෙන යන වැඩ - පුස්තකාල ගොඩනැගිල්ල		39,314,427	39,237,927
කෙරීගෙන යන වැඩ - කෘෂිවිද්‍යාපීඨය		1,793,759	1,717,759
කෙරීගෙන යන වැඩ - ව්‍යවහාරික විද්‍යා පීඨය		237,988,126	16,502,308
කෙරීගෙන යන වැඩ - සමාජවිද්‍යා හා භාෂා පීඨය		341,060	341,060
කෙරීගෙන යන වැඩ - කළමණාකරණ පීඨය		283,560	283,560
කෙරීගෙන යන වැඩ - තාක්ෂණ පීඨය		865,107	865,107
කෙරීගෙන යන වැඩ - වෛද්‍ය පීඨය		5,707,504	4,473,700
කෙරීගෙන යන වැඩ - ව්‍යුහ විද්‍යා විද්‍යාගාරය		1,934,137	1,934,137
කෙරීගෙන යන වැඩ - විෂය මාලා සංශෝධනය -කළමණාකරණ පීඨය		773,112	773,112
කෙරීගෙන යන වැඩ - විෂය මාලා සංශෝධනය -සමාජවිද්‍යා හා භාෂා පීඨය		20,430	20,430
කෙරීගෙන යන වැඩ - විෂය මාලා සංශෝධනය -විවෘත හා දුරස්ථ ඒකකය		-	160,000
කෙරීගෙන යන වැඩ - විෂය මාලා සංශෝධනය -ව්‍යවහාරික විද්‍යා පීඨය		28,290	-
		317,931,993	**92,256,956**

සටහන

දේපල පිරියත හා උපකරණ **14**

විස්තරය	01.01.2020 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්/ ගැලපීම්	31.12.2020 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
ඉඩම්	68,591,566	-	-	68,591,566
ගොඩනැගිලි	3,902,468,830	51,080,637	-	3,953,549,467
ජල පිරිපහදු ඒකකය	8,213,148	-	-	8,213,148
මාර්ග ජාලගත කිරීම	17,719,614	533,733	-	18,253,347
කාර්යාල උපකරණ හා ඉගැන්වීම් උපකරණ	1,002,782,069	113,906,531	-	1,116,688,600
පරිගණක හා උපාංග	383,004,695	12,575,634	-	395,580,329
පුස්තකාල පොත් හා වාරසඟරා	161,102,818	9,903,552	-	171,006,369
මෝටර් වාහන	129,353,408	-	-	129,353,408
සන්නිවේදන උපකරණ	55,763,676	1,881,268	-	57,644,944
උපාධි ලෝගු	4,829,512	-	6,250	4,823,262
අනෙකුත් උපකරණ	192,267,767	42,417,480	-	234,685,246
	5,926,097,102	**232,298,835**	**6,250**	**6,158,389,686**

ක්ෂය සඳහා වෙන් කිරීම්

විස්තරය	01.01.2020 දිනට ශේෂය	වර්ෂය සඳහා අය කිරීම්	ඉවත් කිරීම් / ගැලපීම්	31.12.2020 දිනට ශේෂය
	රු	රු	රු	රු
ගොඩනැගිලි සඳහා ක්ෂය වෙන් කිරීම්	1,197,350,350	187,191,360	-	1,384,541,709
ජල පිරිපහදු ඒකකය සඳහා ක්ෂය වෙන් කිරීම්	5,235,341	479,546	-	5,714,887
මාර්ග ජාලගත කිරීම සඳහා ක්ෂය වෙන් කිරීම	1,196,412	912,667	-	2,109,080
කාර්යාල උපකරණ හා ඉගැන්වීම් උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම	719,280,657	131,365,887	-	850,646,545
පරිගණක සහ උපාංග සඳහා ක්ෂය වෙන් කිරීම්	302,208,381	31,824,137	-	334,032,517
පුස්තකාල පොත් සඳහා සඳහා ක්ෂය වෙන් කිරීම්	142,687,353	8,608,794	-	151,296,147
මෝටර් රථ සඳහා ක්ෂය වෙන් කිරීම්	124,220,624	2,273,796	-	126,494,420
සන්නිවේදන උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම්	39,552,783	5,736,762	-	45,289,545
උපාධිලෝගු සඳහා ක්ෂය වෙන් කිරීම්	3,455,512	364,750	1,250	3,819,012
වෙනත් දෑ සඳහා ක්ෂය වෙන් කිරීම්	158,623,112	18,598,271	-	177,221,384
	2,693,810,525	**387,355,971**	**1,250**	**3,081,165,246**

ලියා හරින ලද අගය

විස්තරය	01.01.2020 දිනට ශේෂය	එකතුකිරීම්	ඉවත් කිරීම් / ගැලපීම්	31.12.2020 දිනට ශේෂය
	රු	රු	රු	රු
ඉඩම්	68,591,566	-	-	68,591,566
ගොඩනැගිලි	2,705,118,480	-	-	2,569,007,757
ජල පිරිපහදු ඒකකය	2,977,807	-	-	2,498,261
මාර්ග ජාලගත කිරීම	16,523,202	-		16,144,268
කාර්යාල උපකරණ හා ඉගැන්වීම් උපකරණ	283,501,411	-	-	266,042,055
පරිගණක හා උපාංග	80,796,315	-	-	61,547,812
පුස්තකාල පොත් හා වාරසඟරා	18,415,464	-	-	19,710,222
මෝටර් වාහන	5,132,784	-	-	2,858,988
සන්නිවේදන උපකරණ	16,210,893	-	-	12,355,399
උපාධි ලෝගු	1,374,000	-	-	1,004,250
අනෙකුත් උපකරණ	33,644,655	-	-	57,463,862
	3,232,286,578	**-**	**-**	**3,077,224,440**

	Note	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
<u>උපචිත වියදම්</u>	**15**		
උපචිත වියදම් - පුනරාවර්තන		238,016,875	173,872,978
උපචිත වියදම් - ප්‍රාග්ධන		61,871,310	164,098,104
		299,888,185	**337,971,082**
<u>ගෙවිය යුතු වියදම්</u>	**16**		
විවිධ ණය හිමියෝ		144,242,467	143,668,367
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව		22,613	18,618
ගෙවිය යුතු - මහපොල භාරකාර අරමුදල		2,201,150	2,201,150
නොගෙවූ වවුචර්		123,075	45,825
නොගෙවූ ශිෂ්‍යාධාර		8,000	8,000
ගෙවිය යුතු මුද්දර බදු - පුනරාවර්තන		64,800	12,550
ගෙවිය යුතු මුද්දර බදු - ප්‍රාග්ධන		3,325	3,350
රඳවා ගැනීමේ බදු (පුනරාවර්තන)		-	412,130
රඳවා ගැනීමේ බදු (ප්‍රාග්ධන)		-	38,808
අවලංගු කල චෙක්පත්		694,084	482,397
යෝග්‍යතා පරීක්ෂණ- සමාජවිද්‍යා හා භාෂා පීඨය		857,350	-
යෝග්‍යතා පරීක්ෂණ- ව්‍යවහාරික විද්‍යා පීඨය		741,550	-
වාර්ෂික සම්මන්ත්‍රණ - කළමණාකරණ පීඨය		298,350	-
වාර්ෂික සම්මන්ත්‍රණ - භූ විඥාපන පීඨය		100,000	-
		149,356,764	**146,891,195**

	සටහන්	2020 රු.	2019 රු.
<u>නැවත ගෙවිය යුතු තැන්පතු හා අරමුදල්</u>	**17**		
සේවක සුරතුම්පත් තැන්පත්		270,643	249,657
10% කොන්ත්‍රාත් වලින් රඳවා ගැනීම්		74,204,934	65,220,209
නේවාසිකාගාර කුලී වලින් රඳවා ගැනීම්		219,575	108,000
ටෙන්ඩර් තැන්පත්		168,000	138,000
උපාධිලෝගු තැන්පත්		34,400	70,100
ගෙවිය යුතු විවිධ තැන්පතු		1,235,430	1,253,770
ලංසු බැඳුම්කරය		194,248	263,900
කාර්සාධක බැඳුම්කරය		1,113,377	1,000,524
විදේශ ශිෂ්‍යත්ව ආධාර		2,452,856	2,591,140
වෛද්‍ය ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යාධාර		-	658,000
චීන අරමුදල මගින් ශිෂ්‍යාධාර		250,000	250,000
පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු නිදහස් කිරීම		9,154,256	7,344,756
විලම්භිත ආදායම -විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය		27,193,083	17,026,357
විලම්භිත ආදායම - පශ්චාද් උපාධි පීඨය		1,625,833	3,700,625
නැවත ගෙවිය යුතු පාඨමාලා ගාස්ත පශ්චාද් උපාධි පීඨය		1,084,025	59,625
		119,200,660	**99,934,663**
<u>විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන් කිරීම්</u>	**18**		
ජනවාරි 01 දිනට ශේෂය		460,279,403	415,608,608
වර්ෂය සඳහා අය කිරීම්		25,057,083	44,892,495
		485,336,486	460,501,103
වර්ෂය තුල කරන ලද ගෙවීම්		(11,416,678)	(221,700)
දෙසැම්බර් 31 දිනට ශේෂය		**473,919,808**	**460,279,403**

		2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
ප්‍රාග්ධන ප්‍රදාන	**19**		
වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන		2,248,103,201	2,084,457,094
උසස් අධ්‍යාපන අමාත්‍යංශ ප්‍රදාන-කාන්තා නේවාසිකාගාර		656,573,274	701,734,085
කිව් ඊ එෆ් ප්‍රදාන - අයි.ආර්.කිව්.යූ.ඊ ව්‍යාපෘතිය		4,155,482	4,891,318
අයි බී පී ප්‍රදාන - අයි.ආර්.කිව්.යූ.ඊ ව්‍යාපෘතිය		2,087,234	2,569,579
වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන		7,127,771	70,537
ප්‍රාග්ධන ප්‍රදාන- ඉඩම් සඳහා ප්‍රාග්ධන		5,900,000	5,900,000
සේවක සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ප්‍රදාන		1,411,871	1,527,420
එච් ඊ ටී සී ප්‍රදාන		8,607,458	11,103,025
අභ්‍යන්තර මාර්ග පද්ධති සඳහා සබරගමුව පලාත් සභාවෙන් ලද ප්‍රදාන		3,055,174	3,055,174
ප්‍රාග්ධන ප්‍රදාන - උසස් අධ්‍යාපන අමාත්‍යංශය		5,168,563	10,337,126
ශිෂ්‍යයින් සඳහා ප්‍රදාන - උසස් අධ්‍යාපන අමාත්‍යංශය		19,302	38,604
විශවවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන - තාක්ෂණ පීඨය		48,679,926	51,908,417
විශවවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන - සේවක නිලනිවාස		31,770,000	33,535,000
උසස් අධ්‍යාපන අමාත්‍යංශය ප්‍රදාන - වෛද්‍ය පීඨය		88,766,898	67,691,482
උසස් අධ්‍යාපන අමාත්‍යංශය ප්‍රදාන - ශාරීරික අධ්‍යාපන ඒකකය		960,000	1,440,000
උසස් අධ්‍යාපන අමාත්‍යංශය ප්‍රදාන - ගොඩනැගිලි සහ උපකරණ එම් එෆ්		179,104,421	191,053,811
අහෙඩී ව්‍යාපෘතියෙන් ලද ප්‍රදාන		142,058,634	30,881,197
		3,433,549,209	**3,202,193,869**
අනෙකුත් සංචිත	**20**		
වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම		60,495,111	58,982,956
		60,495,111	**58,982,956**
සමුච්චිත අතිරික්තය සහ ඌණතාව	**21**		
ජනවාරි 01 දිනට ශේෂය		(629,155,058)	(346,686,028)
ගැලපීම්(පෙර වසර)		(3,502,103)	(196,665,746)
ප්‍රවර්තන වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ඌණතාව		(91,103,424)	(89,305,389)
දෙසැම්බර් 31 දිනට ශේෂය		**(723,760,585)**	**(632,657,162)**
සීමිත අරමුදල්	**22**		
උපකුලපති අරමුදල		10,175,051	10,257,875
රන් පදක්කම් අරමුදල		1,189,500	1,189,500
බැඳුම්කර සහ ගිවිසුම් කඩකිරීම්		43,521,015	39,790,376
විදේශීය සහයෝගීතා ව්‍යාපෘතිය		1,676,971	1,676,971
ඊ අයි. ඒ. ව්‍යාපෘතිය නුවරඑළිය		12,750	12,750
සිලෝන් සිනමන් ව්‍යාපෘතිය		181,301	5,288,623
එන්.එස්.එෆ් පර්යේෂණ අරමුල		1,321,818	1,651,818
කාර්මික සංවර්ධනය සඳහා උපාය මාර්ගික සැලසුම් ව්‍යාපෘතිය		39,375	39,375
පරිගණක මධ්‍යස්ථාන වෙන් කිරීමේ ව්‍යාපෘතිය		38,288	-
අභ්‍යන්තර පරිසරය පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතිය		761,300	761,300
බහු ආංශික සංවර්ධන සැලසුම		90,000	331,200
ආදායම් දෙපාර්තමේන්තුවේ වැඩමුළු		111,838	111,838
එන්.සී.ඒ.එස් පර්යේෂණ අරමුල		80,000	920,000
ජාතික කෘෂිකර්ම ව්‍යාපෘති සැලසුම		838,520	260,000
ඉලුමිනේටින් හිඩින් හාවසට් ව්‍යාපෘතිය		464,069	1,732,600
කොන්පියුසියස් පංතිකාමර සෑදීමේ ව්‍යාපෘතිය		6,973,477	3,852,106
ගංවතුර සමීක්ෂණ ව්‍යාපෘතිය		3,317,604	7,983,302
බ්‍රිසිට ව්‍යාපෘතිය		4,960,470	
අ(ර්)බන් වෙස්ට් ටු සස්ටෙයිනබල් වැලියු චෙයින් ව්‍යාපෘතිය		937,568	
වෙබ් මත පදනම් වූ ඉගැන්වීමේ ව්‍යාපෘතිය		81,110	181,660
		76,772,025	**76,041,294**

	සටහන්	2020 රු.	නැවත සංශෝධනය කල 2019 රු.
ශිෂ්‍යාධාර සහ මහපොල	**23**		
ශිෂ්‍යාධාර		40,555,800	37,324,100
මහපොල		220,050	16,620,600
		40,775,850	**53,944,700**
ස්වයං මූල්‍ය වැඩසටහන් ආදායම	**24**		
විවෘත හා දුරස්ථ අධ්‍යයන ඒකකයේ වැඩසටහන් වලින් ලද ආදායම		16,931,958	27,418,583
ආයුර්වේද රෝහල් කළමණාකරණය		60,000	120,000
ආදිවාසී ජන අධ්‍යයන වැඩසටහන		2,562,500	485,000
පශ්චාද් උපාධි පීඨයෙන් ලද ආදායම		29,887,159	25,274,181
		49,441,617	**53,297,764**
අනෙකුත් ආදායම්	**25**		
ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂක)		1,255,276	886,656
විභාග ගාස්තු (උපාධි අපේක්ෂක)		-	302,025
විභාග ගාස්තු (බාහිර අපේක්ෂක)		58,400	
ණය සහ අත්තිකාරම් මත පොළී		3,080,246	3,146,378
ආයෝජන මත පොළී		3,781,631	6,694,499
පැරණි තොග විකුණුම්		61,398	261,720
නිශ්පාදන ආදායම්		3,027,592	2,854,954
ගෙවල් කුලී		1,718,111	1,824,644
වෛද්‍ය ගාස්තු		1,060,201	889,023
පුස්තකාල දඩ		72,931	142,328
සේවා සහායවීම් මත ආදායම		1,603,950	1,035,810
විවිධ ආදායම්		5,820,318	15,920,673
සම්මන්ත්‍රණ ආදායම් - සමාජ විද්‍යා හා භාෂා පීඨය		47,236	-
		21,587,290	**33,958,710**
විලම්භිත ආදායම්	**26**		
විලම්භිත ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන		271,296,658	296,640,881
විලම්භිත ආදායම - අයි.ආර්.කිව්.යූ.ඊ - කිව්.ඊ.එෆ් ප්‍රදාන		735,836	735,836
විලම්භිත ආදායම - අයි.ආර්.කිව්.යූ.ඊ - අයි.බී.පී		482,345	482,345
විලම්භිත ආදායම - එස්.ඩී.සී ප්‍රදාන		115,549	1,036,723
විලම්භිත ආදායම - උසස් අධ්‍යාපන අමාත්‍යංශය		45,160,811	45,160,811
විලම්භිත ආදායම - පරිත්‍යාග		2,710,579	4,100,935
විලම්භිත ආදායම - පර්යේෂණ ප්‍රදාන-ස්පෘශ්‍ය වත්කම්		-	265,205
විලම්භිත ආදායම - එච්.ඊ.ටි.සී		2,495,567	5,429,608
විලම්භිත ආදායම - උසස් අධ්‍යාපන අමාත්‍යංශය පුස්තකාල පොත් සඳහා ප්‍රදාන		19,302	19,302
විලම්භිත ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන නේවාසිකාගාර ලිබඩු		5,168,563	5,168,563
විලම්භිත ආදායම - උසස් අධ්‍යාපන අමාත්‍යංශය ශාරීරික අධ්‍යාපන ඒකකය සඳහා ප්‍රදාන		480,000	480,000
විලම්භිත ආදායම - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන තාක්ෂණ පීඨය		3,228,491	13,091,583
විලම්භිත ආදායම - සේවක නිල නිවාස		1,765,000	1,765,000
විලම්භිත ආදායම - වෛද්‍ය පීඨය		9,924,584	18,308,518
විලම්භිත ආදායම - වෛද්‍ය පීඨය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන		11,949,390	11,949,390
විලම්භිත ආදායම - අහෙඩ් ව්‍යාපෘතිය		39,084,817	9,032,366
		394,617,492	**413,667,066**

මළු වියදම්	**සටහන්**	**2020**		**නැවත සංශෝධනය කල 2019**
		රු.	**රු.**	**රු.**
පුද්ගලික ඉපයීම්				
අධ්‍යයන	**27 - A**			
වැටුප් හා වේතන		341,634,001		284,415,276
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල		70,866,273		59,195,212
විශ්‍රාම වැටුප්		47,225,115		39,094,252
සේවක භාරකාර අරමුදල		23,618,280		19,658,102
අතර මැදි දීමනාව		-		-
මාසික හිලව් දීමනාව		-		-
අධ්‍යයන දීමනා		414,166,443		341,146,301
වැටුප් සම කිරීමේ දීමනාව		20,520		20,520
අනෙකුත් දීමනා		10,203,471		8,965,939
බාහිර කථිකාචාර්ය දීමනා		8,902,253		14,332,219
පාරිතෝෂික		13,641,241		32,964,172
පර්යේෂණ දීමනා		90,463,328		75,862,745
ජීවන වියදම් දීමනාව		25,925,401		24,470,461
දේපල ණය පොලිය		5,384,062		4,939,522
අතිරේක දීමනාව 20%		56,459,658		46,801,720
		1,108,510,046		**951,866,441**
අනධ්‍යයන				
වැටුප් හා වේතන		220,966,494		192,260,979
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල		30,832,732		27,291,813
විශ්‍රාම වැටුප්		21,824,681		18,860,449
සේවක භාරකාර අරමුදල		10,571,658		9,280,198
වැඩ බැලීමේ දීමනාව		-		
අතර මැදි දීමනාව 10%		-		
මාසික හිලව් දීමනාව		95,349,276		82,602,041
අතිකාල		19,721,138		30,888,203
නිවාඩු දින දීමනා		133,166		207,264
අනෙකුත් දීමනා		1,941,410		5,698,239
භාෂා ප්‍රවීනතා දීමනාව		-		-
පාරිතෝෂික		11,415,843		11,928,323
පර්යේෂණ දීමනා		4,244,240		4,072,048
ජීවන වියදම් දීමනාව		42,689,764		41,017,776
දේපල ණය පොලිය		3,271,135		3,230,779
අතර මැදි දීමනාව :2015-1000		-		-
අමතර දීමනාව 20%		42,339,753		36,569,928
		505,301,290		**463,908,040**
එකතුව		**1,613,811,336**		**1,415,774,481**

	සටහන්	2020		නැවත සංශෝධනය කල 2019
		රු.	රු.	රු.
ගමන් වියදම් හා යැපීම්	**27-B**			
දේශීය		1,730,483		1,696,708
විදේශීය		2,224,567		1,808,835
		3,955,050		**3,505,543**
සැපයුම්	**27-C**			
ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ		10,148,409		12,113,844
ඉන්ධන		15,538,060		19,569,778
නිල ඇඳුම් හා මැහුම් කුලී		1,612,276		1,375,352
යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ සැපයීම්		1,401,084		3,438,181
රසායනික ද්‍රව්‍ය හා විවිධ උපකරණ		2,887,347		12,308,086
වෛද්‍ය සැපයුම්		942,102		1,566,026
අකුරුත් සැපයුම්		10,658,905		13,648,527
		43,188,183		**64,019,794**
නඩත්තු	**27-D**			
රථවාහන		7,517,184		7,690,298
දේපල පිරියත හා උපකරණ		4,933,196		7,161,935
ගොඩනැගිලි හා ආකෘති		1,835,680		3,254,819
ලී බඩු		-		498,108
අනෙකුත්		150,770		459,379
		14,436,830		**19,064,539**
කොන්ත්‍රාත්තුමය සේවා	**27-E**			
ප්‍රවාහන		91,718		208,160
සන්නිවේදන		20,410,932		20,976,233
තැපැල් ගාස්තු		1,280,832		1,028,781
විදුලි		19,504,043		25,678,936
ආරක්ෂක සේවා		86,212,562		81,909,551
ජලය		42,116		168,103
පිරිසිදු කිරීමේ සේවය		62,615,561		55,752,271
කුලී සහ කුලියට දීම්		21,514,586		20,154,736
වරිපනම් බදු		-		-
මුද්‍රණ සහ වෙළඳ දැන්වීම්		6,990,048		8,224,405
අනෙකුත්		1,536,708		2,233,264
		220,199,106		**216,334,440**

	සටහන්	2020		නැවත සංශෝධනය කල 2019
		රු.	රු.	රු.
අනෙකුත් පුනරාවර්ථන වියදම්	**27-F**			
අධ්‍යයන සේවක ගමන් ගාස්තු		677,592		733,400
විශේෂ සේවා - පාලක සහ සහ කමිටු		1,463,000		1,342,120
විශේෂ සේවා - වෘතිකයින්		7,697,216		8,089,254
වැඩමුළු හා සම්මන්ත්‍රණ		2,370,119		4,678,766
අධ්‍යයන පර්යේෂණ		1,483,236		1,823,343
සේවක සංවර්ධනය		-		50,000
නිදහස් ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශ පත්‍ර		47,035		51,280
සංග්‍රහ වියදම්		5,885,723		6,001,643
බැංකු ගාස්තු		-		-
ප්‍රදාන හා හානිපූර්ණ		47,500		-
දායකත්ව හා සාමාජික ගාස්තු		849,329		610,927
උපාධි ප්‍රධානෝත්සවය		-		11,202,574
විභාග වියදම්		9,980,950		15,376,125
අනෙකුත් - පුවත්පත් සඟරා ආදිය		891,448		2,840,474
කර්මාන්ත ආශ්‍රිත පුහුණුවීම්		-		30,125
ශිෂ්‍ය කාර්ය සංවර්ධනය		852,502		476,621
විශ්වවිද්‍යාල සංවර්ධන ක්‍රියාකාරකම්		274,200		5,280,050
ශිෂ්‍ය සුබසාධනය, සේවක සුබසාධනය		-		80,000
		32,519,850		**58,666,702**
ස්වයං මූල්‍ය වරඩසටහන් වියදම්	**27-G**			
බාහිර විභාග ඒකකයේ වියදම්		15,763,756		19,525,232
අයුර්වේද රෝහල් කළමණාකරණය		-		55,000
ආදිවාසී ජන අධ්‍යයන වැඩසටහන		255,315		112,343
පශ්චාත් උපාධි පීඨය		19,756,460		20,116,823
		35,775,531		**39,809,398**
ශිෂ්‍යයින්ට මූල්‍ය සහාය	**27-H**			
මහපොල ශිෂ්‍යත්ව		220,050		16,620,600
ශිෂ්‍යාධාර		40,555,800		37,324,100
		40,775,850		**53,944,700**
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම	**27-I**			
ගොඩනැගිලි ක්ෂය		187,191,360		195,449,805
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ සඳහා ක්ෂය		131,365,887		118,661,047
සන්නිවේදන උපකරණ සඳහා ක්ෂය		5,736,762		6,392,863
ජල ඒකකය සඳහා ක්ෂය		479,546		479,546
පුස්තකාල පොත් සඳහා ක්ෂය		8,608,794		8,584,067
මෝටර්වාහන සඳහා ක්‍ෂය		2,273,796		10,399,323
අනෙකුත් උපකරණ සඳහා ක්‍ෂය		18,598,271		11,829,799
පරිගණක උපකරණ සඳහා ක්‍ෂය		31,824,137		33,013,170
උපාධිලෝගු සඳහා ක්‍ෂය		364,750		366,000
මාර්ග ජාලගත ක්ෂය		912,667		783,372
ක්‍රමක්ෂය - මෘදුකාංග		3,782,014		3,781,614
ක්‍රමක්ෂය - ස්වාධිකාරය		155,258		-
ක්‍රමක්ෂය - බුද්ධි අභිවෘද්ධිය		355,360		1,421,621
ක්‍රමක්ෂය - විෂයමාල ප්‍රතිසංශෝධනය		190,076		428,606
ක්‍රමක්ෂය - ජාත්‍යන්තර සම්මේලන වියදම්		-		1,248,398

ක්‍රමක්ෂය - තත්ව ආරක්ෂණ ඒකකය	1,038,354	2,546,584
ක්‍රමක්ෂය - විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන	2,630,161	4,970,069
ක්‍රමක්ෂය - වෘතීතීය මාර්ගෝපදේශ ඒකකය	-	98,155
ක්‍රමක්ෂය - වෛද්‍ය පීඨය ආරම්භ කිරීමේ වියදම	1,143,886	1,143,886
ක්‍රමක්ෂය - තාක්ෂණ පීඨය ආරම්භ කිරීමේ විටදම්	217,358	217,358
ක්‍රමක්ෂය - වෛද්‍ය පීඨයේ උපදේශක වියදම්	2,100,000	2,100,000
ක්‍රමක්ෂය - වෛරස් ගාඩ් සඳහා	396,750	396,750
	399,365,187	**404,312,033**

14. 2020 වර්ෂයේ දී තිරසර සංවර්ධන අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ දායකත්වය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 3 වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2030

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ශ්‍රම බලකායේ සියලුම සාමාජිකයින්ට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා ක්‍රියාකාරී, කාර්යක්ෂම සැපයුම්කරුවන් සහ පහසුකම් සපයන්නන් වීම සඳහා පුහුණු අවස්ථා සපයනු ලබයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් අධ්‍යාපනයේ ප්‍රවීණයන් වීමටත් රටේ සහ ලෝකයේ මිනිස් බල අවශ්‍යතාවයට දායක වීමට උපාධි අපේක්ෂකයින් පොළඹවා ගැනීමටත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දෙයි.

2030 - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ආයතනික සහ ප්‍රාදේශීය ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය වගකීම්, කුසලතා නිපුණතා වර්ධනය පිළිබඳ ඉගෙන ගැනීමට උපකාර කිරීම සඳහා ක්‍රියාකාරකම් සහ වැඩසටහන් (විධිමත් හෝ අවිධිමත් සහ විශ්වවිද්‍යාලය තුළ හෝ විශ්වවිද්‍යාලයෙන් පිටත) සංවිධානය කරනු ලබයි. තිරසර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථිකයේ ප්‍රධාන කාර්යයක් ඉටු කරන අධ්‍යයන, පරිපාලන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය ලෙස තමන් සූදානම් වීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයේ පෞර්ෂත්වය සහ වෘත්තීය සංවර්ධනය සඳහා මධ්‍යස්ථානය විසින් වැඩසටහන් පවත්වනු ලබයි.

15. විගණකාධිපති වාර්තාව 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGP/RP/D/SUSL/FA/01/2021

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 මැයි 31 දින

උපකුලපති,

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොළොන්නරුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொலன்னறுவை வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polonnawa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 agm@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 893,887,711 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2018 වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු. 1,104,000 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම බැරකම් එම වටිනාකමින් වැඩියෙන් දැක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී වැඩ නිමකර තිබුණු පිරිවැය රු. 1,934,137 ක් වූ වෛද්‍ය පීඨයේ කාය විච්ඡේදන විද්‍යාගාරය නවීකරණය කිරීම ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුළ කෙරිගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලීය ජල අවශ්‍යතා සපුරාගන්නා ලද ජල පවිත්‍රාගාරය සහ අක්කර 02 රූඩ් 01 ක් පමණ වූ ඉඩම් කොටස් 02 ක් පඹහින්න ජල යෝජනා ක්‍රමය සඳහා විධිමත් පවරා දීමකින් තොරව 2018 වර්ෂයේදී එහි වටිනාකම් පිළිවෙලින් රු. 1,600,000 ක් හා රු. 900,000 ක් ගිණුම් වලින් ඉවත්කර තිබුණි.

(ඉ) උපදේශන සේවා ගාස්තු ලබා ගැනීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් පවරන ලද නඩුව අනුව 2017 සැප්තැම්බර් 29 දින ඔහු වෙත අදාල ගාස්තුව ගෙවන ලෙස ලැබී තිබූ අධිකරණ නියෝගය ප්‍රකාරව ගෙවිය යුතු අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදනය කිරීමට හෝ අනාවරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඊ) උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතියෙන් (Accelerating Higher Education and Development Project)(AHEAD) සමාලෝචිත වර්ෂය තුල මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පිළිවෙලින් රු. 207,169,036 ක් හා රු. 207,105,986 ක් ද වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 63.050ක මුදල් ශේෂය ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

(උ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු. 1,873,417 ක් වූ පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා ගාස්තු ආදායමෙන් සිසුන් වෙත නැවත ගෙවන ලද එකතුව රු. 1,667,000 ක් දෝෂ සහගත ලෙස එම ප්‍රමාණයෙන් ආදායම් ගිණුම් හා විලම්භිත ආදායම් ගිණුම් පිළිවෙලින් හර හා බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම අඩුවෙන් හා විලම්භිත ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු. 1,235,430 ක් වූ විවිධ තැන්පතු ශේෂයන්ට අදාළ උපලේඛන විගණන වෙත ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂාකිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම

හා නක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිර්දේශ යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වි්කරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය	මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල් ආයෝජනය කළ හැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. 56,568,786 ක මුදලක් ස්ථාවර තැන්පතු 11 ක ආයෝජනය කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 371(2)	සමාලෝචිත වර්ෂය තුළ තිකුත් කරන ලද එකතුව රු. 6,020,818 ක් වූ ප්‍රනරාවර්තන අත්තිකාරම් 99 ක් පියවීම සඳහා දින 22 සිට දින 363 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 371(5)	2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 29 කදී ව්‍යාපෘති, පුනරාවර්තන සහ පර්යේෂණ අත්තිකාරම් වෙනුවෙන් දෙන ලද රු. 9,206,526 ක් පියවා නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 371	2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 19,549,083 ක් වූ රැඳවුම් මුදල් නියාදනය කර නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 394 හා 396	කල් ඉකුත් වූ හා අවලංගු කර ඇති එකතුව රු. 1,319,084 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය	2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිළධාරීන් 12 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගත යුතු රු. 55,368,659 ක් 2021 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි. එහි ඇතුළත් වාරික වශයෙන් ගෙවීමට එකඟ වූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 28,079,397 ක් 2018 වර්ෂයේ සිට කිසිදු වාරිකයක් අයකරගෙන නොතිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ	
	(i) 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන චක්‍රලේඛය	නිල නිවාස 30 ක පදිංචි නිලධාරීන්ගෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු. 2,266,030 ක් අඩුවෙන් අයකර නිබුණි.
	(ii) 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛය	චක්‍රලේඛය මඟින් ඉඩදී තිබූ වියදම් වලින් බැහැර වෙනත් වියදම් දැරීම සඳහා බැඳුම්කර කඩකිරීම අරමුදලේ පැවති රු. 54,550,464 ක් වටිනා ස්ථාවර

		තැන්පතු 17 ක් සමාලෝචිත වර්ෂය තුළ ආපසු ලබා ගෙන තිබුණි.
(iii)	2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය	සියලුම ස්වයං මූල්‍ය උත්පාදිත (Self-Financing Activities) ක්‍රියාකාරකම් ප්‍රතිපත්තියක් ලෙස වියදම් ආවරණය කර ගැනීමේ පදනම මත (Cost Recovery) සහ ලාභ ඉපැයීම අරමුණු කර නොගත් (Non Profited Basis) පදනම මත ක්‍රියාත්මක කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,298,902 ක ශුද්ධ මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ I අදියර රු. 315,051,433 ක (VAT රහිත) වටිනාකමකට මාස 24 ක් තුළ වැඩ අවසන් කිරීම සඳහා 2018 ජනවාරි 30 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා කළ වැඩ වටිනාකම් වශයෙන් රු. 83,010,286 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද, වැඩ ඉංජිනේරු විසින් සහතික කරන ලද වටිනාකම් රු. 43,058,226 ක් වූයෙන් රු. 39,951,060 ක් වැඩිපුර ගෙවා තිබිය දී ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි සිට අතහැර දමා තිබුණි. අත්තිකාරම් බැඳුම්කරය 2020 පෙබරවාරි 07 දින අවසන් වී තිබූ අතර එය මුදල් කර ගැනීමට හැකි බැඳුම්කරයේ කාලසීමාව දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 ජූනි මාසයේදී රු. 15,964,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු Desktop පරිගණක යන්ත්‍ර 130 ක් නියමිත පිරිවිතර වලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මාසයේදී ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. 2018 මැයි 19 දිනැති පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වගකීම් විරහිත

ලෙස කටයුතු කර ඇති නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කලයුතු බව නිගමනය කර තිබුණද, 2021 අප්‍රේල් වනවිටත් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. 2018 ජූනි 21 දින රු. 1,596,400 ක් වූ රැඳවුම් මුදල් ද කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෘදුකාංගයක් සැකසීම හා දත්ත ඇතුළත් කිරීම සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 1,370,300 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීඨයට අදාළව පිටත පුහුණු ඒකකය (Out Bound Training Centre) පිහිටුවීම සඳහා 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී රු. 2,725,000 ක් වූ භාණ්ඩ හා උපකරණ ලබා දී තිබුණ ද ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් 2021 මාර්තු වනවිටත් එම උපකරණ ඌන උපයෝජිතව පැවතුණු අතර බොහෝ උපකරණ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.

(ඇ) 2018 අගෝස්තු 21 සිට 30 දක්වා නෙදර්ලන්තයේ පැවැත්වුණු PIM International on management වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ අනුමැතියකින් තොර හිටපු ලේඛකාධිකාරිවරයා සහභාගී වීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය උපයාගත් අරමුදල් වලින් රු. 1,200,000 ක් වැයකර තිබුණි. එම සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීමට විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කර තිබුණද එම මුදල අයකර ගැනීමකින් තොරව 2020 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිලධාරියා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත පාලක සභාව විසින් මුදාහැර තිබුණි.

(ඈ) පර්යේෂණ හා පරිසර අධ්‍යයන ව්‍යාපෘති යඳහා දේශීය හා විදේශීය ආයතන මඟින් ලබා දී ඇති අරමුදල් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. 4,418,209 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 506 කින් තනතුරු 110 ක් හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 530 කින් තනතුරු 132 ක් පුරප්පාඩුව පැවතුණි. සමාලෝචිත වර්ෂය තුල නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ලෙස රු. 19,854,304 ක් ගෙවීමට අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැවති පුරප්පාඩු ද හේතු වී තිබුණි.

(ඊ) 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන ලකතුව රු. 62,686,386 ක් වූ විවිධ ණය හිමි ශේෂ 08 ක් හා ඉකුත් වර්ෂයේ සිට මහපොළ හාරකාර අරමුදලට ගෙවිය යුතුව පවතින රු. 2,201,150 ක් සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි.

(උ) 2018 දෙසැම්බර් වනවිට පර්යේෂණ කාලසීමාව අවසන් වී තිබුණු පර්යේෂණ යෝජනා 21 ක් සඳහා පර්යේෂණ ප්‍රදාන ලෙස රු. 23,024,892 ක් ගෙවා තිබුණ ද 2021 මාර්තු වනවිටත් අවසන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) විශ්වවිද්‍යාලය වෙතුවෙන් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර රු. 1,494,543 ක මූලික වියදමක් ලෙස දරා තිබුණ ද 2021 අප්‍රේල් වනවිටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,

විගණකාධිපති.

16. විගණකාධිපති වාර්තාවට පිළිතුරු - 2020

විගණන විමසුම	පිළිතුර	වර්තමාන තත්වය
01. මූල්‍ය ප්‍රකාශන		
1.1 සත්‍යවිගණනය කළ මතය		
1.2 සත්‍යවිගණනය කළ මතය සඳහා පදනම		
(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ නිෂ්ඵලකරණ ප්‍රඥප්ති - 07 හි 65 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල එලදායී ජීවිත කාලය සම්බන්ධයෙන් නොකිරීම 'හේතුවෙන් පිරිවැය රු. 893,887,711 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ නිෂ්ඵලකරණ ප්‍රඥප්ති - 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් ගොඩනැගිලි ඇතුළු සියලුම ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර අංශය කිරීම් කර පරිගණක ගත කර ස්ථාවර වත්කම් ලේඛණයක් සිදුකෙල කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.මෙම ස්ථාවර වත්කම් ලේඛණය සිදුවෙල කල පසු මෙම අඩුපාඩු සියල්ලම ඉවත් කිරීමට හැකියාව පවතී. ඒ අනුව එම දෝෂය ඉදිරියේදී නිවැරදි කරනු ඇත.	උපාධිධාරී අභ්‍යාසලාභීන් පිරිසක් තෝරාගෙන අවශ්‍ය පුහුණු කිරීම් සිදු කර මෙම කටයුතු ආරම්භ කර කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබුවි ද රට තුළ පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙක් ප්‍රමාද වී ඇත. එහෙත් අගෝස්තු මාසයේ දී මෙම කටයුතු නැවත ආරම්භ කර ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ) 2018 වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු. 1,104,000 ක් වැඩිපුර නිෂ්ඵලකරණ කර තිබීම හේතුවෙන් ජංගම වැරකම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන විසින් පෙන්වා දෙන විගණන විමසුම් නිවැරදි වේ. ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම වරද නිවැරදි කර ඇත.
(ඇ) ඉඩම් වර්ෂයේ දී වැඩ නිමකර නිබුණු පිරිවැය රු. 1,934,137 ක් වූ වෛද්‍ය පීඨයේ කාය විච්ඡේදන විද්‍යාගාර තවිකරණය කිරීම ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීකරණය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුළ කෙරිගෙන යන වැඩ ලෙස නිෂ්ඵලීකරණ කර නිබුණි.	ඇතැම් අංශය විසින් මූල්‍ය අංශය වෙත ලබාදෙන තොරතුරු පදනම්කර ගෙන කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධනීකරණ කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් ඇතැම් අංශයන් විමසීම් ලබාගෙන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත.

(ඈ) විශ්වවිද්‍යාලීය ජල අවශ්‍යතා සපුරාගන්නා ලද ජල පවිත්‍රාගාරය සහ අක්කර 02 රූඩ් 01 ක් පමණ වූ ඉඩම් කොටස් 02ක් පඹහින්න ජල යෝජනා ක්‍රමය සඳහා විධිමත් පවරා දීමකින් තොරව 2018 වර්ෂයේදී එහි වටිනාකම් පිළිවෙලින් රු. 1,600,000 ක් හා රු. 900,000 ක් ගිණුම් වලින් ඉවත්කර තිබුණි.	විගණක විසින් පෙන්වා දෙන විගණන විමසුම් සම්බන්ධයෙන් ඉදිරියේ දී සොයාබලා කටයුතු කරනු ලැබේ.	පවරාදීම් ලිඛිතව සිදුකර ඇති අතර ඒ සම්බන්ධයෙන් ලිඛිත අනුමැතිය ලබාගෙන ඇත.
(ඉ) උපදේශන සේවා ගාස්තු ලබා ගැනීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් පවරන ලද නඩුව අනුව 2017 සැප්තැම්බර් 29 දින ඔහු වෙත අදාල ගාස්තුව ගෙවන ලෙස ලැබී තිබූ අධිකරණ නියෝගය ප්‍රකාරව ගෙවිය යුතු අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදනය කිරීමට හෝ අනාවරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	අදාල අංශ විසින් මුදල් අංශය වෙත ලබා දෙන තොරතුරු පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති අතර ඉදිරියේදී අදාල අංශය මගින් විස්තර ලබාගෙන මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් හෝ අනාවරණය කිරීම් සඳහා කටයුතු කරනු ලැබේ.	මෙම අසම්භාව්‍ය වගකීම් නිරවුල් කිරීම් සම්බන්ධව ප්‍රායෝගික ගැටළු මතුව ඇති බැවින් අදාල පාර්ශවයන් කැඳවා මෙම අසම්භාව්‍ය වගකීම් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලැබේ.
(ඊ) උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙන් (Accelerating Higher Education and Development Project) (AHEAD) සමාලෝචිත වර්ෂය තුල මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පිළිවෙලින් රු. 207,169,036 ක් හා රු. 207,105,986 ක් ද වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 63,050 ක මුදල් ශේෂය ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.	AHEAD ව්‍යාපෘතියෙන් ලද ලිපියට අනුව සහ විශ්වවිද්‍යාලයට අයත් මුදල් නොවන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොමැත.	AHEAD ව්‍යාපෘතියේ කටයුතු විශ්වවිද්‍යාලයේ මැදිහත්වීමකින් තොරව වෙනම ඒකකයක් ලෙස (OTS) ක්‍රියාත්මක වන ඒකකයකි. එහි ගිණුම්කරණ කටයුතු අංක AHEAD/AN/2019/28 හා 2019/10/11 දිනැති වක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාත්මක කරනු ලබන අතර AHEAD ප්‍රතිපාදන වලින් ලද වත්කම් පමණක් විශ්වවිද්‍යාලීය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇත.
(උ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු. 1,873,417 ක් වූ පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු	• විගණන විමසුම් හා එකඟ වන අතර පෙර ගිණුම් වර්ෂවල සිට පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු අදායම්	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

අදායම සමාලෝචිත වර්ෂයේ අදායම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	මුදල් පදනම මත ගිණුම්ගත කර ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. • විගණක විසින් පෙන්වා දෙන විමසුම් හා සම්බන්ධ නිරීක්ෂණ මෙසේය. අප සතු මූලාශ්‍ර ලේඛන අනුව MBA 20 පාඨමාලාව වර්ෂයේ 2020 මාර්තු මස ආරම්භ වී ඇති අතර පාඨමාලා අදායම් ගලාඒමද සිදු වී ඇත. ඒ අනුව සාමාලෝචිත වර්ෂයේ මාස 10කට අදාල ආදායම් ගිණුමගත කර ඇති අතර උපලේඛනයේ ශීර්ෂය පමණක් "2020 March" ලෙස සංශෝධනය විය යුතුය. (2020 April වෙනුවට) එබැවින් අදාල ශීර්ෂ වෙනස්වීම් නිසා වැඩිපුර ගිණුම්ගත වී ඇතැයි සඳහන් වන රු. 537,917 ක ආදායම්, ඒ අනුව විගණන විමසුම් ඉවත් කරගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ. • AHM 19 පාඨමාලාවේ සමාලෝචිත වර්ෂයේ ආදායම් රු.4,750,000/- විය යුතු අතර රු.4,780,000/- ලෙස සටහන් වී ගිණුම්ගත වී ඇතඑබැවින් මු .ඒ පාඨමාලා ආදායම් රු.30,000/- ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම වරද නිවැරදි කර ඇත. නිවැරදි කිරීමට කටයුතු කරන ලදී.
(ඌ) සමාලෝචිත වර්ෂයේ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා ගාස්තු අදායමෙන් සිසුන් වෙත නැවත ගෙවන ලද එකතුව රු. 1,667,000 ක් දෝෂ සහගත ලෙස එම ප්‍රමාණයෙන් ආදායම් ගිණුම් හා විලම්බිත ආදායම් ගිණුම් පිළිවෙලින් හර හා බැර කිරීම් හේතුවෙන්	විගණක විසින් පෙන්වා දෙන විගණන විමසුම් නිවැරදි වේ. ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදි කිරීමට කටයුතු කරන ලදී.

වර්ෂයේ අදායම අඩුවෙන් හා විලම්බිත ආදායම වැඩියෙන් දක්වා තිබුණි.		
(එ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු. 1,235,430 ක් වූ විවිධ නැන්පතු ශේෂයන්ට අදාළ උපලේඛන විගණන අංශය වෙත ඉදිරිපත් නොකෙරුණි.	විගණක විසින් පෙන්වා දෙන විගණන විමසුමට අදාල නිරීක්ෂණ මෙසේය. විශ්වවිද්‍යාලයට විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන සහ නැවත ගෙවිය යුතු මුදල් ලැබීම් රිසිට්පත් සහ ප් නල් මගින් මෙම ගිණුමේ ගිණුම්ගත කරනු ලබන අතර ඊට අදාල ගෙවීම් කිරීමද සටහන් කරනු ලැබ ඇති අතර මෙම ගිණුම සඳහා වෙනම උපලේඛණයක් පවත්වාගෙන ගොස් නොමැත. ඉදිරියේදී මෙ සඳහා වෙනම ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.	මෙම ශේෂයේ අන්තර්ගත පැරණි ශේෂ අවිනිශ්චිත ගිණුමක සටහන් කර මුදල් කමිටුවේ නිර්දේශය හා පාලක සභාවේ අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාලයේ ආදායමට ගැනීමට කටයුතු කරනු ලබන අතර ඉදිරියේ දී මෙලෙස ලැබෙන මුදල් සටහන් කිරීම සහ ගෙවීම් සඳහා වෙනම ලේඛණයක් පවත්ගැනීමට කටයුතු සිදු කර ඇත.
1.3 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු		
1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම		
1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම		
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව		
2.2.2. (අ). 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති PED/12 රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල් ආයෝජනය කල හැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය	විශ්වවිද්‍යාලය විසින් විවිධ අවස්ථාවන්හිදී විවිධ වූ අරමුණු සහිතව, ස්ථාවර නැන්පතු වල අරමුදල් ආයෝජනය කර ඇත. විගණන විමසුමෙහි සටහන් කර ඇත්තේ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව මුදල් අමාත්‍යවරයාගේ නිසි අවසරය ඒ සඳහා ලැබී නොමැති බවයි. කෙසේ වුවද විගණන විමසුමෙහි සඳහන් වන ස්ථාවර නැන්පතු 11 අතරින් කිහිපයක්ම ස්වයං උත්පාදන අරමුදල් සහිත ඒකක මගින් කරන ලද ආයෝජනයන්ය. විවෘත හා දුරස්ථ	විවෘත හා දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානයේ ස්ථාවර නැන්පතු සඳහා පහත පරිදි මුදල් කමිටුවේ නිර්දේශයන් සහ පාලක සභාවේ අනුමැතීන් ලැබී ඇත.

<table>
<tr>
<td>අවසන් වන විට රු. 56,568,786 ක මුදලක් ස්ථාවර තැන්පතු 11 ක ආයෝජනය කර තිබුණි.</td>
<td>අධ්‍යාපන මධ්‍යස්ථානය හා පශ්චාද් උපාධි පීඨය නමින් ආරම්භ කර ඇති තැන්පතු සඳහා යොදාගෙන තිබෙන්නේ එම අංශ මගින් උත්පාදනය කරන ලද මුදල්ය. 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරණ චක්‍රලේඛය මගින් ස්වයං උත්පාදිත අරමුදල් සඳහා මගපෙන්වීම් කර ඇත. විගණන විමසුමෙහි සඳහන් ස්ථාවර තැන්පතු අගය වන රු.56,568,786/- ක මුදලින් 90%කට වැඩි ප්‍රමාණයක් ස්වයං උත්පාදිත අරමුදල් තුළ ඇතුලත් වේ. එම අරමුදල් ආයෝජනය සඳහා පාලක සභා අනුමැතිය ලබාගෙන ඇත.

එමෙන්ම ඉහත සඳහන් අගය තුල ඇතුලත් අනෙක් ස්ථාවර තැන්පත් වන ක්‍රීඩා සංවර්ධන අරමුදල හා ධර්මාරාම විශ්වවිද්‍යාල අරමුදල ද විශේෂිත අරමුණු සහිතව ඇති කළ අරමුදල් වන අතර, එම ස්ථාවර තැන්පත් ආරම්භ කිරීමේදී ද පාලක සභා අනුමැතිය ලබාගෙන ඇත.</td>
<td>
<table>
<tr><th>ස්ථාවර තැන්පතු අගය</th><th>මුදල් කමිටුවේ නිර්දේශය</th><th>පාලක සභාවේ අනුමැතිය</th></tr>
<tr><td>රු.මි. 5</td><td>175 මුදල් කමිටුව</td><td>246 පාලක සභාව</td></tr>
<tr><td>රු.මි. 7.5</td><td>191 මුදල් කමිටුව</td><td>264 පාලක සභාව</td></tr>
<tr><td>රු.මි. 10</td><td>194 මුදල් කමිටුව</td><td>267 පාලක සභාව</td></tr>
</table>

පශ්චාත් උපාධි පීඨයේ ස්ථාවර තැන්පතු සඳහා පහත පරිදි මුදල් කමිටුවේ නිර්දේශයන් සහ පාලක සභාවේ අනුමැතීන් ලැබී ඇත.
<table>
<tr><th>ස්ථාවර තැන්පතු අගය</th><th>මුදල් කමිටුවේ නිර්දේශය</th><th>පාලක සභාවේ අනුමැතිය</th></tr>
<tr><td>රු.මි.4</td><td>166 මුදල් කමිටුව</td><td>235 පාලක සභාව</td></tr>
<tr><td>රු.මි. 5</td><td>175 මුදල් කමිටුව</td><td>246 පාලක සභාව</td></tr>
<tr><td>රු.මි. 4</td><td>189 මුදල් කමිටුව</td><td>262 පාලක සභාව</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>2.2.2 (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</td>
<td>දිගින් දිගටම සිහි කැඳවීම් ලිපි යැවුවද පියවීමට උත්සුක නොවීම නිසා මෙම ප්‍රමාදය හටගෙන තිබුණි. මේ වන විට</td>
<td>අත්තිකාරම් නියමිත කාලය තුල දී නොපියවන නිලධාරීන්ට එම අත්තිකාරම් පිළිබඳ දැනුවත් කරමින් සිහිකැඳවීමේ ලිපි 3ක් යැවීමටත් අවසාන</td>
</tr>
</table>

(i) 371 (2) රෙගුලාසිය සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද එකතුව රු. 6,020,818 ක් වූ පුනරාවර්තන අත්තිකාරම් 99 ක් පියවීම සඳහා දින 22 සිට 363 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.	පුනරාවර්තන අත්තිකාරම් පියවා ඇති අතර ඉදිරියේදී මෙම වරද සිදු නොවීමට කටයුතු කර ඇත.	ලිපියෙහි නොපියවන ලද අත්තිකාරම් නියමිත දිනට පෙර නොපියවන්නේ නම් නිලධාරියාගේ ඊළඟ මස වැටුපෙන් අයකර ගන්නා බවටත් දන්වා යැවීමට කටයුතු කිරීම.
(ii) 371 (5) රෙගුලාසිය 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 29 ක දී ව්‍යාපෘති, පුනරාවර්තන හා පර්යේෂණ අත්තිකරම් රු. 9,206,526 ක් පියවා නොතිබුණි.	වාචිකව සහ ලිඛිතව පියවීම් කරන ලෙස අත්තිකාරම් ලබාගත් පාර්ශවයන් දැනුවත් කලද පියවීම් සිදු කර නොමැත. ඉදිරියේ දී මේ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.	පියවා නොමැති විවිධ අත්තිකාරම් 5 මේ වන විට පියවා ඇති අතර (රු59,200) පියවා නොමැති පර්යේෂන අත්තිකාරම් 18 න් (රු.5,702,806) 5ක් (රු.1,555,390) මේ වන විට පියවා ඇති අතර පියවා නොමැති ව්‍යාපෘති අත්තිකාරම් 6 (රු.3,444,978)න් 4ක් (රු.2,161,820) මේ වන විට පියවා ඇත.
(iii) මුදල් රෙගුලාසි 571 2015 සිට 2018 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 19,549,083 ක් වූ රැඳවුම් මුදල් නියදනය කර නොතිබුණි.	විගණක විසින් පෙන්වා දෙන විගණන විමසුමට අදාල නිරීක්ෂණයන් මෙසේය. මු.රෙ.570 (C) අනුව වසර දෙකකට වඩා පැරණි අනෙකුත් සියලුම තැන්පතු නියාදනය කලයුතු වුවද රැඳවුම් මුදල් යනු ඵලෙස තැන්පත් කරන ලද මුදල් නොවන අතර විශ්වවිද්‍යාලය මගින් ස්ථාවර වත්කම් මිලදී ගැනීමේදී ඒ සඳහා ගෙවනු ලබන මුදලින් රඳවා ගනු ලබන මුදල් වන අතර අදාල පාර්ශවයන්ට නැවත ගෙවීමට විශ්වවිද්‍යාලය බැඳි සිටී. එබැවින් මෙම විගණන විමසුම ඉවත් කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.	අවසාන බිල්පත් ඉදිරිපත් නොකිරීම, අදාල ඉදිකිරීම්වල පළුදු වීම් පැවතීම, යනාදි හේතූන් මත රැඳවුම් මුදල් නිදහස් නොකර පවතිනු ඇත.
(iv) මුදල් රෙගුලාසි 394 හා 396	විගණකගේ විගණන විමසුම් නිවැරදි වේ ඉදිරියේදී මෙම . වරදනිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම වරද නිවැරදි කිරීමට කටයුතු සිදුකර ඇත.

කල් ඉකුත් වූ හා අවලංගු කර ඇති එකතුව රු. 1,319,084 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.		
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගත වූ නිලධාරීන් 12 දෙනෙකුගෙන් බැදුම්කර කඩකිරීම් හේතුවෙන් අයකරගත යුතු රු. 55,368,659 ක් 2021 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි. එහි ඇතුළත් වාරික වශයෙන් ගෙවීමට එකඟ වූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 28,079,397 ක් 2018 වර්ෂයේ සිට කිසිදු වාරිකයක් අයකරගෙන නොතිබුණි.	2020.12.31 දින වන විට බැදුම්කර කඩ කිරීම් හේතුවෙන් අය කර ගත යුතුව තිබූ රු. 60,080,197.84 ක මුදල අද වන විට රු. 55, 368, 659. 14 දක්වා අඩු වී ඇත. තවද, විගණන වාර්තාවේ සඳහන් වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති රු. 28,079,397 ක නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතුව තිබෙන මුදල නොගෙවෙන බැවින්, නීතිමය පියවර ගැනීම් සඳහා අදාළ ලිපි ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	2020.12.31 දින වන විට බැදුම්කර කඩ කිරීම හේතුවෙන් අය කර ගත යුතුව තිබූ රු. 60,080,197.84 ක මුදල 2021.06.30 දින වන විට රු. 53,147,465.58 ක් (ජේ.ලක්ෂ්මන් මහතාගෙන් රු. 785,851.25 ක් සහ ඒ.ඒ.සී.එන්. අතපත්තු මහතාගෙන් රු. 1,435,342.31 ක මුදල විශ්වවිද්‍යාලය වෙත ගෙවීම පරිදි) දක්වා අඩු වී ඇත. තවද, විගණන වාර්තාවේ සඳහන් ආචාර්ය ජී.ඩබ්.එල්. ජයවර්ධන මයා, වයි.එම්.පී.එම්.පී.ඉළුක්පිටිය මයා හා කේ.බී.ඩී.පී. සමරජීව මහතා යන නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතුව තිබෙන මුදල වන රු. 28,079,396.95 ක මුදල නොගෙවෙන බැවින්, නීතිමය පියවර ගැනීම සඳහා අදාළ ලිපි ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද, විගණන වාර්තාවේ සඳහන් වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති ඩී.එම්.ඩබ්.කේ. දසනායක මහතාගෙන් අය කර ගත යුතු ඉතිරි ශේෂය ඔහුගේ අර්ථ සාධක අරමුදලින් අය කර ගැනීමට අවශ්‍ය අයදුම්පත් 2021.04.08 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. තවද, වාරික වශයෙන් ගෙවීමට එකඟ වූ වී.කේ.ජී. විනාන මියගෙන් අය කර ගත

		යුතුව ඇති මුදලින් අර්ථ සාධක අරමුදලින් අය කර ගැනීමට නියමිත මුදල සඳහා අවශ්‍ය අයදුම්පත් සම්පූර්ණ කර එවන ලෙස 2020.09.17 දින ඇය වෙත යොමු කර ඇති අතර එයට ප්‍රතිචාර ලබා දී නොමැති බැවින් 2020.10.21 දිනැතිව සිහිකැඳවීම් ලිපියක්ද යොමු කර ඇත. එමෙන්ම, වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති ඒ.ඒ. රොද්‍රිගෝ මයාගෙන් අය කර ගත යුතුව ඇති මුදලින් අර්ථ සාධක අරමුදලින් අය කර ගැනීමට නියමිත මුදල සඳහා අවශ්‍ය අයදුම්පත් සම්පූර්ණ කර එවන ලෙස 2020.12.30 වන දින ඇය වෙත දන්වා ඇත.
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛ **(i) 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන වක්‍රලේඛය** නිල නිවාස 30 ක පදිංචි නිලධාරීන්ගෙන් වක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගාස්තු අයනොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු. 2,266,030 ක් අඩුවෙන් අයකර තිබුණි.	2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛයට අනුව සුදුසුකම්ලත් නිලධාරීන් වන්නේ පත්වීම් ලිපියේ නිල නිවාසයකට හෝ නිල නිවාසයක් සඳහා වන දීමනාවකට හිමිකම් ලබන බවට සඳහන් නිලධාරීන් වුවත් අප විශ්වවිද්‍යාලයේ පත්වීම් ලිපි කිසිවක එවැනි සඳහනක් නොමැත.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන වක්‍රලේඛ අංක 09/2019 යටතේ මූලික වැටුපෙන් 10% ක නිවාස කුලියක් අයකල හැක්කේ එහි සඳහන් කර ඇති නිලධාරීන්ගෙන් පමණකි. අප විශ්වවිද්‍යාලය පිහිටා ඇති ප්‍රදේශයේ දුෂ්කරභාවය සලකා බලා නිවාස පහසුකම් සලසා ඇති අතර කුලිය අයකිරීම සම්බන්ධයෙන් වෙනම වක්‍රලේඛයක් නොමැති බැවින් ඒ සඳහා සාධාරණ කුලියක් නිවාස කමිටුව, මූල්‍ය කමිටුව හා පාලක සභාවේ අනුමැතිය යටතේ අය කරනු ලබයි. මෙම ක්‍රියාවලිය අතීතයේ සිටම සිදුකර ගෙන එනු ලබන අතර අනෙකුත් නිල නිවාස සපයන විශ්වවිද්‍යාලද මෙම ක්‍රමය අනුගමනය කරනු ලබයි.

		නවද, නිවාස කමිටුව විසින් මෙම නිවාස කුලී යාවත්කාලීන කරන අතර අවසන් කුලී යාවත්කාලීන කිරීම 2021/01/01 දින සිදුකර ඇත.
(ii) 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්ලේඛය විශ්ලේඛය මගින් ඉඩදී තිබූ වියළි වැඩාර වෙනත් වියළි දැරීම සඳහා නැවුම්කර කඩකිරීම අරමුදල් පැවති රු. 54,550.464 ක් වටිනා ඒම්බර තැන්පතු 17ක් සම්බන්ධිත වර්ෂය තුළ ආපසු ලබා ගෙන තිබුණි.	2020 වර්ෂයේ රටතුළ උද්ගත වූ කොරෝනා වසංගත තත්වය හමුවේ මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය ආයතන වලට වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා කරන ලදී. විශ්වවිද්‍යාලයේ අවම වියදම් ගැනීම සඳහා ගත් ප්‍රතිඵලයන් පදනම් කරගෙන් අරමුදල් නොලැබුණ අතර එම තත්වය හමුවේ ද්‍රව්‍ය විශ්වවිද්‍යාලයේ වැඩකටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම අභිවාර්ය විය. 2020 ජූනි මස 30 වන දිනට නොගෙවූ බිල්පත් මිලියන තුන්සියය ඉක්මවා තිබූ අතර. ඒ අතින් මහා භාණ්ඩාගාරයෙන් අනෙකුත් ප්‍රතිපාදන වියළම් සඳහා ලැබී තිබුණේ රුපියල් මිලියන 82 දෙකක් පමණි. ප්‍රාග්ධන වියළම් සඳහා ලැබී තිබුණේ රුපියල් මිලියන 90ක මුදලක් පමණි. එමෙන්ම ශිෂ්‍යයන් සඳහා ලබාදිය යුතු ශිෂ්‍යාධාර අරමුදල් ද ප්‍රතිදායකින් තොරව වෙන ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා දී තිබුණි. ශිෂ්‍යාධාර සඳහාද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණ ලැබීම් සුළුතර වූ අතර මෙම සියලම තත්වයන් සලකා බලා විශ්වවිද්‍යාලය මූලික තත්වය යහපත්ව පවත්වා ගැනීමේ අරමුණින් අරමුදල් හිඟයට පිළියමක් වශයෙන් ඇතැම් ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර ආපසු ලබා ගැනීමට තීරණය කරන ලදී. නොගෙවූ බිල්පත් ඇති වූ සිඩනය අවම කර යම් ප්‍රමාණයකට හෝ මූලික තත්වය	

	සමනය කර ගැනීම සඳහා සද්භාවයෙන් යුතුව ස්ථාවර තැන්පතු නැවත ලබා ගන්නා තීරණය ගන්නා ලදී. මුදල් කමිටුවේ අනුමැතිය හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ නිසි අනුමැතිය ද ලබා ගන්නා ලදී. එම නිසා පොළි ආදායම් යම් ප්‍රමාණයක් අහිමි වුවද අවස්ථානුකූලව සද්භාවයෙන් යුතුව ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර ආපසු ලබා ගත් බව සඳහන් කරනු ලැබේ. 2020 ජුනි මස 30 දක්වා මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් පහත පරිදි වේ. මාසය / අනෙකුත් පුනරාවර්තන ප්‍රදාන (රුපියල් මිලියන) / ප්‍රාග්ධන ප්‍රදාන (රුපියල් මිලියන) ජනවාරි 21,750,000.00 - පෙබරවාරි 21,750,000.00 55,000,000.00 මාර්තු 18,000,000.00 25,000,000.00 අප්‍රේල් 2,000,000.00 - මැයි 15,000,000.00 10,000,000.00 ජුනි 3,500,000.00 - එකතුව 82,000,000.00 90,000,000.00	
(iii) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය සියලුම ස්වයං මූල්‍ය උත්පාදිත (self-Financing Activities) ක්‍රියාකාරකම් ප්‍රතිපත්තියක් ලෙස වියදම් ආවරණය කර ගැනීමේ පදනම මත (cost recovery) සහ ලාභ ඉපැයීම් අරමුණු කර නොගත් (Non Profited	විගණක විසින් පෙන්වා දෙන විගණන විමසුම් නිවැරදි වේ. ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	සියළුම ස්වයං මූල්‍ය උත්පාදන ඒකක වල ආදායම් සහ වියදම් විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමේ දී විශ්වවිද්‍යාලයේ ගිණුම්තුළට ඇතුලත් කරනු ලැබ ඇති අතර විගණක විසින් පෙන්වා දෙන පරිදි Development Fund, VC Fund, CODL Fund යන ලෙජර් වල සටහන් කිරීම 2016 සිට සිදු

Basis) පදනම මත ක්‍රියාත්මක කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,298,902 ක ශුද්ධ මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි.		කලයුතු බැවින් අදාල ගණනය කිරීම සිදු කිරීම මේ වන විට සිදු කරනු ලැබේ.
2.2.4 (අ) නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ I අදියර රු. 315,051,433 ක (VAT රහිත) වටිනාකමට මාස 24ක් තුළ වැඩ අවසන් කිරීම සඳහා 2018 ජනවාරි 30 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකරම හා කළ වැඩ වටිනාකම් වශයෙන් රු. 83,010,286 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද, වැඩ ඉංජිනේරු විසින් සහතික කරන ලද වටිනාකම් රු. 43,058,226 ක් වූයෙන් රු. 39,951,060 ක් වැඩිපුර ගෙවා තිබිය දී ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි සිට අතහැර දමා තිබුණි. අත්තිකාරම් බැඳුම්කරය 2020 පෙබරවාරි 07 දින අවසන් වී තිබූ අතර එය මුදල් කර ගැනීමට හෝ බැඳුම්කරයේ කාලසීමාව දිර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	➢ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා වන ගෙවීම් කිරීමේදී එම ගොඩනැගිල්ල ඉදිකිරීම් නිරීක්ෂණය කරන විශ්වවිද්‍යාලීය වැඩ ඉංජිනේරු මහතා විසින් 2019.10.28 දිනට කරන ලද වැඩ වටිනාකම් ලෙස රු. 43,058,226.20 ක් දක්වා ඇති අතර එය රු. 39,314,427.00 ක් නොවන බව කාරුණිකව දන්වා සිටිමි.එසේම 2020 පෙබරවාරි මස වනතෙක් CML – MTD ආයතනය විසින් කරන ලද ඉදිකිරීමෙහි වටිනාකම් ගණනය කර නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි. එසේම ඉහත රු 43,058,226.20 යන වැඩ වටිනාකම්වින් රු 4,305,882.62 ක මුදලක් රදවා ගැනීමේ මුදල් (Retention) සඳහාද අත්තිකාරම් බැඳුම්කරය සඳහා රු 9,567,671.18 ක මුදලක් සහ ඉතිරි මුදල් (balance payment) ලෙස රු. 13,563,063.20 ක මුදලක් ද රදවා තබාගෙන ඇති බවද දැනුම් දීමට කැමැත්තෙමි. ➢ CML- MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ඉදිකිරීම් ආයතනය විශ්වවිද්‍යාලය තුළ අදාළ ඉදිකිරීම් කටයුතු නොකඩවා සිදු කරමින් සිටි බැවින් අදාළ අත්තිකාරම් බැඳුම්කරය දිර්ඝ කිරීමට කටයුතු කරන ලෙස 2020.01.13 දිනැති ලිපිය මඟින් CML- MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ආයතනය වෙත දන්වා යවන ලදි. එම ලිපිය සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලද බැවින් 2020.02.17 දිනැතිව ලේඛකාධිකාරිතුමාගේ අත්සන සහිත ලිපියකින් පළමු වන සිහිකැඳවීමද CML- MTD	කොන්ත්‍රාත්කරු කාර්යසාධන ඇපකරය තවමත් ලබා දී නොමැති බැවින් පළමු ගෙවීමෙන් එම මුදල අඩු කරගෙන ගෙවීමට හෝ කාර්යසාධන ඇපකරය ලබාදෙන තෙක් පළමු ගෙවීම් සිදු නොකර සිටීමට කටයුතු කරනු ලැබේ.

කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ ආයතනය වෙත යවනු ලැබිය.කෙසේ වුවද 2020.02.19 දින මූලධන හා ශ්‍රේෂ්ඨ අංශය වෙත ලද ඉල්ලුම් බැංකුව විසින් CML- MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ ආයතනය වෙත 2020.02.17 දින යොමු කරන ලද ලිපිය මඟින් මෙම බැඳුම්කරය කවුරුවත් දීර්ඝ නොකරන බව දන්වා එවා තිබුණි. එම ලිපිය නිකුත්කළ තිබුණේ 2020.01.22 දින CML- MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ ආයතනය අදාළ බැඳුම්කරය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇති අතර ඉල්ලුම් බැංකුව විසින් එම බැඳුම්කරය දීර්ඝ නොකරන බව පවසන්නේ 2020 පෙබරවාරි 17 දිනැති ලිපිය මඟිනි.

මෙම දිනය වන විටද CML- MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ ආයතනය විශ්වවිද්‍යාල භූමියෙහි අදාල ඉදිකිරීම කටයුතු සිදු කරමින් සිටි බවද වැඩි දුරටත් ඇතුම් දිවංගත කැමැත්තෙමි. මෙම ලිපිය ලැබී දින 14 තුළ උපකුලපතිතුමාගේ අත්සන යෙහෙව 2020.03.03 දිනැති බැංකුව වෙත අදාළ බැඳුම්කර මුදල් විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු නියෝග කළද 2020.03.12 දිනැතිව ඉල්ලුම් බැංකුව විසින් මෙම බැඳුම්කරය කවුරුවත් දීර්ඝ කල නොහැකි බව දන්වා ඇත. නමුත් එම ලිපිය විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත්තේ 2020.05.26 වන දින බවද දන්වා සිටී.

බැඳුම්කරයේ කාල සීමාව දිගු කරන ලෙස දන්වා CML- MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ ආයතනය වෙත පහත සඳහන් දිනයන්හි ලිපි තිකුත් කර ඇති බවද ඔබගේ කාරුණික අවධානයට යොමු කරමි.

2020.01.13	2020.02.17	2020.04.06
2020.06.10	2020.06.19	2020.07.02
2020.07.30	2020.08.13	

CML- MTD කන්ප්‍රක්ෂන් ලිමිටඩ ආයතනය සමග පහත සඳහන් දිනයන්හි පැවති සම්මාලෝචන රැස්වීම් වලදී මෙම බැඳුම්කරය දිර්ඝ කරන ලෙස දන්වා ඇත.

රැස්වීම දින 2020.06.10 2020.06.19

- කවද මෙම ප්‍රමාදවීම සැලකිල්ලට ගෙන CML- MTD කන්ප්‍රක්ෂන් ලිමිටඩ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ රු.15,752,571.65 ක් වූ කාර්යසාධන ඇපකරය විශ්වවිද්‍යාලය විසින් අය කර (encash) ගන්නා ලදී.
- මෙහෙයුම්මණ්ඩල රැස්වීම සඳහා අමතකයාගෙන අධ්‍යක්ෂ සභා පාලක සභා අධ්‍යක්ෂය ලබා ගෙන තිබෙන අතර එම රැස්වීම් අන්සන් කිරීමෙන් පසු අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවකට කොවිඩ රෝගය වැලදී ඇති බැවින් බැංකු ඇපකර ඉදිරිපත් කිරීම සඳහා උප කොන්ත්‍රාත් ආයතනය කල් ඉල්ලා ඇත. එම බැංකු ඇපකර 2021 සිංහල අළුත් අවුරුදු කාල සීමාවෙන් පසු ලබා දෙන බව ලිඛිතව දන්වා ඇති අතර මේ වන විට ඉදි කිරීම් පරිශ්‍රයේ එම ආයතනයේ සේවකයන් කිහිප දෙනෙකු රැඳී සිටිමින් අවශ්‍ය පරිදුනා කටයුතු සිදු කරමින් සිටින බව කාරුණිකව දැනුම් දෙමි.

(ආ) 2016 ජූනි මාසයේදී රු. 15,964,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු Desktop පරිගණක යන්ත්‍ර 130 ක් නියමිත පිරිවිතර වලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මාසයේදී ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. 2018 මැයි 19 දිනැති පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වගකීම් විරහිත ලෙස කටයුතු කර ඇති නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කලයුතු බව නිගමනය කර තිබුණද, 2021 අප්‍රේල් වනවිටත් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. 2018 ජූනි 21 දින රු. 1,596,400 ක් වූ රැඳවුම් මුදල් ද කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි.	මෙහිදී රැඳවුම් මුදල නිදහස් කර ඇත්තේ කමිටු නිර්දේශය මත වේ. කමිටු නිර්දේශ සලකා බලා ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	කමිටු නිර්දේශය පරිදි අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.
2.3 වෙනත් කරුණු		
(අ) ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෘදුකාංගයක් සැකසීම හා මෘදුකාංගයට දත්ත ඇතුළත් කිරීම සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 1,370,300 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර නොතිබුණි.	➢ ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරීමේ කාර්යය සඳහා තොරතුරු ගබඩා කිරීමට මෘදුකාංගයක් සැකසීම පෙන්ඩර් නැදවා විශ්වවිද්‍යාලය මඟින් සිදු කිරීමට හා එහි තොරතුරු ගබඩා කිරීම හා දේපළ තක්සේරු කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීමට Management Frontiers (Private Limited) ආයතනය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් තෝරා ගැනීම සිදුවිය. අදාළ මෘදුකාංගය සකස් කර විශ්වවිද්‍යාලයට බාර දී තිබුණු අතර ඒ සඳහා රු.400,000.00 ක් ගෙවා තිබුණි. ස්ථාවර වත්කම් හඳුනාගෙන නම් කිරීම Management Frontiers (Private Limited) ආයතනය මඟින් සිදු කළ අතර එම තොරතුරු උක්ත මෘදුකාංගයට ඇතුළත් කර එක් එක් අංශයට අදාළ තොරතුරු සහිත මෘදුකාංගය	උපාධිධාරී අභ්‍යාසලාභීන් පිරිසක් තෝරාගෙන අවශ්‍ය පුහුණු කිරීම් සිදු කර මෙම කටයුතු ආරම්භ කර කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබුව ද රට තුල පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මදක් ප්‍රමාද වී ඇත. එහෙත් දැනෝස්තු මාසයේ දී මෙම කටයුතු නැවත ආරම්භ කර ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

Management Frontiers (Private Limited) ආයතනය මඟින් නිරවද්‍යතාවය සහවුරු කිරීම සඳහා එක් එක් අංශ වෙත යොමු කරන ලදී. නමුත් බොහෝ අංශ එම පරිගණකගත තොරතුරු හා සෞඛ්‍යකව එම ආයතනයන්හි ඇති වත්කම් සමඟ නොගැළපෙන බව වාර්තා කරන ලදී.

මෙහි දී ඒරාවර වත්කම් තනුගතය නම් කිරීම සිදු කිරීම මත Management Frontiers (Private Limited) ආයතනයට රු.680,800.00 ක මුදලක් එම කාර්යය ප්‍රගතිය මත හා ගිවිසුම පදිදි මේ සඳහා පත් කර තිබූ අධීක්ෂණ කමිටුවේ නිර්දේශය මත ගෙවන ලදී. නමුත් ඉහත සඳහන් පරිදි මුළුත පරිගණකගත තොරතුරු සහ භෞතිකව පවතින වත්කම් තොගැළපෙන අවස්ථා වාර්තා වූයෙන් එම ආයතනය වෙත ඉන් පසුව ගෙවීම් කිරීම සඳහා (Progress payment) කටයුතු කර තොමැත.

මේ අතර Management Frontiers (Private Limited) ආයතනය විසින් වත්කම් (ගොඩනැගිලි, ඉඩම්) තක්සේරු කර වාර්තාවක්ද ඉදිරිපත් කරන ලද අතර. ඉහත පරිදි ප්‍රගතිය සතුටුදායක තොවූයෙන් ගෙවීම් කිරීම සිදු තොකළ බැවින් අදාළ ආයතනය විසින් එම කටයුතු කිරීම සිදු කිරීමෙන් වැළකී සිටින ලදී.

විශ්වවිද්‍යාලය සහ ආයතනය අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දී පැවති සාකච්ඡාවලදී අදාල ආයතනය ස්ථිරවර වත්කම් ලේඛනය සිළියල කිරීමේ කාර්යයෙන් ඉවත්ව ඇති අතර විශ්වවිද්‍යාලය විසින් වෙනම කමිටුවක් පත්කර අදාල කාර්ය කරගෙන

(ආ) විශ්වවිද්‍යාලයේ වැවහාරික විද්‍යාපීඨයට අදාළ පිටත පුහුණු ඒකකය (Out Bound Training Centre) පිහිටුවීම සඳහා 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී රු. 2,725,000 ක් වූ මාණ්ඩ හා උපකරණ ලබා දී තිබුණ ද ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් 2021 මාර්තු වනවිටත් එම උපකරණ ඒවා	වර්තමානයේ දී මේ සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය ආරම්භ කර ඇති අතර දැනට පවතින පහසුකම් සමඟ මෙම ඒකකය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව දන්වා සිටිමු. 2019 ඔක්තෝම්බර් මස සිට මේ දක්වා එයට අදාල වැඩමුළු 07ක් පමණ විවිධ පීඨ සඳහාත්, විශ්වවිද්‍යාල පරිපාලන නිලධාරීන් සඳහාත් පිටත පාසල් මඟින් සඳහාත් පැවැත්වූ	පෙර දැන්වූ පරිදි වර්තමානයේ මේ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය ආරම්භ කර ඇති අතර දැනට පවතින පහසුකම් සමඟ මෙම ඒකකය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව දන්වා සිටිමු.
යනු ලබන බවට එතිදී එකඟවියට එළඹිණි. ඒ අනුව උපාධිධාරී පුහුණු වන්නන් යොදා ගනිමින් අදාල කටයුතු කරගෙන යාම මේ වන විට ආරම්භ කර ඇත. ➢ ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරීමේ සියලුම කටයුතු විශ්වවිද්‍යාලය මඟින් සිදු කිරීමට තීරණය කර ඇති අතර පැරණි ගිවිසුම් අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කර ඇත. ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරීම හා එහි සියලු කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පියාඹපිත/ කළමනාකරණ උපාධියක සිටියේ සහාපතිවරයෙන් සාමාජිකයන් 09ක් ඇතුලත් කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව අවසන්වරට රැස් වූ අවස්ථාවේදී සාකච්ඡා කළ පරිදි ස්ථාවර වත්කම් හඳුනාගැනීම, තක්සාරණය හා පරිගණක පද්ධතිය සකස් කිරීමේ කටයුතු ශිල්පීන් පවතී. ක්‍රියාකාරිව අදාල කටයුතු ඉටුකරමින් ස්ථාවර වත්කම් ලේඛණය හා පරිගණක ගත කිරීම නිම කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.		

උපයෝජිතව පැවතුණු අතර බොහෝ උපකරණ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.	අතර, ඊට අමතරව සෑම වසරකම පළමු සමාසිකයේ අප අධ්‍යනාංශයේ සිසුන් සඳහා මේ සම්බන්ධයෙන් වන අධ්‍යයන විෂයන් දෙකක් ද (Outdoor recreation and leadership – SSM31209/PED 41203) මෙම ඒකකය මූලික කර සිදු කරනු ලැබේ. ඉහත ක්‍රියාකාරකම් සඳහා නිරීක්ෂණයේ සඳහන් උපකරණ හා සම්පත් අදාල පරිදි භාවිතා කරනු ලබන බව ද දන්වා සිටිමි.	2019 දෙසැම්බර් මස සිට මේ දක්වා එයට අදාලව වැඩමුළු 07ක් පමණ විවිධ පීඨ සඳහාත්, විශ්ව විද්‍යාල පරිපාලන නිලධාරීන් සඳහාත් පිටත පාසල් ළමුන් සඳහාත් පැවැත් වූ අතර, ඊට අමතරව සෑම වසරකම පළමු සමාසිකයේ අප අධ්‍යනාංශයේ සිසුන් සඳහා මේ සම්බන්ධයෙන් වන අධ්‍යන විෂයන් දෙකක්ද (Outdoor Recreational and Leadership – SSM31209/PED 41203) මෙම ඒකකය මූලික කර සිදුකරනු ලැබේ. ඉහත ක්‍රියාකාරකම් සඳහා නිරීක්ෂණයේ සඳහන් උපකරණ හා සම්පත් අදාල පරිදි භාවිතා කරනු ලබන බවද දන්වා සිටිමි.
(ඇ) 2018 අගෝස්තු 21 සිට 30 දක්වා නෙදර්ලන්තයේ පැවැත්වුණු PIM International on Management වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ අනුමැතියකින් තොර හිටපු ලේඛකාධිකාරීවරයා සහභාගී වීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය උපයාගත් අරමුදල් වලින් රු. 1,200,000 ක් වැයකර තිබුණි. එම සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීමට විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කර තිබුණද එම මුදල අයකර ගැනීමකින් තොරව 2020 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිලධාරියා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත පාලක සභාව විසින් මුදාහැර තිබුණි.	PIM ආයතනය විසින් 2018.06.25 දිනැති ලිපිය මඟින් යටෝක්ත වැඩසටහන සඳහා නාම යෝජනා කැඳවා තිබූ අතර 2018.08.01 දිනට පෙර එම අයදුම්පත් යොමුකල යුතුව තිබුණි. ඒ අනුව උපකුලපතිතුමා විසින් 2018.07.20 දිනැතිව හිටපු ලේඛකාධිකාරී වී.ඩී කිත්සිරි මහතා යටෝක්ත වැඩසටහන සඳහා නාම යෝජනා අනුමත කරන ලදී. PIM ආයතනය විසින් 2018.07.20 දිනැති ලිපිය මඟින් වී.ඩී කිත්සිරි මහතාගේ යෝජනාව පිළිගෙන තිබුණි. ඒ අනුව 2018.07.26 දින පැවති පාලක සභාව විසින් ඒ මහතා වෙනුවෙන්, 1. රාජකාරී විදේශ නිවාඩු දින 10ක් (23018.08.21 - 2018.08.30) 2. පාඨමාලා ගාස්තු රු. 425,000	PIM ආයතනය විසින් 2018.06.25 දිනැති ලිපිය මඟින් යටෝක්ත වැඩසටහන සඳහා නාම යෝජනා කැඳවා තිබූ අතර 2018.08.01 දිනට පෙර එම අයදුම්පත් යොමුකල යුතුව තිබුණි. ඒ අනුව උපකුලපතිතුමා විසින් 2018.07.20 දිනැතිව හිටපු ලේඛකාධිකාරී වී.ඩී කිත්සිරි මහතා යටෝක්ත වැඩසටහන සඳහා නාම යෝජනා අනුමත කරන ලදී. PIM ආයතනය විසින් 2018.07.20 දිනැති ලිපිය මඟින් වී.ඩී කිත්සිරි මහතාගේ යෝජනාව පිළිගෙන තිබුණි.

	3. අතියම් දීමනා USD 400 4. සංයුක්ත දීමනා USD 4200 අනුමත කරන ලදී. ඉහත පාලක සභා අනුමැතියට අනුව පාඨමාලා ගාස්තු සඳහා වන රු. 425,000 ක මුදල 2018.07.31 දින PIM ආයතනයට බැර කරන ලදී. ඉහත ගෙවීම් විශ්වවිද්‍යාලය මඟින් උපයා ගත් අරමුදල් වලින් ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත 2018.08.09.දින ලිපියක් මඟින් ඉල්ලීමක් කරන ලදී. 2018.08.09.දිනැතිව විශ්වවිද්‍යාලය මඟින් වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද ලිපියට අමාත්‍යාංශය විසින් 2018.10.12 දිනැති ලිපිය මඟින් පිළිතුරු ලබා දී තිබුණි.නමුත් මෙම පාඨමාලාව 2018.08.21 දින සිට 2018.08.30 දින දක්වා පැවැත්වීමටද නියමිතව තිබූ බැවින් වක්‍රලේඛණවල ප්‍රතිපාදන පරිදි හිමිකම් ලබන අතියම් දීමනා හා සංයුක්ත දීමනා 2018.08.13 දිනැති චටුවරය මඟින් ගෙවීම් කිරීම සඳහා මුදල් අංශයට දන්වන ලදී. ඉහත අමාත්‍යාංශ අනුමැතිය ලබා දීම ප්‍රමාද වූ නමුත් විශ්වවිද්‍යාලය මඟින් වී.ඩී කිත්සිරි මහතා නම කිරීම පරිදි යළෝක්ත මුදල් ඔහු වෙත ගෙවීමට කටයුතු කරන ලදී. වී.ඩී. කිත්සිරි මහතා 2020.03.31 දින සිට මෙම විශ්වවිද්‍යාලයෙන් නිදහස් කර ඇත්තේ යම් අයවීමක්	ඒ අනුව 2018.07.26 දින පැවති 240 වන පාලක සභාව විසින් ඒ මහතා වෙනුවෙන්, 1. රාජකාරී විදේශ නිවාඩු දින 10ක් (23018.08.21 - 2018.08.30) 2. පාඨමාලා ගාස්තු රු. 425,000 3. අතියම් දීමනා USD 400 4. සංයුක්ත දීමනා USD 4200 අනුමත කරන ලදී. ඉහත පාලක සභා අනුමැතියට අනුව පාඨමාලා ගාස්තු සඳහා වන රු. 425,000 ක මුදල 2018.07.31 දින PIM ආයතනයට බැර කරන ලදී. ඉහත ගෙවීම් විශ්වවිද්‍යාලය මඟින් උපයා ගත් අරමුදල් වලින් ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත 2018.08.09.දින ලිපියක් මඟින් ඉල්ලීමක් කරන ලදී. 2018.08.09. දිනැතිව විශ්වවිද්‍යාලය මඟින් වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද ලිපියට අමාත්‍යාංශය විසින් 2018.10.12 දිනැති ලිපිය මඟින් පිළිතුරු ලබා දී තිබුණි.නමුත් මෙම පාඨමාලාව 2018.08.21 දින සිට 2018.08.30 දින දක්වා පැවැත්වීමටද නියමිතව තිබූ බැවින් වක්‍රලේඛණවල ප්‍රතිපාදන පරිදි හිමිකම් ලබන අනියම් දීමනා හා සංයුක්ත

	ඇත්නම් එම අයවීම අයකර ගැනීමට යටත්වය. ඒ අනුව මෙම සංචාරය වෙනුවෙන් කිත්සිරි මහතාට ගෙවා ඇති මුදල ආපසු අයකර ගැනීම සඳහා 2020.09.28 දින පැවති 263 වන විශ්වවිද්‍යාල පාලක සභාවේදී ගෙන ඇති තීරණයට අනුව එම මුදල් අයකර ගැනීම සඳහා 2020.10.13 දිනැති ලිපිය මගින් හා 2021.01.18 දිනැති සිහිකැඳවීමේ ලිපිය මගින් ඔහු වෙත දැනුම් දී ඇත. එම ලිපිය සඳහා ඔහුගෙන් ලැබෙන පිළිතුර අනුව පාලක සභාවේ උපදෙස් පරිදි යටෝක්ත වියදම අර්ඝාධක අරමුදලින් අයකර ගැනීමට බලාපොරොත්තු වේ.	දිමනා 2018.08.13 දිනැති වවුචරය මඟින් ගෙවීම් කිරීම සඳහා මුදල් අංශයට දන්වන ලදී. ඉහත අමාත්‍යාංශ අනුමැතිය ලබා දීම ප්‍රමාද වූ නමුත් විශ්වවිද්‍යාලය මඟින් වී.ඩී කිත්සිරි මහතා නම් කිරීම පරිදි යටෝක්ත මුදල් ඔහු වෙත ගෙවීමට කටයුතු කරන ලදී. වී.ඩී. කිත්සිරි මහතා 2020.03.31 දින සිට මෙම විශ්වවිද්‍යාලයෙන් නිදහස් කර ඇත්තේ යම් අයවීමක් ඇත්නම් එම අයවීම අයකර ගැනීමට යටත්වය. ඒ අනුව මෙම සංචාරය වෙනුවෙන් කිත්සිරි මහතාට ගෙවා ඇති මුදල ආපසු අයකර ගැනීම සඳහා 2020.09.28 දින පැවති 263 වන විශ්වවිද්‍යාල පාලක සභාවේදී ගෙන ඇති තීරණයට අනුව එම මුදල් අයකර ගැනීම සඳහා 2020.10.13 දිනැති ලිපිය මගින් හා 2021.01.18 දිනැති සිහිකැඳවීමේ ලිපිය මගින් ඔහු වෙත දැනුම් දී ඇත. එම ලිපිය සඳහා ඔහුගෙන් ලැබෙන පිළිතුර අනුව පාලක සභාවේ උපදෙස් පරිදි යටෝක්ත වියදම අර්ඝාධක අරමුදලින් අයකර ගැනීමට බලාපොරොත්තු වන අතර එසේ නොහැකි වුවහොත් අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.
(ඇ) පර්යේෂණ හා පරිසර අධ්‍යයන ව්‍යාපෘති සඳහා දේශීය හා විදේශීය ආයතන මඟින් ලබා දී ඇති අරමුදල් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමකින්	විගණක විසින් පෙන්වා දෙන විගණන විමසුමට අදාල නිරීක්ෂණයන් මෙසේය.	ව්‍යාපෘති සම්බන්ධීකරණ පාර්ශවයන් දැනුවත් කර ඇති බැවින් අදාල පාර්ශවයන් විසින්

තොරව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. 4,418,209 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි.	Collaboration Project NSF Research Fund, ETA Project Nuwara Eliya, Internal Environmental Examination යන ව්‍යාපෘතිවලට අදාල මුදල් විශ්වවිද්‍යාලයේ ගිණුම් තුල පෙන්නුම් කරනුයේ අදාල ව්‍යාපෘති සම්බන්ධීකරණ පාර්ශවයන් විසින් අදාල මුදල් ඉල්ලුම් නොකිරීම හෝ අදාල මුදල්, මුදල් ලබාදුන් ආයතන වෙත නැවත යැවීම සඳහා ඉල්ලීම් නොකිරීම මතය. එවැනි ඉල්ලීමක් නොමැතිව මූල්‍ය අංශයට එම මුදල් සම්බන්ධව කටයුතු කල නොහැකි බැවින් ඔවුන් එසේ කටයුතු කර නොමැත.මෙම ව්‍යාපෘතිවලට අදාල නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් කර ඒවැනි ඉල්ලීම් ලබා ගෙන මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	ලබාදෙන ඉල්ලීම් මත ඉදිරියේදී මෙම මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 506 කින් තනතුරු 110 ක් හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 530 කින් තනතුරු 132 ක් පුරප්පාඩු පැවතුණි. සමාලෝචිත වර්ෂය තුල නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ලෙස රු. 19,854,304 ක් ගෙවීමට අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැවති පුරප්පාඩු ද හේතු වී තිබුණි.	<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u> ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා අනුමත කරන ලද පිරිස් ප්‍රතිපාදන (Cadre Report - 2017) අනුව 2021.03.31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ස්ථිර තනතුරු 110ක හා තාවකාලික හා කොන්ත්‍රාත් තනතුරු 60ක පුරප්පාඩුව පවතී. ඉහත පුරප්පාඩු අතරින් අනුමත විනේතෘ මහාචාර්ය තනතුරු 27න් 2021.03.31 දින වන විට පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් ද අනෙකුත් අනුමත මහාචාර්ය හා කථිකාචාර්ය තනතුරු 378 අතරින් 2021.03.31 වන දිනට පුරප්පාඩුව සංඛ්‍යාව 86 දක්වා අඩු වී ඇත .	<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u> ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා අනුමත කරන ලද පිරිස් ප්‍රතිපාදන (Cadre Report - 2017) අනුව 2021.06.30 දිනට ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 103 ක හා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල හා කොන්ත්‍රාත් පදනම මත තනතුරු 70 ක පුරප්පාඩුව පවතී. ඉහත ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු අතරින් අනුමත <u>විනේතෘ මහාචාර්ය</u> තනතුරු 27න් 2021.06.30 දින වන විට පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් ද අනෙකුත් අනුමත <u>මහාචාර්ය හා</u>

මෙහිදී, පුරප්පාඩු පවතින තනතුරු වලට එක් එක් අධ්‍යයනාංශ මඟින් නව කථිකාචාර්යවරුන් බඳවා ගැනීම සිදු කරන ලෙස ඉදිරිපත් කරන ලද ඉල්ලීම් පරිදි බඳවා ගැනීම් සඳහා 2020.06.28 වන් සහ 2020.09.20, 2020.12.20, 2021.01.31, 2021.02.28, 2021.03.07 හා 2021.04.28 දිනැති දැන්වීම් පල කර ඇත. ඒ අනුව, 2021.03.31 දින වන විට අදාල කාර්යය මණ්ඩල බඳවා ගැනීම 13 ක් සිදු කර ඇත. කවද, එම දැන්වීම් පරිදි අනෙකුත් බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට දින වෙන් කර ඔන සිදුවෙද් මේ දිනවල පවතින කොවිඩ් වයංගතය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පවැත්වීමට නොහැකිව ඇත. අනුමත තාවකාලික කථිකාචාර්යවරු 53 න් මේ වන විට පුරප්පාඩු සංඛ්‍යාව 15 ක් වේ. කවද, ඉහත දැන්වීම් පරිදි බඳවා ගැනීම් කිහිපයක් සිදු කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ සඳහා දින වෙන් කර ගැනීමට කටයුතු කිරීමට නියමිතය. ඒ අනුව මෙම පුරප්පාඩු ඉදිරියේ දී සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.	කථිකාචාර්ය තනතුරු 378 අනුමත් 2021.06.30 වන දිනට පුරප්පාඩු සංඛ්‍යාව 79 කි. මෙහිදී, පුරප්පාඩුව පවතින තනතුරු වලට එක් එක් අධ්‍යයනාංශ මඟින් නව කථිකාචාර්යවරුන් බඳවා ගැනීම් සිදු කිරීම පරිදි බඳවා ගැනීම් සඳහා ලෙස ඉදිරිපත් කරන ලද ඉල්ලීම් පරිදි බඳවා ගැනීම් සඳහා 2020.06.28 වන් සහ 2020.09.20, 2020.12.20, 2021.01.31, 2021.02.28, 2021.03.07, 2021.04.25 හා 2021.07.04 දිනැතිව දැන්වීම් පල කර ඇත. ඒ අනුව, 2021 ජනවාරි මස සිට 2021.06.30 දින දක්වා අදාල කාර්යය මණ්ඩල බඳවා ගැනීම් 20 ක් සිදු කර ඇත. කවද, එම දැන්වීම් පරිදි අනෙකුත් බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට දින වෙන් කර ඔන සිදුවෙද් මේ දිනවල පවතින කොවිඩ් වයංගත තත්ත්වය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පවැත්වීමට කටයුතු කරමින් පවතී. අනුමත තාවකාලික ශාඛාකාර කථිකාචාර්ය තනතුරු 53 න් 2021.06.30 දින වන විට පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් දක්වා අඩු වී ඇත. කවද, ඉහත දැන්වීම් පරිදි බඳවා ගැනීම් කිහිපයක් සිදු කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ සඳහා දින වෙන් කර ගැනීමට කටයුතු කිරීමට නියමිතය.

අනෙකුත් තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල 125 අතුරින් (තාවකාලික ශිල්ප පුදර්ශක, තාවකාලික පරීක්ෂණ සහකාර, තාවකාලික උපදේශක) 2021.06.30 දින වන විට පුරපුපාඩු සංඛ්‍යාව 56 ක් වේ. තාවකාලික ශිල්ප පුදර්ශක තනතුර සඳහා පත්වීම් ලබාගත් අදාල උපාධි පාඨමාලාවේ ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත් අයගෙන් පත් කරනු ලැබේ. එම පත්වීම් ලාභීන් පත්වීම් දින සිට කෙටි කාලයකින් ඉවත්ව යන බැවින් බොහෝ විට එම පුරපුපාඩු සංඛ්‍යාව විචලනයකට ලක් වේ.

අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 2021.03.31 දිනට 11 ක් වුවද සම්මුඛ පරීක්ෂණ පවත්වා ගැනීම් කිහිපයක් සිදුකර ඇත. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 2021.06.30 දිනට 8 ක් දක්වා අඩු වී ඇත.

පරිපාලන තනතුරු පුරප්පාඩු වලට බඳවා ගැනීම සඳහා 2020.06.28 දිනැති පුවත්පත් දැන්වීමක් පල කර ඇත. එම පුවත්පත් දැන්වීමට අනුව ව්‍යාපෘති කළමනාකාර තනතුර සඳහා අයදුම්පත් කැඳ වූ නමුත් සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැත. එහෙත් නැවත පාලක සභාවේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනම මත 2021.03.07 දිනැති අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ නමුත් අයදුම්කරුවන් පූර්ණ කාලීනව සේවය කිරීමට අපහසු බව

සම්මුඛ පරීක්ෂණයේදී දැන්වීම පරිදි එම පත්වීම සඳහා තෝරීම කම්ටුව විසින් නිර්දේශ නොකරන ලදී.

මෙවැනි නිළධාරී තනතුර සඳහා 2016 වර්ෂයේ පත්වීමක් සිදු කළද අයුම්කාරු විසින් පත්වීම හාර නොගැනුණි. තවද, එම තනතුර සඳහා 2018.08.19 දිනැතිව පුවත්පත් දැන්වීමක් පල කර අයුම්පත් කැඳවූ නමුත් සුදුසුකම් සහිත අයුම්පත් ලැබී නොමැත. එමෙන්ම මෙම තනතුර සඳහා අවස්ථා කිහිපයකදීම අයුම්පත් කැඳ වූ නමුත් සුදුසුකම් සහිත අයුම්පත් ලැබී නොමැති බැවින් පුරප්පාඩු පිරවීම ඵලදායී වී නොමැත.

සංඛ්‍යාන නිලධාරී II ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා 2020.06.28 හා 2021.03.07 දිනැතිව දැන්වීම් පලවීමත් කැඳවූ අතර කොවිඩ වසංගත තත්ත්වය හමුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී තනතුර සඳහා 2020.12.20 දිනැතිව දැන්වීම් පල කල නමුත් සුදුසුකම් සහිත අයුම්පත් ලැබී නොතිබුණි. එබැවින්, නැවතත් 2021.07.04 දිනැතිව දැන්වීමක් පල කර ඇත.

	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	➢ පරිපාලන තනතුරු පුරප්පාඩු වලට බඳවා ගැනීම සඳහා 2020.06.28 දිනැතිව පුවත්පත් දැන්වීමක් පල කර ඇත. එම පුවත්පත් දැන්වීමට අනුව ව්‍යාපෘති කළමනාකාර තනතුර සඳහා අයදුම්පත් කැඳ වූ නමුත් සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැත. එමගත් නැවත පාලක සභාවේ අනුමැතිය ඇතිව තෝරාත්තුක් පදනම මත 2021.03.07 දිනැතිව අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ නමුත් අයදුම්කරුවන් පූර්ණ කාලීනව සේවය කිරීමට අසමත් බව සම්මුඛ පරීක්ෂණයේදී දැන්වීම එම පත්වීම සඳහා තේරීම කමිටුව විසින් නිර්දේශ නොකරන ලදී. මෙවැනි තනතුර සඳහා 2016 වර්ෂයේ පත්වීමක් සිදු කළද අයදුම්කරු විසින් පත්වීම හාර නොගැණුනි. කවද, එම තනතුර සඳහා 2018.08.19 දිනැතිව පුවත්පත් දැන්වීමක් පල කර අයදුම්පත් කැඳවූ නමුත් සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැත. එමගින්ම මෙම තනතුර සඳහා අවස්ථා කිහිපයකදීම අයදුම්පත් කැඳ වූ නමුත් සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැති බැවින් පුරප්පාඩු පිරවීම එලදායී වී නොමැත. සංවිධාන නිලධාරී II ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා 2020.06.28 හා 2021.03.07 දිනැතිව දැන්වීම් පරිදි අයදුම්පත් කැඳවූ අතර ලිඛිත පරීක්ෂණය පැවැත්වීම සඳහා කටයුතු කිරීමට නියමිතය.	2020.12.31 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ. • තාක්ෂණික කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 47 කි. • ලිපිකරු හා සහායක කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 26 කි. • පාරිමික කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 58 කි. 2017 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව සහ අලුතින් ආරම්භ කරන ලද පියසෑන්ට මෙ වන විට අනුමත වී ඇති සම්පූර්ණ අනධ්‍යයන කාර්ය මණ්ඩල පිරිස් ප්‍රතිපාදන සංඛ්‍යාව පහත පරිදි වේ. අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය - 530 තාවකාලික මැනුම් සහායක - 11 අනුමත වී ඇති මුළු කාර්ය මණ්ඩල පිරිස් ප්‍රතිපාදන ගණන - 541 ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව 530 න් 399 ක් 2020.12.31 දිනට පුරප්පාඩු පුරවා ඇත. 2021.07.16 දින වන විට ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව 398 කි.

	පුධාන විනයාරක්ෂක නිලධාරී තනතුර සඳහා නැවත 2020.12.20 දිනැතිව දැන්වීම පල කර අයදුම්පත් කැඳවා ඇති නමුත්, සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැත. ➢ 2020.12.31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ. • කාක්ෂණික කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 47 කි. • ලිපිකරු හා සහායක කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 26 කි. • පාථමික කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 58 කි. 2017 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව සහ අලුතින් ආරම්භ කරන ලද සිසියන්ට මේ වන විට අනුමත වී ඇති සම්පූර්ණ අධ්‍යයන කාර්ය මණ්ඩල පිරියි පුතිපාදන සංඛ්‍යාව පහත පරිදි වේ. අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය - 530 තාවකාලික මෑනුම් සහායක - 11 අනුමත වී ඇති මුළු කාර්ය මණ්ඩල පිරිස් පුතිපාදන ගණන - 541 ඒ අනුව අනුමත ස්ථිරක සංඛ්‍යාව 530 න් 399 ක් 2020.12.31 දිනට පුරප්පාඩු පුරවා ඇත.	වකුලේඛ අංක 876 හි සඳහන් තනතුරු කිහිපයක් සඳහා නාම ලේඛන ලැබී ඇති බැවින් එම තනතුරු පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු පාථමික ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අභ්‍යන්තර අයුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු සහ පුවත්පත් දැන්වීම මඟින් බඳවා ගැනීම්වලට අදාළ කටයුතු මේ වන විට සිදුකරගින් පවතී. කළමනාකරණ සේවා වකුලේඛ 01/2020 හා 02/2020 ට අනුව පාථමික සේවා ගණයේ තනතුරු බඳවා ගැනීම මෙම පුරප්පාඩු පුමාණය ඉහළ යාමට හේතු වී තිබේ

	2021.04.27 දින වන විට ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව 398 කි. චක්‍රලේඛ අංක 876 හි සඳහන් තනතුරු කිහිපයක් සඳහා නාම ලේඛන ලැබී ඇති බැවින් එකී තනතුරු පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු සහ පුවත්පත් දැන්වීම් මගින් බඳවා ගැනීම්වලට අදාළ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 හා 02/2020 ට අනුව ප්‍රාථමික සේවා ගණයේ තනතුරු බඳවා ගැනීම් අත්හිටුවා තිබීම මෙම පුරප්පාඩු ප්‍රමාණය ඉහළ යාමට හේතු වී තිබේ.	
(ඊ) 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන එකතුව රු. 62,686,386 ක් වූ විවිධ ණය හිමි ශේෂ 8 ක් හා ඉකුත් වර්ෂයේ සිට මහපොළ භාරකාර අරමුදලට ගෙවිය යුතුව පවතින රු. 2,201,150 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොනිබුණි.	මෙම ශේෂය ඇතුලත් වී ඇති මුළු මුදලින් රු.177,401/= ක මුදලක් සහ රු.743,482.37 මුදල ගොඩනැගිලි ඉදිකිරීමේදී අප විසින් පිළිවෙලින් වන්ද්‍රකාන්ති ඉදිකිරීම්කරුවෝ සහ සමරසේකර කොන්ත්‍රාත්කරුවෝ වෙත ගෙවිය යුතු මුදල් වන අතර මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් නඩු ගොනුකර ඇති අතර අදාල නඩු අවසන් වන තෙක් අදාල මුදල් ගෙවිය නොහැක . ඉතිරි මුදල ඇතුලත් වී ඇත්තේ පිළිවෙලින් 2010 සිට 2015 දක්වා 100% ඉදිකිරීම් නිමකර ඇති දැනට භාවිතා කරන පහත ගොඩනැගිලි සඳහා අවසාන බිල්පත් ඉදිරිපත් නොවීම මත ගෙවීමට නොහැකි වීමෙනි .ඉදිරියේදී අවසාන බිල්පත ඉදිරිපත් කිරීමේදී මෙම මුදල ගෙවා නිමකළ හැක.	විගණන විමසුම් සඳහා ලබාදෙන ලද පිළිතුරම අදාල වේ.

	○ කෘෂි විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණ ○ කළමණාකරන පීඨ ගොඩනැගිලි සංකීර්ණය ○ භූ විඥාපන පීඨ ගොඩනැගිලි සංකීර්ණය ○ ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ○ ක්‍රීඩා පිටිය ○ පිරිමි නේවාසිකාගාරය මෙම ගෙවීම් වාර්තා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වේ. විගණන විමසුම හා එකඟ වන අතර, ඉදිරියේ දී මහපොල භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.2,201,150/- නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.	මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
(උ) 2018 දෙසැම්බර් වනවිට පර්යේෂණ කාලසීමාව අවසන් වී තිබුණු පර්යේෂණ යෝජනා 21 ක් සඳහා පර්යේෂණ ප්‍රදාන ලෙස රු. 23,024,892 ක් ගෙවා තිබුණ ද 2021 මාර්තු වනවිටත් අවසන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	2021 මාර්තු මාසය වන විට අවසන් පර්යේෂණ වාර්තා 09 ක් ඉදිරිපත් කරන ලද අතර, රට තුල පවතින වසංගත තත්ත්වය නිසා වරින්වර ඇදිරිනීතිය පැනවීම හා අනෙකුත් නිරෝධායන නීති අනුව කටයුතු කිරීමට සිදුවීම නිසා ක්ෂේත්‍රයෙන් දත්ත ලබාගත යුතු සහ නියැදි ලෙස පුද්ගල කණ්ඩායම් යොදාගනිමින් සිදුකරන පර්යේෂණ ව්‍යාපෘතීන් අදාල කාලසීමාව තුලදී අවසන් කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව ඉතිරි පර්යේෂණ ව්‍යාපෘති 12 සඳහා කාල දිගුවක් 2021 ජූලි මස 31 වන දින දක්වා ලබා දීමට 2021 මාර්තු මස 16 වන දින රැස් වූ විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුව තීරණය කරන ලදී.	පර්යේෂණ හා ප්‍රදාන කමිටුවේ තීරණය අනුව පර්යේෂණ ව්‍යාපෘති 12 සඳහා කාල දිගුවක් 2021/07/31 දක්වා ලබා දෙන ලදි. කෙසේ වුවද අද දින දක්වා ඉන් පර්යේෂණ ව්‍යාපෘති 07 කට අදාලව පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර ඇති අතර පර්යේෂණ ව්‍යාපෘති 02ක් සඳහා පිළිවෙලින් 2021/10/31 දක්වා සහ 2021/12/31 දක්වා කාල දිගුවන් ලබාදෙන ලදි.
(ඌ) විශ්වවිද්‍යාලය වෙනුවෙන් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ දී	පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු කඩිනම් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලීය පරිපාලන නිලධාරීන්ගේ 147	පරිපාලන ගොඩනැගිල්ල සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ගැනීම සඳහා

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර රු. 1,494,543 ක මූලික වියදමක් ලෙස දරා නිබුණ ද 2021 අප්‍රේල් වනවිටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.	වන රැස්වීමේ දී කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් අදාල කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන්, 01 සංකල්පීය පත්‍රිකාවක් (Concept Paper) 02 ගොඩනැගිල්ලේ ඉඩ හා අනෙකුත් අවශ්‍යතා දැක්වෙන විස්තර පත්‍රිකාවක් (Space and other requirements for Proposed Administration Building) සහ, 03 දළ සැලැස්ම (Draft layout plan) සහිත වාර්තාවක් 2021.03.23 දින මූලධන හා සැලසුම් අංශය වෙත ලබා දී ඇති අතර එම වාර්තා 2021 මාර්තු 29 දින පැවති 269 වන පාලක සභාව (Council) වෙත යොමු කර ඇත. එහිදී පාලක සභාව විසින් පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සහා ඇස්තමේන්තු සකස් කිරීමට මිල ගණන් කැඳවීමට අනුමැතිය ලබා දී අතර මෙම කාර්යය සඳහා වන පිරිවැය ඇස්තමේන්තුවක් (Total cost estimate) ලබා ගැනීමට රජයේ ආයතන වලින් මිල කැඳවීම් සිදු කර ඇත.	රජයේ ආයතන කින් 05 ඔවුන්ගේ මිල ගණන් දන්වා එවන ලෙස දැන්වූ අතර ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් පමණක් ගාස්තු සඳහන් කර එවා නිබුණි. ඒ අනුව එම ආයතනයට අදාල මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.

මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක

උපකුලපති